# සීගිරි



*I need you like a heart needs a beat...*

2019 SPRING COLLECTION


## සුජීව ප්‍රසන්න ආරච්චි

# SUJEEWA PRASANNA ARACHCHI

# සීගිරි

සුජීව ප්‍රසන්න ආරච්චි

# 01

'සීගිරි සුපර් මාර්ට්' නගරයේ ඇති ජනප්‍රිය සුපිරි වෙළඳ සැළකි. එහි නැති දෙයක් නැත. සෑහෙන බිම් ප්‍රමාණයක විසිර ඇති සීගිරි සුපර් මාර්ට් වෙත නොයන කෙනෙක් නගරයේ නැතිතරම්ය. අලුත් එළවළු පළතුරු අලුත් මාළු මස් පිරුණු සීගිරි සුපර් මාර්ට් නම කියූ සැනින් සියල්ලන්ම දන්නා හඳුනන පවුලේ ෆැමිලි මාර්ට් එකකි. සීගිරි හී තේමා පාඨය ඒ ගැන මොනවට කියයි. 'සැම

දේ සපිරි - නාමය සුපිරි.’

සීගිරි සුපර් මාර්ට් සුපිරි වෙළඳ සැළ ඉතා කුඩාවට මීන් වසර තිහකට පමණ පෙර අරඹන්නේ සෙනරත් රඹුක්වැල්ල මහතාය. ඒ කාලයේ ලංකාවේ අද මෙන් සුපිරි වෙළඳ සැල් අඩියෙන් අඩිය තිබුනේ නැත. ඔහුගෙ ‘ම අදහසකට අනුව පටන් ගත් සීගිරි සුපර් බලාගෙන ඉඳිද්දී දියුණු විය.

පසුගිය කාලයේ අලුත් අලුත් සමාගම් සුපිරි වෙළඳසැල් ව්‍යාපාරයට ආ පසුව සීගිරි හී අලෙවිය යම් තරමකට පහළ ගියේය. නවීන වෙළඳ උපක්‍රම සහ තරඟකාරී ප්‍රචාරණය නිසා අලුත් සුපිරි වෙළඳ සැල්වලට බොහෝ දෙනා ඇදුනෝය. එය සීගිරි සුපර් මාර්ට් හී දෛනික අලෙවියට සෑහෙන බලපෑමක් කර තිබුණි.

එසේ වුවද පුරුද්දකට මෙන් තවමත් බොහෝ දෙනා සීගිරි වෙත ඇදෙයි. සීගිරි එකත් සමඟ බැදුණු කුමක්දෝ බැඳීමක් ගනුදෙනුකරුවන්ගේ හදවතේ තවමත් තිබේ.

සීගිරි සුපර් හිමි සෙනරත් රඹුක්වැල්ල මහතාගේ විශාල නිවස පිහිටා ඇත්තේද සීගිරි එක අසළින් ඇති මාවතේය. ඒ ළඟමය. එය ඉතා විශාල නිවසකි. සීගිරි මහගෙ දර නිවසක් නොව නිවාස රාජයෙකි. රඹුක්වැල්ල මහතා එය සාදා නිමකලේ මේ මෑතකදීය.

සීගිරි මහගෙදර රඹුක්වැල්ල පවුලම ජීවත් වෙයි. රඹුක්වැල්ල මහතා සිය දරුවන්ට වෙන්වෙන්නට ඉඩනොදුන්නේ ඔවුන්ව එකටම තියාගෙන ලස්සන පවුලක් එක

වහලක් යට හදන්නට ඕනා නිසාය. 'සීගිරි මහගෙදර' සීගිරි සුපර් මාර්ට් මෙන්ම නගරයේ ජනප්‍රිය ය.

මේ විශාල නිවසේ සෙනරත් රඹුක්වැල්ල මහතාගේ වැඩිමහල් පුතා වූ මිලින්දද ඔහුගේ බිරිඳ ඉඳුනිල්ද දියණියන් තිදෙනාද ජීවත් වෙයි. එක ළඟ පිපි මල් තුනක් වන් වූ මේ දියණියන් තිදෙනා නමින් භාවනා තාරකා සහ නේත්‍රාය. ඒ අතරිනුත් පොඩිම දුව භාවනාට ඇත්තේ දෙවතාවක් හැරී බලන්නට හිතෙනා තරම් වෙනස් ලස්සනකි. නිහඬ නිසංසල යුවතියක් වූ ඇය, ඇයටම ආවේනික වූ ජීවන ලතාවකින් හැඩුන යුවතියකි. දෙවැන්නා තාරුකා භාවනාට වඩා හාත්පසින්ම වෙනස් යුවතියකි. ඇය දඟකාර ගතිපැවතුම් ඇති අලුත් සමාජයට ප්‍රියකරන

නිදහස් යුවතියකි. ලොකුම දුව වූ නේත්‍රාගේ ජීවිතය ඇත්තටම දුකයි. ඇය ඇගේ අවාසනාවන්ත විවාහය මැද සිදුවූ කටුක අත්දැකීමක් නිසා අබාධිත තත්වයට පත්වූ සුන්දර යුවතියකි. නේත්‍රාගේ ජීවිතය ගෙවෙන්නේ රෝද පුටුවක් මතය. දෛවයේ ඒ අවාසනාවන්ත අත්දැකීමට පසුවත් ඇය අමාරුවෙන් ජීවිතය අල්ලාගෙන සිනාසෙන්නට වෙර දරන්නීය.

සෙනරත් රඹුක්වැල්ල මහතාගේ දෙවැනි දුව වූ සුරංගි ඉන්නේ මහගෙ දර ළඟම නිවසකය. ඇගේ සැමියා නාමල්ගමය. ඔවුන්ට දරුවන් දෙදෙනෙකු සිටී. ඒ මිහිරංග හා මලීෂාය.

සෙනරත් රඹුක්වැල්ල මහතාගේ

බාලම දියණිය වූ රුවන්ති ජීවත්වන්නේ වෙනමම නිවසක වුවත් ඇය මේ දිනවල ඉන්නේ මහගෙදරය. ඒ ඇගේ සැමියා විදේශගතව ඇති නිසාය. ඔහු විදේශගත වෙලාද නැත්නම් ඇගෙන් වෙන්වෙලාද කියා කවුරුවත් දන්නේ නැත. ඇගේ එකම පුතා කෝසලය.

ඔහුගේ දෙවෙනි දුව වූ නර්මදා මීට වසර විසි දෙකකට පෙර මිය ගියාය. අදටත් සෙනරත් රඹුක්වැල්ල මහතා ජීවත් වන්නේ ඒ දුක පපුවේ තබාගෙනය. ජයග්‍රහණ පිට ජයග්‍රහණ ලැබූ රඹුක්වැල්ල මහතාගේ ජීවිත කතාවේ ඇති පරාජිතම පරිච්ඡේදය නර්මදාය. ඒ කතාව අඳුරින් වැසීගිය දුක්බර කතාවකි.

සෙනරත් රඹුක්වැල්ල මහතාගේ

මේ දරුවන්ගේ දරුවෝ සියල්ලම අද සීගිරි සුපර් මාට් හී කළමනාකරණයට සහය වෙයි. ආබාධිතව ඉන්නා නේත්‍රා පවා එහි සමස්ථ මෙහෙයුම් කළමනාකරණය බලයි. භාවනාට බාරව ඇත්තේ කැෂියර් අංශයය. මිහිරංග එහි ග්‍රොසරි අංශය බලයි. මේ ලෙස සියල්ලන්ම එහි විවිධ කටයුතු වලට සෙනරත් රඹුක්වැල්ල මහතා අනුබද්ධ කර ඇත.

මිහිරංග ඉන්නේ තම ලස්සන නෑනා ගැන තදබල බලාපොරොත්තුවකිනි. එහෙත් භාවනා මුළු හිතින්ම පතන ජීවන සහකරුවා තවමත් පැමිණ නැත. ඇය ඔහු එනතුරු බලාගෙන ඉඳියි.

අපේ කතාව ඇරඹෙන්නේ සීගිරි සුපර් මාර්ට් හී උදාවන තවත් එක

සොඳුරු සෙනසුරාදා උදෑසනකිනි.

*** *** *** *** ***

භාවනා සීගිරි සුපර් වෙත එන්නේ තරමක් දැඟකාර ලෙස අඩි තබමිනි. යුවතියගෙන් අද දිස්වන්නේ වෙනදාටත් වඩා ලස්සනකි. උදේ ඇඳගෙන කාමරයෙන් එද්දී නේත්‍රා තම බාල සොයුරිය දෙස බලාගෙනම උන්නාය.

"අනේ මට ඉන්නේ කොච්චර ලස්සන නංගියෙක්ද? හරිම ස්වීට්. අද බබා සමන්තා වගේ."

නේත්‍රා කීවේ කෙල්ලගේ අතක් මෘදුව අල්ලාගෙනය. නේත්‍රා ඇය ඉඳගෙන උන් රෝද පුටුව ළඟටම නංගීව ඇදගත්තාය. නේත්‍රා තවමත්

ඉන්නේ රෑ ඇඳුම පිටිනි.

"කවුද අක්කා සමන්තා"

භාවනා ඇසුවාය. සමන්තා කවුදැයි ඇයට නිච්චියක් නැත.

"සමන්තා පොඩි නංගි. සවුත් ඇක්ට්‍රස් අනේ. අපි අර බැලුවේ නානි මූවී එක. මැස්සගේ. ඒකේ ඉන්නේ."

භාවනා ලස්සනට සිනාසුනාය. ඇයට සමන්තාව සිහිවිය. සමන්තා හරි ලස්සනය. අහිංසක පාටය. 'මං ඇත්තටම සමන්තා වගේද?' උදේ සිට යුවතිය හිතන්නේ ඒකය. ඇය මේ දුවගෙන එන්නේ පරිගණකය ගෙන අන්තර්ජාලයට ගොස් සමන්තාගේ රූපයක් ගෙන බලන්නත් හිතාගෙනය.

සතියේ දවස් පහේම සීගිරි එකට සාරිය අඳින භාවනා නිවාඩු දවස්වලට අඳින්නේ ඩෙනිම්

ජීන්ස් එකත් එයටම ගැළපෙන බ්ලවුසයකුත්ය. අද ඇය ඇඳගෙන ඉන්නේ සාගර නිලේ ඩෙනිම් ජීන්ස් එකට ඉන්දියානු මෝස්තරයේ සුදු බ්ලවුසයකි. එහි ඇති චාම් ඉන්දියන් මල් මෝස්තරයට භාවනා ආසය. බ්ලවුස් කර වටේ ගිය හීන් රිදී වර්ක් එකක් නිසා එය තවත් ලස්සනය. මෙහෙම අඳිද්දී ඇය එහෙමම කියා ආභරණයක් පළඳින්නේ නැත. වම් අතට හීන් සුදු පටියක් යෙදූ ෆැෂන් අත් ඔරලෝසුව දමාගන්නා යුවතිය දකුණු අතට ඇගේ රිදී පැහැගත් අත් පළඳනාව දමා ගනියි. මේ අත් පළඳනාවට භාවනා හරි ආසය. එය තෑගි ලැබුණු එකකි. කෙල්ලගේ විසි වෙනි උපන් දිනයට එය ඇයට දුන්නේ නේත්‍රාය. ඇගේ ලොකු අක්කාය.

“කාටවත් තෑග්ගක් ගන්න මෙච්චර

මහන්සිවෙලා නෑ. උදේ වරුවම ගියා ඒක තෝරන්න. මේකි පිස්සිනේ. මොනවට ආසද කියලා අපි දන්නේ නෑනේ?”

ඒක ගෙනා දවසේ නේත්‍රා කීවේ එහෙමය. භාවනා ඇගේ සිහින් දෙතොල් මුව තුළට දමාගෙන සිනාසුනාය. එහෙම සිනාවෙද්දී භාවනා මලක් වැනිය. නේත්‍රා ඇගේ නංගිලා දෙන්නාටම එක වාගේ ආදරේය. ඒත් හදවතින් වඩාත්ම කිට්ටු තාරකාට වඩා භාවනාටය.

තවමත් සීගිරි සුපර් මාර්ට් විවෘතකර නැත. එහි සේවකයන් ඉන්නේ සති අන්තයේ පළමු දවසට සීගිරි සුපර් එක සූදානම් කරමිනි. තිහක පමණ ස්ටාෆ් එකක් එහි සේවයට යොදවා ඇත.

සුපවයිසර්වරුන් දෙදෙනා ඇර අනිත් සියල්ලන්ම ඉන්නේ ඔවුන්ට ලබාදී ඇති නිළ ඇඳුම ඇඳගෙනය. ඉන් වැඩි හරියක් භාවනාගේම වයසේ යුවතියන්ය. පිරිමි ළමයින් හය හත් දෙනෙක්ද සේවයට යොදවා ඇත. ඒ බොහෝ දෙනා සේවය කරන්නේ ස්ටෝර්ස් එකේය.

භාවනාට බාරදී ඇත්තේ කැෂියර් අංශයය. එහෙම කියා ඇය සීගිරි සුපර් හී අනෙකුත් අංශයන් දෙස නොබලා ඉන්නේ නැත. භාවනා සීගිරි හී සේවය කරද්දී එය තමාගේ සීයාට හිමි ආයතනය කියා සිතන්නේ නැත. කෙල්ල සිතන්නේ මේ ඇගේ වෘත්තිය කියාය. ඒ නිසාම උසස් පෙළ කර සීගිරි එකට බැඳුණු දවසේ සිට ඇය ඇගේ පළමු රැකියාවට අතිශයින් ආදරය කළාය. ඇය ඇගේ

අංශයෙන් කිසිදු වැරද්දක් වෙන්න ඉඩදෙන්නේ නැත. එහෙත් කැෂියර් එකට බඳවාගන්නා අලුත් යුවතියන් අතින් දහසක් වැරදි වෙයි. භාවනා ඒ සියල්ල නිවැරදි කරන්නේ කිසිවෙකුට නොකියාය. ඇතැම් අවස්ථාවල කැෂියර් මැෂින්වල සටහන්ව ඇති මුදල එහි නැත. එහෙම වෙන්නේ කෙල්ලෝ වංචාවක් කරන නිසා යැයි භාවනා සිතන්නේ නැත. ඇයට ඇගේ කෙල්ලෝ ටිකව විශ්වාසය.

"අනේ මිස් ඉසෙඩ් රිපෝට් එකයි කලෙක්ෂන් එකයි බැලන්ස් වෙන්නේ නෑනේ."

කැෂියර් කෙල්ලෙක් දහදිය දමාගෙන පැමිණ කියයි. භාවනා තොල්පට ඇදකරයි.

"ඔයාලට පිස්සු අනේ. කොල්ලෝ

ගැන හිත හිත කස්ටමස්ලට වැඩිපුර බැලන්ස් දීලා ඇති. පිස්සියෙක්නේ."

කෙල්ල බණින්නේ හිත රිදෙන්නේ නැති විදිහටය. කට උල්කරගෙනය.

"අනේ මට එහෙම බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් නෑ මිස්."

කැෂියර් යුවතිය අවංකව කියයි.

"හා. දැන් මම ඒක පිළිගනියි කියලද හිතාගෙන ඉන්නේ. බොරු කියන ලස්සන. කැෂියර් එකේ ඉඳගෙනත් දාගෙන කල්පනාව. බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් නැත්නම් කවුරු ගැනද හිතන්නේ."

භාවනා අසයි. යුවතිය කැකිරි පලයි.

"මිසුත් එහෙම මේසේ ඉඳගෙන කල්පනා කරකර ඉන්නේ. ඒ බෝයි ෆ්‍රෙන්ඩ් ගැනද?සමහර වෙලාවට අපි

එනවා පේන්නේවත් නෑ"

යුවතිය අසයි. භාවනාට කට උත්තර නැත.

"ඒ පිස්සා තාම නෑ අනේ"

"මොන පිස්සද මිස්?"

"පිස්සා කිව්වේ මගේ මේ එයාට."

"උදේ පහන තියන මිසුත් බොරු කියනවනේ. අපි විශ්වාස කරයි ඔය බොරු"

භාවනා රවයි.

"මම කිව්වේ ඇත්ත. අපි නෑනේ ඔය හොර බොරු. කොල්ලෙක් ඉන්නවානම් මම මේම අතින් අල්ලගෙන එන්නේ."

කෙල්ල කොල්ලාව අල්ලාගන්නා හැටිත් පෙන්වයි.

"ඒ වුණාට මිස් එයාව අල්ලන්න යන්න එපා."

"ඇයි."

"එයා මිස්ව මේම බදාගෙන එයි. ආදරෙන් අල්ලගෙන."

කැෂියර් යුවතිය කියයි.

"මාත් ආස එහෙම තමයි. කෙල්ල කොල්ලව අල්ලන් යනකොට ලස්සන නෑනේද අනූ. නිකං පැනලා දෙනවා වගේ නේද?"

යුවතිය හිස වනයි. භාවනා දෙනෙත් බරකරගෙන කල්පනාවකට වැටෙයි. 'ඔයා දෙහිඅත්තකණ්ඩියේ ඉන්නවද නන්දිකඩාල්වල ඉන්නවද නැත්නම් නිල්දණ්ඩාහින්නේ ඉන්නවද? කෝ ඉන්න තැනකින් එන්නේ නෑනේ' කෙල්ල සිතයි.

"හරි හරි දැන් කොල්ලෝ අල්ලග න්න තැනකින් අල්ලගනී. ෂෝටේජ් එක කීයක්ද කියන්න."

භාවනා හදිස්සියේ පියවි සිහියට පැමිණ කියයි. 'කොල්ලෝ ගැන කතාකරන කොට මගෙත් සිහිය අවුල්වෙනවා' ඇය තමාටම බැණගනියි. යුවතිය හිනාවෙයි.

"මේ එච්චර නෑ මිස්. රුපියල් හත්සිය විස්සයි."

ඇය කීවාය.

"උඹ ගත්තේ නෑ නේද වස්තුවේ."

භාවනා අහන්නේ හරි ආදරයෙනි. එහෙම අහද්දී කවදාවත් කාටවත් සතයක්වත් කැෂියර් කලෙක්ෂන්වලින් ගන්න හිතෙන්නේද නැත. කොහොමත් එහෙම ගන්නද අමාරුය. ඒවාට ක්‍රම යොදා ඇත. කැමරා සවිකර ඇත්තේ කැෂියර් පොයින්ට් තුනම ෆෝකස් වෙන ලෙසය.

"අන්නේ මිස් මම එහෙම. මගේ

අප්පච්චි පල්ලා ගත්තේ නෑ මිස්"

"පිස්සුනේ අනේ. විහිළුවක්වත් තේරෙන්නේ නෑනේ මේ මළ හෝන්තුවට. මි මි. ඒකත් මගේ අතින් තමා ඉතින්."

ඒ වෙලාවට කෙල්ල කරන්නේ ඇගේ පර්ස් එකෙන් හිඟ මුදල දමන එකය.

"මගේ සැලරි එකෙන් දාන්න මිස්"

යුවතිය කියන්නේ දුකෙනි.

"මේ පාර විතරයි මං දාන්නේ. ඔයාලා කරන වැඩ නිසා මගේ දුප්පත් පඩියත් ඉවරයි. අනිත් පාර ඇත්තටම කපනවා හරි"

භාවනා බැරෑරුම් ලෙස කියයි.

"කල්පනාවෙන්ම කරනවා මිස්. අද ටිකක් බිසී වුණානේ."

"හරි හරි දැන් හරි. මේ ඒක

නෙමේ. බුචර් එකේ අලුතින් ගත්ත කොල්ලා ඔයාට ලයින් නේ."

භාවනා අසයි. යුවතිය ඇඹරෙයි.

"ටිකක් මිස්. අද උදේ මට සීනි සම්බෝල පානුත් ගෙනල්ලා මිස්."

"උඹත් ෂේප් එකේ ගත්තනේ."

"ඒක රසයි මිස්. කොහෙන් ගේනවද දන්නේ නෑ."

"ඉතින් කොල්ලා මොකද කියන්නේ."

"පිස්සෙක් මිස්. මං ආස නෑ උස කොල්ලන්ට."

"හා එතකොට ඔයා හොයන්නේ කොට කෑල්ලක්."

යුවතිය සිනාසෙයි. භාවනා ඇය යන දෙස සිනාබරව බලාගෙන ඉඳියි. 'ඔයා උසද කොටද කළුද සුදුද හොඳද නරකද ඒ මොනවත්

මම දන්නේ නෑ. හරිම පාළුයි. වෙයා ආ යූ' භාවනා අසන්නේ කිසිදාක දැක්කේ නැති ඇයගේ සංසාර ආදරවන්තයාගෙනි.

සීගිරි එකේ ජීවිතය එහෙමය.

අද භාවනාට ටිකක් කාර්යබහුල දවසකි. සති අන්තයට සීගිරි එක උතුරයි. නගරයේ කොතරම් අලුත් සුපිරි වෙළඳසැල් තිබුණද සීගිරි එකටම පුරුදු වූ පාරිභෝගිකයෝ දහස් ගණනක් මේ අවට ඇත. ඔවුන් කවුරුද සුපිරි වෙළඳ සැල් දැමූවද එන්නේ සීගිරි එකටය. බොහෝ පාරිභෝගිකයන්ව නමින්ද සීගිරි එක දනියි. ඒ අර පුරුද්දට එන පාරිභෝග කයන්ය.

"අද මිසිස් හේවගේ ආවේ නැද්ද සර්."

එන පාරිභෝගිකයෙක්ගෙන් ඇතැම් විට භාවනා අසයි.

“අනේ නෑ දුව. වයිෆ්ට ටිකක් සනීප මදි. මාකටින් කරන්න අද මම ආවේ.”

“අනේ ඇයි මැඩම්ට?”

“චුට්ටක් කලන්තේ වගේ.”

“මැඩම්ව මතක් කළා කියන්න සර්.”

සීගිරි එකේ පාරිභෝගිකයන් ඒ තරම්ම සීගිරි එකට සමීපය. ඔවුනුත් එසේය. ‘මොන දේ විකුණන්නත් කලින් පුතේ හොඳ හිත විකුණන්න ඕන. තේරුණාද? ඊට පස්සේ තමයි අපි අනිත් දේවල් දෙන්නේ’ සෙනරත් රඹුක්වැල්ල මහතා මේ කතාව නිතරම කියයි. භාවනා එය තදින්ම අදහයි.

භාවනා අලුත් නිළියක් මෙන් ලතාවකට ඇවිදගෙන එද්දී කැෂියර් එකේ කෙල්ලෝ ටික එක පොකුරට ඉඳගෙන ඇය දෙස බලාගෙන ඉඳියි. එහෙම තමා දෙසම බලාගෙන සිටිද්දී භාවනා මොකක්ද වාගේය.

"ගුඩ් මෝනිං මිස්."

යුවතියන් ටික කියන්නේ එක පොකුරටය.

"ගුඩ් මෝනිං. මං කොල්ලෙක් නෙමේ මං දිහා ඔහොම බලාගෙන ඉන්න"

භාවනා ඔවුන් අතරට එමින් කියයි. කෙල්ල ඇය අත වූ දවසේ උදෑසන ලබාදෙන ෆ්ලෝට් එක කැෂියර් පරිගණකයක් මත තබා සිනාසෙයි.

"අනේ නෑ මිස් බලාගෙන උන්නේ අද මිස්ගේ ලස්සන."

එහෙම කියද්දීනම් ඇගේ දෙතොලට හරිම ලස්සන හිනාවක් එයි. 'අද අක්කත් කිව්වා ලස්සනයි කියලා. මොකෝ මේ. අලුත් ක්‍රීම් එකක්වත් ගෑවේ නෑනේ එහෙමම හදිස්සියේ ලස්සන වෙන්න.' භාවනා තනිවම සිතයි. මේ ලස්සන වසන්ත කාලය බව කෙල්ල හිතන්නේ නැත. ඒ වසයට මල් ඔහේ තිබ්බත් ලස්සනය. කැලේ පිපුනත් හැඩය. මඩේ පිපුනත් හැඩය.

"අනේ මගේ ලස්සන. උඹලා ටික මාව මුරුංගා අත්තේ තියන්නේ ඉන්නේ අදත් මගෙන් මොනවාහරි ගන්න ඔය."

"අනේ නෑ මිස්. අනේ මන්දා මිස් සාරිය ඇන්දාමත් ලස්සනයි ජින්ස් එක ඇන්දාමත් ලස්සනයි. මොකක්ද

හොඳ කියලා හිතාගන්න බෑ මිස්”

භාවනා දෙනෙත් එසෙව්වේ සිනාබරවය.

“දවසක මං නයිට්ටිය පිටින්ම එන්නම්කෝ. එදාටත් කියන්නකෝ ලස්සනයි කියලා.”

“නයිට්ටිය පිටින් ඉන්නකොට ඉතින් ලස්සනයි කියන්නේ අපි නෙමේනේ මිස්.”

“එහෙනම් කවුද?”

කෙල්ල පුදුමයෙන් අසයි.

“එයා.”

“කවුද එයා?”

“එයා මිස්ගේ හස්බන්ඩ්.”

සිනාව මිහිරෙන් පිරී යයි.

“එයාට වඩාත් ලස්සන නයිට්ටියත් ගැලෙව්වාම නේද මිස්.”

යුවතියන් අතරේ සිටිනා තරින්දි කියයි. යළිත් අර සිනාවෙන් සීගිරි දොරකඩ පිරීයයි. කෙල්ල දසන් වලින් යටිතොල තදකරගනී.

"මේ මහ වල් කෙල්ලෝ ටිකක්. හිතේ තියෙන්නෙම ඒවානේ"

"ඒක වල්කමක්යෑ මහත්තයා එක්කනේ."

භාවනා දෑස් පමණක් හරවයි.

"කවුරු එක්ක කළත් වල් වැඩ වල් වැඩම තමයි."

"ඔය කිව්වට මිසුත් වල් වැඩක් කරන්න ආසයි."

"ෂටප්. උඹට මම."

භාවනා යුවතියට ඇත්තටම ගසයි. සීගිරි උදේ ඇරඹෙන්නේ මෙහෙමය.

"හරි දැන් ඔක්කොමල්ලා මේක

හරියට අහගන්න."

කෙල්ලෝ ටික එක පෙළට සිටගනී. මේ හදන්නේ දවසේ දේශනාව දෙන්නටය. ඒකට කියන්නේ 'ඩේ බ්‍රීෆ් එක' කියාය.

"සීගිරි එකේ අපි ලංකාවේ ඉන්න හොඳම කැෂියර් පොයින්ට් එක. ඒක තදින් හිතේ තියාගන්න. ඒත් අපේ සංගක්කාරටත් කැච් මිස්වෙනවා වගේ අපේ අතිනුත් පොඩි පොඩි වැරදීම් වෙනවා. අපි ඒවා තේරුම් ගන්න ඕන. ම්."

"ඔව් මිස්."

යුවතියන් ටික කියයි.

"අනූ කස්ටමස්ලට හරියට ග්‍රීට් කරන්නේ නෑ. මං කැමරා එකෙන් හැමදේම චෙක් කරනවා අනූ. හරියට අත් දෙක එකතුකරලා ඒක කරන්න

හොඳද? ඒක කොච්චර ෂෝක් වැඩක්ද ළමයෝ. කෙනෙක්ගේ හිත පිරිසිදු වෙනවනේ."

භාවනා කීවාය.

"බිසී උනාම මොනවත් මතක නෑ මිස්. මම අද ඉඳලා හිතලම ග්‍රීට් කරන්නම්."

"ගහගන්න වගේ නෙමේ අත් දෙක මෙහෙම එකතු කරලා ලස්සනට හිනාවෙලා චුට්ටක් නැලවිලා ඒක කරන්න ඕන. හරිද?"

"හා මිස්. මෙහෙම. ගුඩ් මෝනිං සර්"

අනූජා එය කර පෙන්වයි.

"ඔය කළේ. මොනවද පිස්සි ඉගෙනගෙන තියෙන්නේ. අත් දෙක එකතු කරලා වැඳලා ගුඩ් මෝනිං කියනවද? අපි සිංහල මිනිස්සු.

උදේ එකක් කියලා දවල් තව එකක් කියලා හවස තව එකක් කියන්නේ නෑ. හැමවෙලාවේම ග්‍රීට් කරන්නේ එකම විදිහට. තේරුණාද? අත් දෙක එකතුකරලා ලස්සනට හිනාවෙලා ආයුබෝවන් සර් කියන්නෝන."

කෙල්ල එය කර පෙන්වයි. හරි ලස්සනය. වැදගත් සිංහල කෙල්ලෙක් ග්‍රීට් කළ යුත්තේ එහෙමය. දෑත් එක්වන්නේ පපුවට ටිකක් උඩිනි.

"මිස් හොඳයි ශ්‍රී ලන්කන් එයා එකට. එයාහොස්ටස් කෙනෙක් වෙන්න තිබුනේ."

කෙල්ලන්ට හැමදේම විහිළුය.

"මං ආස නෑ උඩ යන්න. දැන් ඇති. තරින්දිගේ වැඩත් කිසිම පිළිවෙලක් නෑ."

කෙල්ල මේ අද කතාකරන්නේ

ඊයේ කැමරා දර්ශන ටික රිවයින් කර පැය දෙකක් පමණ පරීක්ෂාවෙන් එය බැලීමෙන් පසුවය. සතියකට වතාවක් ඇය එය කරයි. කෙල්ලෝ ටිකද එය දනියි.

"ඇයි මිස්."

"කෝඩ් එකක් හොයාගන්න බැරිවුණාම අක්කේ මේකේ කෝඩ් එක දෙන්නකෝ. කියලා කෑගහලා කියනවා. වටේ ඉන්න කස්ටමස්ලත් බලනවා. මේකිට පිස්සු හැදිලද කියලා. මේ ගෙදර නෙමේ. ටොයිලට් එකේ ඉඳන් කාමරේ ඉන්න අක්කට කෑ ගහන විදිහට අනිත් කෙනාට කෑගහන්න බෑ. තේරුණාද? මෙතන තව මිනිස්සු ඉන්නවා. ටිකක් පොලයිට් විදිහට අනිත් කෙනාගේ නමින් කතාකරන්න. අනූ කෝඩ්

ප්ලීස්. තරී පාස්වර්ඩ් ප්ලීස්. එහෙමයි තේරුණාද?”

මේ වෙලාවේ කෙනෙක් සැඟවීගෙන සියල්ල අසාගෙන සිටී. ඒ මේ සීගිරි සුපර් හිමි සෙනරත් රඹුක්වැල්ල මහතාය. ඔහු සීගිරි හී අයිනකට වී කෙල්ල කියන සියල්ල අසාගෙන සිටියි. ඔහුගේ සිතට දැනෙන්නේ පුදුමාකර සතුටකි. ‘දවසක කෙල්ල තමයි මේක ලස්සනටම කරන්නේ.’ රඹුක්වැල්ල මහතාට සිතෙයි.

“සොරි මිස්. මම අද ඉඳලා එහෙම කරන්නම්”

“අනිත් කෙනා නයෝ. මං ඔක්කොම ඊයේ බලාගෙන. බබෙක් ලැබෙන්න ඉන්න තරුණ අම්මා කෙනෙක් ආවා බඩු ගොඩක් අරගෙන.

මෙතන සුමිත් උන්නෙත් නෑ ඒවා වෙහිකල් එකට දාන්න. ඒ අම්මගේ බඩ මෙච්චරක් විතර ඇති. හරි අමාරුවෙන් ඇවිද්දෙත්. තාරාවෙක් වගේ. ඔයා මොකද කළේ. බිල් කළා. බෑග්වලට බඩු ටික දාලා දුන්නා එච්චරයි. අර අම්මා අච්චර බඩු ගොඩක් අරගෙන යන්නේ කොහොමද කියාල එක තත්පරයකට හිතුවේ නෑ. අනිත් පැත්ත හැරුණා සිරික්කිය. පව් කියලා හිතුනේ නැද්ද? දවසක ඔයත් අම්මා කෙනෙක් වෙනවනේ."

කෙල්ල සංවේදී ලෙස කියයි. රඹුක්වැල්ල මහතාට පුදුම නැත. ඔහු තම බාල මිණිපිරියගේ මේ උතුම් මිනිස්කම්වලට හිස නමා ආචාර කළේය. 'මම සීගිරි එක හැදුවේ එහෙම තමයි. ව්‍යාපාරයට මනුස්සකම එකතු කරලා. කෙල්ල ඒක ඉවෙන්

තේරුම් අරන් ඉන්නේ. පුදුමයි' ඔහු සිතුවේය.

"සොරි මිස්. මට ඒක ඒ වෙලාවේ තේරුණේ නෑ. මිස් කියන්නේ ඇත්ත තමයි. ඒ මිස්ට අමාරුවෙන්න ඇති"

"එහෙම කරන්න එපා. කවුරු කළත් අපි සීගිරි එකේ අය එහෙම කරන්නේ නෑ. එයාලා එද්දි පිළිගත්ත ආදරෙන්ම තමයි අපි එයාලව පිටත් කරන්නත් ඕන. එයාලා තමයි අපේ දෙවියෝ වෙන්නේ. එයාලා සීගිරි එකට නෑවිත් ඉන්න දවසට අපිත් නෑ ඔයාලත් නෑ මේ සීගිරි එකත් නෑ. හරි. කස්ටර්මර් තමයි දෙවියෝ"

යුවතියන් මෙන්ම රඹුක්වැල්ල මහතාත් හිස වැනුවේය.

"තව දෙයක් අලුත් ෆයිව් තවුසන්ඩ් නෝට් එක ටිකක්

පැටලෙන්න බලනවා රුපියල් පන්සීයේ නෝට් එකත් එක්ක. ඒ නිසා හරිම පරිස්සමින් ඒක බලන්න ඕන. තව දෙයක්. අපි වෘත්තීය මට්ටමේ අයකැමිවරුන්. ප්‍රොෆෙෂනල් කැෂියර්ස්ලා. නැතුව මේ ගමේ කඩ කෑල්ලක බිල් දාන අය නෙමේ. ඒ නිසා කැෂියර් එකේ ඉන්න ගමන් ඇඹරැල්ලා අච්චාරු කන්නයි වෙරළුයි ලුණුයි තියාගෙන කන්නයි බෑ. ඒකේ ඉන්න ගමන් අක්කේ කමුද? බඩගිනියි. ඒවා බෑ. එතන ඉන්නකොට වෘත්තීය මට්ටම ආරක්ෂා කරගන්න ඕන. සාමාන්‍ය ජීවිතේ මෙතනට අදාල නෑ. ඒක වෙනස්. වෘත්තීය වෙනස්"

රඹුක්වැල්ල මහතා සිතුවේ මේ දැණුම කෙල්ලට කොහෙන් එන්නට ඇත්ද කියාය. කෙල්ලව එවැනි ව්‍යාපාරික පාඨමාලාවකට

යොමුකරන්නට සිතාගෙන උන්නද එය කරන්නට බැරිවිය. ඇය උසස් පෙළ කර එහෙමම ආවේ සීගිරි එකටය. එහෙම එකේ මේ දියුණු දැණුම ආවේ කොහෙන්ද? 'ඒවා ලේ වල ඇති' පසුව ඔහු සිතුවේය.

"හොදයි මිස්."

අද ලංකාවේ ජනප්‍රියවී ඇති සුපිරි වෙළඳ සැළක අයකැමිවරුන්ටවත් මේ වැනි දේශනයක් අහන්නට ලැබෙන්නේ නැතැයි රඹුක්වැල්ල මහතාට සිතුණි.

"හවස හතර පහ වෙද්දී මූණවල් ගන්න දෙයක් නෑ. මම රෙස්ට් රූම් එකට අද පොඩි මේක් අප් බඩු ටිකක් ගේනවා. හතරට එක එක්කෙනා ගිහිල්ලා පොඩි වොෂ් එකක් දාලා චූටි මේක් අප් කරන් එන්නෝන. හරිද?

මේ මල් වගේ කෙල්ලෝ. ඒත් මහන්සි පාටට තියෙද්දී මූණුවල් ගන්න දෙයක් නෑ. මලක් වගේ ඉන්නෝනනේ. කවුද දන්නේ මේ එන කස්ටම කෙනෙක්ට කෙනෙක් ගැන හිතක් යයිද කියලා."

කෙල්ල කියන්නේ සිනාසීය. රඹුක්වැල්ල මහතා සිනාසුනේය. 'හිත රිද්දන්නෙත් නැතුව ඒක කියන්නේ.' ඔහු තනිවම සිතුවේය.

"හරි මට දැන් කියන්න කවුද මේ සතියේ ලීව් දාලා තියෙන්නේ කියලා."

කෙල්ල ඒවාත් බලයි. උදෙන්ම මේ සියල්ල කතාකර අවසන් කළ විට පහසුය. එවිට සැළසුම් කළ හැක. කෙල්ලගේ වැඩ එහෙමය. හරි ලස්සනය. පිළිවෙලය. නීට්ය. ඔක්කොමටම වඩා හුරතල්ය. ස්වීට්ය.

"මට ෆ්රයිඩේ ඕන මිස්."

"ෆ්‍රයිඩේ ඕන කියන්නේ සැටඩේ සන්ඩෙත් ගන්න නෙමේනේ. නේද?"

කෙල්ලගේ කතාව හරිය. සිකුරාදා ගමේ යන කෙනා ආයෙත් එන්නේ සඳුදාය.

"න්නෑ මිස්. මම තර්ස්ඩේ හවස ගිහින් සැටඩේ උදෙන්ම එනවා. අම්මගේ දානේ මිස් සිකුරාදා."

තරින්දි කියන්නේ අහිංසකවය.

"අනේ වේලාසන කියන්නෙපැයි කෙල්ලේ. අවුරුදු දෙක නේද?"

"ඔව් මිස්."

"ඉතින් දවසක් මදිනේ."

රඹුක්වැල්ල මහතාගේ ළය ඉහිරීගෙන යයි. මේ හදවත පුදුමය.

"ලොකු දානයක් නෑ මිස් අක්කයි මායි පන්සලට දන් කඳක් දෙනවා."

"මි. යද්දී එන්නකෝ. මාත්

පිරිකරක් දෙන්නම් පූජ කරන්න."

හාවනා කීවාය. රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

"හා මිස්. ගිය අවුරුද්දෙත් මිස් දුන්නා."

තරින්දි සිහිකළාය.

"එහෙනම් වැඩ පටන් ගන්න."

කෙල්ල හරි ඉක්මනින් කැෂියර් මැෂින් හතරටම පාස් වර්ඩ් දෙයි. ඒවා ඔන් වෙන්නේ ඉන් පසුය. කෙල්ල ඒවා කරන්නේ වෙනස්ම බුහිටිකමකිනි. ලා රෝස පැහැයෙන් හැඩ ගැන්වූ ඇඟිලිතුඩු පරිගණකයේ බොත්තම් අතර යද්දී හරි ලස්සනය. කෙල්ල පාස්වර්ඩ් එක දෙන්නේ අදහාග න්නට බැරිතරම් වේගයකිනි. එවිට බලාගෙන ඉන්නා කෙනෙක්ට වුව පාස්වර්ඩ් එක මොකක්ද කියා

සොයාගන්නට බැරිය. කෙල්ලගේ පාස්වර්ඩ් එක කවුරුවත් දන්නේ නැත. පරිගණකයකට මුරපදයක් දිය යුත්තේ එසේ සිතාගන්නට බැරි ලෙසය. ඇය සතිපතා ඇගේ පාස් වර්ඩ් එක මාරුකරයි. මේ සතියේ ඇගේ පාස් වර්ඩ් එක 'යූ ආ මයි හනී බනී' ය.

# 02

භාවනා සීගිරි සුපර් එකේම පැත්තක වූ කාර්යාල සංකීර්ණයට එන්නේ සියල්ල නිමාකරය. ඇය මුළින්ම එන්නේ රඹුක්වැල්ල මහතාගේ කාමරයටය. එය ඇය පුරුද්දක් ලෙස කරනා දෙයකි. මේ ලෝකයේ ඇය දුටු සත්‍යවාදීම මිනිසා ඇගේ සීයාය. ඔහුගේ අසාමාන්‍ය උතුම් ගතිගුණවලට කෙල්ල දැඩිව ආදරය කළාය. භාවනා ඇයගේ

සියාව දැක්කේ සිය දහස් වාරයක් පෙරා ගත් පිරිත් පැන් පොදක් තරම් පිරිසිදු ලෙසිනි.

"ගුඩ් මෝනිං සීයා."

කෙල්ල කාමරයට එන්නේ එහෙම කියාගෙනමය. රඹුක්වැල්ල මහතා සිනාසෙන්නේ කෙල්ලගේ ලස්සනත් බලමිනි. 'නර්මදා තරුණ කාලේ වගේ' රඹුක්වැල්ල මහතා සිහිකරන්නේ ඔහුගේ මියගිය බාල දුව ගැනය. ඔහුට උන් රූමත්ම කාරුණිකම දියණිය ඇයය.

"මෝනිං මැණික. කෙල්ලෝ ටිකට උදෙන්ම ලෙක්චර් එකක් දුන්නා නේද?"

භාවනා සිනාසුනාය. සමහරවිට සීයා තමා කතාකරනවා අසාගෙන ඉන්නට ඇත.

"අනේ කෙල්ලෝ ටික එහෙමම වැරදි කරන්නේ නෑ සීයේ. චූටි චූටි දේවල් පවා හදාගන්න ඕනනේ."

මේ හොඳ කළමණාකරුවෙකුගේ උතුම් ගතිගුණයයි. ඔවුන් කවදාවත් තම පිරිසව පාවාදෙන්නේ නැත. ඒ වැරදි පවා තමා පිට දමාගෙන ඔවුන්ව අගය කරයි. එහෙත් හැම කෙනෙක්ම එහෙම නැත. 'මට මුන් එක්ක එපාවෙලා තියෙන්නේ. ජරාම ගෲප් එකක් මට ලැබුනේ' බොහෝ දෙනා කියන්නේ එහෙමය. මිහිරංග කියන්නේ එහෙමය.

"ම්. එහෙම කියපු එක හොඳයි. ඔයා කෙල්ලෝ ටිකගේ හිත රිද්දුවේ නෑ. එයාලා ඔයාට හරි ආදරෙයි."

භාවනා සිනාසෙයි. කෙල්ල එය දනී. ගමේ ගොස් එනවිට කෙල්ලෝ

ටික තමාට මොනවා හෝ ඔතාගෙන එයි. ඒ ඇති ආදරයට බව කෙල්ල දනී. ඇයත් එහෙමය. 'මං කේක් කෑලි තුනක් හෑන්ඩ් බෑග්වලට දැම්මා. බෝඩිමට ගියාම කන්න හොඳේ' ඇය නිතරම කෙල්ලෝ ළඟට ඇවිත් කියයි. යුවතියන්ට සනීපාරක්ෂක තුවායක් හදිස්සියේ ඕනාවුනත් දුවගෙන එන්නේ භාවනා ළඟටය. ඇය ළඟ අමතර ඒවා ඇත.

"සීයේ."

කෙල්ල ඉඳගන්නේ ටිකක් බැරෑරුම්ව කතාකරගෙනය.

"ඇයි මැණික."

"සේල්ස් චුට්ටක් ඩ්‍රොප්නේ."

රඹුක්වැල්ල මහතාත් එය දනී. ඔහුට පුදුම කෙල්ලත් ඒ ගැන අවධානයෙන් සිටීමය.

"ටිකක් ඩ්‍රොප් තමයි මැණික. දිගටම එහෙමයි"

"ඇයි ඒ."

"මේ දවස්වල රටේ එකොනොමි එක එච්චර හොඳ නෑ පොඩි පුතේ. මිනිස්සු ජීවත්වෙන්නේ හරි අමාරුවෙන්."

භාවනා හිස වැනුවාය.

"ඒත් එහෙමයි කියලා මේ තත්වය දිගටම තියෙන්න බෑනේ සීයේ අපි මොනවාහරි කරන්න ඕන."

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

"අපිට බෑනේ පුතේ ලොකු ප්‍රමෝෂන් එකක් කරලා ටීවී එකේ ඇඩ් කරන්න. ජනප්‍රිය කෙනෙක්ව දාලා ඒවලට කෝටි දහයක් පහළොවක් යනවා. අපි මේ තනි

සුපර් මාර්කට් එකක්නේ එයාලට සුපර් මාකට් චේන් එකක්ම තියෙනවා. සමහරවිට එයාලට මේ කස්ටටස්ලත් ඇදෙනවා ඇති. කීල්ස් සුපර් මාර්කට් හයක් මේ අවට තියෙනවා. සුපර් මාර්කට් වැඩිවුණාට කස්ටමස්ලා වැඩිවෙන්නේ නෑ. ඉන්න අය බෙදිලා යනවානේ"

රඹුක්වැල්ල මහතා කීවේය.

"එහෙම වෙන්න දෙන්න බෑනේ සීයේ. මේ ඉන්න ඔක්කොම ඇදෙනකල් අපිට බලාගෙන ඉන්න බෑනේ."

"ම්. ඒකට තමා මම ප්‍රමෝෂන් වැඩට කියලා හොඳ දෙන්නෙක් ගන්න පත්තරේ ඇඩ් එකක් දැම්මේ. එහෙම අරන් අපි දෙයක් හිතමු."

"එහෙම ආවා කියලා එයාලා

මොනවද කරන්නේ. මෙතන හාස්කමක් කරන්න එයාලට බෑනේ සීයා. සිකුරාදා සේල් එක මට අදහාගන්න බැරිවුණා. දෙපාරක්ම චෙක්කළා වැරදිලාද කියලත්"

"අපි බලමු. එයාලගෙත් යෝජනා අරගෙන අපිත් ඒකට අදහස් දාලා කරමු."

භාවනා හිස වැනුවාය.

"කවදද සීයා ඉන්ටර්වීව් එක."

"මන්ඩේ. ඔයත් ඉන්නෝන. මං නේත්‍රටත් කිව්වා. මිහිරංගත් ඉඳී."

භාවනා මේසය දෙස මොහොතක් බලාගෙන උන්නාය. 'මිහිරංග අයියා කරන ඉන්ටර්වීව්.' ඇය සිතුවාය. ඒත් කියන්න ගියේ නැත. බොහෝ දේවල් භාවනා හිතේ තබාගන්නවා මිස කාටවත් කියන්නේ නැත. ඇය

සීගිරි පවුලේ සමගිය සියල්ලටම වඩා අගය කළාය.

"මං ඔයාට කියන්න උන්නේ. මං ලබන මාසේ ඉන්දියා යනවා. පොඩි වැඩකට."

"හා. මාවත් එක්කන් යන්නකෝ. හරි ආසයි."

කෙල්ල කීවාය.

"ඒක කියන්න තමා කතාකළේ. යන් දෙන්නත් එක්ක."

"ෂෝක්. ෂෝක්. අපි ලව් යූ සෝ මච්."

කෙල්ල ඇවිත් රඹුක්වැල්ල මහතාව බදාගෙන ඔහුගේ වියපත් මුහුණ සිපගත්තාය.

"අපි ගිහින් වෙඩින් එකටත් සාරි ගමු."

කෙල්ලගේ ඇඟම සීතල විය.

"කාගේ වෙඩින් එකටද සීයා."

"කාගෙද කියලා අහන්නේ. ඔයාගේ."

"මගේ. මං කාවද දැන් මැරිකරන්නේ."

"ඒක දන්නේ ඔයාම තමයි."

භාවනා දෙපසට හිස වැනුවාය.

"නොටි යෙටි සීයා. මට කලින් පොඩි අක්කා ඉන්නේ"

"එයා ගැන කතාකරන්න එපා. මං ඊයෙත් බැනලා ඉන්නේ."

මේ කතාකරන්නේ භාවනාගේ දෙවෙනි අක්කා වූ තාරකා ගැනය.

"අපි ෂෝක් කොල්ලෙක්ව හොයලා මැරිකරමු. මී."

ඔහු කීවේය.

"ෂෝක් කොල්ලෙක්. කොහෙද සීයේ ෂෝක් කොල්ලෝ ඉන්නේ ඉන්න

තරමක් ඉන්නේ පිස්සෝනේ. මෙහෙම බලන්නේ. මේ මෙහෙම. මං ආස නෑ එහෙම බලන කොල්ලන්ට. අනිත් අය දිහාත් බලන්නේ ඔය සීසීටිවී ඇස් දෙකෙන් තමයි. කොල්ලෙක් අරන් පරිස්සම් කරකර ඉන්න බෑ. එහෙම පරිස්සමක් නැතත් මං දිහාම බලන කොල්ලෙක් ඕනවෙයි. මේ ඉන්න කොල්ලොද? මුන් කොල්ලෝ නෙමේ. වවුලෝ"

"එහෙමත් නෑ."

"එක්කෙනයි හොඳ?"

"කවුද"

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"මගේ හනී බනී. ඒත් එයා තාම නෑ. ඒවා ඕන නෑ. ඕවා අම්මටයි තාත්තටයි කියන්න එපා. මං මේ ඒ ලෙවල් කරලා අතගත්තා විතරයි.

මට මගේ රස්සාව කරගෙන සිංදුවක් අහලා ෆිල්ම් එකක් බලලා ඉන්න දෙන්න සීයා හොඳද?"

"ඉතින් මැරිකරලා මහත්තයා එක්කම ෆිල්ම් එකක් බලන්න."

"එයාම දෙයි ෆිල්ම් බලන්න."

කෙල්ලට නොදැනීම කියවින. පසුව ඇයටම ලැජ්ජය. රඹුක්වැල්ල මහතා සිනාසුණේය. සීයාත් සමඟ මෙහෙම කතාකරන්නට ඇය කැමතිය. වයසට ගියත් ඔහුට ඇත්තේ නූතන අදහස්ය. ඒ මොඩර්න් අදහස් අද කාලේ කොල්ලන්ට පවා නැත.

ඉන් පසුව සෑහෙන වෙලාවක් යනතෙක් භාවනා ඉන්නේ කල්පනාවේය. 'දැන් පරිස්සමින් කල්පනා කරන්නත් ඕන. මේ

කෙල්ලෝ මාව නෝට් කරනවා. කිච්චේ ළඟින් ගියත් පේන්නේ නෑ කියලා. ඇත්තටම මාත් මොනවා කල්පනා කරනවද මන් දන්නේ නෑ. ඇති දේකුත් නෑ නැති දේකුත් නෑ' භාවනා තමාටම කියාගත්තාය.

ජීවිතය කොහොමත් පාළුය. ටිකක් නොව ගොඩක් පාළුය.

# 03

දේවක තනි ගෑස් ලිපේ ඉඳුණු රතු කැකුළු බත් එක ලිපෙන් බෑවේය. එය හොඳින් ඉදී ඇත්දැයි ඔහු ඇටයක් ගෙන කා බැලුවේය. 'නියමයි. සුපර් එකට බත ආවා' ඔහු තනිවම කියෙව්වේය. මේ අලුත් කැකුළු හාලේ බත රසය. පසුව ඔහු කුඩා තාච්චිය ලිපේ තැබුවේය. ඒක හරි පුංචි තාච්චි කෑල්ලකි. දේවකත් අප්පච්චීත් උයාගෙන කන්නේ මේ

වාගේ පුංචි බඳුන්වලය. දෙන්නාට මහ ගොඩක් ඕන නැත. ඒකටම සෙට්වෙන සාස්පාන් ටිකක් ඇත. මේ උයන්නේ ඒවාවලය.

රත්වූ තාච්චියට දෙහි ඇඹුල් ඇල්ලූ කරවල කෑලි ටික ඔහු දැම්මේය. කුඩා කුස්සිය පුරා මිහිරි කරවල බැදුම් සුවඳක් විසිරී ගියේය. කුස්සිය තිබුනේ පිටුපස අතුරුගිරිය වෙල්යායට මුහුණලාය. මේ නිවසට දේවකත් ඔහුගේ අප්පච්චීත් පැමිණ තාම සතියය. මේක ගෙයක් නොවේ. ගේ කෑල්ලකි. අතුරුගිරියේ මේ වෙල්යාය ළඟ ගේ කෑල්ල හිමි දේවකගේ අප්පච්චි වූ ජීවන්ගේ මිතුරෙක්ටය. නිවස කුඩා කාමර කෑලි දෙකක් හා සාල කෑල්ලක් පමණක් ඇති නිවසකි. එහි ඇත්තේ කුඩා

කුස්සියකි. තවමත් නිවසේ වැඩ නිමකර නැත. ඇත්තේ ගඩොල් බිත්තිය. බොහෝමයක් දොර ජනේල් උළුවහුද සවිකර නැත. මේ නිවස දුටු පළමු දවසේම දේවකගෙ නම් එය හිත් ගත්තේය. නිවස පින් පාටය. නිස්කලංකය. නිවස කුඩා වූවාට තරමක වත්තක් ඇත. පිටුපස වෙල්යායට නිවසේ පිටුපස මුහුණ ලා තිබුණි. අතුරුගිරියේ පන්සල පාර ඇත්තේ ඒ අද්දරිනි. දේවක මේ කෑම හදන්නේ බාගෙට වෙල්යාය පැත්තට ඇරුණු කුස්සියේ කොට කලිසමක් හා සුදු වෙස්ට් එකක් ඇඳගෙනය. වේලාව උදේ හතට අටට වන්නට ඇත. තවමත් වෙල් යාය උඩින් තුනී මීදුම් තට්ටුවක් සටහන්ව ඇත. ඒ මතට ඉරඑළිය වැටී තිබුනෙන් ලස්සනය. දේවකට

සිහිවෙන්නේ නුවර යහළුතැන්නය. මේ අතුරුගිරියට එන්නට කලින් ඔහුත් අප්පච්චීත් උන්නේ නුවර යහළුතැන්නේය. ඔවුන් මේ අතුරුගිරියට ආවේ ඉන් පසුය.

එයට හේතු දෙකක් තිබුණි. එකක් ජීවන් සේවය කළ පෞද්ගලික ඉදිකිරීම් ආයතනය කොළඹට අරගෙන ආ නිසාය. අනිත් හේතුව ඔහු තවමත් දේවකටත් කියා නැත. උසස් පෙළ විභාගයෙන් පසුව අලෙවිකරණය ගැන පාඨමාලාවක් කළ දේවක උන්නේ තම කුළුඳුල් රැකියාව කරන්නට සිහින දකිමිනි. ඔහු රැකියාවක් නොකළාට මහනුවර අලෙවිකරණ වැඩසටහන් සියයකට පමණ සහභාගී විය. ඒ කොන්ත්‍රාත් ක්‍රමයටය. අවසානයට කළේ ඩයලොග් බ්‍රෝඩ් බෑන්ඩ් මහනුවර

ප්‍රමෝෂන් එකය. ඊට කලින් ඔහු අති සාර්ථක මැගී පිටිකළ පොල් කිරි ප්‍රවර්ධන වැඩසහනක් කළේය.

'අපි මහත්තයෝ කොළඹ ගිහිල්ලම හොඳ තැනක් බලමු' ජීවන් දේවකට කීවේය. දේවකව කොහේවත් යවන්නේ නැතැයි ඔහු සිතාගෙන උන්නේය. 'කොල්ලව යවන්නේ එකම තැනකට විතරයි' ඔහු සිතුවේය. ඒ ගැන ජීවන් තවමත් දේවකට කියා නැත. ඔහුගේ දයාබර බිරිඳ දේවකගේ අම්මා නැතිවී දැන් හරියටම අවුරුදු විස්සක් ගෙවී ඇත. ඒත් ඒ දවස් අද ඊයේ වාගෙ ය. එක දෙයක් ගැන ජීවන්ට සතුටුය. 'ඔයා නැතිවුණාට පස්සේ මම වෙන ගෑණියෙක්ගේ ඇඟකට අතක්වත් තියලා නෑ. ඔයාගේ පුතා හදාගෙන මං ඉන්නේ නිරූ' ජීවන් හැමදාම

ඔහුගේ මියගිය බිරිඳගේ පින්තූරය දෙස බලාගෙන සිටියි. 'පුතාව සීගිරි එකට යවන්න ජීවා' පසුගිය දවසක නර්මදා හීනෙන් පැමිණ ජීවන්ට කීවේය. එදා ඔහුට පුදුම සිතුණි. කරන්නේ එයම කියා ඔහු සිහිනෙන්ම ඇයට පොරොන්දු විය.

මේ ජීවිතයේ තම බිරිඳ තරම් උතුම් ගතිගුණ ඇති ගැහැණියක්ම ජීවන් දැක නැත. ඇයගෙන් වියෝවී ගෙවී ගිය කාලය තුළ ඔහු වෙන ගෑනියෙන් දෙස හැරිලාවත් නොබැලුවේ ඒ නිසාය. 'ඔයා වගේ කෙනෙක් මේ ආත්මේ ආයේ ලැබෙන්නේ නෑ' ඔහු සිතින් ඔහුගේ රත්තරං නර්මදාට කීවේය. තම අප්පච්චී ගතකරන පිරිසිදු අහිංසක ජීවිතය දෙස දේවක බලාගෙන උන්නේ හරි ආදරයෙනි. පිරිමි එහෙම

නැති බව ඔහු දනී. ඒ අතින් තමාගේ අප්පච්චි බෝධිසත්වයෙක් යැයි ඔහුට සිතෙයි. 'මම අදහන්නේ ඔයාව විතරයි' දේවක නිතරම සිතුවේය.

පොඩි එකාත් අප්පච්චීත් ජීවත්වූයේ හරි අහිංසක ඒත් සුන්දර ලොවකය. ජීවන් සේවය කළේ ඉදිකිරීම් සමාගමකය. ඔහු දේවකට ඉගැන්වූයේ ඉන් ලැබෙන වැටුපෙනි. මොන දේ නැතත් ජීවන් කොල්ලාට හොඳට ඉගැන්වූවේය. කොල්ලා ඇත්තේ නර්මදාගේ අහිංසක මුහුණය. තමගේ ශක්තිමත් හිතය. ජීවන් ඒ ගැන අතිශයින් සතුටු විය.

දේවක බැඳුණු කරවල තාච්චියටම ලූණු අමුමිරිස් කරපිංචා ටිකත් දැම්මේය. කොල්ලා මෙහෙම උයන්න ඉගෙන ගත්තේ අප්පච්චීගෙ

නි. ඔහු හොඳ කුක් කෙනෙකි. කාලයක් ජීවන් නුවර තරු පන්තියේ හෝටලයක කෝකියෙක් ලෙසද සේවය කළේය. කරවල බැඳුම රසට සුවඳට ආවේය. අවසානයට දේවක එයට දෙහි බෑයක් මිරිකුවේය. රස එන්නේ එවිටය. කැකුළු බත් කන්නට කරවල බැඳුමක් තරම් වෙන දෙයක් නැත. ඒත් ඒකට පරිප්පු ටිකක් තෙම්පරාදු කර ගත යුතුය. ඒත් නැත්නම් පොල් සම්බෝලයක් හදාගත යුතුය. අද ගෙදර පරිප්පු නැත. කොල්ලා ගාගත් පොල් ටික අතට ගත්තේ පොල් සම්බෝලේ හදන්නටය. අප්පච්චීත් පුතාත් හැමදාම පොල් සම්බෝලය හදන්නේ අතිනි. ඒකට කියන්නේ 'අතේ සම්බෝලේ ' කියාය. දෙන්නාගේ ජීවිතයේ මේ වගේ 'අතේ පොල්

සම්බෝල' දස දහස් ගණනක් හදා ඇත. එය කොතරම් රසවත් අහාරයක්ද කියා දන්නේත් මේ අප්පච්චීත් පුතාත්ය. අතේ පොල් සම්බෝලයට ලූණු සිහින්ව ලියා දැමිය යුතුය. අමුමිරිස් කරලක්ද සිහින්ව ලියා දැමිය යුතුය. කෑළි මිරිස් ලුණු කුඩු ගම්මිරිස් කුඩු දෙහි ඇඹුල් දාන්නේ ඉන් පසුය. අවසානයට එය හොඳින් ඇනිය යුතුය. තියෙනවානම් උම්බලකඩ තේ හැන්දකුත් දැමිය යුතුය. ඒත් අද ඇති උම්බලකඩයක් නැත. පාන් කාල දෙකට කපාගෙන අතේ සම්බෝලය ටිකක් තබා ඒක මැදට බැදගත් බිත්තරයක් තැබූ විට රත්තරන්ය. මේවා දේවකට පුරුදු කලේ ජීවන් ය. අම්මා නැති අප්පච්චීගේත් පුතාගේත් ජීවිතය එහෙමය. දුකය. ඒත් ආදරය

උතුරාම යයි.

ජීවන් ආවේ කොල්ලා සම්බෝලය අනද්දීය.

"අනේ පුංචි මහත්තයෝ. ඔයා ඉව්වද?"

ජීවන් ඇසුවේ හරි ආදරයෙනි. ඔහුට මේ කොල්ලා තරම් කෙනෙක් ජීවිතයේ නැත. ජීවන් ඔහුගේ පුංචි මහත්තයාව හැදුවේ ක්‍රිෂ්ණා කුමාරයාව හදන්නාක් තරම් ආදරයෙනි.

"ඉව්වා අප්පච්චි. කරවල බැඳුම නියමෙටම ආවා. සුපර්"

කොල්ලා කියන්නේ පොල් සම්බෝලයෙන් ටිකක් කමිනි.

"මට සුවඳ ආවා."

"තේ හදන්නද අප්පච්චි."

"දැන් එපා. නාගෙන එකපාරම

කනවා. රෑ වෙලාවනේ ආවේ මට නින්ද ගියා."

"දුර සයිට් එකක්ද ලැබුනේ අප්පච්චි."

"එච්චරම දුරක් නෑ මහත්තයෝ. දෙහිවල සයිට් එකක්. අලුතින් හදන අපාට්මන්ට් එකක්. සී සයිඩ් එකේ"

ජීවන් කොල්ලා දෙස මොහොතක් බලාගෙන උන්නේය.

"අද මාත් එක්කම කාලා යන් පුංචි මහත්තයත්."

"කොහෙද අප්පච්චී."

"හොඳ ඇඳුමක් ගන්න ඕන. ඔයාට මන්ඩේ යන්න තියෙනවා පොඩි ගමනක්."

දේවක පුදුමයෙන් අප්පච්චී දෙස බැලුවේය.

"ගමනක්. කොහෙද?"

"මං කියන්නම්. ඔයාට තියෙනවා පොඩි කතාවක් කියන්න. ඊට පස්සේ මම එක තැනකට ඔයාව ඇරලවනවා. එතනට ගිහින් රවුමක් දාලා එන්න."

"කොහෙද අප්පච්චී."

ජීවන් බලාගෙන උන්නේය.

"සීගිරි සුපර් මාර්ට් එකට."

දේවක බලාගෙනම උන්නේය. ඔහු දන්න සීගිරි එකක් නැත. ඇහුවේත් අදය.

"සීගිරි සුපර්. ඒ කොහෙද?"

ජීවන් දුක්බරව සිනාසුනේය. මේ කතාව ජීවන් කවදාවත් දේවකට කියා නැත. කියනවානම් මේ කතාව මුල සිටම කිව යුතුය. පසුගිය කාලයේ ජීවන් මේ කිසිවක් කොල්ලාගේ ඔළුවට නොදැම්මේ

ඔහුට එක පිළිවෙලකට ඉගෙන ගන්න දිය යුතු නිසාය. අතීතයේ ජීවත්වෙන්නේ තමාය. තම පොඩි එකා ජීවත්විය යුත්තේ අනාගතයේ යැයි ජීවන් හැමදාම සිතුවේය.

එහෙත් නර්මදා හීනෙන් ඇවිත් හැමදාම කියන්නේ කොල්ලාව සීගිරි එකට යවන්න කියාය. මේ සීගිරි පවුලම තමාව බාරගත්තේ නැති බව ජීවන් දනී. සීගිරි එක හිමි සෙනරත් රඹුක්වැල්ල මහතා තමාව බෑණා කෙනෙක් ලෙස පිළිගත්තේම නැත. ඒ ගැන ජීවන්ට අද දුකක්ද නැත. 'ඒත් රඹුක්වැල්ල මහත්තයෝ ඔයාට ඔයාගේ මුණුපුරාව පිළිගන්නේ නැතුව ඉන්න බෑ. මං කොල්ලව හැදුවා. දැන් හරි ආසයි ඔයාලට පෙන්නන්න. ඒකයි මම කොල්ලව කොළඹ අරන් ආවේ. මාව බෑණා

විදිහට ගත්තේ නැති එක ගැන මට තරහක් නෑ. දැන් ඔයාට ඔයාගේ මුණුපුරාව බාරගන්න වෙනවා' ජීවන් සිතුවේය.

"අප්පච්චී."

දේවක කතාකළේ ජීවන් දිග කල්පනාවකට වැටී උන් නිසාය. ජීවන් අසරණව සිනාසුනේය.

"මට අම්මව මතක් වුණා පුංචි මහත්තයෝ."

දේකව දුක්බරව අප්පච්චී දෙස බලාගෙන උන්නේය. 'මගේ අම්මා එසේ මෙසේ කෙනෙක් වෙන්න බෑ. අප්පච්චී මෙච්චරම ආදරේ කරන්න එයා අසාමාන්‍ය ගෑණියෙක් වෙන්න ඕන. සාමාන්‍ය ගෑණියෙක්ට බෑ පිරිමියෙක්ගේ හිත මෙච්චරම බදාගෙන ඉන්න.' දේවක සිතුවේය.

"අර කිව්ව සීගිරි සුපර් එක මොකක්ද අප්පච්චි."

දේවක යළිත් ඇසුවේය. කොල්ලාට ඒ ගැන කියන්නට පෙර ඔහුට සීගිරි සුපර් එක පෙන්විය යුතුයැයි ජීවන්ට සිතුණි. රෑට නිස්කලංකයේ කොල්ලට කතාව කියන්නට පුළුවන.

"යන්කෝ මම පෙන්නන්නම්. ඒක දිග කතාවක්. අපට පුංචි මහත්තයෝ සතියකට විතර බඩුත් ගන්න ඕනනේ. ඔයාව මං සීගිරි සුපර් එකට ඇරලවන්නම්. මී. බඩු ටිකකුත් අරන් එන්න."

දේවක කිසිවක් නොකියා හිස වැනුවේය.

"අප්පච්චි සුදු ෂර්ට් එකද අඳින්නේ අද?"

දේවක ඇසුවේ විදුලි ඉස්තිරික්කය ප්ලග් එකට ගසමිනි. ජීවන් බැලුවේ දුකෙනි.

"මම මැදගන්නම් මහත්තයෝ. ඔයා දැන් ඉව්වත් එක්කනේ. තියන්න."

"කියන්නකෝ අප්පච්චී. අද නිල් පාට ෂර්ට් එක අඳිමු."

ජීවන් දුක්බරව හිස වැනුවේය. 'ඔයා සුදු නෝනේ මට කොල්ලෙක්වම දීලා ගිය එක කොච්චර හොඳද?' ඔහු මේ සිතින් කියන්නේ ඔහුගේ මියගිය බිරිඳටය.

ජීවන් සන්ඩේ ටයිම්ස් පුවත්පතේ කොටසක් අරගෙන කොල්ලා ළඟට ආවේය. දේවක උන්නේ අප්පච්චීගේ කමිසය ලස්සනට අයන් කරමිනි. ඔහු ඒක හරියටම කරයි. එක

පොඩි වූ රැල්ලක්වත් හිටින්නේ නැති ලෙස කමිසයක් ඉස්තිරික්ක කිරීමත් එක්තරා කලාවකි. ජීවන් කොල්ලාට ඒක ඉගැන්වූයේ අවුරුදු හතේ අටේදීය. හදිස්සියේ තමාත් නැතිවුවහොත් තනිවම ජීවත්වෙන කලාව ඔහු දේවකට ඉගැන්වූවේය. ඒත් බොහෝ දවස්වල කොල්ලාගේ පාසල් සුදු ඇඳුම මැද දුන්නේ ජීවන්ය.

"පුංචි මහත්තයෝ."

දේවක බැලුවේ තාත්තා මේ ඉංග්‍රීසි පත්තර කෑල්ලක් අතේ තියාගෙන කියන්නට යන්නේ මොකක්ද කියාය.

"අප්පච්චී."

"මේ ගිය සතියේ සන්ඩේ ටයිම්ස් පත්තරේ."

"හා අප්පච්චි."

"මේකේ තියෙනවා මහත්තයෝ ජොබ් වේකන්සි එකක්. මේ බලන්න. මේක."

දේවක පරිස්සමින් එය කියවූවේය. ඒ දැන්වීම දමා තිබුණේ 'සීගිරි සුපර් මාර්ට්' එකෙනි. ඉල්ලා තිබුණේ 'පුහුණුවන අලෙවි ප්‍රවර්ධන කළමණාකරුවන්ය'. දේවක උසස් පෙළින් පසු ඉගෙන ගත්තේ අලෙවිකරණ පාඨමාලාවකි. ඔහු ඒ පැත්තට ආසය. මාකටින් තියෙන්නේ කොල්ලාගේ ඇඟේ යැයි ජීවන්ට සිතෙයි. නුවර සිටිද්දී ජීවන්ගේ මිතුරෙක් නුවර පේරාදෙණිය පාර අද්දර කුඩා හෝටලයක් කළේය. උයන්නට බැරිවූ ඇතැම් දවසක ජීවනුත් දේවකත් ගොස් ඉන් ආප්ප

කයි. 'මේ හෝටලේ වහලා දාන්න ඉන්නේ ජීවා. කොත්තු බාස්ටයි ආප්ප බාස්ටයි තේ කොල්ලටයි වේටර්ලටයි ගෙවලා බඩු ටික ගත්තාම අතින් පාඩුයි' ඔහු දවසක් කීවේය.

'මාසයක් බලන්න අන්කල්. මම පොඩි අයිඩියා එකක් දෙන්නම්' දේවක කීවේය. ජීවන් සිනාසුනේය. දේවක හෝටලයේ එළියේ ගසන්නට බෝඩ් දෙකක් දුන්නේය. එකක තිබුනේ 'හැමදාම හවසට තෙම්පරාදු ඉඳි ආප්ප.' කියාය. අනිත් එකේ තිබුනේ 'දවල්ට කිරි කොස් සමඟ මස් බත්' කියාය. ඒවා හදන හැටිත් දේවක කියා දුන්නේය. තව මොනවාද ඔහු සමඟ කතාකලේය. ජීවන්ට පුදුම සිතුණි. ගතවූයේ සතියකි. හෝටලයේ මිතුරා දවසක් රෑක දේවකටත් ජීවන්ටත් කොත්තුත් ආප්පත් රෝස්ට්

චිකනුත් එළෑමස් කරිත් අරගෙන ආවේය. 'මේ මොකද අනුර' ජීවන් ඇසුවේය. 'පුතාගේ අයිඩියා එක මාරයි ජීවා. දැන් හොඳට බිස්නස් තියෙනවනේ. හැමෝම ඇවිත් අහන්නේ අර තෙම්පරාදු ඉඳි ආප්ප එකයි දවල්ට දෙන කිරි කොසුයි බතුයිනේ.' ඔහු කීවේය. එදා ජීවන් කොල්ලා දෙස බලා සිනාසුනේය. දවසක පොඩි එකා ලස්සන තැනකට එයි කියා ඔහුට සිතුණි.

"මේක අප්පච්චි අර ඔයා කිව්ව සීගිරි සුපර් මාර්කට් එකෙන් දාලා තියෙන්නේ නේ."

"ම්. මොකද හිතෙන්නේ."

"අප්පච්චි කියන්නේ මම මේකට."

ජීවන් කොල්ලාගේ උරහිසට අතක් තැබුවේය.

"ඔයා මේ ජොබ් එක ගන්න ඕන. ගන්නම ඕන. ඇයි කියලා මම හවසට කියන්නම්. මී. එතනට ගිහින් අපි බලමු අද? මම එන්නේ නෑ. ඔයාව එතනට ඇරලවන්නම්."

දේවක හිස වැනුවේය.

"මෙච්චර ජනප්‍රිය සුපර් මාර්කට් තියෙන්නේ අප්පච්චි. ඇයි අපි මේකටම යන්නේ."

ජීවන් බලාගෙන උන්නේය.

"ඇයි කියලා මම ඔයාට හවසට කියන්නම්. දැනට මම කියන දේ කරමුකෝ පුංචි මහත්තයෝ. දෙයක් නිසා කියන්නේ"

ඔහු හිස වැනුවේය.

"ඒ පෝස්ට් එක ලැබුනොත් ඔයාට වැඩක් කරන්න පුළුවන්ද?"

කොල්ලා සිනාසුනේය.

"අප්පච්චි මං ගැන දන්නවනේ."

ජීවන් දේවකගේ උරහිසට තට්ටුකර සිනාසුනේය.

"හොඳට දන්නවා"

දේවක ඇඳුම මදින්න ගත්තේය.

"අපි ඉන්ටවීව් එකට අඳින්න හොඳ ඇඳුමක් ගමු අද? එයාලා එන්න කියලා තියෙන්නේ මන්ඩේ. අපි යමු සටිෆිකට් ටිකත් අරගෙන. එයාලා ඔයාව ගන්නවා."

දේවකට පුදුම සිතුණි.

"අප්පච්චි කොහොමද එහෙමම කියන්නේ."

ජීවන් කොල්ලා දෙස බලාගෙ නම උන්නේය. 'කොල්ලගේ මූණ දැක්කාම රඹුක්වැල්ල මහත්තයට හරි හුරුපුරුදු ගතියක් දැනෙයි. සමහරවිට එයාගේ බාල දූවත්

මතක්වෙයි. මේ ඒ සුදු මූණාමනේ.' ජීවන් සිතුවේය.

"එහෙම කියන්නේ හේතුවක් නිසා පුංචි මහත්තයෝ."

දේවක ඉන් එහා මොනවත් අහන්න ගියේ නැත.

'මේ කියන්න යන කතාව මොකක්ද' දේවක සිතුවේය.

# 04

මිහිරංග සීගිරි සුපර් එකට ආවේ දවල් දහයට පමණය. රඹුක්වැල්ල මහතා ඔහුගේ මුණුපුරුන් සියල්ලන්ටම කියා ඇත්තේ උදේ නමයට පෙර සීගිරි සුපර් එකට එන්න කියාය. ඒත් ඔහුගේ වචනය කණකට ගන්නේ භාවනාත් නේත්‍රාත් පමණි. එහි සේවය කරන මිහිරංගත් කෝසලත් මලීෂාත් සේවයට එන්නේ එක එක වේලාවටය. කෝසලවත්

මිහිරංගවත් හදන්නටම අමාරුය. බොහෝ විට මිහිරංගගේත් කෝසලළගේත් අංශයන් බලන්නට වෙන්නේත් භාවනාටය. මිහිරංගත් කෝසලළත් හැමදාම කියන්නේ සීගිරි එකටම හිරවී ඉන්නට කැමති නෑ කියාය. 'අපිට තවත් බිස්නස් තියෙනවා බබා' මිහිරංගගේ මේ කතාව අසා දැන් භාවනාට තිත්තය.

'මේ ගම් බයියෝ ටිකවත් දක්ක දක්ක මේ රැක්ස් වටේ කැරකෙනවට වඩා වෙන වැඩක් නෑනේ. ලයිෆ් එක කියන්නේ එච්චරද? එන්නකෝ බබා ටිකක් අපිත් එක්ක මෙපුර සිරි විසිතුරු බලන්න යන්න.'

මිහිරංග කෙල්ලගේ අතකින් ඇද කියද්දී ඇය කේන්තියෙන් අත ගසා දමයි. මේ සියල්ලන්ම මේ තරම්

සැප විඳින්නේ සීගිරි එක නිසාය. කොළඹ හොඳම පාසල්වලට ගියේ සීගිරි එකට පින්සිද්ධ වෙන්නය. අද කාර් එකක් තියාගෙන රට වටේ යන්නේද සීගිරි එක නිසාය. ඒ සියල්ලම දුන් සීගිරි එකට මෙහෙම නිගරු කරනවාට භාවනා ආසම නැත. ඇයටම් සීගිරි එකෙන් තොර ජීවිතයක් ගැන සිතාගත නොහැක. 'මං බැන්ඳත් එයාට මොත්තයක් දාලා සීගිරි එකේ වැඩට එනවා අනේ. මට බැරිද එයාව නම්මගන්න' භාවනා දවස් දෙක තුනක්ම සිතුවාය.

මිහිරංග නෑකමට භාවනාගේ මස්සිනාය. රඹුක්වැල්ල මහතාගේ දෙවෙනි දුව වූ සුරංගිගේ එකම පුතා වූ මිහිරංග භාවනාගේ තාත්තාගේ ලොකු නංගීය. මිහිරංගට එක නංගී කෙනෙක් ඇත. ඇය මලීෂාය.

ඇයත් සීගිරි චකෝ සේවය කරයි. ඇයට බාර දී ඇත්තේ ස්ටෝරුවේ අංශයකි. ඒ ගැන මලීෂා ඉන්නේ කේන්තියෙනි.

'භාවනාට ලස්සනට කැෂියර් චක දීලා. මට මේ කරවල ගඳ ගහන ස්ටෝර්ස් දීලා.'

හැමදාම ඇය ඇගේ මව වූ සුරංගිට කියයි.

'ඔයා අල්ලගෙන යන්නකෝ. මම සීයට කියලා මාරුකරලා දෙන්නම්'

සුරංගි නිතරම කියයි. චීත් රඹුක්වැල්ල මහතා මේ අංශ වෙන්කර දී ඇත්තේ පරිස්සමිනි. කාට කොහොම වෙන්කර දුන්නත් මුලක් ලක්ෂ ගාණක් චකතුවෙන කැෂියර් චක ඔහු භාවනාට ඇරෙන්නට වෙන කිසිවෙක්ට දෙන්නේ නැත.

එසේ කරන්නේ කෙල්ලගේ හදවත ගැන රඹුක්වැල්ල මහතා හොඳින්ම දන්නා නිසාය. කැෂියර් එක දියයුත්තේ සල්ලිවලට පෙරේත නැති කෙනෙක්ටය. එහෙම ඉන්නේ නේත්‍රාත් භාවනාත් පමණී. නේත්‍රා ආබාධිත තත්වයෙන් ඉන්නා නිසා ඇයට හැම වෙලාවේම කැෂියර් අංශයට යන්නට අමාරුය. එය භාවනාට දී ඇත්තේ ඒකය.

සීගිරි සුපර් හී සේල්ස් අංශය බාරදී ඇත්තේ මිහිරංගටය. රඹුක්වැල්ල මහතා මිහිරංගට ඒ සම්බන්ධයෙන් ව්‍යාපාරික පාඨමාලාවක්ද උසස් පෙළින් පසු සූදානම් කර දුන්නේය. ඔහු එයට යනවා කියා ගොස් වෙන කොහේ ගියාද කියා කිසිවෙක් දන්නේ නැත. ඇත්ත කතාව මිහිරංග දෙවසරක

පාඨමාලා කාලයෙන් දවස් දෙක තුනකට වඩා දේශනවලට නොග ්‍ය බවය. ඔහු සීයාට රැගෙන විත් පෙන්වූයේ මිතුරෙකු ගත් ඩිප්ලෝමා සහතියකයක් පරිගණකයෙන් ස්කෑන් කර එයට තමාගේ නම දමාය. සම්පූර්ණ පාඨමාලාව නිම කරන්නට රඹුක්වැල්ල මහතා දුන් රුපියල් ලක්ෂ තුනක මුදල මිහිරංග ඔහුගේ වියදමට තබාගත්තේය.

'මේ එන ගෑණු ටිකටයි පප්පා මහත්තයලා ටිකටයි බඩු ටිකක් විකුණන්න මොන බිස්නස් ඩිග්රිද? ට්‍රොලිය තල්ලු කරගෙන ගිහින් උන්ට ආස දේවල් දාගෙන දාගෙන යනවා. අපි බම්බු ගහන්නද?'

ඔහු සිතුවේ එහෙමය. එහෙත් පාරිභෝගිකයා සුපර් මාර්කට් එකේ

රාක්ක අතර යද්දී ඔහුගේ හදවත වෙනස් කරන්නට පුළුවන. පාරිභෝග කයා ගන්න හිතාගෙන ආ දේම නැතත් වෙන වෙන දේවල් ගන්නට ඔහුගේ හදවත පොලඹවන්නට පුළුවන. සේල්ස් වැඩිවෙන්නේ එවිටය. එහෙම කළ හැක්කේ පාරිභෝගිකයා ඇවිදයන රාක්ක අතර මැජික් එකක් කර පෙන්වන්නට පුළුවන් නම් පමණි. මිහිරංග එහෙම දෙයක් දන්නේ නැත.

"මොනවාහරි දාලා රාක්ක පුරවලා තියනවා හරි. හිස් රාකක් තියන්න එපා. මෙතන මටයි කේස් එක."

ඔහු ඔහුට බාරදී ඇති සේල්ස් එකේ කොල්ලන්ට කියන්නේ එහෙමය.

"සර් මේ කස්ටමස්ලා නිතරම ඉල්ලන්නේ මේ බ්‍රෑන්ඩ් එක නෙමේ.

මේවා අදින්නේ නෑ සර්"

සේල්ස් අංශයේ කොල්ලෙක් ඇවිත් මිහිරංගට කියයි.

"අපි දෙන්නේ අපිට ඕන බ්‍රෑන්ඩ් එක. එයාලට ඕන බ්‍රෑන්ඩ් එක අපි දෙන්නේ නෑ. අදින්නේ නැත්නම් ඔහොම තියනවා. අපි ඇදගෙන නාන්න ඕන නෑ."

ඒ කතාව වැරදිය. පාරිභෝග කයන්ගේ හදවත දිනාගත් වෙළඳ නාම ඇත. එහෙම හදවත දිනාග න්නට වෙළඳ ආයතන කෝටි ගණන් දැන්වීම්වලට යටකර ඇත. එසේ හදවතේ ඇඳුණු වෙළඳ නාම සොයාගෙන වෙළඳපොළට එන පාරිභෝගිකයා
හොයන්නේම ඒ බඩුවමය. එය නැතිවිට බලාපොරොත්තු සුන්වෙයි.

කට්ටියක් කන්නේ මන්චී බිස්කට්ය. තවත් කට්ටියක් කන්නේ මැලිබන් බිස්කට්ය. මේ දෙකම කන්නේ නැති කට්ටියක්ද ඇත. ඔවුන් සොයන්නේ මාමි බිස්කට්ය. ඔය තුනටම ආස නැති අයත් ඇත. ඔවුන් සොයන්නේ හෝම් මේඩ් බිස්කට්ය.

මිහිරංග කොහොමත් සීගිරි සුපර් එකේ ඉන්නේ දවල් එක දෙක වෙනතුරු පමණි. ඊට පසු ඔහුව සොයාගන්නත් නැත. පාරිභෝග කයන් සීගිරි එකේ පිරෙන්නේ හවස හතරෙන් පසුය. ඔවුන්ගේ ප්‍රශ්න තේරුම් ගන්නට පුළුවන් ඒ වෙලාවටය. ඒත් මිහිරංග කිසි දිනක මේ වෙලාවට සීගිරි එකේ නැත.

"මං කස්ටම සර්ච් එකක් දාන්න කීල්ස් එකට ගියා කියනවා හරි."

ඔහු පනින්නේ සේල්ස් අංශයේ සුපවයිසර් කෙනෙක්ට එසේ කියාය.

"එයා කස්ටම සර්ච් දාන්නේ කීල්ස් සුපර් එකේ නෙමේ. ලේක් සයිඩ් ක්ලබ් එකේ."

සුපවයිසර් සේල්ස් කොල්ලෙක්ගේ කණට කර කියයි.

දැන් මාස කිහිපයක සිට සීගිරි එකේ අලෙවිය අඩුවීමට මෙයද එක හේතුවකි. පර්චසියන් කරන්නේ නේත්‍රාය. ඒත් ඇයට පර්චසින් කරන්නට නිර්දේශ කළ යුත්තේ සේල්ස් එකෙනි. පර්චසින් ඇණවුම් හදන්නේ මිහිරංගය.

අද මිහිරංග එන්නේ කාකි පැහැගත් ඩෙනිම් කළිසමට කළු ටී ෂර්ට් එකක් ඇඳගෙන අව් කණ්නාඩියද හිසේ ගසාගෙනය.

ජංගම දුරකථනයද කණේ ගසාගෙන එන ඔහු කැෂියර් එකේ කෙල්ලෝ ටික දෙස බලා මනමාල සිනාවක් පායි.

"කෝ ඔයාලගේ සුදු මිස් ආවද අද?"

මිහිරංග අසන්නේ අනූගෙනි. ඇය ඉන්නේ පාරිභෝගිකයෙක් ගෙවීම් කරන්නට දුන් ක්‍රෙඩිට් කාඩ්පත ක්‍රෙඩිට් කාඩ් මැෂිමට දමමිනි. 'කස්ටම කෙනෙක් ඉන්නවද කියලවත් බලන්නේ නෑනේ.' ඇය සිතුවාය.

"ආවා සර්. ඔෆිස් එකේ ඇති."

මිහිරංග රාක්ක දිගේ එහෙට මෙහෙට ඇවිදගෙන යයි. ඒ යන අතරතුරත් ඔහුට ඇමතුම් එයි.

"ආ මචං පොඩ්ඩක් හිටපන්. මේ මෙහේ එනවා හලෝ."

මිහිරංග දුරකථනය කණෝන් ගෙන සේල්ස් අංශයේ සුපවයිසර්ට කතාකරයි.

"ගුඩ් මෝනිං සර්."

"මෝනිං මෝනිං. මොකද මහානාම මේ රැක්ස් හිස්. බලනවකෝ තියෙන කැත."

"මිල්ක් පවුඩර් ස්ටොක්ස් ආවේ නෑනේ සර්."

"ඇයි මොකද චෙක් එක රිටන් වෙලාද?"

නගරයේ ජනප්‍රියම සුපර් මාර්කට් එකේ සේල්ස් අංශය බාර කෙනා කිරිපිටි වෙළඳ පොළට නේන හේතුව දන්නේ නැත. 'කාට කියන්නද' මහානාම සිතයි.

"නෑ සර් මේ කිරිපිටි වර්ග හතරක සේල්ස් නවත්තලනේ."

"කවුද සීයද?"

මිහිරංග කටට ගත්වනම ඇසුවේය. මහානාමට සිනාගියේය. 'ගොනෙක්නේ.' ඔහුට බැලුනේ පිටුපසින් උන් භාවනා දෙසය. 'මීට වඩා හොඳයි ඕ ලෙවල් පාස් කොල්ලෙක් ගත්තනම් සේල්ස් මැනේජර් විදිහට.' භාවනා සිතුවාය. 'හරි ෂෝක් සීයගේ ලොකු මුණුපුරා.'

"මිල්ක් පවුඩර් සේල්ස් කරන එක නවත්තලා තියෙන්නේ මිහිරංග අයියේ සීයා නෙමේ. ගවන්මන්ට් එකෙන්. නිව්ස් බලන්නේ නැද්ද? ලංකාවට ගේන කිරිපිටි වර්ග හතරක මිනිස් ශරීරයට අහිතකර විකිරණ තියෙනවා කියලා සැකයක් තියෙනවා. ඒ නිසා අලෙවිය තහනම් කරලා තියෙන්නේ."

භාවනා පහදා දුන්නාය. මිහිරංග ඇයගේ කතාව ගණනකට ගත්තේ නැත. ඔහු එහෙමය. ඇත්තේ අමුතුම අහංකාරකමකි.

"මේ රැක්ස් පුරවලා දානවා මහානාම. කිරිපිටි නැත්නම් පාන්පිටි හරි දාන්න."

මිහිරංග කීවේ භාවනා ළඟදී දෙවෙනි තැනට පත්වෙන්නට බැරි නිසාය.

"එහෙම දාලා බෑනේ. මහානාම බලන්න හයිලන්ඩ් එකයි ලක්ස්ප්‍රේ එකයි තියෙනවද කියලා ඇතිතරම් ස්ටොක්ස්. ඒවා බලලා දාන්න. බොටම් රැක් එකට නෙස්ටමෝල්ට් දාන්න තනූජට කියලා නෝට් එකක් දාන්න අවේලබල් නැති මිල්ක් පවුඩර් හතරේ නම් දාලා ඒවා

අලෙවිය තාවකාලිකව නතර කරලා තියෙන්නේ කියලා."

භාවනා උපදෙස් දුන්නාය.

"හොඳයි මිස්."

'එයාට දුන්න සෙක්ෂන් එක බලාගත්තනම් ඉවරනේ. මගේ සේල්ස් සෙක්ෂන් එකට හොට දාන්නේ නැතුව. අක්කයි නංගියි දෙන්නම එකයි. අනුන්ගේ සීනි කිරන්න එන්නේ' මිහිරංග සිතින් භාවනාට බැන්නේය.

"යන්න මිහිරංග අයියා ගිහින් සීයව මීට්වෙන්න උදේ හෙව්වා."

භාවනා කීවාය.

"ඇයි ලෙඩක්ද අදත්?"

මිහිරංග ඇසුවේ අවැදගත් ලෙසිනි.

"දන්නේ නෑ. ඔක්කොටම කලින් ඔයා පාවිච්චි කරන මොබයල්

නම්බර් එක සීයට දෙන්න. පරණ නම්බර් එකක් සීයට දීලා ඒ මනුස්සයා දුක් විඳ විඳ ඩයල් කරනවා. පව් වැඩනේ."

භාවනා කීවේ නොහොඳ සිතිනි. මිහිරංග කරන වැඩ හැමදේම ඇය දනියි. එහෙත් කෙල්ල කවදාවත් කාටවත් කේළම් කියන්නේ නැත. ඇය කරන්නේ ඇයට බාරදුන් වැඩය පමණි.

"බබා ගාණට නිව්ස් එක දීලා ඇති සීයට මම වෙන නම්බර් එකක් යූස් කරන්නේ කියලා.නේ."

මිහිරංග කීවේය. භාවනා නතරවූවාය.

"එකක් කියන්නම් මිහිරංග අයියේ. මම ළඟ දෙවෙනි පංතියේ වැඩ නෑ. හරිඳ? ඔයා ගැන එක

එක්කෙනාට කිය කිය යනවට වඩා ගොඩක් වැඩ මට තියෙනවා. මම සෝ බිසී."

භාවනා ගියේ එසේ කියාගෙනය. තමාට පිටුපා යන භාවනා දෙස මිහිරංග බලාගෙනම උන්නේය. 'මේකී ඊයේ දැක්කට වඩා අද ලස්සනයිනේ. ෆිගර් එක අඹලා වගේ. බලමුකෝ.' ඔහු සිතුවේ යටිතොළ හපාගෙනය.

# 05

දේවක හා ජීවන් පැමිණි ත්‍රී වීලරය නැවතුණේ හරියටම සීගිරි සුපර් මාර්ට් එක ඉදිරිපිට පාරේ අනෙක් පැත්තේය. අඩි සීයක් එකසිය පනහක් පමණ ප්‍රධාන පාරට විවරව තිබූ දැවැන්ත සුපිරි වෙළඳ සැළ දකිද්දී කොල්ලාගේ හිත ටිකක් සසල විය. 'මම හිතුවේ පොඩි සුපර් මාර්කට් කෑල්ලක් කියලා. මේක මහ විසාල එකක්නේ. මෙතන

එකපාරම මට ජොබ් එකක් දෙයිද' ඔහු සිතුවේය.

"මේක තමයි පුතේ."

සීගිරි සුපර් මාර්ට් එක ඉදිරිපිට වූ දැවැන්ත වාහන නැවතුම සෙවණ වී තිබුණේ විශාල මැයි මාර ගස් හතරකිනි. ඒ මැයි මාර ගස් නිසා සීගිරි එකට අමුතුම ලස්සනක් ආවේය. සීගිරි එකට ආ පාරිභෝගිකයන්ගේ වාහන දහයක් දොළහක් ඒ වෙද්දීත් නතරකර තිබුණි.

"මේ අප්පච්චි දන්න තැනක්ද?"

දේවක ඇසුවේය. ජීවන් සීගිරි එක දෙස බලාගෙනම උන්නේය. ඔහුගේ දෙනෙත්වල මොකක්ද තෙත පාටක් විය. දේවකට පුදුම සිතුණි. 'අප්පච්චිගේ ඇස්වල කඳුළුද මේ' දේවක පුදුමයෙන් ඒ ඇස් දෙස

බලාගෙනම උන්නේය.

"ඇයි අප්පච්චි?"

දේවක ඇසුවේය. ජීවන්ට කොල්ලා කතාකරනවාවත් ඇසුනේ නැත. ජීවන් මේ සීගිරි එක දකින්නේ හරියටම වසර විසි දෙකකට පසුය. අවසාන වරට මේ සීගිරි එකට ජීවන් ආවේ නර්මදාගේ මරණය ගැන කියන්නටය. එදා මෙදා තුර වසර විසි දෙකක් ගෙවී ඇත. එහෙත් සීගිරි එක තවමත් එහෙමමය. ජීවන්ට අදහාගන්නට බැරිලෙස ඔහුගේ දයාබර බිරිඳ වූ නර්මදාව සිහිවෙන්නට විය.

"අප්පච්චී."

දේවක කතාකළේය. ජීවන් පියවි සිහියට ආවේ එවිටය. ඔහු නෙත්වූ දෑස් අමාරුවෙන් පිසදාගෙන

කොල්ලා දෙස බැලුවේය.

"ඇයි අප්පච්චි?"

"නෑ පුංචි මහත්තයෝ. මම ඔයාට හවසට කියන්නම්."

"මේ අප්පච්චි දන්න තැනක්ද?"

"ම්. ගොඩක් හොඳට දන්න තැනක්. ඒවා පස්සේ කතාකරමු පුංචි මහත්තයෝ. දැන් ගිහින් පැයක් දෙකක් මේකේ ඇවිදින්න. බඩුටිකක් ගන්න මං දුන්න සල්ලි වලින්. ම්. ඔයා අනිද්දා මේ සීගිරි සුපර් එකේ ඉන්ටර්වීව් එකට යන්නෝන. එයාලා හොයන්නේ සේල්ස් ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක්. තේරුණාද? එහෙම හොයන්නේ මොකක්හරි සේල්ස් ඩ්‍රොප් එකක් තියෙන නිසා. වටේම අලුත් සුපර් මාර්කට්නේ. ඒවල තරඟයක් ඇති. අද සෙනසුරාදා.

සැටඩේ වගේ නිවාඩු දවසක මේ ඇවිත් ඉන්න කස්ටමස්ලා ටික මදි. තේරෙනවා නේද?"

"ඔව් අප්පච්චි. පාකින් එක පිරෙන්න වෙහිකල් තියෙන්න ඕන. වාහන දහයයි දොළහයි තියෙන්නේ."

"ම්. ඒකෙනුත් වාහන හතර පහක්ම මේක අයිති අයගේ. ඔයා බලන්න ටිකක්. මන්ඩේ ඔයාට ඉන්ටවීව් එක."

දේවක යළිත් ජීවන් දෙස බැලුවේය.

"ඇයි අප්පච්චි මේ ඇස්වල කඳුළු?"

දේවක ඇසුවේය.

"මට කෙනෙක්ව මතක්වුනා පුංචි මහත්තයෝ. ඒකයි."

ජීවන් කොල්ලාගේ උරතලය

පිරිමැද කීවේය.

"ම්. යන්න. මං මෙහෙමම සයිට් එකට යනවා."

දේවක හිස වැනුවේය. ජීවන් ත්‍රී වීලරයට ගොඩවී ටික වෙලාවක් කොල්ලා සීගිරි එකට යන දෙස බලාගෙනක උන්නේය. 'මං ඔයාගේ කොල්ලව සීගිරි එකට යැව්වා සුදු නෝනා. ඒකව ටිකක් බලන්න.' ජීවන් සිතින් කීවේ ඔහුගේ මැරිච්ච බිරිඳටය. 'මට ඕන රඹුක්වැල්ල මහත්තයෝ මගේ කොල්ලගේ අයිතිය නෙමේ. මට එක දෙයයි ඔයාට පෙන්නන්න ඕන. මම මගේ කොල්ලව ලස්සනට හැදුවා කියලා පෙන්නන්නයි. ඒක හරි අමාරු දුෂ්කර අවුරුදු විසි හතරක්. ඒත් මම ඒක කළා.' ජීවන් සිතින් කීවේය.

***   ***   ***   ***   ***

දේවක පුංචි බණ්ඩාර සීගිරි සුපර් මාර්ට් එකට පය තැබුවේය. එයට පිවිසෙද්දීම කොල්ලාගේ පපුවට මොකක්ද වාගේ වුනේය. හරියට ළඟක ඉඳගෙන කවුරු හෝ කුමක් හෝ කීවාක් මෙන්ය. හිතේ සැකයට ඔහු හැරී බැලුවේය. සීගිරි එකට පිවිසෙද්දීම ඔහු දැක්කේ රන්වන් පැහැයෙන් ලියා ඇති එහි තේමා පාඨයය.

'සැමදේ සපිරි. නාමය සුපිරි. සීගිරි.'

ඒ කතාව කොල්ලාගේ සිත් ගත්තේය.

'ලස්සන ස්ලෝගන් එකක්. හරිම

ලස්සනට ලියලා. මාකටින් ගැනයි කලාව ගැනයි දෙකම දන්න කෙනෙක් ලියලා තියෙන්නේ'

දේවක සිතුවේය. ඔහු හරිය. හරියටම හරිය. මේ තේමා පාඨය ලිව්වේ අලෙවිකරණය ගැනත් කලාව ගැනත් දෙකම දැනගෙන උන් කෙනෙකි. සීගිරි සුපර් හී මේ තේමා වැකිය හැදුවේ අන් කිසිවෙක් නොවේ දේවක පුංචි බණ්ඩාරගේ මියගිය අම්මාය. නර්මදා රඹුක්වැල්ලය. සෙනරත් රඹුක්වැල්ල මහතාගේ බාල දූය. මේ ව්‍යාපාරික දැණුමත් කලාත්මක හදවතත් තිබුනේ ඇයටය. තේමා වැකිය ලියන්න රඹුක්වැල්ල මහතා දුන්නේ ඇයටය. මේ ඇය ලියූ තේමාවය. එය දකින දකින වාරයක් පාසා රඹුක්වැල්ල මහතාට තම දුවව සිහිවෙයි.

අද මේ සීගිරි එකට අවුරුදු විසිදෙකකට පසුව ඇවිත් ඉන්නේ ඒ නර්මදාගේ එකම පුතාය. දේවක රඹුක්වැල්ලය. එහෙත් සීගිරි හී කිසිවෙක් එය දැනගෙන උන්නේ නැත. පුදුමම දේ ඒක කොල්ලාද දැනගෙන උන්නේ නැති එකය.

සීගිරි එකට ඇතුල්වූ මොහොතේම හදවතට දැනුන අමුත්ත කුමක්ද කියා දේවක සිතුවේය.

'හරි පුදුමයි. හරියට දන්න තැනකට ආවා වගේ මට හිතෙන්නේ.'

ඔහු සීගිරි එක පුරාම දෙනෙත් රැගෙන ගියේය. තරමක පාරිභෝග කයන් පිරිසක් ඒ මොහොතේ සීගිරි සුපර් හී විය. එහෙත් කැෂියර්

පොයින්ට්වල කිසිම පෝළිමක් වූයේ නැත.

'අද වගේ දවසක කැෂියර් පොයින්ට්ස්වල පොඩි කියූ එකක් තියෙන්නම ඕනනේ.'

දේවක සිතුවේය.

'එන්ට්‍රන්ස් එකේම ලොකු රැක් එකක් තියලා. මුළු සුපර් මාර්කට් එකේම වීව් එක බ්ලොක් කරලා. එන කෙනෙක්ට සාගරේ වගේ තියෙන සුපර් මාර්කට් එක එක බැල්මකින් පේන්න ඕනනේ. මෙතන තාප්පයක් ගහලා වගේනේ'

දේවක පළමු අඩුපාඩුව දැක්කේය.

'කැෂියර් පොයින්ට් හතරම ටිකක් පාළුවට තියලා තියෙන්නේ. ඒ වටේ ප්‍රඩක්ට් ඩිස්ප්ලේ එකක් කරන්න පුළුවන්නේ. අන්තිම මොහොතෙත්

එතකොට කස්ටමර් මොනවාහරිම ගන්නවනේ. එක කස්ටමර් කෙනෙක් විනාඩි හයක් හතක් කැෂියර් ළඟ වේටින් වෙනවනේ. ඒ වෙලාවටත් මොනවාහරි එයාගේ ඇස්වල ගාවන්න ඕනේ. අඩුම ගානේ චොකලට් බාර් එකක්හරි. චීස් ස්ලයිසස් පැකට් එකක් හරි. අලුත් මෙයොනස් ක්‍රීම් එකක් වගේ දෙයක්හරි. ඒ මොනවත් නෑ. වමට සුදු බිත්තියත්. දකුණටත් සුදු බිත්තියක්. මළගේ වගේ. ඇයි බැරි සයින් බෝඩ් එකක් දාන්න. ලීවර්ස්ලට කිව්වානම් අතට ගාණකුත් දීලා සයින් එකක් දානවනේ’

දේවක දෙවන තුන්වන අඩුපාඩුත් දැක්කේය.

ඔහු නිහඬව ගොස් ට්‍රොලියක්

ගත්තේය. ට්‍රොලි ටිකක් පරණය. යැවෙනවා හොරය. අලුත් සුපර් මාර්කට්වල තියෙන්නේ අලුත්ම ට්‍රොලිය. ඒවාවල මෝස්තරයද අලුත්ය. මොන පැත්තකින් බැලුවද සීගිරි සුපර් එක ලස්සනය. විශාලය. 'ඒත් ඇයි සේල්ස් ඩ්‍රොප්වෙලා තියෙන්නේ මෙහෙම. මොකක්හරි හේතුවක් තියෙන්නම ඕන' දේවක සිතුවේය.

දේවක ගන්නට ඕනා බඩු ලිස්ට් එකක්ම හිතාගෙන ආවේය. 'ඇයි මේ බ්‍රෙඩ් රැක් එකෙන් ෂොපින් ලයින් එක පටන් ගන්නේ. ඒවා දාන්න ඕන අග හරියටනේ. කොහොමත් ගන්න දේවල්නේ ඒවා. මුලින්ම දාන්න ඕන අත්‍යාවශ්‍යයම නොවෙන දේවල්.' දේවක සියුම්ව සිතුවේය. එවිට වැඩි සේල්ස් එකක් කරගන්නට

පුළුවන. අගට ඇති අත්‍යාවශ්‍ය දේවල් කොහොමත් ගනී. මුලින් වැඩි බඩු ප්‍රමාණයක් පාරිභෝගිකයා ලවා ට්‍රොලියට දම්මවාගත යුතුය. මාකටින් කියන්නේ ඒකටය. ඒක ලේසි දෙයක් නොවේ.

සීගිරි එක ඇතුලේ ඇති ආලෝකය හරි ලස්සනය. නිස්කලංකය. නමුත් සුපර් මාර්කට් එකකට දිලිසෙනවා මදිය. 'මෙතන වැඩ කරන්න හරි ආසයි. මටත් දෙයක් කරන්න තියෙනවා' දේවක කැමති එහෙම අභියෝග ඇති තැනක වැඩකරන්නටය.

පසුබිමින් ඇසෙමින් තිබුනේ ජනප්‍රිය එෆ් එම් නාලිකාවකි. මේ වෙලාවේ එහි විකාශනය වෙමින් තිබුනේ මේ දිනවල ජනප්‍රිය හින්දි

චිත්‍රපට ගීතයකි.

දේවක උන්නේ ෂැම්පූ රැක් එක ළඟ නතරවී ආයුර්වේද ෂැම්පූ එකක් තෝරමිනි. ඔහු ආස ආයුර්වේද සුවඳටය. අප්පච්චීත් ආස එහෙමය. ඉඳහිට ජීවන් තෙල් ටිකක් දමා කොල්ලාගේ හිස මසාජ් කරයි.

නිල් ජීන්ස් කලිසමට සුදු ඉන්දියානු මෝස්තරයේ බ්ලවුසයකින් සැරසුණු යුවතිය ආවේ එෆ් එම් එකේ වාදනය වෙමින් තිබූ ගීතය මෑදුව මුමුණමිනි. තැඹිලි ෂැම්පූ එක අතේ තබාගෙන බලමින් උන් දේවකට රාක්ක මැදින් එන යුවතිය දෙස බැලුනේ ඉබේටමය. සීගිරි එකට ඇතුල්වෙද්දී හදවතට ආ විදුලි සැරය යළිත් ඔහුගේ පපුව හරහා ගියේය. රාක්ක දෙස බලාගෙනම ආ

යුවතිය හදිස්සියේම මෙන් දෙනෙත් හැරෙව්වාය. දෙදෙනාගේ දෙනෙත් එකට ගැටිණ.

ආවේ භාවනාය. භාවනා රඹුක්වැල්ලය. මේ තමාගේ අම්මාගේ අයියාගේ පොඩි දුව බව කොල්ලා දන්නේ නැත. නෑකමට දෙන්නා නෑනා මස්සිනාලාය.

කළු කළිසමට සුදු අත් කොට කමිසය ඇඳගෙන උන් දේවකගෙ න් අද එන්නේ වෙනස්ම වැදගත් වැදගත් පෙනුමකි. ඔහුට යළිත් භාවනා දෙස බැලිණි. යුවතිය යන්තමට සිනාසුනේ පුරුද්දටය. සීගිරි එකේ පාරිභෝගිකයන් කාටත් ඇය දාන මල් මල් සිනාවක් ඇත. දේවකට සිනාසෙන්නට අමතක විය. ඇය ගොස් නැවතුනේ දේවක උන්

තැනට එහායින් ෆේස් වොෂ් තබා තිබූ රාක්කය ළඟය. කෙල්ල ආවේ හොඳ ෆේස් වොෂ් එකක් තෝරාගන්නය. හවස් වෙද්දී මුහුණ තෙල් පාටය. පුදුමයකට මෙන් ඇයද සොයන්නේ ආයුර්වේද ෆේස් වොෂ් එකකි. ඇයට රාක්කට අසළ බිම පහත්වෙන්නට වූයේ ෆේස් වොෂ් තබා තිබුනේ ඒ තරම්ම පහළ නිසාය. 'හරිනේ. පිස්සෙක්නේ මේවා තියන්න තැන් කියන්නේ. මෙච්චර පාත්වෙලා එන ලේඩීස්ලා ගනී ෆේස් වොෂ්.' කෙල්ල බිම ඇණ තබාගෙන ආනයනික ෆේස් වොෂ් එකක් අතට ගත්තාය. ඇය ආවේම එය සොයාගෙනය. මේ ෆේස් වොෂ් එක ලංකාවේ එකක් නොවේ. ඉන්දියාවෙන් ගෙනෙන එකකි.

දේවක ඔහුගේ ට්‍රොලිය තබාගෙන

එතනම උන්නේය. හරියටම කියනවානම් කොල්ලාට ඇයව දැන් ලස්සනට පෙනෙයි. ඔහු හොරැ හින් මෙන් ඇය දෙස බැලුවාය. 'පිස්සෙක්ද කොහෙද එයා ගර්ල් කෙනෙක්ද මෙච්චර වෙලා අරගෙන ෂැම්පූ තෝරන්න.' භාවනා සිතුවාය. අලුත් ෆේස් වොෂ් වර්ගයේ ඕපන් එක ටිකක් සංකීර්ණය. භාවනා ඒක ඒ අතට මේ අතට මිරිකමින් බැලුවේ විවර කරන්නේ කොතනින්ද කියාය. කෙල්ලට ඕනා මේ ෆේස් වොෂ් එකෙන් ටිකක් අත්ලට ගෙන බලන්නටය.

එක්වරම වූයේ නොසිතූ දෙයකි. භාවනා ෆේස් වොෂ් එක මිරිකද්දී එහි වූ ෆේස් ක්‍රීම් වලින් බාගයක්ම හදිස්සියේම ඉන් විද්දිණ. එහි විවරය තිබුනේ රිදී පාටින් නිසා කෙල්ල

ලයිට් එළියට එය දැක්කේ නැත.

ටියුබ් එකෙන් විද්ද ෆේස් වොෂ් ගොස් කෙළින්ම ගොස් වැදුනේ කොල්ලාගේ සුදු කමිසයේය. ඇක්ටිව් කාබන් අඩංගු මේ අලුත් ෆේස් වොෂ් එක කළු පාටය. දැන් බතික් මෝස්තරය හරි ලස්සනය. කොල්ලා කළු පාටින් බතික් වූ තමාගේ කමිසය දෙසත් යුවතිය දෙසත් මාරුවෙන් මාරුවට බැලුවාය. කෙල්ල ඔහුගේ මුහුණ දෙස බැලුවේ අසරණවය.

"අනේ සොරි. එක්ස්ට්‍රීම්ලි සොරි. මට මේ. මේක. ඒක."

කෙල්ල හිස් ටියුබ් එක අතේ තබාගෙන ගොත ගැසුවාය. දේවක බලාගෙන උන්නේ ඒ පොඩි මුව කමළ දෙසය. 'ඇයි මං දිහා එහෙම බලාගෙන ඉන්නේ.' බිය මැද කෙල්ල

සිතුවාය. 'මේ කවුද' භාවනාට සිතාග න්නට අමාරුය.

"මේක මේ ඇක්ටිව් කාබන් තියෙන නිසයි කළු පාට. මම පිහදාන්නම්."

යුවතිය ඇයගේ ජීන්ස් එකේ සාක්කුවේ තිබූ ටිෂූ එකක් ගත්තාය. කෙල්ල තොලට උඩින් පිපෙන දහදිය පිසදාන්නට ටිෂූ එකක් නිතරම සාක්කුවේ දමාගෙන ඉඳියි.

"ඒක කමක් නෑ මිස්."

දේවක කීවේය. ඒත් කෙල්ල ළඟටම ආවාය. දේවකට ඇගේ වතින් එන සුවඳ ළංළංව දැනෙන්නට විය. 'එයාව දැකලා තියෙනවා වගේනේ.' භාවනාට සිතුනේ ළඟට ඔහුව දකිද්දීය.

"මෙතනම උන්නනේ. මං හිතලා

කළේ නෑ."

ඇය කීවේ වඩාත් ළංළංව ඔහු ළඟට පැමිණය.

"ඒක කමක් නෑ මිස්. හිතලා කළේ නෑ කියලා මම දන්නවා"

"ඉන්නකෝ."

යුවතිය ඇක්ටිව් කාබන් සහිත ෆේස් වොෂ් පැල්ලම් ඇගේ ටිෂූ එකෙන් පිසදාන්නට ගත්තාය. දේවක අදහාගන්නට බැරිතරම් ළඟට ඇයගේ මුහුණ දැක්කේය. යුවතිය දෙනෙත් එසවූයේ හදිස්සියේය. අඟල් දහයක් දොළහක් තරම් ළඟට ඒ ඇස් හතර හමුවිය. 'ඇයි මේ. මං එනකොටත් මං දිහා බලාගෙන උන්නේ' භාවනා සිතුවාය.

"අනේ මේ. මේක."

භාවනා ලස්සනට වැඩේ කර

තිබුණි. දැන් තිබුණාටත් වඩා බතික් මෝස්තරය ලස්සනය. ඇක්ටිව් කාබන් සහිත ෆේස් වොෂ් එක දැන් කොල්ලාගේ කමිසය පුරාමය. දේවක සිනාසුණේය. 'හිනාවෙනකොට ලස්සනයිනේ' භාවනා සිතුවාය. ඒත් කෙල්ලගේ පපුව දැන් ගැහෙයි. 'කමිසේ ගන්න දෙයක් නෑ. දැන් ගෙදර යන්නේ කොහොමද' ඇය සිතන්නේ ඒකය.

"මම මේ. සොරි. ඒක මේ ස්ප්‍රේඩ් වුණානේ."

භාවනා ගොත ගැසුවාය. දේවක ඉන්නේ සිනාබරවය.

"දැන් ඒක ඩිසයින් පැටන් එකක් වගේනේ මිස්. ගාණක් නෑ. මං ගෙදර ගිහින් හෝදගන්නම්. ඇක්ටිව් කාබන්නේ. හෝදනකොට යයිනේ"

දේවක කීවේය. කෙල්ල තොල්පට තදකරගෙන බිම බලාගෙන සිනාසුනාය.

"මං හිතලා කළේ නෑ. අනේ සමාවෙන්න"

ඇය මුමුණා මෙන් කීවාය. පසුව දෙනෙත් එසෙව්වාය. දේවක ඉන්නේ බලාගෙනමය. 'කවුරුවත් එහෙම බලලා නෑනේ. ඇයි මේ. දැකලත් පුරුදුයි වගේ' ඇය සිතුවාය.

"මිස් මගේ කම්පියුට එක ස්ටක් වුණා. පාස් වර්ඩ් දෙනවද?"

කැෂියර් එකේ නයෝමි දුවගෙන පැමිණ කීවාය. 'එහෙනම් ඔයා සීගිරි එකේ. මාරයිනේ' දේවක සිතුවේය.

"මං එන්නම් නයෝ."

භාවනා එසේ කියා ඔහුගේ කමිසය දෙස යළිත් වරක් බැලුවාය.

කෙල්ලටත් දුකය. 'ලස්සනට මැදලා ඇඳගෙන ඇවිත් හිටියේ'

"සොරි. මං හිතලා කලේ නෑ."

දේවක සිනාසුනේය. ඒ සිනහව කීවේ තරහක් නැති බවය.

"ඒක හිතන්න එපා මිස්. මම ගෙදරනේ යන්නේ"

කෙල්ලට බැලුනේ ඔහුගේ අතේ රැඳි ආයුර්වේද ෂැම්පු එක දෙසය.

"සර් වයිෆ්ටනම් ෂැම්පු තෝරන්නේ ඕක ගන්න එපා. නෝනා බනී. ඕක ආයුර්වේද කිව්වට එච්චරම හොඳ නෑ. මේක ගන්න."

භාවනාගේ කතාවෙන් කොල්ලා අන්දමන්ද විය. 'බනින්න නෝනා කෙනෙක් නැති එකනේ වැඩේ'

"මේක හොඳයිද?"

"ම් ද බෙස්ට්."

"තැන්කියු."

"යො ආ වෙල්කම් සර්."

කෙල්ල එතනින් ගියේ ලස්සන සිනාවකින් මුව සරසාගෙනය. යද්දී ඇයට යලිත් වතාවක් ඔහුගේ කමිසය දෙස බැලිණ. 'දැන් නෝනා අහයි මොකද මේ ෆේස් වොෂ් නාගෙන කියලා. සැකත් හිතෙයි කෙල්ලට. හොඳ වැඩේ. සුපර් මාර්කට්වලට ඇවිත් කෙල්ලෝ දිහා බල බල ඉන්නවට' භාවනා රාක්ක පෙළ අවසන් වෙන තැනදීත් හැරී බැලුවාය. දුටු දෙයින් කෙල්ලගේ දෙපතුල් සීතල වීගෙන ගියාය. දේවක කෙල්ල යන දෙස බලාගත්වනම බලාගෙන උන්නේය. 'මේ ඇයි දෙයියනේ.' ඇය කැෂියර් එකට ගියේ හදවත අලුතින් අවුල්වී

යද්දීය. 'කවදාහරි කොහේදීහරි දැකලත් තියෙනව වගේ. කවුද මේ.' භාවනා කැෂියර් මැෂින් එකේ පරිගණකයට පාස් වර්ඩ් එක දෙමින් සිතුවාය.

"ඇයි මිස් මගේ කම්පියුට එකට පාස් වර්ඩ් දෙන්නේ?"

අනූ ඇසුවාය. කෙල්ලට සිහියක් නැත. පාස් වර්ඩ් ඕනා කිව්වේ නයෝමිගේ මැෂිමටය. ඒත් කෙල්ල පැමිණ පාස්වර්ඩ් දෙන්නේ අනූගේ පරිගණකයටය. 'මටත් පිස්සු අනේ. මේ පිස්සෙක් අද සීගිරි එකට ඇවිත් මගේ ඔළුවත් අවුල්වෙලා' භාවනා නයෝමිගේ පරිගණකය වෙත ගියේ ඇගේම හිසට අත තිබූ පෑනෙන් ඇණ ගනිමිනි.

"ඇයි මිස්."

නයෝමි ඇසුවාය.

"මුකුත් නෑ."

"නෑ මිස්ගේ මූණ අමුතු නිසා ඇහුවේ."

නයෝමි කීවාය. භාවනා තොල්පත තදකරගෙන සිනාසුනාය.

"එහෙම මොනවත් නෑ අනේ. හරි."

භාවනා නෙතඟින් ඔහු ඉන්නේ කොහෙද කියා බැලුවාය. දේවක උන්නේ වෙජිටබල් අංශයේය. 'නෝනා අද හොඳ බඩු ලිස්ට් එකක් දීලා කොල්ලට. හොඳ වැඩේ. අද සැටඩේ නිසා නිවාඩු ඇති. උදෙන්ම නෝනා අල්ලගෙන. එහෙම තමයි කරන්න ඕන. මුල ඉඳලම හදාගන්න ඕන.' භාවනා තනිවම සිතුවාය. 'හරි අහිංසක පාටයි. කෙල්ල ඒක වෙන්න

ඇති නාස් ලණුව දාන් ඇත්තේ.'
භාවනාට සිතෙන්නේම දේවක
මැරිකරපු කෙනෙක් කියාය.

සීගිරි එකට එළවළු ඕනවටත් වඩා පැමිණ තිබුණි. මේ දිනකට එන වෙජිටබල් ප්‍රමාණය වැඩියි කියා නිකමට දේවකට සිතුණි. 'ආපු වෙජිටබල් එහෙමම කූල් රැක් එකේ ගොඩගහලා. කිසිම ලස්සනක් නෑ. සලාද කොළ ළඟ බතල. ඊට එහා පැත්තේ ලූණු කොළ. ඒක යට මෂ්රූම් පැකට්. .එහෙම නෙමේනේ තියන්න ඕන. සැලඩ් එකට ගන්න දේවල් වෙනමම ලස්සනට තියන්න ඕන. ලෙටියුස් ලීව්ස්. අයිස් බර්ග්. බෙල් පෙපර් රෙඩ්. බෙල් පෙපර් ග්‍රීන් බෙල් පෙපර් යෙලෝ. කොත්තමල්ලි කොළ. මින්චි කොළ. ඊට පස්සේ පාස්ලි. එහෙමයි උඩ රැක් එක

හදන්න ඕන මේ මොකක්ද කරලා තියෙන්නේ.' දේවක පරිස්සමින් සියල්ල බලාගත්තේය. මෙහෙම වෙජිටබල් තියද්දී ලස්සනක් නැත. ආසාවක් එන්නේ නැත. 'සෙකන්ඩ් රැක් එකේ උඩරට වෙජිටබල් ටික ලස්සන ඇරේන්ජ් කරන්නනේ තිබුනේ. කැරට්. ගෝවා. ලීක්ස්. බීන්ස්. ඊට පස්සේ ටොමාටෝ. ඊටත් පස්සේ කුකුම්බ. එහෙමයිනේ. මේ මොනවද කරලා තියෙන්නේ. ඇයි කැරට් එක්ක වට්ටක්කා දැම්මේ. ඒක දාන්න ඕන යටින්. ඊට පස්සේ අමුමිරිස් දාලා.' බොහෝ දේ වැරදිය. එළවළු ඇසුරුම් කලාවේ මූලිකම දැණුමවත් නැති කෙනෙක් මේ දේ කර ඇතැයි දේවකට සිතුණි.

ඔහු එළවළු ගොඩක් ගත්තේ නැත. එළවළු අලුත්ද නැත. පොළේ

මීට වඩා අලුත් එළවළු ඇත. එහෙත් ඔහු රැඳුනේය. වෙජිටබල් කූල් රැක් අසළ සිටිද්දී කොල්ලාට කැෂියර් මැෂින් ළඟ සිටිනා භාවනාව ලස්සනට පෙනෙයි. 'ඇයි සුපර් මාර්කට් එකක වර්ක් කරන්නේ. යන්නනේ තිබුනේ රඟපාන්න.' ඔහු තනිවම සිතුවේය. එහෙම සිතද්දී කොල්ලාගේ මුවේ තුනී මඳහසක් ඇඳෙයි.

භාවනා එය දැක්කාය. ලස්සනට දැක්කාය. 'මොකද මේ පැත්ත බල බල හිනාවෙන්නේ. තාම හිතන්නේ ෂර්ට් එක ගැන වෙන්න ඇති. වෙච්ච දේට හිනා ඇති' භාවනා ඕනේ නැති ගණනක් කැල්කියුලේටරයෙන් හදමින් සිතුවාය. 'බටර් කේක් එක තැනක. පාන් තවත් තැනක.' දේවක සිතුවේ අලෙවියට තබා ඇති බටර් කේක්

එක අතට ගෙනය. පසුව ඔහු එහි කල් ඉකුත්වෙන දිනය බැලුවේය. බටර් කේක් එකේ කල් ඉකුත්වෙන දිනය පසුවී දැන් දවස් දෙකක්ම ගතවී ඇත. 'කෑවනම් ලස්සනට ජයවර්ධනපුර හොස්පිට්ල් එක බලාගෙන එන්න තිබුණා. දවස් දෙක තුනක් නතරම වෙලා' දේවක සිතුවේය. සීගිරි එකේ අලෙවිය ඩ්‍රොප් වී ඇත. මීට කලින් මේ සුපර් මාර්කට් එකට හොඳ අලෙවියක් තිබෙන්නට ඇති කියා ඔහුට නිකමට සිතෙයි. 'ඒකනේ අප්පච්චි මාව මෙතනටම එව්වේ ඒත් ඇයි. මොකක්ද ඒකේ රහස.' දේවක සිතන්නට ගත්තද එහෙම දෙයක් ඔහුට හිතෙන්නේ නැත.

ඔහු රේසරයක් සොයාගෙන ෂේවින් ක්‍රීම් ඇත්තේ කොහේද කියා

සෙව්වේය. රේසර් ඇති තැන ෂේවින් ක්‍රීම් තියා නැත. ඒක තියා ඇත්තේ ෂැම්පූ රාක්ක අසළය. ඔහු ආයෙත් ෂැම්පූ රාක්කය වෙත යද්දී භාවනා කල්පනාවෙන් බැලුවාය. 'ආයෙත් ඇයි ඒ පැත්තට ගියේ.' කෙල්ලගේ දෑස් සී සීටී කැමරාවක් මෙන් කැරකෙයි.

"නයෝ මේ කැෂියර් එක ඇයි නිතරම ස්ටක් වෙන්නේ."

භාවනා ඇසුවේ මෙතනටම වී ඉඳිද්දී කෙල්ලෝ ටික තමාව සැකකරන බව දැනගෙනමය. 'මුන් ටිකට ඉව තියෙනවා' ඇය සිතුවාය. ඒත් කෙල්ලට ඔෆිස් එකට අද යන්නට සිතෙන්නේ නැත. 'එයා ගත්තේ මොනවද කියලා බලන්න ඕන' එහෙම හිතන්නේ මක්කටද කියා

කෙල්ලම දන්නේ නැත.

දේවක ආවේ තරමක බඩු ටිකක් ට්‍රොලියේ දමාගෙනය. කොල්ලා ට්‍රොලිය තල්ලු කරගෙන ආවේ සෑහෙන අමාරුවකිනි. මේ තරම් විශාල සුපර් මාර්කට් එකක් හදා පරණ ට්‍රොලි තබන්නේ ඇයි කියා ඔහු සිතුවේය. 'එයා කැෂියර් පොයින්ට් එකේ ඉන්නවා.' දේවක ඈත තියාම දැක්කේය. ඔහුට ඇය දෙස එක එල්ලේ බලන්නට නොහැක. දුකත් ඒකය. 'ඩෙනිම් ජීන්ස් එකට ඉන්දියන් සල්වාර් ටොප් එක ඇන්ඳාම හරිම ලස්සනයිනේ. එයත් දන්න ෆැෂන්ස්.' ඔහු සිතුවේය.

පුදුමයකට මෙන් දේවක ආවේද නයෝමි ළඟටමය. කෙල්ල උන්නේ එහි පරිගණකයේ හාඩ් එක අඳිමිනි.

"මිස් මේ සර්ව අනූ ළඟට යවන්නද?"

නයෝමි ඇසුවාය. මේ වෙද්දී නයෝමි කෙල්ලගේ ඇස් හිමිහිට නිරීක්ෂණය කර උන්නාය.

"මම බලන්නම් නයෝ."

පුදුමය. අද බිලින් කරන්න යන්නේ කෙල්ලය. නයෝමිටත් පුදුමය. ඇය බැලුවේ එහා මැෂින් එකේ උන් අනූ දෙසය.

"ආයුබෝවන් සර්."

භාවනා ලස්සනට දෑත් එක්කර ආයුබෝවන් කීවාය. දේවකගේ දෙතොලතර මෘදු සිනාවක් සටහන් විය.

"ආයුබෝවන්."

කොල්ලාද දෑත් එක්කර ආයුබෝවන් කීවේය. භාවනාට

පමණක් නොව නයෝමිටත් සිනායන්නට ආවේය. 'පිස්සෙක්' කෙල්ල තොල්මතුරා කීවාය. 'සීග රි එකේ මිස් ෂෝක්නේ.' දේවක සිතුවේය.

"නයෝ මේ සර්ගේ බඩුටික දාන්න."

භාවනා කීවේ ඇය තමාගේ මුහුණ දෙසත් ඔහු දෙසත් බලාගෙන ඉන්නා නිසාය. බිල් කරනා ගමන් භාවනාට ඔහුගේ කමිසය දෙසද බැලෙයි. දැන් ෆේස් වොෂ් පැල්ලම ටිකක් වේලී ගොස් ඇත. ඒත් බතික් සිතුවම එහෙමමය. කෙල්ල එදෙස බලද්දී දේවකටද තමාගේ කමිසය දෙස බැලෙයි. පසුව දෙදෙනාගේ දෑස් එක්වෙයි.

"අයම් සොරි."

ඇය ඔහුට පමණක් ඇසෙන්නට මුමුණා මෙන් කීවාය. ඔහු සිනාසුනේ 'ඒක හිතන්න එපා' කියන්නාක් බඳුවය.

"චන්දන."

කෙල්ල කතාකළේ වෙජිටබල් අංශයේ කොල්ලෙක්ටය.

"මිස්."

"මේ පොටේටෝ වේ කරගෙන එන්න චන්දන."

දේවක අර්තාපල් අල ටික දමාගෙන ඇත්තේ බර කිරාගන්නේ නැතුවය.

"මට ඒක අමතකවුණා මිස්."

දේවක සමාව ඉල්ලන්නට මෙන් කීවේය.

"වැරැද්ද අපේ සර්"

භාවනා විනීතව කීවාය. සීගිරි

එකට මේ අරගෙන ඇත්තේ ලංකා අල නොවේ. රට අලය. රට අර්තාපල් තැම්බෙන්නේ නැත. දේවක එය ගත්තේ නැතිකමටය. ඒත් වැලිමඩ අල ටිකක් ගෙනත් දැම්මානම් ෂෝක්ය.

බිලින් කරන අතරතුර භාවනා යන්තමට දෙනෙත් ඔසවා බැලුවාය. ඇය දැක්කේ දේවක බලාගෙ නම ඉන්නා අයුරුය. 'ඇයි එහෙම කරන්නේ. මාව බයකරනවනේ මේ පිස්සා.' ඇගේ දෙපතුල්වල සිට පටන් ගත් ගින්දරක් එහෙමම උඩට එන්නාක් මෙන් ඇයට දැනුණි. කැෂියර් මැෂිමේ බටින් පවා ඔබාග න්නට බැරිලෙස තමාව වෙව්ලන බව කෙල්ලට යන්තමට අවබෝධ විය.

දේවකට පිටුපසින් තවත් වියපත්

ගැහැණු කෙනෙක් ඇගේ ට්‍රොලිය තල්ලුකරගෙන ආවේය. කොල්ලාට නිකමට ඇයගේ ට්‍රොලිය දෙස බැලිණ. 'අනේ එයා එක්ස්පයි වෙච්ච බටර් කේක් එකත් දාගෙන. දැන් ගිහින් කයිනේ.' දේවක සිතුවේ දුකෙනි. හැම පාරිභෝගිකයෙක්ම කල් ඉකුත්වෙන දින බලන්නේ නැත. එහෙම කරන්නේ සුපර් මාර්කට් එක ගැන ඇති විශ්වාසයටය.

"මිස්."

දේවක භාවනාට කතාකළේ මෘදු පහත් හඬකිනි. භාවනාට පුදුම සිතුණි.

"ඔව් සර්."

කෙල්ලගේ හඬ එන්නේ උගුරෙන් මෙන්ය. 'මෙතන මොනවා කියයිද දන්නේ නෑ. බයෙත් බෑ'

"මේ මගේ පිටිපස්සේ ඉන්න මැඩම් බටර් කේක් එකක් දාගෙන ඉන්නේ."

"ඔව් සර්. ඇයි ඉතින්"

"නෑ මිස්. ඒ බටර් කේක් එක්ස්පයවෙලා තියෙන්නේ. දැන් දවස් තුනකට කලින්. මිස් බිලින් කරද්දී ඒක රිමූ කරන්න. හොඳ නෑනේ.. බිත්තර බේකින් පවුඩර් දාපු කෑම එක්ස්පය වුණාම පොයිසන් වෙනවා"

භාවනාට පුදුම සිතුණි. ඇය දෑස් ලොකුකරගෙන පිටුපස උන් කාන්තාවගේ ට්‍රොලිය දෙස බැලුවාය. 'බටර් කේක් එක්ස්පය වෙලාද? ඇයි එහෙනම් රැක්ස්වලින් අයින් කළේ නැත්තේ.' ඇය සිතුවේ ලැජ්ජාවෙනි.

"තැන්කියු කිව්වට. මම රිමූ

කරන්නම්."

භාවනා කීවාය. 'හරි පුදුම කෙනෙක්නේ. ඒක හිමිහිට මට කිව්වේ. කස්ටමර්ට කිව්වානම් ඉවරයි මෙතන. කෑගහනවා එක්ස්පය වෙච්ච බඩු දානවා කියලා. එයා එහෙම කළේ නෑ' භාවනා සිතින් කීවාය.

"ෆෝ තවුසන්ඩ් සෙවන් හන්ඩ්‍රඩ් ටුවෙන්ටි ෆයිව් සර්."

භාවනා ඔහුගේ බිල කීවාය. දේවක දුන්නේ ඔහුගේ ඩෙබිට් කාඩ් එකය. මේ කාඩ් එක දේවක ගත්තේ සල්ලි තියෙනවාට නොවේ. ඒත් මෙහෙම අප්පච්චී දෙන සල්ලි ටික බැංකුවට දමා ඉන් ගත් කාඩ් එකෙන් වියදම් කරන එක පහසුය.

භාවනා දේවක දුන් කාඩ්පත ගෙන බැලුවාය. කෙල්ලගේ දෑස්

ගියේ එහි වූ නම දෙසටය. 'දේවක පුංචි බණ්ඩාර. හරි ලස්සන නමක්' යුවතිය යන්තමට දෑස් ඔසවා යළිත් ඔහු දෙස බැලුවාය. 'බලන බලන වෙලාවට මං දිහා බලාගෙන ඉන්නේ. ගෑණු ළමයි දැකලා නැද්ද?' ඇයට අසන්නට සිතෙයි. ඒත් සිත යටින් දැනෙන මිහිර කුමක්ද කියා ඇය සිතුවාය. භාවනා කාඩ් එක පන්ච් කර ඔහුට අත්සන් කරන්නට පෑනත් සමඟ දුන්නාය.

"තැන්කියු සර්"

ඔහු අතට කාඩ් පත යළිත් දෙමින් භාවනා කීවාය. දේවක නෙත්පුරා ඇයව දැකගත්තේ සීගිරි එකෙන් යන නිසාය.

"යන්නම් මිස්."

"අගේන් සොරි"

භාවනා මෘදුව කීවාය.

"ඒක එච්චර හිතන්න එපා."

දේවක කියාගෙන ගියේය. භාවනා තොල්පට තදකරගෙන හුස්ම ටිකක් තදකරගෙන උන්නාය. 'එයා යන දිහාත් බලන්න මට හිතෙන්නේ මොකද?' ඇය සිතින් ඇසුවාය. කෙල්ල හැඟීම් මැඬගෙන උන්නේ අමාරුවෙනි. කාදෙසවත් මෙසේ බලාගෙන ඉන්නට මේ තාක් සිතී නැත.

දේවක සීගිරි එකේ කා පාක් එකට වී ටික වෙලාවක් සීගිරි එක දෙස බලාගෙනම උන්නේය. ඔහුගේ සිතට අද මොකක්ද විය.

"ඇයි මේ සීගිරි එක දැක්ක වෙලාවේ ඉඳලා මට හරි හුරුපුරුදු ගතියක් දැනෙන්නේ. ඒක එහෙම

වෙන්නේ ඇයි? ඔක්කොටම වඩා එයාව දැක්කවෙලාවේ ඉඳලා. ගොඩක් කල් දකින්න බලාගෙන උන්න කෙනෙක් දැක්කා වගේ හැඟීමක් අද හිතට ආවේ"

දේවක බඩු බෑග් ටික ඔසවාගෙ නම සිතුවේය.

"මං සීගිරි එකට ඉක්මනටම එනවා. සඳුදනේ ඉන්ටර්වීව් එක. බලමුකෝ එදාට"

දේවක සිතුවේය.

"කාගෙද දන්නේ නෑ මේ සිගිරි එක. එයාගෙන් අහන්නත් තිබුණා. ඒත් මොකටද?"

දේවක සීගිරි එකෙන් පිටවෙන්නට ප්‍රථම එය දෙස යළිත්වරක් බැලුවේය.

"කස්ටමස්ලා උතුරන

සුපර් මාර්කට් එකකට ගිහින් මට කරන්න දෙයක් නෑ. ඒත් මෙතන මට කරන්න දෙයක් තියෙනවා. ඒක චැලේන්ජ් එකක්. ඒ වගේ චැලේන්ජ් බාරගන්න මාත් ආසයි. ඒක කරන්න මට දෙනවානම් මම මේ කැෂියර් මැෂින් ළඟ අඩි දහයේ විස්සේ පෝළිම් මවනවා."

දේවක සිතින් කීවේය. එය පුදුමාකාර අභියෝගයකි. අභියෝගවලට දේවක කැමතියි. එක්තරා ජංගම දුරකථන සමාග මකින් දුන්නේ සිම් කාඩ් පත් හාරදහසක අභියෝගයකි. දේවක ඔහුගේ මිතුරන් දෙදෙනෙක්ද සමඟ දවස් දෙකෙන් සිම්කාඩ්පත් හත්දාහක් අලෙවි කලේය. ඒ මහනුවර ඇසළ පෙරහැර කාලයේය. ඒ වෙනුවෙන් දේවකට සෑහෙන

ලාභයක් ලැබුණි.

"එයා මං හිතන්නේ කැෂියර් එකේ හෙඩ්. ඒකනේ කැෂියර් කෙල්ලෝ ටික මිස් ගාගෙන ඉන්නේ."

දේවක සිතුවේ සිනාබරවය.

# 06

භාවනා සම්පූර්ණ කතාවම නේත්‍රා ළඟ රඟදක්වාම කීවාය. නේත්‍රා සිනාසුනේ දුකෙනි.

"අනේ පව් පැටියෝ කොල්ලා. හොඳ කොල්ලෙක් වෙන්න ඇති. නැත්නම් දෙකක් කියනවා ඔයාට."

නේත්‍රා කීවාය.

"මමනම් කියන්නේ හොඳම වැඩේ. මොකද මේ මම ළඟට වෙලා මං දිහාම බලාගෙන හිටියේ.

අක්කි කියන්නේ මෙන්න ඇස්දෙක. වෙජිටබල් සෙක්ෂන් එකේ ඉඳගෙනත් මිනිහා මං දිහාමයි බලාගෙන උන්නේ මං හොඳට බලාගෙන."

භාවනා කීවාය.

"ඉතින් සුදු කවුරුහරි බලන්නත් ඕනනේ. මෙච්චර ලස්සන කෙල්ලෙක් දිහා බලන්නේ නැත්නම් තමා පුදුම. එහෙමනම් කොල්ලට ලෙඩක් තියෙන්න ඕන"

නේත්‍රා කීවාය.

"වැඩක් නෑ අනේ එයා මැරිකරලා."

භාවනා සිනාව තදකරගෙන කීවාය. නේත්‍රා සිනාසුනේ යටිතොල හපාගෙනය.

"ඔයා බැලුවද වෙඩින් රිං එක දිහාත්."

"මං බලන්න ගිය වෙඩින් රිං එකක් නෑ අනේ. වයිෆ්ට ෂැම්පූ තේරුවා. අක්කා කියන්නේ අද කෙල්ල සෑහෙන බඩු ලිස්ට් එකක් දීලා කොල්ලට. කරපිංචා මිටියේ ඉඳලා ගෙන්න කියලා. එහෙම තමයි කෙල්ලෝ ඉන්න ඕන."

භාවනා කීවාය. නේත්‍රාට දුකය.

"අනේ මැරිකරපු දවසක එහෙමම කොල්ලට කරන්න එපා. මං කියන්නේ දෙන්නත් එක්කම යන්න. කොල්ලත් සතිය පුරාම මහන්සිවෙලානේ ඉන්නේ සුදූ. වීක් එන්ඩ් එකේ ඔයාගේ අතින් හදන තේ එකක් බීලා පත්තරයක් බලලා ඔයා වටේ කැරකි කැරකි ඉන්නත් කොල්ලා ආසයිනේ. එහෙම කොල්ලව රස්තියාදු කරන්න එපා."

නේත්‍රා කීවේ ආදරයෙනි. එහෙම

හිතන කෙල්ලටම මෙහෙම වුයේ ඇයිද කියා භාවනා සිතුවාය.

"හරි ඉතින් මම එහෙම ඉන්නවා තමා. කවුද දන්නේ එහෙම කැරකි කැරකි ඉන්න මැරිගෝ රවුන්ඩ් එකක් ලැබෙයිද කියලා. දෛවය එයනම් සුදු අපි නාඬමු කියලා බැඳගත්ත බෙරේ ගහන්නනේ වෙන්නේ."

භාවනා කීවාය. නේත්‍රා කෙල්ලගේ අතකින් අල්ලාගත්තාය.

"බබාට එහෙම වෙන්නේ නෑ. මගේ මස්සිනාව මම හිතේ ඇඳගෙන ඉන්නේ."

නේත්‍රා කීවාය. භාවනාගේ ඇස් ලොකු විය.

"කොයි වගේද?"

කෙල්ලට එය දැනගන්න ආසය.

"ම්. ටිකක් සුදුයි. ගොඩාක්ම

නෙමේ. ඒත් ලස්සන පාට"

"හරි"

"කෙට්ටුමත් නෑ."

"ම්. හරි. ගොඩක් කෙට්ටු කොල්ලන්ට මං ආස නෑ. පැන්සල වගේ"

"උසයි ටිකක්."

"හරි පොඩි හයිට් එකක් තියෙන්න ඕනනේ නේද? මාත් එක්ක යනකොට කොට කෑල්ලක් වගේ ඉන්නවට මම ආස නෑ. එයාගේ අත මෙහෙම අල්ලගෙන යන්න තියෙන්න ඕන."

කෙල්ල පෙන්වන්නේ ඔහුගේ බාහුවේ පැටලී යන ආකාරයය. නේත්‍රාගේ පපුව ආදරෙන් පිරී ගියේය. 'පච් කෙල්ල' ඇයට සිතෙයි.

"හරිම වැදගත් පාටයි. ඒත් කොල්ලා අහිංසකයි."

නේත්‍රා කීවාය.

“ගොඩක්”

“ම්. හැබැයි ස්මාට්”

‘එයා ඒ වගේමයි’ භාවනා සිතුවේ මොහොතකට කලින් සීගිරි එකේදී දුටු තරුණයා ගැනය.

“කතාකරනකොට හරිම පොලයිට්. අහගෙනම ඉන්න හිතෙනවා. මෙහෙම ඇස්දෙක දිහා බලාගෙන කතාකරන්නේ. ඇස්දෙක හරි කරුණාවයි. පොඩ්ඩක් මනමාල පාටක් තියෙනවා. නැත්නම් වැඩක් නෑනේ”

“ම්”

“ඉතින් අපි කොල්ලෙක්ව හොයාග මුකෝ එහෙම.”

නේත්‍රා හදිස්සියේ කීවාය. භාවනාගේ දෑස් කල්පනාබරව

බරවිය.

"එහෙම පිස්සෙක් නෑ අක්කා"

ඇය කීවේ දුක්බරවය.

"එයා එයි."

"නෑවිත්ම ඉඳීද කියලා කවුද දන්නේ"

"අම්මයි තාත්තයි ඔයාගේ මැරේජ් එක ගැන ඉඳලා හිටලා කතාකරනවා."

"අනේ මගේ."

"නැතුව මගේයෑ."

භාවනාගේ දෙනෙත් බරවිය.

"මං ආසයි ආදරේ කරලා මැරිකරන්න. අඳුනන්නේ නැති පිළිම වලට මම පූජාව තියන්නේ නෑ. දෙයියෙක් වුනත් ප්‍රබෝෂන් පීරියඩ් එකක් තියෙනවා. නැතුව බෑ අනේ"

කෙල්ලගේ කතාව ඇගේ පැත්තෙන් හරිම සාධාරණ කතාවකැයි නේත්‍රාට සිතුණි.

"ඒක ඇත්ත බබා. මම කරපු ගොන් වැඩ උඹ කරන්න එපා. ගොඩක් පිළිම හරි අපිරිසිදුයි තමයි. ඒක දේව පිළිමයක් කියලා දැනගෙ නම පූජාව තියන්න."

"අනේ මම ඔයාව රිද්දන්න කිව්වේනෑ."

නේත්‍රා ලස්සනට සිනාසුනාය.

"ඔයාට පිස්සු පැටියෝ. මට එහෙම රිදුනේ නෑ."

භාවනා නේත්‍රා ඉඳගෙන උන් රෝද පුටුව පාමුළ ඉඳගෙන නේත්‍රාගේ අතක් පිරිමැද්දාය. නේත්‍රා කෙල්ලගේ සුන්දර හිසකේ අතරින් ඇඟිලිතුඩු යැව්වේ ආදරයෙනි.

# 07

මල්ෂා උන්නේ ඇගේ මේසයට වී අයි පොඩ් එකත් කණේ ගසාගෙන සිංදු අසමිනි. සිංදු අසන එක හොඳ වැඩකි. ඒත් සීගිරි එකට කාර්යබහුල දවසක් වූ සෙනසුරාදා උදෑසන සියළු වැඩ නවතා අයි පොඩ් කනේ ගසාගෙන ඉන්නා එක පිස්සුවකි. භාවනා මල්ෂාගේ මේසයට ආවේ පෑන අතින් අරගෙනමය. කෙල්ල මේ එන්නේ පැය බාගයක් පමණ සීගිරි

එකේ රැක්ස් පරීක්ෂාකර බලාය.

සීගිරි සුපර් හී සේල්ස් සියයට හැටකින් පමණ පහත වැටී ඇති බව කාටත් වඩා දන්නේ භාවනාය. දවසේ කලෙක්ෂන් රිපෝට් හදන්නේ ඇයය. එහෙම වෙන්න බරපතල හේතු ඇත. ලොකුම හේතුව ඒ ඒ අංශ බාර දී ඇති අය තමන්ගේ වගකීම් ඉටුනොකිරීමය. ඉනුත් මල්ෂාත් මිහිරංගත් ප්‍රධානය. සේල්ස්වලට කෙළෙන්ම බලපාන්නේ ඒ අංශයය. ‘හරිනේ ඉතින් සේල්ස් ඩ්‍රොප් වෙන එක. එක්කෙනෙක් රස්තියාදුවේ. අනිත් එක්කෙනා අයිපොඩ් කණේ ගහගෙන එයාගෙම සිහින ලෝකේ’ භාවනා මල්ෂාගේ මේසයට ආවේ එසේ සිතමිනි.

“ගුඩ් මෝනිං මල්ෂා.”

භාවනා කීවාය. මල්ෂා භාවනා දෙස බැලුවේ අමුතුම බැල්මකිනි. 'කැෂියර් එකේ කෑෂ් ගහනවද කොහෙද? දවස ගානේ ලස්සන කිට් ගහන්නේ.' මල්ෂා සිතුවේ භාවනා ඇඳගෙන උන් වටිනා සල්වාර් ටොප් එක දෙස බලාය. ඒත් කෙල්ලට කියා මහ වියදම් නැත. ඇය ඇයට ලැබෙන පඩියෙන් ලස්සන දේවල් ගනී. කෙල්ල එහෙම ආසය.

"මොකක්ද කිව්වේ?"

මල්ෂා කෑ ගසමින් ඇසුවේ ඉයර්ෆෝන් එක කණේ ගසාගෙ නමය. එය කණේ ගසාගෙන සිටිද්දී කියන දෙයක් ඇසෙන්නේ නැත. කතාකරන්නේද සද්දෙටය.

"ගුඩ් මෝනිං කියලා කිව්වේ අනේ"

භාවනා සිතින් බණිමින් කීවාය.

"ආ ගුඩ් මෝනිං."

මල්ෂා ඇගේ ඉයර් ෆෝන් එක ගැලෙව්වේ දැන්ය.

"හින්දි සෝන්ග් එකක්ද ඇහුවේ."

භාවනා ඇසුවේ නිකමටය. ඇදේට කතාකරන්න ඇය කැමති නැත.

"නෑ ඉන්ග්‍රිලිෂ් නම්බ එකක්. මම හින්දි සෝන්ග්ස් අහන්නේ නෑනේ භාවනා. බෝරිං අඬවැඩියාවනේ"

භාවනා සිතින් සිනාසුනාය. ඇයනම් හින්දි සින්දු අහන්නට හරිම ආසය. මේ දවස්වල කෙල්ල අහන්නේ ටයිගර් සින්දාහේ චිත්‍රපටයේ 'කච්චි ඩෝරි යේ' සිංදුවය. එහි සල්මන්ගේත් කත්රිනාගේත් රංගනය පුදුමය.

"මම මල්ෂා මේ ටිකක් කතාකරන්න ආවේ."

භාවනා මල්ෂාගේ මේසය ඉදිරිපිට ඉඳගත්තාය.

"ස්ටෝස්වල ගොඩක් ප්‍රඩක්ට්ස්වල එක්ස්පය ඩේට් පැනලනේ. ඒවා රිටන් කරලත් නෑ."

භාවනා කීවාය. මල්ෂා භාවනා දෙස බැලුවේ කන්නට මෙන්ය.

"මගේ සෙක්ෂන් එකේ වැඩ ඇයි ඔයා හොයන්නේ භාවනා. මම ඒවා කරන විදිහක් තියෙනවා."

මල්ෂා කීවාය. භාවනා දෙනෙත් බරකරගත්තාය.

"හරි බබා. මම ඒක හෙව්වේ නෑ. ඒත් මේ කස්ටමස්ලා කැෂියර් පොයින්ට් එකට එනවා එක්ස්පය බඩු අරගෙන. එතකොට

බැණුම් අහන්නේ මගේ කෙල්ලෝ ටිකනේ කෙල්ලේ."

භාවනා කීවේ ආදරයෙනි. ඇය කාත් සමඟවත් ප්‍රශ්න හදාගන්න කැමති නැත. සීගිරි එක යනු හැමෝටම අයිති දෙයකි. ඒ බව ඇය දැනගෙන උන්නාය.

"මට ස්ටාෆ් මදි මේ ප්‍රඩක්ට් දහ දොළොස් ද්‍රාහක් චෙක් කරන්න. මම සීයට කියන්න ඉන්නේ. මට වෙන සෙක්ෂන් එකක් දෙන්න කියලා. මේක මල වදයක්. උදේකට ඇඳුමක් ඇඳගෙන ස්ටෝස්වලට යන්න බෑ ගඳයි."

මල්ෂා කීවාය. භාවනා දෙනෙත් බරකරගෙන උන්නාය. 'එයා ඉල්ලන්න යන්නේ කැෂියර් සෙක්ෂන් එක හරි අමාරුවෙන් ඉන්නේ මම මේ

සෙක්ෂන් එක කරනවට. මම ඉල්ලලා ගත්තේ නෑනේ. මම කරන්නේ මට දුන්න දේ' ඇය සිතින් කීවාය.

"කොහොමත් ටිකක් බලන්න වෙයි මල්ෂා. කන්සියුම එකෙන් හරි පී එච් අයිලා හරි පැන්නොත් අපිට ටිකක් අමාරුයි. යෝගට් ප්‍රශ්නෙට වෙච්ච දේ මතකයිනේ. නේද"

භාවනා සිහිකළාය. සුපර් මාර්කට් එකක් කරද්දී පරිස්සම් වියයුත්තේ ඒ නිසාය.

"දැන් භාවනාව මගේ වැඩ බලන්නත් අපොයින්ට් කරලද ඉන්නේ. ඒක කියන්නකෝ මට."

කෙල්ලට කට උත්තර නැතිවිය. 'මේක අපි හැමෝගෙම. ඇයි ඒක හිතන්නේ නැත්තේ'

"මල්ෂා මාව මිස්අන්ඩර්ස්ටෑන්ඩ්

කරලනේ. මම කිව්වේ කැෂියර් එකට එක්ස්පය බඩු එනවා කියලා. ඒක හොඳ නෑ. අපි බල බල අයින් කරනවා. ඒත් එළියට ගියොත් බබා. හිතන්නකෝ."

භාවනා කීවේ කරුණාවෙනි.

"මං ඒක බලාගන්නම්. ඔයා ඔයාගේ සෙක්ෂන් එක බලාග න්නකෝ. ස්ටාෆ් අතින් පොඩි පොඩි වැරදි වෙනවා. කැෂියර් සෙක්ෂන් එකේ ඔයාගේ කෙල්ලෝ අනන්තවත් බිල් වරද්දන්නේ. නේද? කස්ටමස්ලගේ ක්‍රෙඩිට් කාඩ්වලින් රුපියල් පන්දාහට පනස්දාහක් ගහන්නේ. අපිටත් කස්ටමස්ලා කෑගහනවා ඇහෙන්නේ ඔය. මම ආවේ නෑනේ ඒක බලන්න."

මල්ෂා ගැසුවේ කෙල්ලටය.

භාවනා තර්ක කරගෙන ගියේ නැත. ඇය නැඟිට්ටේ කතාකර තේරුමක් නැති බව දැනගෙනය. 'ජීවිත කාලෙම සීගිරි එකේ රස්සාව කරන්නනම් බෑ. දවසක මම සීයට කියලා අයින් වෙනවා.' භාවනා සිතුවාය.

"සොරි."

භාවනා මල්ෂා ළඟින් ගියේ එසේ කියාගෙනය. අඩි දෙක තුනක් යන්නට පෙර ඇගේ දෑස් මොකක්දෝ හේතුවක් නිසා තෙත්විය.

*** *** *** *** ***

සීගිරි එකෙක් ගෙන ආ බඩු අස්කර දේවක නාගන්නට ගියේය. දවාලක නාගන්නවානම් හොඳම

තැන ඉඩම පහළ ඇති පොඩි ළිඳය. එය ඇත්තේ ගේ කෑල්ල පිටුපස වූ කුඹුර අද්දරමය. අතින් ගන්නට හැරිතරම් වූ මේ පුංචි ළිඳ මේ නිවසට ආ මුල්ම දවසේම කොල්ලාගේ සිත්ගත්තේය. දේවක කොට කළිසම ඇඳගෙන තුවායද කරේ දමාගෙන නාන්නට ගියේ භාවනා සීගිරි එකේදී තෝරාදුන් ආයුර්වේද ෂැම්පූ එකද අරගෙනමය. එය දකිද්දීත් කොල්ලාට සිහිවූයේ ඇයවය.

"මේ පාරත් එක්ක දෙසිය වතාවක් විතර එයාව මතක්වුනාණේ. ඇයි ඒ? මේක මාර වැඩක්නේ"

දේවක සිතුවේය.

"අනේ මන්දා. ළඟටත් ලස්සනයි දුරටත් ලස්සනයි. කතාකරනකොටත්

ලස්සනයි බලනකොටත් ලස්සනයි. සීගිරි එකත් හරි කෙල්ලත් හරි."

දේවක සිතුවේය.

කුඹුර වටේ යන පුංචි දොළ පාර නිසා ළිඳේ වතුර උතුරයි. නිල් කැටේට ඇති වතුර ටික දකිද්දී දේවකට හරි ආසාවක් ආවේය. ඔහු වතුර බාල්දි සීයක් පමණ එක දිගට දාගත්තේය. සනීප එවිටය. කවුරුු හෝ ළඟ ඉඳගෙන උන්නානම් එයාවද නාවන්නට තිබුණා කියා දේවකට සිතුණි. 'මම ඉතින් නාවන්නේ කාවද? බලු පැටියෙක්ව තමයි හොයාගන්න වෙන්නේ නාවන්න' තමාට සිතුන දේ ගැන පසුව දේවකටම සිනාය.

ඇය කිව්වා හරිය. ඇය තෝරාදුන් ආයුර්වේද ෂැම්පූ එක

හරි සුවඳය. නියම ආයුර්වේද බෙහෙත් සුවඳය. එය ඉන්දියාවේ නිෂ්පාදනයකි. 'එයත් ගාන්නේ ඒකද දන්නේ නෑ.' දේවක සිතුවේය. 'දැන් දෙසිය එක් වතාවයි' ඔහු ඇයව සිහිවෙන වාරගණන ගණන් කරයි. 'ඇයි එයා මගේ බිල් එක එයාම දැම්මේ හැබැයි පට පට ගාලා බිල්කළා හොඳ පැක්ට්‍රිස් එකක් තියෙන්නේ. ඇඟිල්ල නිකම් මැෂිමක් වගේ කී බෝඩ් එකේ ගියේ. එයා බිල් කරනවා කියලා දන්නවානම් රුපියල් දෙකේ තුනේ හරි බඩු හැටක් හැත්තෑවක් ගන්නවා. ටික වෙලාවක් එතනට වෙලා ඉන්න හිතාගෙන' එහෙම හිතෙන හිත ගැන දේවකට පුදුමය.

"නුවරදී හරි අමාරුවෙන් සන්සුන් කරගෙන හිටපු හිත සීගිරි එකේදී

හොල්ලගත්තා එහෙනම්. සෙංකඩගල කුමාරිහාමිලා ළඟත් නොසෙල්වෙච්ච දේවකගේ ශ්‍රෑම් තුන්සිය පනහේ හදවත"

දේවක සිතුවේය.

"පිස්සු කෙල්ලෙක් හිතාගෙන ඉන්නේ මම මැරිකරලා කියලා. ඇත්තනේ. මෙච්චර බඩු උස්සගෙන කොල්ලෝ සුපර් මාර්කට් යන්නේ නෑනේ. ගියා බයිට් පැකට් එකක් ගත්තා ෂේවින් ක්‍රීම් එකක් ගත්තා ආවා"

දේවක සිනාසුනේ ළිඳේ දිය මතුපිට ඇඳුන තමාගේම රුව දෙස බලාගෙනය. ළිඳ අසළ වූ විශාල අඹ ගහේ කොළ අතරින් හිරු එළිය යන්තමට ළිඳට වැටී ඇත. ලස්සන ඒ නිසාය. 'කාළෙක මේ ඉඩම

ගන්න තියේනම් ෂෝක්. අප්පච්චිට කියන්න ඕන. මොනවා කරන්නත් මාත් රස්සාවක් කරන්න ඕන. දැන් ඇති ටෙම්පරි වැඩ කළා.' දේවක සිතුවේය. අලෙවිකරණ උපාධිය ගත් දවසේ සිට ඔහු කළේ තාවකාලික වැඩය. අන්තිමට දේවක සේවයකළේ දුරකථන සමාගමක මහනුවර සේල්ස් ප්‍රමෝෂන් ටීම් එකේය. ඔහු ඔහුගේ ටීම් එකත් සමඟ එක්ව මහනුවර පමණක් දුරකථන සම්බන්ධතා දාහතර දහසක් අලෙවි කළේය.

නාගෙන එද්දී හරිම බඩගිනිය. කොල්ලා දවල්ට උයන්නේ නැත. එකපාරම උයන්නේ රෑටය. දවල්ට කන්න ඉන්නේ තමා පමණකි. ඒ නිසා දේවක සීගිරි එකට ගොස් ආවේ බත් පැකට් එකකුත් අරගෙනමය.

තට්ට තනියම බත් පැකට් එකක් දිගහැරගෙන කන්නට යද්දී දේවකට පුංචි දුකක්ද ආවේය.

"හරි පාළුයි. පට්ට පාළුයි. මේකත් ජීවිතයක්ද බං"

ඔහු තමාටම කියාගත්තේය.

මේ පාළුව දැන් ටික දවසක සිට ඕනවටත් වඩා දැනෙයි. වඩාත්ම පාළු මේ දවල්ටය. අප්පච්චී ද නැත. කොල්ලා කන්නේ තනිවමය.

කොළඹ බත් පැකට් කනවා තියා හිතන්නවත් අමාරුය. පරිප්පුත් එක පාටය. මෑකරලුත් ඒ පාටමය. වට්ටක්කාත් ඒ පාටමය. කන්නට හිතෙන්නේ නැත. දේවක බත් එක එහෙමම අකුලා දමා නැඟිට්ටේය.

"සීනි බනිස් එකකුයි කෙසෙල් ගෙඩියකුයි ගෙනත් කාලා

ප්ලේන්ටියක් බිව්වානම් මීට වඩා හොඳයි.”

ඔහු සිතුවේය. තව ටිකකින් තේ එකක් හදාගෙන බොනවා කියා ඔහු සිතුවේය.

“ඉක්මනට රස්සාවකට යන්න තියෙනවානම් හොඳයි උදේ නැඟිටලා ගහනවා බත් දෙකක්. අප්පච්චිටයි මටයි. කෙහෙල් කොලේක ගහලා. නියමයි”

දේවක සිතුවේය.

“සීගිරි එකෙන් මාව ගන්නවාමයි කියලා අප්පච්චි කියන්නේ කොහොමද? මොකක්ද අප්පච්චිගෙයි සීගිරි එකෙයි තියෙන සම්බන්ධය.”

එතන කුමක් හෝ ඇත. අප්පච්චී රෑටවත් කියනවානම් හොඳය.

“රෑට කියනවා කිව්ව කතාව

මොකක්ද? ඒ කතාවයි සීගිරි එකයි අතර තියෙන සම්බන්ධය මොකක්ද?"

එහෙම හිතන්නට පුළුවන් හෝඩුවාවක්වත් දේවකට හිතෙන්නේ නැත.

"ඒත් අප්පච්චි සීගිරි එකට යන්න ලොකු හේතුවක් අද මට ඇතිවුණා. යනවමම තමයි."

දේවක සිහිකළේ ඇයවය. කොල්ලාට හිතෙන්නේ හවසත් ටිකක් සීගිරි එකට යන්නටය. එහෙම ගියහොත් තමා ගැන සැක හිතන බව දේවක දනී. ඒත් හදවතට දැනෙන මේ නුහුරු නුපුරුදු හැඟුම හදවතෙන් අඩක්ම ගිලගෙන ඇත.

"හවස පහට හයට සීගිරි එක ළඟට ගියානම් එයා ඕෆ්වෙන වෙලාවට. කෙල්ලව බලාගන්න

තිබුණා. රෑ වෙනකල් ඉන්නේ නැතුව ඇති. සමහරවිට කොල්ලා එනවත් ඇති කෙල්ලව ගන්න.”

ඒත් සමඟම දේවකගේ පපුව ඇකිලීගෙන මෙන් ගියේය. ‘එච්චරම ලස්සන මලක් තනියම ඉන්නවා කියලා හිතන්නත් බෑනේ. මට වගේ කී දෙනෙක්ට එයාව දැකලා හාට් ඇටෑක් හැදෙන්න ඇත්ද? මීට කලින් සීගිරි එකට යන්න තිබුනේ.’ ඒත් දෛවය කියා දෙයක්ද ඇති බව දේවක දනී. ‘දෙයක් ඔයාට ලැබෙනවානම් පුංචි මහත්තයෝ එක ලැබෙයි. කොච්චර බාධක අවහිරතා තිබුණත් ඒක ඔයාටම ලැබෙනවා. නොලැබෙන දෙයක්නම් ඔයා කොච්චර වලි කෑවත් ඒක ලැබෙන්නේ නෑ ඒ ලෝකේ හැටි.’ ජීවන් කොල්ලට කියා දී ඇත.

"මොක වුණාත් මම සීගිරි එකට යනවා. මේ සීගිරි එකයි මායි අතර මොකක්හරි සම්බන්ධයක් තියෙනවා. ඒක අද මට හිතුණා. මට එතන හාස්කමක් කරලා පෙන්නන්න වෙනවා"

ඒ හාස්කම තමාට කරන්නට පුළුවන් බව දේවක පුංචි බණ්ඩාර දනී.

"අමතක කරන්න බැරිදෙයක් සීගිරි එක ඇතුලේ මවන්න පුළුවන් උනොත් සේල්ස් හදන්න පුළුවන්. කතරගම ඉඳලා කොළඹට කඩ සාප්පු දහස් ගාණක් තියෙනවා. ඒත් කතරගම යන මිනිස්සුන්ගේ හිතේ මතක තියෙන්නේ දොදොල් කඩ ගැන. ඇයි ඒ?"

කළ යුත්තේද එයම කියා ඔහුට

සිතෙයි. ලස්සන රාක්කවලින් මිනිස්සුන්ව ගෙන්වා ගන්නට නොහැක. හැම තැනම ලස්සන රාක්ක ඇත. ලස්සන කූල් කබඩ් ඇත. ලස්සන යුවතියන් කැෂියර්වල ඇත. ඇතුළ සීත කළ පමණින් කිසිවෙක් එන්නේද නැත.

දේවක ඒවා මේවා සිතමින් ගේ කෑල්ල අස්කළේය. ගඩොල් බිත්තිවලින් සැදුම්ලත් මේ ගේ කෑල්ල එහෙමම කියා අස්කරන්නට ඕනද නැත. සාලයට ඇත්තේ හතර වටින්ම හායි කියා ඇරුණු කෑල්ලකි. එහි ඇත්තේ ගඩොල් බිත්ති හතර පමණි. තවම දොර ජනේලවත් සවිකර නැත. බිමට ඇත්තේ කටු සිමෙන්තිය. දේවක මේ ජීවිතයට ආසය. සාලයේ දමා ඇති පොඩි පුටු සෙට් එකේ වාඩිවූ විට වායු

සමීකරණය කළ නිවසක ඉන්නාක් මෙන් සිසිල්ය. අවට වෙල් යාය පිසගෙන එන සුළඟ එහෙමම නිවසට ඇතුල්වෙයි.

"ඉන්ටර්වීව් යන්න ඇඳුමක් ගන්නත් ඕන. තියෙන ඒවා ඔක්කොම පට්ට ගහලා තියෙන්නේ. හෙටම ගන්නවා."

දේවක සිතාගත්තේය.

# 08

භාවනා ඇගේ පුටුවෙන් නැඟිට්ටේ එක දිගට පැය දෙකක් පමණ වැඩකරය. පැය දෙකක කාලයක් තිස්සේ ඇය කළේ වැඩ කරනවාට වඩා කල්පනා කරන එකය. කවදාවත් එහෙම වී නැත.

"කොහෙද එක පිස්සෙක් ඇවිත් දවසම අවුල්කළා. බෑන්ක් ස්ලිප් ටිකවත් හරියට චෙක්කරගන්න ලැබුනේ නෑ"

ඔහුවම මෙහෙම සිහිවෙන එකේ තේරුම මොකක්ද කියා භාවනා සිතුවාය. 'ඇත්තටම එයා මැරිකරලද' ඇය සිය වතාවක් පමණ එසේ සිතුවාය. 'එහෙම නැතුව කොල්ලෝ මොකටද මෙහෙම බඩු ගන්න එන්නේ. කරපිංචා මිටිය පවා ගත්තේ.' ඇය අභ්‍යන්තර දුරකථනයෙන් නේත්‍රාව ඇමතුවාය.

"අක්කී ලන්ච් ගමුද? බඩගිනියි."

කෙල්ල කීවේ හුරතල්වය. අම්මා කෑම එවා දැන් පැයකට වැඩියි. ඉඳුනිල් කෙල්ලෝ දෙන්නාට කෑම එවන්නේ ලස්සන පිඟන් දෙකක දමා එය සර්වියට් එකකින්ද බැඳය.

"කමු බබා. මං චීත් බැලුවා මොකද අද බඩගිනි නැද්ද කියලත්."

"වැඩ අනේ."

භාවනා කීවාය. ඇය ලන්ච් ගන්නේ නේත්‍රාගේ මේසයට පැමිණාය. අක්කා ඉන්නේ රෝද පුටුවක් මතය. මේ ජීවිතයේ ඇය දකින්න ආසම නැතිදේත් ඒකය. නේත්‍රාට මේ අනතුර වෙද්දී භාවනා උන්නේ සාමාන්‍ය පෙළ පන්තියේය. කෙල්ල පාසලේ සිට නවලෝක රෝහලට ආවේ සිහියක් නැතුවය. ඒ දවස් භාවනා සිහිකරන්න පවා කැමති නැත. අක්කාව විවාහ වුයේ නගරයේ ඇති කා සේල් හිමිකරුවෙක්ගේ පුතෙක් සමඟය. ඇගේ ජීවිතයම අඳුරු කළේ ඔහුය. කොළඹ නවලෝක රෝහලෙන් නේත්‍රා ආවේ රෝද පුටුවකිනි. ඊටත් මාස දෙකකට පසු ඇය ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයෙන් දික්කසාදය රැගෙන ආවාය. එදා සිට අද දක්වා නේත්‍රා

ගතකරන්නේ ඇයටම වෙන්වූ පාළු ලෝකයකය. ඇගේ දුක යම්තරමකට අඩුවූයේ මේ සීගිරි එකත් ඇයගේ බාල නංගී භාවනාත් නිසාය.

භාවනා නැඟිට්ටේ ඇගේ ජංගම දුරකථනයත් වතුර බෝතලයත් කෑම එකත් රැගෙනය. බත් එක දකිද්දී කෙල්ලට අම්මා ගැන දුක සිතුණි. ඇය ලන්ච් එක එවන්නේ පේ වී මෙන්ය.

භාවනා එද්දී නේත්‍රා පුංචි කොකා කෝලා බඩී බෝතලයක්ද ගෙනවිත් තබාගෙන උන්නාය. ඒ භාවනාටය. ඇය ලන්ච් ගන්නේ මෙහෙම මොනවාහරි බොම්නි. එය දැක භාවනාට දුක සිතුණි. 'මේ ලෝකෙම ඉන්න අක්කලාත් හරි මගේ අක්කත් හරි' ඇයට එය නිතරම සිතෙයි.

"අද කෙල්ල හරි අමුතුයි."

භාවනා ඉඳගනිද්දීම නේත්‍රා කීවාය.

"ඒ ඔයාට පේන හැටි අනේ."

"පේන හැටි තමයි. අර කොලු පැටියව මතක් වෙනවද?"

නේත්‍රා කියද්දී භාවනාගේ දෙපතුල් සීතලවීගෙන ගියාය. 'අක්කා කොහොමද ඒක දන්නේ'

"යන්න අනේ යන්න. ඒ කොලු පැටියෙක්යෑ. කිඹුල් පැටියෙක්නේ"

නේත්‍රා සිනාසුනාය. 'පව්. කෙල්ල දවසක හරි ලස්සනට ආදරේ කරයි. හොඳ කොල්ලෙක් ලැබුනොත් හොඳයි. මට වෙච්ච දේවල් කෙල්ලට වෙන්න දෙන්න බෑ. අහිංසක කොල්ලෙක් එන්නෝන කෙල්ලගේ ජීවිතේට. පණ වගේ ආදරේ කරන'

නේත්‍රා සිතුවාය.

"පව් අම්මා අද සොසේජසුත් බැදලා එවලා."

"ඒ බබාට."

නේත්‍රා කීවාය. භාවනා බත් කන්නට පෙර කොකා කෝලා උගුරු දෙක තුනක් බීවාය.

"අද නන්දා බැඳුමක් හදලා නෑ අනේ. කී දවසක් කිව්වද එයාට"

කෙල්ල මේ බණින්නේ නිවසේ උයන්නට ඉන්නා නන්දාටය. දවල් බත් එකට බැඳුමක් නැත්නම් කෙල්ල කන්නට කැමති නැත. පුංචි දවස්වල සිට ඇයට එහෙමය.

"හැමදාම හදන්න බැඳුම් කොහෙද බබා. අනික තෙල්නේ. එහෙම කන්න හොඳත් නෑ."

කෙල්ල මුහුණ ඇඹුල් කරගනී.

"චූටි කරවල කෑල්ලක් තෙල් දැම්මා නම් ෂෝක්."

භාවනා කීවාය. නේත්‍රාට දුකය.

"මම අම්මට කියන්නම්."

"පෙරේදා කෙල්ලෝ ටික කනවා බත් මුලක්. ගමේ ගිහින් එන ගමන් ගෙනත්. ඒකේ ෂෝක් කරවල බැඳුමක් තිබුණා. ලූණු ගොඩක් දාලා. මුන් ටික වටවෙලා කනවා පෙරේතකමට. මට ගහන්න හිතුණේ."

භාවනා කීවාය.

"අපි අද යනකොට කරවල ටිකක් අරන් යන්."

භාවනා බැලුවාය.

"අක්කී."

"බබා."

"මං දෙයක් අහන්න උන්නේ."

"අහන්න."

"ගොඩක් බඩු අපි ළඟ නෑනේ දැන්. ඇයි ඒ. දැන් සෝප් ගත්තොත් ෆා නෑ. පාමොලිව් නෑ. ඩව් නෑ. ෂැම්පූ ගත්තොත් පැන්ටීන් නෑ. ගානියර් නෑ. මේ ලෝකල් ෂැම්පූ සෝප් ටිකක් විතරයි තියෙන්නේ. ෆුඩ් අයිටම් ගත්තොත්."

නේත්‍රා භාවනා කියාගෙන ආ දේ නැවැත්තුවාය.

"ඇත්ත බබා"

"ඇයි ඉතින් ඒ"

"කෝ සප්ලයර්ස්ලට දෙන්න කෑෂ්. දැනටමත් චෙක්ස් ලක්ෂ හතළිහක විතර හිරවෙලානේ. ඩේලි කලෙක්ෂන් එන්න එන්න අඩුවෙනවා. අලුත් සප්ලයර්ස්ලා ඉන්නවා. ඒත් අපි ටිකක් හිරවෙලා ඉන්නේ. අනික

මිහිරංග. එයා තියෙන විදිහටවත් පර්චසින් ලිස්ට් එක හදන්නේ නෑ. ඒක පැත්තක තියමු. මටහරි බලලා ගන්න පුළුවන්. ඒත් කෑෂ් කෝ"

භාවනා සුසුමක් හෙළුවාය.

"ඇයි මේ ඉතින්."

"මටත් හිතාගන්න බෑ."

"උදේ සියත් මට කිව්වා. සේල්ස් ප්‍රමෝෂන්වලට කෙනෙක්ව ගන්නවත් කිව්වා."

නේත්‍රා හිස වැනුවාය.

"වටේම සුපර් මාර්කට් පිරිලා බබා ඒවා දාන්නේ හතු පිපෙනවා වගේ. අපේ කස්ටමස්ලා ඒවට ගිහින්."

"ඒත් අපිට මෙහෙම."

නේත්‍රා ඇයගේ පිඟානේ තිබූ සොසේජස් එකද කෙල්ලට දැම්මාය. කෙල්ල ඇගේ සොසේජස් දෙකම

කාලා ඉවරය.

"අපේ කස්ටමස්ලා ආයෙත් අපි ගාවට ගෙන්න ගන්න ඕන. එයාලා මාසෙකට අපෙන් දහ පහළොස් දාහක බඩු ගත්තා."

"දැන් රුපියල් හත් අට දාහක් බිලක් වැටෙන්නේ කළාතුරකින් අක්කි. මම බිලෙන් බිල චෙක්කළා. බිල් ඔක්කොම දාහට අඩුයි"

භාවනා කීවේ දුකෙනි.

"මලීෂයි මිහිරංග අයියයි එයාලගේ සෙක්ෂන් හරියට බලන්නේ නෑ. මට කියන්නත් බෑ. කිව්වාම ඇඟට කඩාගෙන පනිනවා. අපේ සෙක්ෂන්වලට ඇඟිලි ගහන්න එපා කියලා. අද අර බෝයි කිව්ව දෙයක් අක්කා දන්නවද?"

භාවනා කල් ඉකුත්වූ කේක් එක

ගැන කතාව නේත්‍රාට කීවාය.

"අනේ හොඳ කොල්ලෙක් එහෙනම්."

"මටත් හිතුනා. කස්ටමර්ට කිව්වානම් ඉවරයි අපි මෙතන."

"ස්ටෝස්වලින් මට හරි වාර්තාවක් ලැබෙන්නේ නෑ බබා. සීයට මේවා කියන්නත් බෑ. ෆුල් චිකන් ෆ්‍රීසර්වල කිලෝ හාරසීයක් තියෙද්දී ඊයේ මම තවත් ෆුල් චිකන් දෙසීයක් ඕඩර් කළා. සමන් ඇවිත් ෆ්‍රීසර් ෆුල් කියලා කියනකොටයි මාත් දන්නේ. රිටන් කරන්නත් බෑනේ. එයාලා ගේන්නේ හලාවත ඉඳලනේ චිකන්. ගන්න වුණා."

නේත්‍රා දුක්බරව කීවාය.

"සීයා කියන්නේ ඇත්ත. සේල්ස් ප්‍රමෝෂන් කරන්න ඕන. ඒකට මිලියන

ගණන් ඇඩ් දාන්න අපිට බෑ."

"ඊත් අක්කේ මැජික් කාරයෙක් එන්නේ නෑනේ එයා ආපු ගමන්ම සේල්ස් සරුංගලේ වගේ උඩ යන්න. නේද?"

භාවනා කීවාය.

"සමහරු එහෙම කරනවා බබා. හාස්කම් කරනවා. අපි බලමුකෝ."

"අනේ මන්දා. දවසකට ටෙන් තවුසන්ඩ් විතර සේල්ස් බහිනවා. ඒක නගින්නේම නෑ."

නේත්‍රා බලාගෙන උන්නේ කෙල්ලගේ නිය දෙසය.

"අලුත් පාටක් ගෑවද?"

කෙල්ල සිනාසුනාය.

"මී. ලස්සනද?"

"අපි දවසක ෆෙන්ච් මෙනිකියු එකක් කරමු. මී."

ෆෙන්ච් මෙනිකියු එකක් කරන්නට භාවනාටත් ආසය. ඒත් මේ සීගිරි එකට ආ පසුව සැලෝන් එකකට යන්න නිවනක් එන්නේ කළාතුරකිනි.

"දවසක අපි දෙන්නම ගිහින් කරගමු. මී."

"අනේ පැටියෝ. මට මොන ෆෙන්ච් මෙනිකියුද?"

එහෙම කියද්දී භාවනාගේ පපුවම ඇකිලීගෙන යයි. 'ජීවිතේ කිසිම බලාපොරොත්තුවක් නැතුව ඇති.' ඇයට සිතෙයි.

"ඇයි එහෙම කියන්නේ. ජීවිතේ ලස්සන එක්කෙනෙක්ට අරගෙනම යන්න දුන්නද?"

භාවනා ඇසුවාය. නේත්‍රා ඇස් බරකරගෙන බත් ඇට පොඩි කළා මිසක කිසිවක් කීවේ නැත.

"පැණි කජු කප් එකක් ගෙනත් දෙන්නද?"

සියල්ල අමතක කරන්නට මෙන් නේත්‍රා ඇසුවාය. භාවනාට දුකය. ජීවිතය ගැන හැමදාම කතාකරද්දි නේත්‍රා මෙහෙමය. ඇය ඕනවට වඩා අසුබවාදීව ඇයගේ නංගිලා දෙන්නා සමඟ ජීවිතය ගැන කියවන්නේ නැත. කෙල්ලෝ දෙන්නා තාම පිපෙන්න හැදුවා පමණි. එහෙම කෙල්ලෝ දෙන්නාට ජීවිතය එපාවෙන තැනට කිසිවක් කියන්නට නොහැක.

"අද එපා. මම ස්වීට් කනවා වැඩියි. දැන් සීයට වගේ මටත් ඩයබිටික් එනවා කොයි වෙලාවක හරි."

නේත්‍රා සිනාසුනාය.

# 09

දේවක රෑට උයන්න ගත්තේ හවස හතරට පහට පමණය. අප්පච්චී එද්දී හය හත වෙන බව දේවක දනී. අලුත් සයිට් එකක වැඩ බලද්දී එහෙමය.

"රස්සාවකට යන්න ගියාට පස්සේ තමයි වැඩේ. මාත් එනකොට හය හත වෙනවා. ගාණක් නෑ. ඇවිත් මොනවාහරි හදනවා. අප්පච්චී වේලාසන ආවොත් අප්පච්චී මොනවාහරි හදයි."

දේවක කන්න ආසම අප්පච්චී හදන මස් කරියය. ඔහු ඒකත් සමඟ හරි රස පරිප්පු එකක් හදයි. ඔහුගේ ළමා වියේ ඔහු වැඩිපුරම කා ඇත්තේ මේ කුකුල් මස් කරියත් පරිප්පු කරියත්ය. ජීවන් කොල්ලට දෙන්නම කියා කුකුල් මස් ටිකක් ගෙනවිත් තියාගෙන උන්නේය. ඔහු එය එක එක විදිහට කොල්ලාට හදා දුන්නේය.

"සීගිරි එකේ තියෙන හාල් නම් ගන්න දෙයක් නෑ. කොච්චර හාල් වර්ග අද තියෙනවද? එක සම්බා කැකුළු එකක් නෑ. රතු කැකුළු සම්බා එකක් නෑ. අඩුම ගානේ හොඳ සම්බා හාල් එකක්වත් නෑ. තිබුන රතු කැකුළු හාලත් හරිම පරණයි ඇට කැඩිලා. කස්ටමස්ලා දෙන්නෙක්ම හාල් අතගාලා යනවා මම බලාගෙන."

දේවක සිතුවේය. ඔහු උයන්න ගියා ගත්තේ පොඩි සැමන් එකක් සමඟ පරිප්පු ටිකකි. මෙහෙම බැඳුමක් හදාගත් විට ලේසිය. රෑකට එළවළු කන්න අමාරුය. ඇරත් කොල්ලාට රසටම හදන්න පුළුවන් බැඳුම්ය. පරිප්පු එක රසටම හදන්නට ජීවන් දේවකට කියා දී ඇත. එහෙම දෙකක් හදාගත්විට රෑට බත් ටිකක් කන්න පුළුවන. දේවක පොඩි සැමන් එක කඩා එහි ඇති දියර බේරා කෑලි ටික දීසියකට දැම්මේය. පසුව එයට දෙහි ඇඹුල් ටිකක් දමා පැත්තක තැබුවේය. පරිප්පු ටික සෝදා එය ලිපේ තැබුවේ ඊටත් පසුය.

දේවකට ආයෙත් සිහිවෙන්නේ සීගිරි එකේදී දුටු යුවතියවය.

"ඔයා හිතන් ඉන්නේ මම මැරිකරලා කියලා. ඒකනේ ෂැම්පු එක තෝරලා දෙද්දි කිව්වේ මේකට වයිෆ් ආසවෙයි කියලා. පිස්සු කෙල්ලෙක්. මාව දැක්කහම පේන්නේ මැරිකරපු කෙනෙක් වගේද?"

මෙහෙම හිතන තමාත් දවසක බළිදියි කියා දේවක සිතුවේය.

"ලේසි නෑ පුංචි නෝනා කෙනෙක්ව හොයාගන්න එකනම්. මේ පට්ට පාළු ජීවිත කතාව එහෙම වෙනස්කරලා ලියන එක ලේසිවෙන්නේ නෑ. අපි නොදන්න ලව්"

ඒත් ජීවිතයට කවුරු හෝ එනවානම් හොඳය. ඒ තරම් පාළුය.

"එහෙම ආවනම් මේ වෙලාවට උයන්නේ එයා. මම මේ කුස්සි කෑල්ලට වෙලා කෙල්ල එක්ක කයියක්

දාගෙන ඉන්නවා. සැන්දෑ වළාවන් පා වුණාවේ...කුස්සියේ මා තනිවූ වේලේ. ඇය එන්නේදෝ. මඟ එන්නේදෝ”

තමාට හිතෙන දේවල් කියා දේවක තනිවම සිනාසුනේය.

“මේ දුප්පත් ජීවිත කෑල්ලට එන කෙල්ලෝ.”

පසුව ඔහු සිතුවේය.

“අප්පච්චියි මායි ගෙවන මේ ජීවිතේ එක අතකට සැපක්.”

බොම්බයිළූණු ගෙඩි තුන සිහින්ව ලියා ඔහු ඉන් ටිකක් පරිප්පු තෙම්පරාදුවට තැබුවේය. සැමන් බැඳුමට අමු මිරිස් දැමිය යුත්තේ දිග අතට පලාය.

“වෙජිටබල් සප්ලයර්ස්ලා ඔහේ ගෙනත් දෙන දේ රැක්ස්වලට දානවා විතරයි. මේ අමුමිරිස් කිසිම ලස්සනක්

නෑ. එහා පැත්තේ පොළේ තියෙනවා මීට වඩා ෂෝක් අමුමිරිස්. කස්ටමස්ලා එහෙම හිතනවා ඇති."

සීගිරි එකට වී ඇති දේ ඉවෙන් මෙන් දේවක තේරුම් ගත්තේය.

"එයාගේ වරදක් නෑ. එයා බලන්නේ කැෂියර් පොයින්ට්ස් ටිකනේ. ඒක ලස්සනට කරනවා ඉතින්."

දේවක සිතුවේ යුවතිය ගැනය.

"මං ඉන්ටර්වීව් ආවම එයාට පුදුමත් හිතෙයි. සමහරවිට මාව මතකත් නැතුව ඇති."

තමාව මතක තියාගන්නම වැඩේ කියා දේවක සිතුවේය. 'ඒත් මට ඔයාව ලේසියෙන් අමතක වෙන්නේ නෑ මිස්' මේ හදවත ඒ තරම් සමීපව කිසිවෙක් දෙස බලා නැත.

"සීගිරි එකයි අප්පච්චියි අතර තියෙන සම්බන්ධය මොකක්ද?"

දේවක යළිත් සිතුවේය.

"ඇයි සීගිරි එක දිහා බලාගෙන ඉන්නකොට අප්පච්චිගේ ඇස්වල කඳුළු පිරුණේ."

කොල්ලාට නිකමට සිහිවූයේ අම්මාවය. ඔහුට අම්මා ගැන සිහිවෙද්දි සිහිවෙන්නේ ලස්සන තරුණියකි. අප්පච්චී ළඟ අම්මාගේ ෆොටෝ ඇල්බම් එකක්ම ඇත. ඔහු මේ ලෝකයේ දැක ඇති ලස්සනම කාන්තාව අම්මාය. ඇයට තරම් කරුණාබර අහිංසක මුහුණක් වෙන කොහේදීවත් දේවක දැක නැත. හදවතට දැනෙන අසීමිත දුකත් ඒකය.

"අඩුම ගාණේ පහ වසර වගේ

වෙනකල්වත් ඔයා මං ළඟ උන්නේ නැත්තේ ඇයි සුදු අම්මේ. එහෙමනම් මට ඔයාව මෙහෙම ෆොටෝ එකකින් මතක් කරගන්න ඕන නෑනේ."

දෑස් තෙත්ව ගියේ හිතේ ඇතිවූ දුකටද නැත්නම් ලූණු සැරටද කියා දේවකම දන්නේ නැත. ඔහු තත්පරයකට කුස්සි කෑල්ලේ ගඩොල් ගැට්ට ළඟට ගොස් පහළ වෙල්යාය දෙස බලාගෙන උන්නේ දෑස් පෑදෙන තෙක්ය.

***    ***    ***    ***    ***

ජීවන් රංජිත්ට කතාකළේ දෙහිවල සයිට් එකෙන් පිටවෙන්නට පෙරය. රංජිත් යනු රඹුක්වැල්ල පවුලට ඉතාම සමීප කෙනෙකි. ඔහු ජීවන්ටත්

හරිම ආදරේය. ජීවනුත් කොල්ලාවත් බලන්නට රංජිත් දෙතුන් වතාවක්ම නුවර ගියේය. ඒත් නර්මදාගේ කොල්ලා මේතරම් ලස්සනට හැදෙන බව රංජිත් කිසිම දවසක රඹුක්වැල්ල මහතාට කියා නැත. ජීවන් සමඟ සම්බන්ධයක් ඇති බවවත් රංජිත් කියා නැත.

නර්මදාගේ මරණයෙන් පසු වසර විසි ගාණක් ගතවී ඇතත් රංජිත් ජීවන් සමඟ ඇති බැඳීමද එහෙමම රැක්කේය. ඔහු මේ ජරා ලෝකයේ අහම්බයෙන් හමුවෙන විදිහේ දුර්ලභ මිනිසෙක් බව රංජිත් දනී. නර්මදා ඒ තරම්ම ජීවන්ට පැලුනේද ඒ නිසා බවද ඔහු දනී. ඒ දවස්වල ජීවන්ගේත් නර්මදාගේත් එක්වීම වෙනුවෙන් රඹුක්වැල්ල මහතා සමඟ රංජිත් කතාකළේය. එදවස ඔහුද

හොඳ තරුණයෙක් විය. එහෙත් ජීවන්ව පවුලට බාරගන්නට සෙනරත් රඹුක්වැල්ල මහතා කැමති නොවීය. නර්මදා අවසානයට ජීවන් සමඟ හිතුවක්කාරකමට විවාහවිය. ඉතාම රහසිගත ලෙස ලියාපදිංචිකළ ඒ කසාදයට එක් සාක්ෂිකරුවෙක් ලෙස අත්සන් කළේද රංජිත්මය. එය මහා පිනක් බව ඔහු එදාද දැනගෙන උන්නේය.

ජීවන් කොල්ලා සමඟ කොළඹ ආ විගසම රංජිත්ට කතාකළේය.

“මං හවසක එන්නම් ජිවා කොල්ලවයි උඹවයි බලලා යන්න. මේ දවස්වල මේ මාව නිගම්බු බ්‍රාන්ච් එකට දාලා.”

රංජිත් කීවේය. ‘හවසක රංජිත් අන්කල් එනවා පුංචි මහත්තයෝ. අපි

කෑමක් දෙන්නෝන' ජීවන් කොල්ලාට කීවේය. 'අප්පච්චි එන්න කියන්නකෝ. අපි දෙමු මරු ඩිනර් එකක් රංජිත් අන්කල්ටයි සමන්ති ඇන්ටිටයි' දේවක කීවේය. අවසන් වරට රංජිත් ඔහුගේ බිරිඳ වූ සමන්ති සමඟ නුවර විත් නතරවී උන්නේ ජීවනුත් කොල්ලාත් උන් කුඩා නිවසේය. දෙන්නාටම කොල්ලාව දැක හරි ආදරයක් ආවේය. 'අම්මගෙයි අප්පච්චිගෙ යි දෙන්නගේම ගතිගුණ කොල්ලට ඇවිත්' රංජිත් සිතුවේය.

අද ජීවන් මේ රංජිත්ට කතාකරන්නේ කොල්ලාව සීගිරි එකට යවන බව කියන්නටය.

"මචං මම ජීවා."

ජීවන් කතාකළේ උණුසුම් ලෙසය.

"ජීවා. අනේ සොරි මචං. තාම මම

නිගම්බුවල. මං සමන්තිටත් කිව්වා දැන් ජීවා මාත් එක්ක තරහත් වෙනවා කියලා."

රංජිත් සමාව ඉල්ලුවේය.

"පිස්සුද බං. උඹ වැඩටික ඉවර කරගනින්කෝ. අපිට කොයිවෙලේ සෙට්වෙන්න බැරිද?"

"ඇත්තමයි ජීවා හරිම ආසාවෙන් ඉන්නේ හවසක උඹත් එක්ක පොඩි ඩ්‍රින්ක් එකක් ගන්න. මං සිකුරාදා එනවා."

"හරි රං ආවාම සෙට්වෙමු. කතාකළේ මචං පොඩි දෙයක් කියන්න උඹට."

"කියපන් ජීවා. කොල්ලා සනීපෙන් නේද?"

"ඔව් ඔව් සනීපෙන් ඉන්නවා. කතාකළේ කොල්ලා ගැන දෙයක්

කියන්න තමයි."

"කොල්ලා කෙල්ලෙක් එක්ක යාළුවෙලා. කොල්ලොනේ බං. උඹ මේ වයසේදී දාගෙන ලව්නේ ජීවා"

රංජිත් කීවේය.

"තාම එහෙමම ආරංචියක් නෑ රං. මාත් හරි ආසාවෙන් ඉන්නේ මගේ ලේල්ලිව බලන්න. ඒත් මේකගේ එහෙමම දෙයක් තාම නෑ."

රංජිත් සිනාසුනේය.

"අපි හොඳ කෙල්ලෙක් බලමු දවසක ජීවා. මට කෙල්ලෙක් නෑනේ නැත්නම් මම උඹේ කොල්ලට දෙනවා."

රංජිත් කට පුරා කීවේය. ඔහුට ඉන්නේද පුතෙකි. ඔහු තාම ඉගෙන ගනී.

"ඉතින් ජීවා."

"මම රංජි කොල්ලව සීගිරි එකට යවන්න ඉන්නේ."

ජීවන් සියල්ලම කීවේය. රංජිත් පරිස්සමින් අසාගෙන උන්නේය.

"උඹ හරි නිහතමානී මිනිහෙක් ජීවා. කරන්න තියෙන හොඳම දේත් ඒකයි. බයවෙන්න එපා. කොල්ලට ජොබ් එක ලැබෙනවා. එහෙම නොවුනත් මම කොල්ලව රඹුක්වැල්ල අන්කල්ට කියලා දානවා."

රංජිත් කීවේය. ජීවන් රංජිත්ට කතාකළේද ඒකය. රංජිත් රඹුක්වැල්ල මහතාට බොහෝ සේ ළඟින් ඇසුරුකරන බව ජීවන් දැනගෙන උන්නේය.

"අපි ඉස්සෙල්ලා මේ මොනවත් නොකියා කොල්ලව යවලා බලමුකෝ සීගිරි එකට ජීවා. කොල්ලගේ

පින් පාට තියෙනවා. රඹුක්වැල්ල මහත්තයට එයාගේ ලේ අඳුනගන්න පුළුවන් ඇතිනේ. දූගේ මූණමනේ තියෙන්නේ. මොකක්හරි හුරුපුරුදු ගතියක් දැනෙයි."

රංජිත් කීවේය. එය ඇත්තකි. දේවකට ඇත්තේ නර්මදාගේ ලස්සන මුහුණේම කොපියකි. ජීවන්ගේ හදවතේම කොපියකි.

"හදිස්සියේ ගත්තේ නැත්නම් උඹ මොකක්හරි කරපන් රං මට අයිතියක් ඕන නෑ මචං. මට ඕනා මගේ කොල්ලව පෙන්නන්න."

"මං උඹ ගැන දන්නවා ජීවා. එදා උඹ අයිතියක් ඉල්ලුවෙත් නෑනේ."

රංජිත් කීවේය.

"අපි යවලා බලමුකෝ. මාත් එන්නම් ඉක්මනට."

"මේ වෙලාවේ මට පිහිට වෙයන් රං"

ජීවන් අවංකව කීවේය.

"උඹ එහෙම කියන්න එපා. මම උඹයි නර්මදයි දෙන්නම වෙනුවෙන් ඒක කරනවා."

රංජිත් හැඟීම්බරව කීවේය. නැතිවූයේ ජීවිත කාලයේදීවත් හමුනොවන විදිහේ හොඳ මිතුරියකි. දැන් මිතුරාවත් නැතිකරගන්නට නොහැක.

ජීවන් ගෙදර ආවේ අද අවුරුදු විසි ගණනකට නොකියූ කතාවක් කොල්ලාට කියන්න හිතාගෙනය. 'පුංචි මහත්තයට පුදුම හිතෙයි. ඒ කතාව ඇහුවාම අද සීගිරි එකට ගිහින් මොනවා වුණාද දන්නේ නෑ' ජීවන් සිතුවේය. ජීවන් එන ගමන්

කොට්ටාව හන්දියෙන් උළුඳු වඩේ තුන හතරක්ද ගත්තේය. කොල්ලා උළුඳු වඩේ කන්න හරිම ආසය. 'වෙලාවක සරස්වතී එකට එක්කගෙන යන්නෝන. තෝසෙයි වඩෙයි කිව්වොත් වෙන මොනවත් ඕන නෑ.' දේවක පොඩි කාලේ සිට එහෙමය. කොල්ලා ආසම ඔහුගේ අම්මා ආස කළ දේවල්වලටමය.

ජීවන්ට ගෙට ඇතුල් වෙන්නටත් පෙර සැමන් බැඳුමේ සුවඳ ආවේය. තමාට ඉන්නේ මේ ලෝකයේ හොඳම කොල්ලා කියා ජීවන්ට සිතෙයි. දැන් හැදෙන කොල්ලෝ එහෙම නැත. දවසක ඔහුට හරි යා යුත්තේද ඒ නිසාමය. කවදා හෝ දවසක පොඩි එකා පොඩි කාර් කෑල්ලකින් එනවා දකින්නට ජීවන් හරි ආසාය. 'දවසක මේකා වගේම අහිංසක හොඳ

කෙල්ලෙක් ලැබුනොත් මට ඇති. මාත් නැති කාලෙක කොල්ලා තනිවෙනවා. කෙල්ලෙක් උන්නොත් හරි ආදරෙන් ඉඳී.' තමා වැනි දුප්පත් කොල්ලෙක්ට ආදරය කරන්නට නර්මදා වැනි කෙනෙක් උන් ලෝකයේම තමාගේ අහිංසක කොල්ලාට ආදරය කරන්නටත් එක කෙල්ලෙක් හෝ ඉන්නා බව ජීවන් දනී. 'දෛවය දෙන්නව දවසක මුණගස්සවයි. එදාට ඇවිත් කියයි. මූණම රතු කරගෙන' ජීවන් තනිවම සිනාසෙමින් සිතුවේය.

එන්නේ සැමන් බැඳුමක සුවඳක් පමණක් නොවේ. පරිප්පු තෙම්පරාදුවක සුවඳක්ද එයි. කොල්ලා උයා තියා ඇඟ සෝදාග න්නට ළිඳට ගොස්ය. ජීවන් පොඩි සාස්පාන් ඇර බැලුවේය. ඔහු හදා ඇත්තේ සැමන් බැඳුමත් පරිප්පු

තෙම්පරාදුවත් පමණි. සුදු හාල් ටික සාස්පානට දමා ගොස්ය. කොල්ලා එය එහෙමම තබා ඇත්තේ කන්න ටික වෙලාවකට කලින්ම තියන්න හිතාගෙන විය යුතුය. ඒවා ඔහුට පුරුදු කාළේ ජීවන්ය. උණු සුදු හාල් බත් එක්ක මේ බැඳුමත් හොද්දත් රසය. ඉරිදා කුකුල් මස් ටිකක් ගෙනවිත් හැදියි යුතුයැයි ජීවන් සිතාගත්තේය.

"ආ. අප්පච්චි ආවද?"

ජීවන් සිනාසුණේය. කොල්ලා ඇඟ සෝදන්නේ අවට වෙල්යායේ ලස්සනද බලමිනි. බැසයන ඉරේ අවසන් ලා රත යායට ලස්සනට වැටී ඇත.

"ටිකක් වේලාසන ආවා පුංචි මහත්තයෝ. සීගිරි එකට ගියා නේද?"

දේවක සිනාසුණේය.

"ඒක මරු ප්ලේස් එකනේ අප්පච්චි. මට නිකං හරි පුරුදුයි වගේත්."

පුරුදු සීගිරි එකද නැත්නම් සීගිරි එකේදී හමුවූ ලස්සන සුදු කෙල්ලවද කියා දේවකම පසුව සිතුවේය.

"මහත්තයගේ හිතට ඇල්ලුවද?"

ජීවන් ඇසුවේය.

"මං එතන කොහොමහරි ජොබ් එක ගන්නවා අප්පච්චී ඒක එහෙමම තමයි. මට එතනට ගිහින් කරන්න වැඩක් තියෙනවා."

දේවක කෙටියෙන් සීගිරි එකට අද ඇතිවී ඇති තත්වය කීවේය.

"ඔයාට පුළුවන්ද ඒ හාස්කම කරන්න."

ජීවන් ඇසුවේය.

"අප්පච්චී මාව යවලා බලන්නකෝ."

කොල්ලා ඒක කරන බව ජීවන් දනී.

"කාවවත් එතන හම්බවුනේ නෑනේ පුංචි මහත්තයෝ. නේ."

ජීවන් ඇසුවේය. දේවකගේ මුහුණ මත තුනී සිනාවක් ඇතිවිය.

"ඇයි අප්පච්චි එහෙම ඇහුවේ. කාවද හම්බවුණාද ඇහුවේ."

"නෑ මං කිව්වේ මැනේජ්මන්ට් එකේ කාවවත්."

"එහෙම නෑ අප්පච්චී. ඒත් මේ."

ජීවන්ගේ දෙපතුල් සීතල වීගෙන ගියේය.

"ඇයි පුංචි මහත්තයා?"

"නෑ අප්පච්චි මේ එතන මේ කැෂියර් සෙක්ෂන් එක බාර මිස්

එක්ක නම් කතාකරන්න වුණා."

දේවක කීවේය.

"ඒ ඇයි පුතේ?"

"නෑ මේ හරි ලස්සන කෙල්ලෙක්. මේ කෙල්ල මේ."

දේවක සිදුවූ දේ කීවේය. ජීවන් සිනාසුණේය.

"මේ මගේ සුදු කමිසෙම ඉවරයි."

දේවක සෝඩා මිරිකා ප්ලාස්ටික් බේසමට දමා තිබූ සුදු කමිසය පෙන්වූවේය.

"ඒ ළමයා ඉතින් හිතලා කළා නෙමේනේ."

"නෑ පස්සේ හරියට සමාව ඉල්ලුවා."

"කෙල්ල ලස්සනයි."

ජීවන් ඇසුවේය.

"මී. අපේ අම්මට පස්සේ දැකපු ලස්සනම කෙල්ල."

කොල්ලා අවංකය. ජීවන්ට සිතුනේ එයය. 'මේකා දැක්කේ මිලින්දගේ දුවෙක්වද දන්නේ නෑ. නැත්නම් සුරංගිගේ දුවෙක්ද?' ජීවන්ට අවසාන වරට භාවනාගේ පියා වූ මිලින්දව හමුවූයේ නර්මලාගේ මරණයෙන් මාස තුනකට පසුය. එදා මෙදා තුර ඔහුට මිලින්දව හමුවී නැත. 'එතකොට හිටියේ දූලා දෙන්නයි මගේ හිතේ. පස්සේ තව දුවෙක් ලැබුණා කියලා රංජි කිව්වා.' ජීවන් සිතුවේය.

"ඇයි අප්පච්චි?"

"නෑ පුංචි මහත්තයෝ. වොෂ් එකක් දාගෙන එන්නකෝ."

"අප්පච්චිත් වොෂ් එකක් දාගමු. මං ඉව්වා."

"මං දැක්කා. සැමන් බැඳුම නියමෙට ඇවිත් තියෙන්නේ."

දේවක සිනාසුණේය.

"මං ඇවිත් තේ හදන්නම් අප්පච්චි."

"මං උළුඳු වඩෙත් ගෙනාවා. දැන් දාපුවා උණු උණුවෙන්."

"ෂා මරුනේ අප්පච්චි. හොඳ ඉඟුරු ප්ලේන්ටියක් ගහමු."

දේවක කියන්නේ වතුර බාල්දියක් ඇඟට දමාගනිමිනි. වෙන සියල්ල පැත්තක තිබ්බද මේ ළිඳේ වතුර ටික රත්තරන් වාගේය.

# 10

මිහිරංග ආවේ භාවනා සීගිරි එකෙන් පිටවෙන්න සූදානම් වෙනවාත් සමඟමය. කැෂියර් පොයින්ට්ස් දෙකක අවසාන කලෙක්ෂන් එක ගන්නේ ගිණුම් අංශයේ පතිරණය. භාවනාට ඔහුව විශ්වාසය. ඇය හය වෙද්දී බොහෝ විට සීගිරි එකෙන් පිටවෙයි. රඹුක්වැල්ල මහතානම් කියා ඇත්තේ කෙල්ලට පහ වෙනතුරු උන්නාම ඇති

කියාය. ඒත් සීගිරි එකට අද ඇතිවී තිබෙන තත්වය දකිද්දී කෙල්ලට එහෙමම යන්නට හිතෙන්නේ නැත. හැමෝම ටිකක් වැඩියෙන් වැඩකර කැපවුනොත් සීගිරි එක ගොඩගන්නට පුළුවන. එහෙම කරන්නට පුළුවන් කුමක් හෝ හාස්කමක් කරන්නට පුළුවන්නම්ය.

ඒත් ඒ හාස්කම කරන්නේ කවුද? ප්‍රශ්නය ඒකය.

"බබා ඕෆ් වෙන්නද?"

මිහිරංග ඇසුවේ එහා මේසයේ තිබූ පුටුවක් ඇදගෙන එහි ඇදේට ඉඳගනිමිනි. භාවනා යන්නට පෙර ඇගේ මේසය ලස්සනට අස්කරයි. නැත්නම් උදේ එද්දී කෙල්ලගේ හිතට හරි නැත.

"ඔව් මිහිරංග අයියේ යන්න

කියලා.”

භාවනා ඔහේ කීවාය.

“ගෙදරමද යන්නේ නැත්නම්”

ඒ කතාවට කෙල්ල හරි ලස්සනට සිනාසුනාය.

“මගේ හනී බනී එනකල් මම එහෙම යනවා. එයා ලැබුන දාට මම ටිකක් වේලාසන යනවා සීයට කියලා. එයා එක්ක රවුමක් ගහලා රෑට කොහෙන් හරි ඩිනර් අරන්. චූටි ෂොපින් පාරක් දාලා තමයි ගෙදර එන්නේ. එයිට්යලට විතර”

කෙල්ල දිග විස්තරයක් කීවාය.

“කවුද හනී බනී.”

“මගේ සුදූ.”

භාවනා කියන කතාවලට මිහිරංගගේ හදවත අලුතෙන් උණුසුම් වෙයි. ‘පට්ට කෑල්ලක් වෙලා

දැන්. මාරයි' මිහිරංග සිතන්නේ දැඩි පෙරේතකමකිනි.

"ඉතින් යන් මාත් එක්ක රවුමක් දාලා ඩිනර් අරන් එමු ටිකක් රෑ වෙලා"

භාවනා ඇගේ ලාවිචු ටික වසා යතුර අත් බෑගයට දමාගන්නේ හිස දෙපසට වනමිනි.

"නෝ නෙවර්. එහෙම යන්නේ මගේ හනී බනී එක්ක විතරයි."

කෙල්ල පැහැදිළිවම කීවාය. 'ඒකට දෙන්නද මේ රෝස පාට තොල් පෙති පරිස්සම් කරගෙන ඉන්නේ' මිහිරංගට අසන්නට සිතෙයි.

"දියවන්නාවේ මරු ජොයින්ට් එකක් තියෙනවා බබා. සුපර් චයිනීස්. පුදුමම රසයි. යන්කෝ."

භාවනා සිනාසුනාය.

"මං චයිනීස්වලට ආස නෑ අපි නියම සිංහල කෙල්ලොනේ අයියේ."

"පිස්සු නැතුව යන්. මේ හයට ගෙදර ගිහින් මොනවා කරන්නද? යන්."

"සොරි අනේ. බෑ. මට අද ගෙදර යන්නෝන. ටිකක් මහන්සියි."

මහන්සි කෙල්ලගේ ඇඟට නොවේ. හිතටය. ගෙදර ගිහින් ඇඟ ටිකක් සෝදාගෙන තේ එක්ක බිබී සිතන්නට දෙයක් ඇත්තාක් මෙන් ඇයට අද සිතෙයි. ඒත් කුමක් ගැනද කියා ඇය දන්නේ නැත.

"බබා මං කතා  කළොත් කවදාවත් එන්නේ නෑ. ඇයි ඒ."

'ඒක හරි වැඩක්නේමං මොකටද එයා එක්ක මේ මහ රෑ ඩිනර් යන්නේ එහෙම සිරිතක් නෑනේ මගේ බෝයි

ෆ්‍රෙන්ඩ් නෙමේනේ එයා' භාවනා සිතින් බැණ්නාය.

"දවසක යන්. අක්කිවත් දාගෙන මල්ෂාවත් දාගෙන. සීයත් ඕන ඩ්‍රින්ක් එකක් දාගත්තාම සීයත් හරි දේවල් කියන්නේ."

භාවනා සන්සුන්ව කීවාය. මිහිරංගගේ කටට ආවේ කුණුහරුපය.

"මං එහෙනම් යනවා මිහිරංග අයියේ. ගුඩ් නයිට්."

භාවනා යන්නට හැදුවේ එහෙම කියාගෙනය. මිහිරංග ඇගේ අතකින් අල්ලාගත්තේය. කෙල්ල බැලුවේ ගැස්සීය. 'මෙ මොකද මේ'

"ඇයි මේ?"

භාවනාට ඇසිණ.

"කොහේවත් යන්නේ නැත්නම්

ටිකක් ඉඳලා යන් මොනවා හරි ගෙන්නගෙන බොමු. සිට්."

මිහිරංග කෙල්ලගේ අත අල්ලාගෙන නම කීවේය.

"මාව අතාරින්නකෝ ඉස්සෙල්ලම."

භාවනා කීවාය. මිහිරංග ඇගේ අත බුරුල්කළේ කෙල්ල ඉඳී කියා හිතාගෙනය.

"මට පරක්කුවෙනවා මං යනවා."

භාවනා කාර්යාලයෙන් පිටවූයේ ඉක්මන් අඩි තබාය. 'එක විදිහක් දැන් එයා.' භාවනා සිතුවාය. කෙල්ල සීගිරි එක දෙස මොහොතක් බලාගෙන උන්නාය. සෙනඟ හරි අඩුය. දැන් වේලාව හවස හයයි දහයය. සුපර් මාර්කට් උතුරන්නේ මේ වෙලාවටය. කෙල්ලට හීල්ලින.

'සේල්ස් බලන්න දීපු කෙනාට මදන විසේ ඉහට ගහලා. ඉතින් සීගිරි එකට කොහොමද උතුරන්නේ' ඇය සීගිරි එකෙන් පිටවී කා පාක් එක දෙස බැලුවාය. පාක් එකේම තුන් කාලක්ම හිස්ය. මෙහෙම වෙන එක හොඳ නැත. 'ඇයි මේ' සීගිරි එකේ සේල්ස් බහින හේතුව තේරුම් ගන්නට කෙල්ලට ඇති අලෙවිකරණ අවබෝධය අඩුය. ඇය උස්ස පෙළ කර සීගිරි එකට ආ කෙල්ලය. ඒත් අද දේවක සීගිරි එකට ආ පැයට ඔහු සීගිරි එකට වී ඇතිදේ තේරුම් ගත්තේය. ඒ ඔහුට ඇති මාකටින් ඉවෙනි. මෙතනට ඕනා එහෙම කෙනෙකි.

තනිවම නිවසට ඇවිදෙගන එද්දී කෙල්ලට හරි පාළුය. නිවස ඇත්තේ සීගිරි එක පිටුපසය. සුපර් මාර්කට්

එකේ එක් ස්ටෝරුවක ඇත්තේද නිවස ඇති ඉඩමේ කොණකය. මේ පළාතටම ඇති ලස්සනම නිවස මේ සීගිරි නිවසය. රඹුක්වැල්ල මහතා එය හැදුවේ හැමෝටමය. අද ප්‍රශ්නයක් වී ඇත්තේද ඒකමය.

භාවනා මේ දේවල් ගැන එච්චරම හිතන්න යන්නේ නැත.

"දවසක එයා ඇවිත් කතාකළාම මම යනවා."

කෙල්ල හිතන්නේ එහෙමය. ඒත් එයා කවුද කියා තවම දැක නැත.

# 11

මේ වගේ නිසංසල රෑකට තෝ ටිකක් බිබී කතාකරන්නට නිවසේ සිමෙන්ති පඩිය හොඳය. එතන ඉඳගත් විට අතුරුගිරිය වෙල්යාය සිපගෙන එන සුළඟ සනීප ලෙස එතනට එයි. ගඩොල් බිත්ති පමණක් ඇති නිවසේ ප්‍රධාන දොර තබන්නට නියමව ඇත්තේ මේ සිමෙන්ති පඩියට උඩිනි. එහෙත් මේ නිවසට තවම එහෙම ප්‍රධාන දොරක් කියා

දෙයක් නැත. මෙහෙමත් හොඳය. එයට ජීවනුත් කැමතිය. දේවකත් කැමතිය. 'පස්සේ අපි හිමිහිට ඉඩම් කෑල්ලක් අරන් ගේ පොඩ්ඩක් හදමු පුංචි මහත්තයෝ. දැන් ගෙවල් හදන අලුත් ක්‍රම තියෙනවා' ජීවන් කීවේය. ඔහු ඉන්නේ ඉදිකිරීමේ අංශයේය.

දේවක ඉඟුරු ප්ලේන්ටී දෙක අරන් ආවේ දුම් දමද්දිය. ඔහු ප්ලේන්ටි දෙක ගෙනාවේ ජීවන් ගෙනා වඩේ ටිකත් පීරිසියකට දමාගෙනමය. ජීවන් උන්නේ කොල්ලාට මේ කතාව කොහෙන් කියන්නට පටන් ගන්නවාද කියා සිතමිනි.

"වඩේ එක මරු අප්පච්චි. කමු."

අප්පච්චීත් පුතාත් සයිවර් සම්බෝලයේ ගාගෙන උළුඳු

වඩේ කෑවෝය.

"පුංචි මහත්තයෝ."

"අප්පච්චි."

"සිගිරි එකට ගියාම මොකක්ද දැණුනා කිව්වේ පුතේ."

ජීවන් ඇසුවේ රස්නෙට ප්ලේන්ටි උගුරක් බොන ගමන්ය.

"ඒක දන්නේ නෑ අප්පච්චි නිකං මොකක්ද වුණා. හරියට මං හිටපු තැනක් වගේ. මාරයි එහෙම. මම මේ ආවමනේ. කොළඹ ආවත් මේ පැත්ත පළාතේ ඇවිත් නෑ."

දේවක කියන්නේ ඇත්තය. මේ දැනෙන්නේ ලේ වල රස්නයය. ජීවන් එය දනී. ඒවා මහ පුදුමාකාර දේවල්ය.

"සීගිරි එක හොඳට තිබුණ තැනක් කියලා තේරෙනවා අප්පච්චි. ඒත්

දැන් මොකක්හරි අවුලක් තියෙනවා. එතනට මාකටින් බයිපාස් එකක් කරන්න වෙනවා. තත්වය ක්‍රිටිකල්”

දේවකගේ ඉව ගැන ජීවන්ට පුදුමය. දැන් රඹුක්වැල්ල මහතා වයසය. මිලින්දත් දැන් වෙනමම ව්‍යාපාරයක් කරයි. මින් වසර විස්සකට විසි පහකට පෙර ලංකාවේ සුපර් මාර්කට් කියා ජාතියක් තිබුනේ නැත. තිබුනේ සිල්ලර කඩය. ඒත් දැන් හන්දියක් හන්දියක් ගානේ සුපර් මාර්කට්ය.

“මොනවා උනත් සීගිරි එක මරු තැන අප්පච්චි .මට හරි පුරුදු තැනක් වගේ. අප්පච්චි කියන්නේ ඒකේ තේමාව. සැමදේ සපිරි නාමය සුපිරි. සීගිරි මාරයිනේ අප්පච්චි. නියමම මාකටින් ස්ලෝගන් එකක්නේ.

දැක්කයින් දැක්කේ නෑ එහෙම ක්‍රියේටිව් වර්ඩින්ග්ස් ටිකක්"

දේවක කීවේය. ජීවන්ගේ පපුවම සීරීගෙන ගියේය. 'අහගෙනද සුදු නෝනා. ඔයා ලියපු සීගිරි එකේ තේමාව ගැන කොල්ලා කියන දේ. පුදුමයි නේ. ඔයා කොහේහරි ඉඳන් අහගෙනත් ඇති' ජීවන් සිතුවේය. 'හැමදේ සපිරි නාමයි සුපිරි - සීගිරි' මේ වැකිය ලීවේ නර්මදාය. දේවකගේ අම්මාය.

දැන් මේ කතාව කියන්නට වෙලාව හරි යැයි ජීවන්ට සිතුණි.

"පුංචි මහත්තයෝ."

"අප්පච්චි."

"මම මේ කියන්න යන කතාව මම ඔයාට කවදාවත් කියපු කතාවක් නෙමේ. මේක දවසක ඔයාට කියන්න

මම හිටියේ ඒ වෙලාව දැන් ඇවිත්.”

දේවකගේ ඇස් උඩය. කොල්ලා ප්ලේන්ටිය හිස් කළේය.

“මොකක්ද අප්පච්චි.”

දේවක ඇසුවේය. ජීවන්ගේ දෑස් තෙත්ව ඇත. ‘සීගිරි එක ළඟදීත් අද ඇස්වල කඳුළු තිබුණා’ දේවක අප්පච්චිගේ දෑස් දෙස බලාගෙන සිතුවේය.

“ඇයි අප්පච්චි මේ. ඇස්වල කඳුළු. ඇයි කියලා කියන්නකෝ.”

කොල්ලා ඇසුවේය.

ජීවන් දේවකගේ පිටට අතක් තබාගත්තේය.

“මට පුංචි මහත්තයෝ අද අම්මව හරියට මතක්වෙනවා.”

ජීවන් කීවේය. දේවක බලාගෙන උන්නේ දුකෙනි.

"ඇයි දන්නවද පුතේ?"

"නෑ අප්පච්චි."

ජීවන් දෑස් පිසදාගත්තේය.

"අදින් අවුරුදු විසි හතකට කලින් මට ඔයාගේ අම්මව හම්බවුනේ."

ජීවන් කතාව පටන් ගත්තේය.

"අම්මා මේ කොළඹ."

"ම් කොළඹ. ඔයා කිව්වනේ මහත්තයෝ අද සීගිරි එකට පය තියන කොට මොකක්ද වුණා කියලා. හරි හුරුපුරුදු ගතියක් දැණුනා කියලා."

"ඔව්."

"එහෙම වෙන්න ඕන. ඒ ලේවල රස්නේ පුතේ."

"මට තේරෙන්නේ නෑ අප්පච්චි."

"මේ සීගිරි සුපර් එක කාගෙද

දන්නවද මහත්තයෝ. කාගෙද කියලා දන්නවානම් ඔයාට පුදුම හිතෙයි."

"කාගෙද අප්පච්චි"

ජීවන් තත්පරයක් උන්නේය.

"ඔයාගේ සීයගේ."

දේවකගේ දෑස් උඩ ගියේය.

"මිමේ මගේ සීයගේ."

"ඔව් අම්මගේ තාත්තගේ. සීගිරි එකේ හිටපු පුංචි ලස්සන කෙල්ලට තමයි ඔයාගේ අප්පච්චි මැරීගෙන ආදරේ කළේ. නර්මදා රඹුක්වැල්ල කියන්නේ මහත්තයෝ සීගිරි එක අයිති සෙනරත් රඹුක්වැල්ල මහත්තයගේ බාල දුව තමයි ඔයාගේ අම්මා. ඉතින් ඔයාට සීගිරි එකට පය තියනකොට අමුත්තක් දැනෙන එක පුදුමයක් නෙමේ පුංචි මහත්තයෝ.

ලේ කකියනවනේ."

ජීවන් කොල්ලාගේ පිට අතගා කීවේය. දේවක මේ කිසිවක් සිතාගන්නට නොහැක.

"ඇයි අප්පච්චි මට."

"කිව්වේ නැත්තේ කියලනේ අහන්නේ. මම බලන් උන්නේ මේ දවස එනකල් පුංචි මහත්තයෝ."

දේවකට හරි දුකක් ආවේය. 'අප්පච්චිව ඒ පවුලෙන් අයින් කළේ දුප්පත් කොල්ලෙක් නිසාද'

"මාව එයාලා පිළිගත්තේ නෑ. රංජිත් අන්කල් හරියට උත්සහ කළා අපට කැමැත්ත අරන් දෙන්න ඒත් ඔයාගේ සීයා මාව පිළිගත්තේ නෑ. අම්මගේ මරණයෙන් පස්සේ මම ඔයාවත් අරන් නුවර ආවා එයාලා ඔයාව දැකලා නෑ අවුරුදු

දෙකෙන් පස්සේ. අම්මා ඒ දවස්වල සතියකට දවසක් දෙකක් යනවා ඔයාවත් අරගෙන එහෙට. ඒත් අම්මා හදිස්සියේ නැතිවුණාට පස්සේ එයාලායි මායි අතර තිබුන සම්බන්ධය නැතිවුණා."

ජීවන් සියල්ල කීවේය. දේවකගේ දෑස් තෙත්ව ඇත.

"අම්මා පව්. අප්පච්චිත් පව්."

කොල්ලා කීවේය.

"මේ ජීවිතේ එහෙම දේවල් වෙනවා පුංචි මහත්තයෝ. ඒක හිතන්න එපා. ඔයා කිව්වේ අර සීගිරි එකේ තේමා වැකිය. සැමදේ සපිරි නාමය සුපිරි. සීගිරි කියන එක."

"ඔව් අප්පච්චි."

"ඒක ලිව්වේ ඔයාගේ අම්මා. එයාට තිබුනේ එහෙම කලාත්මක

හිතක්. ඒ වගේම හොඳට එයා ඉගෙන ගත්තා.”

“ඒක පුදුමයි. මගේ අම්මා ලිව්වේ”

“ම්. ඒ මාකටින් දැණුමෙයි කලාවයි දෙකම ඔයාට ආවා. ඒ සුදු මූණත් එක්කම.”

ජීවන් කීවේ කොල්ලාගේ මුහුණම අතගාය.

“මම ඔයාව සීගිරි එකට යවන්නේ අම්මගේ අයිතිය ඉල්ලගෙන එන්න කියන්න නෙමේ. මට හරි ආසයි එයාලට ඔයාව පෙන්නන්න. රඹුක්වැල්ල මහත්තයා මාව පිළිගත්තේ නෑ තමයි. ඒත් නරක මනුස්සයෙක් නෙමේ. එයා හරි ප්‍රතිපත්තිගරුක කෙනෙක් ඒ වගේම හරි කරුණාවන්තයි. එයා මාව පිළිගත්තේ නැත්තේ එයා අම්මව

බන්ඳලා දෙන්න ගියේ එයාගේ හොඳම යාළුවගේ පුතාට නිසා. දැන් හැමදේම වෙලා ඉවරයි සීයා වයසයි. සීයගේ ලොකු පුතා මිලින්ද? ඔයාගේ මාමා. එතකොට අම්මගේ අක්කා සුරංගි. පොඩි අක්කා රුවන්ති. ඔයාගේ ලොකු අම්මලා"

ජීවන් හැමදේම කොල්ලට කියා දුන්නේය.

"ඔයා සීගිරි එකට යන්නේ මේ කිසිදෙයක් කියලා නෙමේ. එතන වැඩකරන්න. දවසක එයාලට ඔයාව නැතුවම බැරිවෙනවා එදාට මම ඇවිත් කියනවා මේ නර්මදාගේ පුතා කියලා."

ජීවන් කීවේය. දේවක හිස වැනුවේය.

"ඒක හොඳයි අප්පච්චි දැන්ම

කියන්න එපා. මට සීගිරි එක ඇතුලේ දෙයක් කරලා පෙන්නන්න දෙන්න."

"ඔව් ඔයාට ඒක කරන්න පුළුවන්. අම්මගේ ලේ ඔයාගේ ඇඟේ තියෙන්නේ. හැමදේ සපිරි නාමය සුපිරි කියන තේමාවට ගැළපෙන්න ඔයාට අලුතින් සීගිරි එක හදන්න පුළුවන් වෙයි. එහෙම වෙයි. අම්මගේ ලේ ඔයාට මඟ පෙන්නයි"

"අම්මගෙයි අප්පච්චිගෙයි දෙන්නගෙම."

කොල්ලා කීවේය. ජීවන් දේවකගේ පිට පිරිමැද්දේය.

"රඹුක්වැල්ල මහත්තයා ලොකු ගෙයක් හැදුවා පිටිස්සේ. ඒක හරි ලස්සන ගෙයක්. ඒ ගෙදර දැන් ඉන්නේ ඔයාගේ සීයයි ආච්චියි මාමයි එයාගේ පවුලයි දුවලා තුන්දෙනයි.

අනිත් අයත් ඉන්නේ ඒ ළඟම තමයි. සීයා හැමෝටම ගෙවල් හදලා දුන්නා. ඔයාගේ අම්මට ඇර."

දේවක දුක්බරව බිම බලාගත්තේය.

"ඔයා අම්මා නැතිවුණාම හරියට තනිවෙන්න ඇති."

"ඒක කවදාවත් නැතිවෙන්නේ නැති දුකක් පුංචි මහත්තයෝ. ඒත් මං ඔයා දිහා බලාගෙන ජීවත්වුණා. අම්මා මැරුණේ ජීවා කොල්ලව බලාගන්න ඒකා දවසක ඔයාව බලාගනී කියලයි."

දේවකගේ දෑසින් කඳුළු ගලාගෙන ගියේය. අප්පච්චිගේත් පුතාගේත් දෙදෙනාගේම ඇස්වල කඳුළුය.

*** *** *** *** ***

දේවකට රෑ නින්ද ගියේ නැත. හිතේ තිබූ මහා බරක් නිදහස් කරගත් නිසාදෝ ජීවන් වේලාසනින්ම නින්දට වැටුණේය. ඒත් දේවකගේ පපුව අසාමාන්‍ය ලෙස දිගටම දැන්නට පටන් ගත්තේය. ඔහු අම්මාගේ පින්තූරයක් ලෙස පැයක් පමණ බලාගෙන උන්නේය.

"ඔයා හරි පුදුම කෙනෙක් අම්මේ. පුදුමම කෙනෙක්. එච්චර දෙයක් මගේ දුප්පත් අප්පච්චි වෙනුවෙන් කැපකළානේ. පුදුමයි."

දේවකට හරි දුකය.

"මේ ලෝකේ දාලා ගියේ ඇයි සුදු අම්මේ. ඉන්නනේ තිබුණේ. ඔයාගේ ජීවා ඔයාට පැලෙනවා. උන්නානම් මේ කොල්ලත් අම්මට පැලෙන හැටි

බලාගන්න තිබුණා.”

දේවක අම්මාගේ පින්තූරය අතගාමින් සිතුවේය. නර්මදා මේ පින්තූරයේ ඉන්නේ ලස්සන කොළ පැහැගත් සාරියකින් සැරසීය.

“මං සීගිරි එකට යනවා අම්මේ. ඔයාව ආයෙත් මං සීගිරි එකේ ජීවත්කරනවා. ආත්මයක් වෙලාහරි මම ළඟට එන්න”

දේවක අම්මාට පොරොන්දු විය.

රෑ සුළඟ හරි සීතලය. දේවක සිමෙන්ති පඩියේ වාඩිවූයේ තේ එකක් හදාගෙනමය. ඔහු තේ එක බොමින් බොහෝ දේ සිතුවේය. ඒ බොහෝමයක් සීගිරි එක ගැනය. ‘කෙනෙක් දෙයක් ආත්මයෙන්ම කරනකොට ඒක යාදෙනවා. මට දැන් සීගිරි එකට යන්න ලොකු හේතුවක්

තියෙනවා. අප්පච්චි කිව්වා වගේ මම යන්නේ මගේ අයිතිය ඉල්ලගන්න නෙමේ.මගේ අම්මා වෙනුවෙන්.' ඔහු සිතුවේය.

ඒත් සමඟම කොල්ලාට සිහිවූයේ සීගිරි එකේදී දුටු යුවතියවය.

"අප්පච්චි කිව්වා වගේ මම දැක්කේ මගේ මාමගේ දුවෙක්ව වෙන්න බැරිද? නැත්නම් මගේ පුංචිගේ දුවෙක්ව. මොකක්ද හුරුපුරුදු ගතියක් දැණුනා එයාගෙ න්. එයත් මං දිහා බලාගෙන හිටියේ එහෙමයි."

හැමදේම සීගිරි එකට ගියපසු විසඳෙනු ඇත.

"සීගිරි එකට යන්න දැන් හේතු ගොඩක් තියෙනවා. සඳුදා ඉන්ටර්වීව් එක. ඊට කලින් මෙහේ සුපර් මාර්කට්

දෙක තුනකට විසිට් එකක් දාන්න වෙනවා.”

දේවක සිතුවේය. හෙටත් සීගිරි එකට ටිකක් යන්නට දේවකට ආසය. එහෙත් එහෙම යන්නට හොඳ නැත. ඒක හිතාමතාම  තමා කරන දෙයක් වෙන බව ඔහුට සිතෙයි. ඇරත් ආයෙත් සීගිරි එකේ බලන්න දෙයක් නැත.

“ගියොත් ඔයාව ටිකක් බලාගන්න තමයි.”

දේවක සිතුවේය. ඇයගේ රුව මේතරම් සමීප රූපයක් සේ හිතේ ඇඳුනේ කෙසේද කියා ඔහුට සිතාග න්නට නොහැක. ‘සමහරුන්ගේ රූප එහෙමයි.’

“එතකොට මාව ඉන්ටර්වීව් කරන්නේ මගේ සීයා. පුදුමයි.”

දෛවය මේ තරම්ම අසීරු බැරෑරුම් දෙයක් තමාගේ ජීවිතය ඉදිරියෙන් තබාවී කියා දේවක සිතුවේ නැත. 'එහෙම වෙච්ච එක හොඳයි. මොකක්හරි බර දෙයක් පපුවට වැටෙන්නත් ඕන මෙහෙමම ඉන්න බෑනේ.' දේවක කෝප්පයේ ඉතිරිව තිබූ අවසාන තේ උගුරත් බීවේය.

# 12

භාවනා තාරකාගේ කාමරයට ආවේ උදේ හයට පමණය. කෙල්ල තාම ඉන්නේ රෑ ඇඳුම පිටිනි. තාරකාගේත් භාවනාගේත් කාමර උඩය. නේත්‍රාගේ කාමරය ඇත්තේ පහළ මාළයේය. ඒ ඇය රෝද පුටුවක් උඩ ජීවත්වෙන නිසාය. සමහර දවසක භාවනා ඇගේ පොරවනයත් කොට්ටයත් රැගෙන නේත්‍රාගේ කාමරයට එන්නේ බය

නිසාම නොවේ. අක්කා ගැන දුක සිතීය. 'ආවා ඔයා එක්ක දොයියන්න' ඇය කියන්නේ ආදරයෙනි. නේත්‍රා කෙල්ලට නින්ද යන තුරු මොනවා හෝ කියවයි. එහෙම කියවන්නේ ඇගේ හිසකේද මෘදුව පිරිමදිමිනි. බොහෝ දිනවල කෙල්ලට ඉබේම නින්ද ගොස්ය. සෑහෙන වෙලාවක් නේත්‍රා තනියම කියවා ඇත.

උදේ භාවනා ඇගේ පොඩි අක්කා වූ තාරකාගේ කාමරයට ආවේ ඇයත් සමඟ කතාකරන්නවත් වෙලාවක් එන්නේ නැති නිසාය. බොහෝ විට තාරකා ගෙදර නැත. ඇය ගෙදර ඉන්න වෙලාවට භාවනා සීගිරි එකේය. තාරකා ගුවන් සේවිකාවක් වෙන්නට ඉගෙන ගනී. භාවනාට නම් එය හිස රදයකි. එහෙත් එක එක්කෙනා තමාගේ සතුට කියා

සිතන්නේ එක එක දේවල්ය. 'මට ආසයි හැමදාම ෆලයි කරන්න. අද සිංගප්පෝවල හෙට බැංකොක්වල අනිද්දා ඩුබායිවල.' තාරකා කියන්නේ ආසාවෙනි. 'ඔයා හැමදාම සීගිරි එකේ' එහෙම කියද්දී භාවනාට දුක හිතෙන්නේ නැත. ඇය සීගිරි එකට ඒ තරම් ආදරේය.

තාරකා නිදාගෙන උන්නේ මුනින් අතට ඇගේ පස්සම එළියේ දාගෙනය. 'කොහොම හැදිලද මන්දන්නේ නෑ.' භාවනා ඇයගේ ඇඳෙන් ඉඳගන්නේ එසේ සිතමිනි.

"පොඩි අක්කා. නැඟිටිනවකෝ."

කෙල්ල තාරකාගේ උරහිසට ගසයි.

"මොකද බබා නිදාගන්න දෙනවකෝ. මං ටුවෙල් නිදාගත්තේ."

"ඇයි රෑ ෆ්ලයි කලාද සිංග ප්පෝවලට හීනෙන්."

භාවනා අසන්නේ සිනාසෙමිනි.

"ෆ්ලයිකරනවා තමා හෙට අනිද්දට."

තාරකා කියන්නේ භාවනා දෙස බලාය.

"ම්."

කෙල්ල ඇගේ තේ එක දෙයි.

"බබා"

"ම්."

"ඔයා ලස්සන වෙලා."

ඒක ඊයේ නේත්‍රාත් කීවාය. කෙල්ලට හරි ආසය.

"තැන්කියු සෝ මච්."

"මොනවාහරි වෙනවද?"

තාරකා ඇසුවාය.

"මොකුත් නෑ අනේ. මොනවා වෙන්නද? මොනවත් වෙන්නේ නැති එකනේ වැඩේ."

කෙල්ලගේ කතාවට තාරකා සිනාසුනාය.

"මම නෙක්ස්ට් වීක් ශ්‍රී ලන්කන් ඇප්ලයි කරනවා. එමිරේට්ස් එකටත් දානවා"

තාරකා කිවාය.

"විෂ් යූ ඕල් ද බෙස්ට්. ඔයාට ෆ්‍රී ටිකට්ස් ලැබෙන කාලෙට මාවත් එක්කගෙන යන්න හොඳේ."

"මී උඹවයි කොල්ලවයි. තනියම බෝරින් බං."

තාරකා කීවාය. භාවනා සිනාසුනාය. ඇයට බොමින් උන් කිරි තේ එකත් ඉස්පොල්ලේ යන්නට ආවේය.

"බලමුකෝ."

භාවනා කල්පනාබරව කීවාය.

"බබා."

"ම්."

"මට ලෝන් එකක් දෙන්නකෝ."

තාරකා එහෙමය. ඇය නේත්‍රාටත් තාරකාටත් ඉඳහිට දඩ දමයි.

"කීයක් විතරද"

"තුනක් විතර."

භාවනා සිනාසුනාය.

"ම් දෙන්නම්. යනකොට එන්නකෝ."

"ඔයා ස්වීට්. ගත්ත ඔක්කොම මම ජොබ් එක ලැබුන ගමන් රිටන් කරනවා. ෂුව."

"අනේ එපා. ඔයා ඒවා ඉතුරු කරගන්න."

තාරකා ඇඳ දිගේ රූටා ගෙන විත් භාවනා ළඟට පැමිණ ඇගේ දෙපා සිපගත්තාය. භාවනා සිනාසුනාය.

"සමින්ද අයියා මොකද කියන්නේ."

"මේ දවස්වල දිගටම වලි."

සමින්ද කියන්නේ තාරකාගේ පෙම්වතාය. දෙන්නා ආදරය කරනවාද නැත්නම් වෙන මොකක්හෝ කරනවාද කියා භාවනා දන්නේ නැත.

"ශ්‍රී ලන්කන් ඇප්ලයි කරනවා කියලා. එයාලයින් එකකට යනවානම් එයාව අමතක කරන්නලු."

"අනේ"

"මං කිව්වා හා කියලා බං. මට මගේ ජොබ් එක වටිනවා."

තාරකා කීවේ සැහැල්ලුවෙනි. එහෙම ආදරය කරන්න පුළුවන්ද කියා භාවනා දන්නේ නැත. 'අනේ ඉතින් මම බබානේ. ලව් එකක් ගැන මෙලෝ සසරක් දන්නේ නෑනේ.' ඈය තනිවම සිතුවාය.

"එහෙනම් යනකොට එන්න මං කෑෂ් දෙන්නම්."

"අක්කට කියන්න එපා"

"ඇයි අක්කටත් වෙනම දඩයක් දාන්නද යන්නේ"

තාරකා ගැන දන්නා භාවනා ඇසුවාය.

"ගිය සතියේ දඩයක් දැම්මා. ජොබ් එක කරනකල්නේ සුදූ."

තාරකා කීවාය.

භාවනා කාමරයෙන් ගියේ සිනාබරවය. හිත අද ටිකක් බරය.

ටිකක් නොව ගොඩක් බරය. තාම උදේ නිසා ඇඳගන්නත් වේලාසන වැඩිය. කෙල්ල තේ එක බොමින්ම යළිත් ඇඳට ආවාය. කෙල්ලගේ කාමරය හරි ලස්සනය. තාමත් ඇයගේ ඇඳ කොණක හාවෙක් ඇත. මේ හාවා මේ ඇඳට ආවේ දැනට අවුරුදු හත අටකට පෙරය. ළමා විය ගෙවී ගියේ කොයි කාලෙද කියා භාවනා දන්නේ නැත. එහෙත් මේ හාවා සමඟ තනිවම කතාකරමින් ඇඳ උඩ සෙල්ලම් කළ අතීතයක් විය. ඇගේ දෙතොලතර තුනී සිනාවක් නැඟිණ. භාවනා ඇගේ රෝස පාටත් සුදු පාටත් මුසුවූ හාවව ගෙන දෙපා මත තබාගත්තාය.

"කොහොමද ඉතින්. කාලෙකින් ඔයත් එක්ක කතාකරන්නත් ලැබුනේ නෑ. මට වැඩ අනේ. ඔයාටනම්

මොකද? මෙතනට වෙලා නිදාග න්න එකනේ කරන්නේ. මොකක්ද කියන්නේ. පාළුයි. හරි ෂෝක්. මං කොහෙන්ද ඔයාට හාවියෙක් හොයන්නේ. මාත් මේ ඉන්නේ මට කෙනෙක් හොයාගන්න බැරුව. දවසක් එයි. අපි හැමෝගෙම දෛවයේ කෙනෙක් ලියවිලා තියෙනවනේ. වෙලාවට එයා එයි. මමත් එහෙමයි හිතන්නේ.”

කෙල්ල මේ තනිවම කතාකරන්නේ ඇගේ හාවාත් සමඟය.

“දවසක කෙනෙක්ව දැක්කාම ඔයාට මොකක්ද වෙයි. මෙතනට. මේ. හාට් එකේ වම් පැත්තට. නිකං පිච්චිලා ගියා වගේ. එහෙම දෙයක්. මට එහෙම වුණා කෙනෙක්ව දැකලා. ඊයේ උදේ. මේ තාමත් නිකං

තොන්තුයි වගේ. එයා නොම්මර එකේ පිස්සෙක්. ඒත් ඒ පිස්සා අදත් සීගිරි එකට එයි කියලා හිතාගෙන ඉන්නේ. ඇස්වලට වැලි ගාලා වගේ."

ඔහුගේ රුව හද පුරා මැවෙයි. එහෙම වුණේ කොහොමද කියා භාවනා සිතුවාය.

"ඊයේ රෑ පුරාමත් එයාව මතක්වුණා. හරි වැඩක්නේ මේක. උදේ පහට ඇහැරුණේ. කවදාවත් එහෙම වෙලා නෑ."

කෙල්ලට කොහොමත් අද තෝන්තුය.

"දේවක පුංචි නිළමේ. හරි ලස්සන නමක්."

කෙල්ල ඔහුගේ නම සිහිකළාය. භාවනා ඔහුගේ නම දැනගත්තේ ඔහු මුදල් ගෙවන්නට කාඩ් එකෙනි.

# 13

ජීවන් රුපියල් හත්දාහක් කොල්ලගේ අතේ තැබුවේය. අප්පච්චී අතින් මෙහෙම හැමදාම සල්ලි ගනිද්දී දේවකට දුකය. ‘මෙච්චර ලොකු කොල්ලෙක් අප්පච්චි හම්බකරන තුට්ටු දෙකෙන් කීයක්හරි හැමදාම ගන්නෝන. පව්.’ ඔහුට සිතෙයි. ඉක්මනට රැකියාව ලැබුනොත් හොඳයි කියා දේවකට සිතුණි.

“මෙච්චර වැඩියි අප්පච්චි.

මට ෂර්ට් එකක් ගත්තාම ඇති. ට්‍රවුසර් තියෙනවා ඇතිවෙන්න."

දේවක කීවේය. ජීවන් සිනාසුණේය. කොල්ලාගේ කළිසම්වල තත්වය ගැන ජීවන් හොඳට දනී.

"ඒවා ඔක්කොම හෝදලම හම ගිහින් පුංචි මහත්තයෝ. එහෙම යන්න හිතන්න එපා අද හොඳ ට්‍රවුසර් දෙකක් ගන්න. ලා පාටින් බලලා ෂර්ට් දෙකක්වත් ගන්න. හොඳ ටයි දෙකකුත් ගන්න."

ජීවන් කීවේය. පසුව ඔහු කොල්ලා දෙස බලාගෙනම උන්නේය.

"රෑ නින්ද ගියේ නැද්ද පුංචි මහත්තයට."

දේවක බිම බලාගෙන සිනාසුණේය.

"නෑ අප්පච්චි. මට හරියට අම්මව

මතක්වුණා."

ඔහුගේ හදවත කැපීගෙන යයි.

"එයා ඔයාව දාලා ගියේ නෑ."

ජීවන් එය ඉන්තේරුවෙන්ම දනී.

"මටත් හිතෙනවා."

"ම්. මොනවාහරි මඟින් කන්න."

නැත්නම් කොල්ලා බඩගින්නේය.

"අපරාදේ අප්පච්චි. මට අද නින්ද ගියානේ."

දේවක හිතාගෙන උන්නේ උදේට කැකුළු බත් හදන්නටය. එහෙත් ඇහැරෙද්දී උදේ හතය.

"අද සීගිරි එකට යන්න එපා. එයාලට ඔයාව නෝට් වෙයි."

"න්නෑ අප්පච්චි."

කොල්ලා ලැජ්ජාවෙන් කීවේ සිනාසීය. 'අප්පච්චි හිතුවද දන්නේ නෑ අර ලස්සන කෙල්ලව බලන්න

මම අද ඒ පැත්තේ යයි කියලා.'

"ඔයා දැක්කේ ඔයාගේ නෑනා කෙනෙක්වද දන්නේ නෑ."

"දන්නේ නෑ අප්පච්චි."

"බලමුකෝ."

ජීවන් ගියේ කොල්ලාගේ හිසත් අතගාය. දේවක ඔහු යන දෙස බලාගෙනම උන්නේය. 'එයාට සීයේ ලොකු වැරදීමක් වුණා. මේ වගේ කොල්ලෙක්ව කවදාවත් අතාරින්නේ නැතුව ඉන්නයි තිබුනේ ඔයාට.' ඔහු මේ සිතින් කියන්නේ ඔහුගේ අම්මාගේ තාත්තාටය. සීයාටය. රඹුක්වැල්ල මහතාටය.

"අපි සඳුදා හම්බවෙනවනේ"

දේවක සිතුවේය. ඔහු ගේ ටිකක් අස්කර දැම්මේය. එහෙමට කියා අස්කරන්න දෙයක් නැත. දේවක

ඇඳගත්තේ උදේ නමයට පමණය. අද දවල්ටත් කොහෙන් හෝ කාලම එනවා කියා කොල්ලා සිතාගත්තේය. තනිවම ඇවිත් කන එක තරම් දුකක් තවත් නැත.

"හරි ආසයි ඔෆිස් එකක වැඩකරලා කට්ටිය එක්ක කයියක් ගගහ ලන්ච් එක ගන්න. ඔයත් එයි ලන්ච් ගන්න."

දේවක සිතුවේය. ඒ මොනවා කරන්නත් තමාව සීගිරි එකට ගතයුතුය. 'ඔයා හොයන්නේ කොයි වගේ කෙනෙක්වද සීයේ.' දේවක සිතින් අසන්නේ රඹුක්වැල්ල මහතාගෙනි.

"මේ කාලේ හැමෝටම ජීවත්වෙන්න හරි අමාරුයි. ඒ නිසා හැමෝම බලන්නේ කීයක්හරි

අඩුවෙන් බඩු ගන්න. ඒ වගේම හොඳ බඩු ගැනත් හරියට හිතනවා. ලොකු සුපර් මාර්කට් කරන අයට සප්ලයර්ස්ලගෙන් හොඳ ඩිස්කවුන්ට් ලැබෙනවා. එයාලට සුපර් මාර්කට් චේන් එකක්ම තියෙන නිසා. ඒ නිසා එයාලා ඒ ඩිස්කවුන්ට් එකෙන් ටිකක් කස්ටමර්ට දීලා සෙනඟ අද්දග න්නවා. සීගිරි එක ඒක කරන්නේ නෑ. සීගිරි එකටම එන්න කියලා විශේෂ දෙයක් අද ඒකේ නෑ. දැන් මම සාමාන්‍ය පාරිභෝගිකයෙක් නම් මම ආයෙත් සීගිරි එකට යන්නේ නෑ. වේලිච්ච කරපිංචයි ඇට්ටකුණාවෙන හාලුයි කල් ඉකුත් වූ කේකුයි ගන්න ඒකට යන්නේ මොකටද?"

සීගිරි එකට සෙනඟ අද්දාග න්නනම් එතන මොකක් හෝ හාස්කමක් කළ යුතුය. ඒක

කරන එක ලේසි දෙයක් නොවේ. හැප්පෙන්නට වෙන්නේ නගරයේ ඇති හොඳම සුපර් මාර්කට් සමඟය.

"එහෙම කියලා බෑනේ. මැජික් එකක් මං ළඟ තියෙන්නම ඕන."

කොල්ලා හිතට ධෛර්ය ගත්තේය.

# 14

කෙල්ල සීගිරි එකට අද එන්නේත් සාරිය ඇඳගෙන නොවේ. ඇය සාරිය අඳින්නේ සතියේ දවස් පහටය. ඇය සතියේ දවස් පහට අඳින සාරි පහ ඉරිදා රෑට තෝරා තියයි. කෙල්ල දවස් පහට අඳින්නේ පාට පහෙන් සාරිය. මුළින් මුළින් සාරි අඳින එක වදයක් වුවද දැන් භාවනා සාරියට හරි ආසය.

භාවනා අද ඇන්ළේ කෝපි

පැහැගත් ටයිට් ස්කට් එකත් එයටම යන බටර් පැහැගත් බ්ලවුසයත්ය. පපුව මැදින් බෝ එකක් ගැටගහන මේ චිපෝන් බ්ලවුස් පැටින් එකට ඇය හරි ආසය. මේ වාගේම බ්ලවුස් එකක් හින්දි ෆිල්ම් එකක කත්රිනා කයිෆ් ඇඳගෙන ඉන්නවා භාවනා ඊයේ පෙරේදා දැක්කාය. ඇයත් ඒ බ්ලවුස් එක ඇඳගෙන උන්නේ මේ වාගේ ටයිට් ස්කට් එකටය. කෙල්ල ෆැෂන් අල්ලාගන්නේ ඒවායෙනි.

භාවනා කාමරයෙන් පිටතට ආවේ රුපියල් තුන්දාහක්ද අතේ ගුලිකරගෙනය. ඒ තාරකාට දෙන්නටය. භාවනා යද්දීත් තාරකා ඇඳ උඩය. තාරකා ඇගේ ලැප්ටොප් එක බලමින් උන්නාය.

"ෂා. අද කෙල්ල හරි ස්මාට්නේ.

ලව් යූ බබා.”

දෙපා යන්තමට පෙනෙන ටයිට් ස්කට් එකට කෙල්ල ලස්සනය. තාරකා ඇගේ නංගීගේ ලස්සනට ඊර්සියා කළේ නැත. මොනවා වුවත් තාරකා ඇගේ අක්කාටත් නංගීටත් හරි ආදරේය.

“තැන්කියු. ආ ඔයා ඉල්ලපු සල්ලි.”

භාවනා අතේ තබාගෙන උන් රුපියල් තුන්දාහ තාරකාට පැවාය. තාරකා බලාගෙන උන්නේ ආදරයෙනි.

“ඔයා පව්.”

තාරකා කීවාය.

“මං යනවා.”

“මේ බබා.”

තාරකා ඇයව නැවැත්තුවාය. භාවනා හැරුණාය.

“තත්පරයක් ඉඳපන්.”

තාරකා ඇඳෙන් පැන ආවාය. පොඩි අක්කා ඉන්නේ උඩින් ටී ෂර්ට් එකක් දමාගෙන යට පෑන්ටිය පිටින් පමණක් බව භාවනා දැක්කේ එවිටය. ඇගේ හැටි එහෙමය. තාරකා ගොස් ඇගේ අල්මාරිය එහෙන් මෙහෙන් ඇද ගත්තේ ලිප්ස්ටික් කූරකි.

"මේක ගාන්න බබා. ඔය ලිප් කලර් එක මේ ඇඳුමට යන්නේ නෑ."

තාරකා දුන්නේ සුදු පැහැයත් ලා රෝස පැහැයත් එකට මුසුවූ තොල් ආලේපනයකි. ඇය ඒවා ගැන හොඳින් දනී. එයා හොස්ටස් කෙනෙක් ලෙස පුහුණුවෙන කෙල්ලෙක් ඒවා දැනගත යුතුය.

"මං එච්චර හිතුවේ නැහැ."

භාවනා කීවාය.

"මෙතන තියෙනවා. ඕන පාටක්.

හැම එකකටම බ්ලඩ් රෙඩ්ම ගාන්න එපා මෝඩ්."

තාරකා කියා දුන්නාය. පොඩි අක්කා කියන කතාව ඇත්තය. ඇය දුන් පාට හරි ලස්සනය. බ්ලවුස් එකේ පාටට යන්නේ මේ පාටය. ඇරත් හරි චාම්ය. භාවනා තාරකාගේ කාමරයේ සිටම තොල් ආලේපනය ගෑවාය.

"ෂා. ස්වීට්. ඉඹින්න හිතෙනවා දැන්."

තාරකා කීවාය. ඇය ඇඟිලි තුඩින් භාවනාගේ දෙතොල් මත වූ තොල් ආලේපනය ලස්සනට හැදුවාය.

"ස්වීට්. මෙහෙම කොල්ලා ළඟට පලයන් උඹව ඉතුරු කරන එකක් නෑ."

භාවනාගේ දෙපතුල් සීතල වීගෙන ගියේය. 'ඔයත් මාව එහෙම

ඉතුරුකරන එකක් නැද්ද? මගේ මොකෝ.'

"මං එතන කිස් කරන්න දෙන්නේ නෑ."

තාරකාට පුස් ගා සිනාවක් ගියේය.

"කොල්ලා එතනම තමයි කිස් කරන්න එන්නේ. විනාඩි දහයකට ලිප් ලොක්"

ඇය එය අත්දැකීමෙන් දනියි.

"ඒ නිසා ඒ දවස්වලට මේ ලිප්ස්ටික් කූරක් කොයි වෙලෙත් හෑන්ඩ් බෑග් එකේ දාගෙනම ඉඳපන්. නැත්නම් උඹට එන්න වෙන්නේ ප්ලේන් ලිප්ස්වලින්. එතකොට කට්ටිය වැඩේ දැනගන්නවා."

තාරකා කියා දුන්නාය.

"තාම එහෙම ප්‍රශ්නයන් නෑ."

"ඔය නොඉඳුල්ව තියාගන්න

ගොඩක් දේවල් දන්නෙම නැති වෙලාවක ඉඳුල් වෙනවා බං. ඇරත් කොල්ලව පැත්තක තියමු උඹ නිකං ඉඳීයෑ."

භාවනා තාරකාට ගැසුවාය. 'මටත් හරි ආසයි තමයි ඔයාව කිස් කරන්න. ඒත් චූටි දෙකක් විතරයි.' භාවනා සිතයි.

"යනවා."

භාවනා කීවේ තාරකාව හරි ලස්සනට වැළඳගෙන ඇයව සිපගනිමිනි. කෙල්ල ළඟ හරි සුවඳයි කියා තාරකාට සිතුණි. 'පව් හොඳ කොල්ලෙක් ලැබුනොත් හොඳයි. මේකිට එහෙම හතර පස් දෙනෙක්ට ලව් කරන්න බෑ. අපිට වගේ. අපි ඇදගෙන නානවනේ' තාරකා පැහැදිලිව සිතුවාය.

භාවනා ලස්සන සාලය හරහා පැමිණ පැන්ට්‍රියට ආවේ උදේ කෑම කන්නටය. භාවනාගේ අම්මා වූ ඉඳුනිල් උන්නේ රුවන්තිත් සමඟය. රුවන්ති යනු රඹුක්වැල්ල මහතාගේ එක දුවෙකි. භාවනාගේ පොඩි නැන්දාය. 'කෙල්ල දවසින් දවස ලස්සන වෙනවනේ.' රුවන්ති භාවනා දැක සිතුවාය.

"ඔයා අදත් සීගිරි එකට යනවද පොඩි දුව?"

රුවන්ති ඇසුවාය. භාවනා සිනාසුනාය.

"මම ඕෆ් එක ගන්නේ මට ඕන වෙලාවට විතරයි පොඩි නැන්දා. මේ දවස් ටිකේ යනවා. ඕනවුණාම සීයගෙ න් ඕෆ් එකක් ඉල්ලගන්නවා."

භාවනා කීවාය. ඉඳුනිල්

සිනාසුනාය.

"ගෙදරම පාළුයි තුන්දෙනාම ගියාම."

ඉඳුනිල් කීවාය. භාවනා අම්මාගේ උරහිසට බරවූවාය.

"මං ඉන්න දවස්වල ඔයාගේ නැට්ට වගේ හිටියේ මම. දැන් තේරෙනවා නේද මගේ අගේ."

ඇය හුරතලයෙන් කීවාය.

"තේරෙනවා තේරෙනවා. පැයෙන් පැය එක එක දේවල් හදලා දෙන්නෝන. උදේට කිරිබත් ඕන කියනවා. නමයට කියනවා පාන් ඕන කියලා මාමයිට් ගාලා ආයේ දහයට ඇවිත් කියනවා අඹ අච්චාරු ඕන කියලා. එකොළහට ඇවිත් කියනවා."

"වෙරළු ඕන කියලා. නේද?"

ඇය කියන්නට පෙර කෙල්ල

කීවාය.

"ඒක දීලා ඉවරනම් කමක් නෑ. කෑම කාලා කියනවා සීගිරි එකෙන් අයිස් ක්‍රීම් ගෙනත් දෙන්න කියලා."

ඉඳුනිල් සිනාබරව කීවාය.

"දවසක ගියාම තේරෙයි මම."

භාවනාට කියවිණ.

"ආ. ඔයා මැරිකරලා යන්නද හිතන් ඉන්නේ. එහෙම ඕන නෑ. මැරිකරලා මෙහෙම ඉන්න."

රුවන්ති කීවාය. ඇය හිතාගෙන ඉන්නේ ඇගේ එකම පුතා වූ කෝසළට කෙල්ලව බන්ඳා දෙන්නය. සුරංගි හිතාගෙන ඉන්නේද එහෙමය. ඔහුගේ පුතා වූ මිහිරංගට කෙල්ලව බන්ඳවා දෙන්නටය.

"ඒවා තාම මොනවත් හිතලා නෑ පොඩි නැන්දා. මං තාම පොඩියි."

කෙල්ල කීවාය. ඉඳුනිල් සිනාසුනාය. ඇයටත් තාම මේ කෙල්ල පොඩිය. 'දැන්ම ගියොත් පැත්තම පාළුවෙයි' ඇයට සිතෙයි.

"සුදු පුතා හෙට එනවා පොඩි දුව. මේ දවස් තුනේම එයා යාළුවගේ ෂොප් එකේ වැඩනේ. මට කිව්වා බබාට කියන්නත් කියලා."

රුවන්ති කීවාය. 'කවුද කෝසළයෙක් ගැන මතක් කළේ. හොඳ සුදු පුතා එයා.' භාවනා සිතුවාය.

"ආ ඇත්තද පොඩි නැන්දේ. දැක්කෙත් නෑ තමයි ගොඩ දවසකින්."

භාවනා කීවාය.

"තාත්තා කිව්වා කොල්ලට සීගිරි එකේ ලොකු වගකීමක් දෙනවා කියලා මේ පාර."

රුවන්ති කීවේ ඉඳුනිල් දෙස බලාගෙනය. භාවනා කිසිවක් කීවේ නැත.

"හැමෝම එකතුවෙලා මහන්සිවෙන්න වෙයි පොඩි නැන්දේ. මේ දවස්වල සීගිරි එක ටිකක් වැටිලා තියෙන්නේ."

භාවනා කීවාය.

"මිහිරංගලට මේවා තේරෙන්නේ නෑනේ අක්කේ. කොල්ලා ඇවිත් මොනවාහරි කරයි. ඔය යාළුවත් ඇවිත් එක්කගෙන ගියේ කොල්ලා දක්ෂයා නිසා."

රුවන්ති ආලවට්ටම් දමා කීවාය. භාවනා කිසිවක් කීවේ නැත. 'බලමුකෝ හැමෝම ඇවිත් මොකද කරන්නේ කියලා.' ඇය සිතුවේ එපමණය. මේ කිසිවෙක්ට සීගිරි එක

ගොඩගන්නට බැරියැයි කෙල්ලට සිතෙයි. 'ඒකට මොකක්හරි හාස්කමක් කරන කෙනෙක් මෙතනට එන්න ඕන. ඒත් කවුද' ඇයට තේරෙන්නේ නැත.

"මොනවද අම්මා කන්න තියෙන්නේ?"

භාවනා ඇසුවාය.

"ඉඳි ආප්ප මැණික."

"මට ඔතලා දෙන්න අම්මා. දැන්ම බඩගිනි නෑ."

මෙතනට වී නිස්කලංකයේ කන්නට නොලැබෙන බව දැන් කෙල්ල දනී.

# 15

භාවනා උදෙන්ම ෆැෂන් කලෙක්ෂන් එකට යන්නට සිතුවේ ඇයට ඇඳුමක් ගන්නට නොවේ. හෙට අම්මාගේ උපන් දිනය නිසාය. කෙල්ලට ආස අම්මාට ලස්සන ඇඳුම් දෙක තුනක් ගෙන ලස්සනට පැකින් කර ඇයට දෙන්නටය. අම්මා අඳින්නේ ලා පාට බ්ලවුස්ය. ඇය ආස මෝස්තරය භාවනා දනී. අම්මාට අවුරුදු පනස් දෙකක් යැයි

කෙල්ලට නිකමටවත් සිතෙන්නේ නැත. ඇයට හිතෙන්නේ අම්මාට තාම හතළිස් දෙකයි කියාය.

"අනේ මැණික මාත් එහෙනම් මොනවාහරි අම්මට දෙන්නෝනනේ."

කෙල්ල එළියට යන බව කියන්නට රඹුක්වැල්ල මහතා ළඟට ගිය විට ඔහු කීවේය.

"සීයා මොනවද දෙන්නේ."

"ඔයාගේ අම්මට පුතේ මොනවා දුන්නත් මට මදි. එයා මට ලේලි කෙනෙක් නෙමේ. මගේ ලොකු දුව තමයි අම්මා."

සීයා අම්මාට කොතරම් ආදරේද කියා භාවනා දනී. ඇයත් එහෙමමය. කවුරු හෝ කෑම මේසයේ උන්නද අම්මා මුලින්ම බෙදන්නේ සීයාටය. ඒ ඇයගේ ප්‍රතිපත්තියය.

“මං සල්ලි දෙන්නම්. අම්මට අපි හොඳ සාරියක් ගමු.”

“හා. මං අරන් එන්නම්. පැකින් කරලම ගෙනත් ඔයාගේ කාමරෙන් තියන්නම්.”

භාවනා කීවාය. රඹුක්වැල්ල මහතා මුදල් ටිකක් දුන්නේය.

“ඔයාටත් ඒ ගමන්ම සාරියක් ගන්න.”

“අනේ. මට.”

“ගන්න මැණික.”

“ඉතුරු වුණොත් ඔයාට ලස්සන ෂර්ට් එකක්. හා.”

රඹුක්වැල්ල මහතා සිනාසුනේය. කෙල්ල ගෙනවිත් දුන් කමිස හතර පහක්ම ඔහු සතුව ඇත. එහෙම දෙයක් ගේන්න මතක් වෙන්නේ කෙල්ලටත් නේත්‍රාටත් පමණි.

භාවනා ගියේ රඹුක්වැල්ල මහතාව සිපගෙනය. ඇය එහෙමම සීගිරි එකෙන් පිටවී ගොඩවූයේ රඹුක්වැල්ල මහතාගේ මෝටර් රථයටය. කෙල්ල ගමනක් යන්නට ඕනා වූ විට යන්නේ ඔහුගේ කාරයෙනි. ඇයට කාරයක් අරන් දෙන්නට රඹුක්වැල්ල මහතා හැදුවේය. එහෙත් ඇය එපා කිව්වාය. 'දවසක මම එයාගෙම කාර් එකේ යනවා සීයා' කෙල්ල කිව්වේ එහෙමය.

"අන්කල් මට ෆැෂන් කලෙක්ෂන් එකට යන්නෝන. යමු."

"යමු බේබි."

භාවනා පිටුපස අසුනට බරවූවාය. ඇය සීගිරි එකෙන් පිටවෙද්දීත් බැලුවේ සීගිරි එකේ කා පාක් එක

දෙසය. නගරයේ ඇති සුපිරි වෙළඳ සැල්වලින් ලොකුම කා පාක් එක ඇත්තේ සීගිරි එකටය. ඒත් අද ඉරිදා වීත් එය හිස්ය. කෙල්ලට හරි දුකය. 'මෙහෙම වුනේ කොහොමද?' ඇයට හිතාගන්නට නොහැක.

***   ***   ***   ***   ***

දේවකත් ෆැෂන් කලෙක්ෂන් වෙත පැමිණියේ මීට ටික වෙලාවකට පමණ පෙරය. සීගිරි එකට ඊයේ ආ වෙලාවේ ඔහු මේ විශාල සාප්පුව දැක්කේය. අද ආවේය. ඔහු එහෙමම ගියේ පිරිමි ඇඳුම් අංශයටය. කොල්ලා උඩට යනවිට කාන්තා ඇඳුම් අංශය දෙස නිකමට

බලාගෙන ගියේය.

"ජීවිතේට ලේඩීස් ඇඳුමක් තෝරලා නෑ. දවසක ඉතින් ඔයාට තමයි තෝරන්න එන්නේ මුළින්ම."

කොල්ලා සිතින් කියන්නේ ඔහුගේ අනාගත පෙම්වතියටය. 'දෛවය මොනවා කරන්න හිතාගෙන ඉන්නවද කියලා දෙයියෝ තමයි දන්නේ. ඔහොම යන් දේවෝ. ඔහොම යන්. දවසක උඹේත් හොට පැටලෙයි.' කොල්ලා සිතුවේය.

"පැටලෙන්න කලින් පටලවාගන්න මම ආස නෑ."

දේවක හැමදාමත් එහෙම සිතුවේය. ආදරය යනු සොයාගෙන යා යුතු දෙයක් නොවේයැයි ඔහුට හැමදාම සිතෙයි. එය ලැබියයුතු දෙයකි. 'ලැබීමක් තියේනම් ලැබෙයි.

සමහරුන්ට නොලැබීමම තමයි.’ එහෙමත් වේදැයි ඔහු සිතුවේය.

ඇඳුමක් තෝරන්නට ආවේ සෑහෙන කාලයකට පසුය. දේවක ළඟත් මුදල් ටිකක් ඇත. ඔහු සිතුවේ අප්පච්චීටත් ඇඳුමක් ගන්නටය. ඔහු හැමදාම අඳින්නේ එකම කමිස ටිකය. අප්පච්චී සෑහෙන කාලයක සිට අඳින්නේ සුදු කමිසය.

භාවනා ෆැෂන් කලෙක්ෂන් වෙතට ආවේ දැන්ය. ඇය කෙළින්ම ගියේ කාන්තා ඇඳුම් අංශයටය. අම්මාට ඇඳුම් තෝරන එක මහ දෙයක් නොවේ. අමාරු තමාට තෝරනවා නම්ය. ඒකට අඩුම ගණනේ වරුවක්වත් යන බව භාවනා අත්දැකීමෙන් දනියි. කෙල්ලට එක්කෝ පාට හරි නැත. නැත්නම්

පැටින් එක හරි නැත. ආස ඇඳුමක් තෝරාගත් විට එය කොටය. නැත්නම් දිගය. භාවනා අම්මාට ලස්සන චාම් බ්ලවුස් දෙකකුත් සායකුත් තෝරාගත්තාය. ඇය මේ චාම් ඩිසයින්වලට කැමතිය.

සාරිය තෝරන්නටනම් වෙලාවක් ගතවිය. අද තමාට සාරි තෝරන එක බොරු වැඩක් යැයි කෙල්ලට සිතුණි. ඊකට වෙනමම දවසක ආ යුතුය. එන්නට පෙර තියෙන සාරිවල ටික එළියට ගෙන ඒවා දෙස පැයක් පමණ බලා ආ යුතුය. අලුත් පාටක අලුත් මෝස්තරයක සාරියක් තෝරාගන්නට හැකි එවිටය. සාරි ගන්නවානම් ඇය යන්නේ වැල්ලවත්තටය.

භාවනා අම්මාට තෝරාගත්තේ

ලස්සන දම් පැහැගත් සිහින් මල්කමක් ගිය සාරියකි. ඇය ලොකු බෝඩර්වලට කැමති නැත. ඒ අතින් අම්මාට ඇත්තේ හරි අහිංසක සිතක් යැයි භාවනාට සිතෙයි. කොහොමත් ඇය නිහඬ නිස්කලංක කාන්තාවකි.

"අපේ තාත්තට කිසි දෙයක් හරියට තෝරගන්න බැහැ. කා එකක් ගත්තත් ගන්නේ මහ ගෝඩි කාර් එකක්. ඒත් මැරිකරනකොට එයාව නම් හරියටම තෝරගෙන තියෙනවා. ලකුණු සීයෙන් දෙසියක් දෙනවා ඒකට. සුපර් තේරීමක් ඒක. එයා හරියට කියලා ජීවිතේ තේරුවේ එච්චරයි. ඒකත් ඉතින් ඇති. ගොඩක් පිරිමින්ට බැරිත් ඒකනේ."

කෙල්ල මෙහෙම සිතා ඇත්තේ දවසක් දෙකක් නොවේ. දවසක්

ඇය මේ කතාව හැමෝම ඉදිරියේ කීවාය. මිලින්ද සිනාසුණේය. කෙල්ල කියන්නේ ඇත්ත බව ඔහු දනී.

සාරිය ටිකක් මිලය. ඒත් ඒ ගාණට පාඩුත් නැත. යුවතිය තෝරාගත් ඇඳුම් සියල්ලම බෑගයක දමාගෙන උඩු මහලේ වූ පිරිමි ඇඳුම් අංශය වෙත ගියේ සීයාට කමිසයක් තෝරන්නටය. සීයා හැමදාම අඳින්නේ සුදු කමිසය. කෙල්ල අද සිතුවේ ඔහුට ඊට වඩා වෙනස් පාටක කමිසයක් තෝරන්නටය.

දේවක උන්නේද කමිස රාක්කය අසළමය. කොල්ලා ආසම ස්ට්‍රිප්ස් ගිය කමිසවලටය. ඒ කියන්නේ සිහින් ඉරක් ගිය කමිසවලටය. ඔහු කමිසයක් ගන්නවානම් ගන්නේ එහෙමය. ලා පාට පසුබිමේ සිහින්

ඉරක් ගිය විට හරි ලස්සනය. කොල්ලා කොහොමත් උසය. ඒ නිසා එවැනි මෝස්තර ලස්සනය.

දෙන්නා කමිස තේරුවේ ඒ පැත්තේ මේ පැත්තේ සිටය.

කෙල්ලව මුලින්ම දැක්කේ දේවකය. ඔහුගේ දෙපාන්තයේ සිට ඇවිලීගෙන ගියේය. 'මේ සීගිරි එකේ හිටපු මිස්නේ' දේවකට ඔහුගේ දෑස් අදහාගන්නට නොහැක. ඔහු යළිත් ඇය දෙස ඕනාකමින් බැලුවේය. නැත. මේ ඇස්වලට වරදින්නට හේතුවක් නැත. කොහෙත්ම නැත. ඇයගේ රූපය කොඩැක් සේයාරුවක් මෙන් ලස්සනට මේ හිතේ ඇඳී ඇත. 'අද එයාගේ ලස්සන. ටයිට් ස්කට් එකක් ඇඳලා. එක විදිහක්නේ.' දේවකගේ පපුව අලුත් ලෝබකමකින්

පිරිගියේය. 'දැන් මොකද කරන්නේ. පොඩ්ඩක් කතාකරන්නත් හරි ආසයි' දේවකට සිතුණි. ඒත් එහෙම කරන එක හරිද කියා දේවකම සිතුවේය. 'හෙට මම එතන ඉන්ටවීව් යන්නත් ඉන්න එකේ.' මොනවා කරන්නද කියා හිතෙන්නේ නැත. දැන් කොල්ලාට තෝරන තෝරන කමිසය හරියන්නේ නැත. බැලෙන්නේම ඇය දෙසය.

භාවනාගේ දෑස් තිබුනේ කමිස රාක්කයේමය. භාවනා එක කමිසයක් තෝරාගත්තාය. ඒත් ඇය තෝරාගත්තේ එහි පහළොවාමාරය. සීයාගේ කොළර් සයිස් එක දාසයය. දේවකගේ දෙනෙත් තිබුනේ කෙල්ල වෙතමය. 'බෝයි ෆ්‍රෙන්ඩ්ටද ෂර්ට් තෝරන්නේ' දේවක දුක්බරව සිතුවේය. 'මටත් ඉන්න තිබුණා එහෙම කෙනෙක්.' ඔහුගේ සිත

කියයි.

"මේ. මේ ඩිසයින් එකේ දාසය මට දෙන්න."

භාවනා සාප්පුවේ උන් සේල්ස් තරුණයෙක්ට කීවාය. දේවක ඇය තෝරාගත් ඩිසයින් එකේ සයිස් දාසය අතට ගත්තේය. 'හොඳ චොයිස් එකක් තියෙන්නේ ඔයාට' ඔහු සිතුවේය. කොල්ලා සයිස් දාසය කමිසය අතට ගෙන ඇය වෙතට ආවාය. 'මාරයිනේ. මොනවද දේවෝ මේ කරන්න යන්නේ. බය නැද්ද උඹට' ඔහුතේ හිත කීවේය.

"මෙන්න සයිස් දාසය මිස්."

දේවක ඇය සෙවූ සයිස් එකේ කමිසය ඇයට පෑවාය. භාවනා ඔහු දෙස බැලුවේ එවිටය. ඇයගේ දෙපා වෙව්ලන්නට විය. 'අනේ දෙයියනේ

එයා.' ඇය පපුව ඇකිලීයද්දි සිතුවාය. 'කොහොමද මෙතනට ආවේ. එයාම තමයි.' ඇය සිතුවාය.

"මේ. මේ."

ඇය ගොත ගැසුවාය.

"සීගිරි එකේ මිස් නේද? මම ඊයේ අර ෆේස් වොෂ් නෑවේ. මතකද දන්නේ නෑ."

කොල්ලා මෘදුව සිනාසී කීවේය. කෙල්ලගේ මුව මත තුනී සිනාවක් සටහන් විය. 'එහෙම වුණේ කොහොමද?' ඇය සිතුවාය.

"මට මතකයි.ෂර්ට් තෝරන්න ආවද?"

ඇය දෙනෙත් බරකරගෙන ඇසුවාය.

"ඔව්. මට හෙට මේ ඉන්ටවීව් එකක්."

ඔහු කීවේය. 'ඉන්ටවීව් එක සීගිරි එකේ' ඔහුට කියන්නට සිතුණි. 'ඒවා වැඩි වැඩ කොල්ලෝ.'

"අර මේ කමිසේ ෆේස් වොෂ් මාක් එක ගියාද?"

කෙල්ල බිම බලාගෙන සිනාබරව ඇසුවාය.

"සේදුවා සේදුවා. ටිකක් ගියා. යන්නම හේදුවේ නෑ. ඒකත් ලස්සන පැටින් එකනේ"

"සොරි. වයිෆ් බනින්නත් ඇති."

කොල්ලා සිනාසුණේය. කිසිවක් කීවේ නැත. 'මං ෆේස් වොෂ් හැලුවේ තිබ්බ හොඳම කමිසෙද දන්නේ නෑ.' ඇය සිතුවාය. 'තාම ඉන්ටර්වීව් යනවද? මැරිකරන්න කලින්නේ ඒවා කරගෙන ඉවරකරන්න ඕන.' භාවනා සිතුවාය.

"මේකත් සයිස් දාසය මිස්."

දේවක ඇය තෝරන මෝස්තරයේම තවත් කමිසයක් තොරා දුන්නේය. භාවනා නෙතඟින් ඔහු දෙස බැලුවාය. 'හරි පුරුදුයි එයා. එකපාරක් දැකලත් මතක තිබුන හැටි.' ඇය සිතුවේ සිතිවිලි අවුල්ව යද්දීය.

"මොකක්ද දන්නේ නෑ ලස්සනම."

"බෝයි ෆ්‍රෙන්ඩ් ඔෆිස් යන කෙනෙක්ද මිස්. එහෙමනම් මේක තමයි ලස්සන."

කොල්ලා කීවේය. කෙල්ල ඇස් ගෙඩි දෙක ලොකුකර ඔහු දෙස බැලුවාය. 'පිස්සෙක්. කවුද බෝයි ෆ්‍රෙන්ඩ්ලට කමිස තේරුවේ.' ඇය සිතින් බැන්නාය.

"මම තේරුවේ මගේ සීයට."

කෙල්ල කීවාය. දේවකගේ සිතට සැනසීමක් දැනුණි. ඒ ඇයිදැයි දන්නේ නැත.

"ආ. එහෙනම් මේක තමයි ලස්සන මිස්."

කෙල්ලත් ආස ඒ සුදුත් අළු පැහැයත් මුසුවූ කමිසයටය. ඇය එය බෑගයේ දමාගත්තාය.

"යන්නම්."

කෙල්ල කීවාය. 'අපරාදේ තවත් ෂර්ට් එකක් තෝර තෝර ඉන්න තිබුණා ඒත් මොකටද' ඇය සිතුවාය.

"හොඳයි මිස්. බුදු සරණයි."

දේවකට කියවිණ. ඇයට හැරී බැලිණ. භාවනාගේ පපුවට මොකක්ද විය.

"බුදු සරණයි."

ඇය ගියේ එසේ තොල් මතුරාගෙ

නය. දේවක ඈය යන දෙස බලාගෙ නම උන්නේය. පහළට යන පඩිපෙළ ළඟදී භාවනා හැරී බැලුවාය. කෙල්ල දැක්කේ තමා යන දෙසම බලාගෙන උන් දේවක ය. ඇගේ දෙපතුල් සීතලවිගෙ ගියාය. 'මගේ හොරේ අහුවුණා මගේ මොකද එයත් මම යන දිහා බලාගෙනනේ උන්නේ පිස්සෙක්' කෙල්ල පහළට බැස්සේ මුව මත ඇඳුන තුනී සිනාවක් සමඟය.

"පහළ ලේඩීස් ඇඳුම් තෝරන්න ආවේ නැහැ. සමහරවිට එයාගේ ඇඳුම් අරන් පස්සේ වයිෆ්ට තෝරනවා ඇති. ඒත් ඇයි මට හිතෙන්නේ එයා මැරිකරලා නෑ කියලා. තාම ජොබ් එකක් කරන්නෙත් නෑ. ඒකනේ ඊයේ සිගිරි එකේ හිටියේ අද ෆැෂන් කලෙක්ෂන් එකේ."

භාවනා කැෂියර් එක වෙත ගියේ එවන් සිතිවිලි වලින් හදවත අවුල්ව යද්දීය. දේවක ඒත් සමඟම පහළට ආවේ කෙල්ල යන්නට පෙර තවත් වරක් බලාගන්නටත් එක්කය. ඔහු ඇය පිටුපසින්ම සිටගත්තේය. 'ලේඩීස් ඇඳුම් තෝරන්න ගියේ නෑ' ඇය සිතින් සිතුවාය.

දේවකට ඇමතුමක් ආවේය. 'වයිෆ් ගන්නවා ඇති. කොල්ලා කොහෙද කියලා බලන්න එහෙම තමයි ඉන්නෝන. මේ කොල්ලෝ විශ්වාස නෑ.' භාවනා සිතුවාය. ඇගේ කන් ඇත්තේ ඇමතුමේය.

"කියන්න අප්පච්චි."

දේවක කතාකළේය. 'අප්පච්චි කතාකරන්නේ එයා නුවරද හරිනේ. සර්නේම් එක පුංචි බණ්ඩාරනේ'

"ඔච් අප්පච්චි මේ දැන් ගත්තා. ඔච් නෑ නෑ ඇතිවුණා. මම අප්පච්චිටත් ෂර්ට් එකක් ගත්තා."

දේවක කීවේය. භාවනා අසාගෙ නම උන්නාය. 'අප්පච්චි තමයි ඇඳුම් ගන්න සල්ලි දීලා තියෙන්නේ. ඒ කියන්නේ' භාවනා ඊට එහා සිතන්නට ගියේ නැත.

"නෑ අප්පච්චි. තාම කෑවේ නෑ. මැඟින් මොනවාහරි කනවා. හා. එහෙනම් මම රෑට කෑම හදන්නේ නෑ. හා අප්පච්චි."

දේවක ඇමතුම තැබුවේය. 'කෙල්ලත් ඔක්කොම අහගෙන ඉන්න ඇති.' දේවක ලැජ්ජාවෙන් සිතුවේය. 'එයාද එතකොට ගෙදර කෑම හදන්නේ. කෝ වයිෆ් එතකොට. ඒක මේ මමම හදාගත්ත

බොරුවක්ද? අප්පච්චී එක්ක හරි ආදරෙන් කතාකළේ. අප්පච්චිත් පුතාට හරි ආදරෙයි වගේ. කෑවද කියලත් කතාකරලා අහන්නේ ඒකනේ. අප්පච්චි රෑට කෑම අරන් එනවා ඇති. ඒකනේ කිව්වේ රෑට කෑම හදන්නේ නෑ එහෙනම් කියලා' භාවනා එහෙන් මෙහෙන් අහුලාගත් වචනලින් කතාවක් හදාගත්තාය.

කෙල්ල බිල ගෙව්වාය. ඇය බෑග් ටික අතට ගත්තේ දේවක දෙස බලාගෙනමය.

"යන්නම්."

කෙල්ලට කියවිණ.

"හොඳයි මිස්."

දේවක කිවේය. ඇය සාප්පුවෙන් පිටව යන තුරුම දේවක බලාගෙන උන්නේය. 'හෙට අපි මුණගැ

උහෙයිනේ.' ඔහු සිතුවේය.

පපුවේ පැත්තක් දවාගෙන එන්නාක් මෙන් භාවනාට දැනෙයි. එය එසේ මෙසේ දැවිල්ලක් නොවේ. පපුවේ කුහර කකියාගෙන එන දැවිල්ලකි. ඇය වාහනයට ගොඩවූයේ ඕනවටත් වඩා වෙලා ගෙනය. තව පාරක් ඔහුව බලා යන්නට මේ ඇස්වලට දැනෙන ආසාව කුමක්ද කියා භාවනාට තේරෙන්නේ නැත.

"අපි යන්ද බේබි."

"ඉන්න අන්කල් ටිකක්. මට මේ තව මොකක්ද ගන්න හිතන් ගියේ. මතක් වෙන්නේ නෑ."

ඇය එසේ කියා වේගයෙන් පපුවට පිඹගත්තාය. හදවතේ ගින්දරක් ඇතිවිට එහෙම කරන්නේ

ඒ පිඹින හුස්මෙන්වත් පපුවේ ගින්දර නිවෙයි කියා සිතාගෙනය. එහෙම සිතුවත් කවදාවත් පිඹලා පපුවේ ගින්දර නැතිකරගන්නට අමාරුය.

දේවක ආවේ විනාඩි පහකට පමණ පසුය. පිටතට ආ කොල්ලාගේ ඇස් කැරකෙයි. 'එයත් ඇස් කරකව කරකව කාවද හොයන්නේ.' භාවනා ඔහුගේ නොසන්සුන් දෑස් දෙස බලාගෙන උන්නාය. ඇයගේ දෙතොලතර තුනී සිනාවක් සටහන් විය. 'ඔයා කාවද හොයනවා. මාවද' භාවනා සිතුවාය. ඇය පැති වීදුරුවෙන් දේවක දෙස බලාගෙනම උන්නාය. එහෙම බලාගෙන ඉන්න පුළුවන් මේ වීදුරුවෙන් එපිට සිට බලන කෙනෙක්ට ඇතුලේ ඉන්නා කෙනාව හරිහැටි නොපෙනෙන නිසාය. 'ඔයා යනවා.' දේවක පාරට

එද්දී භාවනා තොල්පට තදකරගෙන සිතුවාය.

"අපි යන් අන්කල්. පස්සේ ඇවිත් ගන්නවා"

භාවනා සුසුමක් හෙළා කීවාය. ෆැෂන් කලෙක්ෂන් එකේ කා පාක් එකේ සිට යන වාහනය දෙස දේවකට බැලුනේ ඉබේටමය. ඔහු මෙතෙක් වෙලා සෙවූ රුව එහි පිටුපස අසුනේ උන්නාය. දේවකගේ අත උඩට ගියේ ඉබේටමය. භාවනාද ඇතුළත සිට අත වැනුවාය. ඔහු ඒ සිනහව දැකගත්තේ පැති වීදුරුව අතරිනි. 'ඔයා ලස්සනට මාත් එක්ක හිනාවුණා.' දේවක සිතුවේය.

ඇය රැගත් වාහනය ඈත පාරේ නොපෙනී යනතුරුම දේවක බලාගෙන උන්නේය. 'ඔයා ගියේ

මගේ තිබ්බ මොකක්ද අවයවයකුත් අරගෙන වගේ මිස්. මගේ අම්මේ සිහිනැතිවෙන්නත් වගේ' දේවක මහපාර මැද හිටගෙන සිතුවේය. ත්‍රී වීල් රියදුරෙක් එක දිගට නලාව නාද කළේ ඔහුට මහ පාර මැද්දෙන් අයින් වෙන්න කියන්නටය. කොල්ලා සිනාසී පාරේ අයිනට පැන්නේය. 'මොනවද මේ වෙන්නේ දේවෝ.'

ඔහු ඇඳුම් බෑග් දෙකත් අරගෙ නම අසළ වූ තෝසේ කඩයට ගොඩවූයේ උණු කිරි හොදි සමඟ ඉඳි ආප්ප ටිකක් කන්නටය. දේවක සයිවර් හෝටලයට ගොඩවී ඉඳි ආප්ප ගෙන්වාගත්තේය. ඔහු ආසම සයිවර් හෝටලයේ දුම් දමන කිරි හොද්දටය. එය කෑ යුත්තේ රතු මිරිස් පාටින් යුතු සයිවර් සම්බෝලයත් අමු මිරිස්

පාටින් යුතු සයිවර් සම්බෝලයත් යන දෙකම දාගෙනය.

"වඩේ කොහොමද?"

"දැන් දැම්මේ මහත්තයා."

"ගේන්න උළුඳු වඩයක්."

කොල්ලාට උළුඳු වඩේ තියෙනවානම් වෙන මොනවත් ඕන නැත. ඒක පුරුදු කළේ ජීවන්ය. අප්පච්චිත් පුතාත් සමහර දවස්වලට පාන් කන්නේද උළුඳු වඩේ සමඟය. එය රසවත් කෑමකි. ඉන්දියාවේ ඒකට කියන්නේ 'වඩ පාව්' බව දේවක දැනගත්තේ ඔහුගේ මිතුරෙක්ගෙනි. 'ඒක මචං හදන්නේ පාන් පෙති දෙකක් අරගෙන ඒකට ග්‍රීන් චිලී චට්නි ගානවා. මේ අමුමිරිස් වලින් හදන්නේ. ඒක ගාලා උණු උණු උළුඳු වඩයක් මැදින් තියලා

කනවා. මාර පාර බං.' ඔහු දේවකට කීවේය. දවසක් ඔහු එහෙම කෑවේය. ඒක මාර පාර බව එදා ඔහුද දැනගත්තේය.

ඉඳි ආප්ප කන ගමනුත් ඔහුට සිහිවෙන්නේ කෙල්ලවය. 'ඔයාගේ අද ලස්සන. මාව මතක තිබුණා ඔයාට. ඒකම ඇතිනේ. ඔයාට පුදුමත් හිතෙයි මම හෙට සිගිරි එකට ඉන්ටවීව් එනකොට මොනවා කරන්නද? අපි දෙන්නව දෛවය ඊට කලින් මුණ ගැස්සුවනේ මිස්'

"එයා කිව්වේ ෂර්ට් එක තෝරන්නේ සීයට කියලා. ඒකියන්නේ මගෙත් සීයටද? අනේ ඔයා මගේ නෑනද? එතකොට අප්පච්චි කිව්වේ අම්මගේ අයියගේ දුවෙක්ද දන්නේ නෑ දැක්කේ කියලා. සමහරවිට

එහෙමත් වෙන්න ඇති.'

මේ දෛවය මහ පුදුමාකාරය. අද රෑට ටිකක් නිදාගන්නේ නැතුව හෙට ඉන්ටර්වීව් එකට මුහුණ දෙන ආකාරය ගැන ටිකක් සිතිය යුතුය.

"සුපර් මාර්කට් මාස්ටර්ලා ඉන්ටවීව් එකට එන්න පුළුවන් එහෙමනේ. බලමුකෝ."

සියල්ල සිතන්නේ අද රෑ කියා දේවක සිතාගත්තේය.

"නිකම්ම සහතික ටික දික්කළාට සීයා මාව ගන්නේ නෑ කියලා මම දන්නවා. ඔයත් ලේසි පාසු කෙනෙක් නෙමේනේ සීයේ. ලංකාවේ සුපර් මාර්කට් නැති කාලේ සුපර් මාර්කට් ලංකාවට ගෙනාපු කෙනෙක් ඔයා. එහෙම කෙනා මේ මාකටින් සටිෆිකට් එකක් දැකලා

හෙට ඉඳලා වැඩට එන්න කියන්නේ නෑ. මාත් ඒක දන්නවා."

දේවක තව ඉඳි ආප්ප තුනක් දාගත්තේය. කිරි හොද්ද රසය.

"ඒත් සීයේ ඔයා මාව හෙට ගන්නවා. මම ලබන සතියේ ඉඳලා සීගිරි එකේ වැඩ."

දේවක සිතුවේය. හිතුවොත් කරන්නට බැරි දෙයක් නැතැයි ඔහු විශ්වාස කළේය. ඉඳි ආප්ප ටිකට බඩ ෆුල්ය.ආයේ දැන් දවල්ට කන්න ඕන නැත. හවසට හොඳ ප්ලේන්ටියක් හදාගත් විට ඇතිය. රෑට උයන්නටද නැත. ඒ නිසා පැත්තක් අල්ලගෙන කල්පනා කරන්නට පුළුවන.

"ඔයාව දකින එකත් ඇස්දෙකට සමන් පිච්ච මල් වතුර දානවා වගේ.

ඒක මාරයි. පතනවානම් අන්න පැතුමක්. හැමදාම උදේ ඔයාව දකින්න ලැබෙන්න කියලා."

දේවක ගෙදර යන ගමන් සිතුවේය.

"කෙල්ලට වෙන වැඩක් නෑනේ. ලස්සන කොල්ලෙක් ඇති. සමහරවිට එන්ගේජ් වෙලත් ඇති."

දේවක හරි දුකෙන් බිම බලාගෙ නම ආවේය. 'මම කඩන මල්.' ඔහු අසරණව සිතුවේය.

# 16

භාවනාටනම් ටිකක් උණාත් වාගෙ ය. ඇය වාහනයේ එද්දී ගෙළටත් අත තබා බැලුවාය. එහෙමම රස්නයක් නැත. ඇරත් වාහනයේ ඒ සී එකත් වැඩිය.

"ඒත් මොකක්ද දේකින් පිච්චෙනවා වගේනේ."

ඇය සිතුවේ අසරණවය. යන්තමට ඇස් පියාගත් විටත් මැවෙන්නේ ඒ රුවය. ඔහු අප්පච්චි

හා කතාකළ වචන කෙල්ලට ඇසෙන්නාක් ඇසෙන්නාක් වැනිය. 'නෑ අප්පච්චි. තාම කෑවේ නෑ. මඟින් මොනවාහරි කනවා. හා. එහෙනම් මම රෑට කෑම හදන්නේ නෑ. හා අප්පච්චි.' ඔහු පුදුමමම කෙනෙකි. කෙල්ල නිකමට මේ ඉන්නේ මිහිරංග කියා සිතුවාය. ඇයට බකස් ගා හිනායන්නට ආවේය. 'මිහිරංග අයියා වගේ කෙනෙක් එක්ක එයාව සංසන්දනය කරන එකත් ගොන්කමක්. පවක්' ඇය සිතුවාය. 'අනේ පව්. ඉතින් මේ කොල්ලද ගෙදර උයන්නේ. ඒක කියපු ලස්සන. එතකොට කෝ අම්මා ඇත්තටම' භාවනාට එය පුදුමයකි.

"හොඳ ජොබ් එකකට වෙන්න ඇති හෙට ඉන්ටර්වීව් යන්නේ. ඉගෙන ගත්ත වැදගත් පාට

තියෙනවා එයාගේ. ගොඩක්ම වයසකුත් නෑනේ. සමහරවිට ෆස්ට් ජොබ් එක වෙන්නත් ඇති මම මේ හිතුවට එයා මැරිකරලා කියලා."

ඔහු විවාහ වී උන්නේ නැතත් කෙල්ලෙක් නැතැයි සිතිය නොහැක. 'එහෙම කොල්ලෝ කොහෙද අද? එක්කෙනෙක් නෙමේ. දෙතුන් දෙනෙක්ම ඇති' භාවනා සිතුවාය. ඒත් එහෙමම හිතන එක සාධාරණද කියා ඇය පසුව කල්පනා කළාය. 'නල්ල මලේ කෙල්ලෙක්ට අහුවුනොත් ඉතින් කොල්ලා ඉවරයි' ඒ ගැන සිතා තමා දුක් විඳින්නේ අහවල් එකටද කියා භාවනා සිතුවාය.

කෙල්ල සීගිරි එකට ආවේ මේ සිතිවිලි මැදමය. ඒත් සීගිරි එකේ කැෂියර් එකක් ළඟ වූ කෑ ගැසීම

දැක කෙල්ලගේ ඇඟ සීතල වීගෙන ගියාය. ඇය දුවගෙන මෙන් ආවාය.

"ඇයි අනූජා මේ?"

භාවනා ඇසුවේ කැෂියර් එකේ අනූජාගෙනි. කෙල්ලගේ මුහුණම බියපත්ව ඇත.

"ආ යූ ද ඉන්චාජ් දිස් සෙක්ෂන්."

කැෂියර් එකේ කෑ ගසමින් උන් කාන්තාව ඇසුවාය. කෙල්ලටත් බය සිතුණි. 'ලෙඩක් වගේ'

"යර්ස් මැඩම්."

"සී. මේ බලන්න. ඔයාලා මොනවද මේ සුපිරි බඩු කියලා අපට විකුණන්නේ. ආ. අපි මේ ගැන කන්සියුමර් එකට ඉන්ෆෝම් කරනවා."

ඇය කතාකළේ කේන්තියෙනි. සමහර පාරිභෝගිකයෝ එහෙමය.

එන්නේම ගහගන්නය. අවශ්‍යම දේ ඉවසීමය. ඇය පෙන්වූයේ බෝතල් කළ පොල් තෙල් බෝතලයකි. මේ පොල් තෙල් මේ දිනවල ජනප්‍රිය 'ෆෝචූල් පොත් තෙල්' හෝ 'එන් ජෝයි' නමින් එන පොත් තෙල් වර්ගය නොවේ. වෙන මොකක්ද නමකින් දැමූ එකකි. පොල් තෙල් මුඬු පාටය.

"මේ ස්මෙල් කරලා බලන්න. ඔයාලා මොනවද කියන්නේ නාමය සුපිරි. මේවා සුපිරි කියලද කියන්නේ ආ."

ඇය පොල් තෙල් බෝතලය කෙල්ලගේ මුහුණටම ගැසුවාය. භාවනාට ලැජ්ජත් එක්කය. ඒත් කරන්න දෙයක් නැත. ඇය කියන්නේ ඇත්තය. පොත් තෙල් මූඩිය විවර

කරද්දීම මුඬු ගඳ ආවේය.

"මේවා හොඳයි පුන්නක්කු බදින්න. කුකින් කරන්න නෙමේ. අපි සීගිරි එකට ආවේ මෙහෙම කරයි කියලා හිතාගෙන නෙමේ. පාස්ට් ටුවෙන්ටි ඉයර්ස් අපි සීගිරි එකට ආපු කස්ටමස්ලා. පාස්ට් ටුවෙන්ටි ඉයර්ස්"

ඇයගේ තරහව සාධාරණය.

"අයම් සොරි මැඩම්. මේ බාල ප්‍රඩක්ට් එකක් තමයි. මම දැන්මම සප්ලයර්ට කතාකරන්නම්. ඔක්කොම බොට්ල්ස් අපි රිමූ කරනවා."

භාවනා කීවාය. රඹුක්වැල්ල මහතා මේ සියල්ල අසාගෙනය. ඔහු ඒත් එතනට ආවේ නැත. ඔහුට ලැජ් ජය.

"ඇයි බැරි හරි දේ පර්චස්

කරන්න. මොනවද මේ බාල බඩු. ඔයාලට වැඩි කොමිෂන් එකක් ඇති ඒකනේ මේවා දාන්නේ. කොහොමද මිනිස්සු මේවා අරන් ගිහින් බැඳුමක් හදන්නේ. පපඩමක් ෆරයි කරන්නේ."

"අයම් සොරි මැඩම්. මේ මැඩම්ගේ කෑෂ් රිටන් කරන්න අනූ. අයම් සොරි මැඩම්"

භාවනා යළි යළිත් ඇයගෙන් සමාව ඉල්ලුවාය.

"කෝ දෙන්න. ඒත් අපි ආයෙත් සිගිරි එකට එන්නේ නෑ. යු බෙට අන්ඩර්ස්ටෑන්ඩ් දිස්. නෙවර් ඩූ දැට්."

ඇය ගියේ එසේ කියමිනි. මේ කතාව සීගිරි එකට ආ සෑහෙන පාරිභෝගිකයන් පිරිසක්ද අසාගෙනය.

භාවනා පර්චසින් අංශය වෙත

ආවේ වේගයෙනි. ඈය කෙළින්ම ගියේ එහි සුපවර්සර් සරත්ළඟටය.

"සරත් කියන්න කොහොමද මේ බාල පොල් තෙල් බෝතලේ සීගිරි එකට ආවේ."

ඔහු බිම බලාගත්තේය. භාවනා බැලුවේ නේත්‍රා දෙසය.

"අක්කි දැනගන්න ඕන මේක. කියන්න."

භාවනා කීවාය. රඹුක්වැල්ල මහතාද බලාගෙන උන්නේය.

"කියන්න සරත්. කොහොමද ආවේ."

ඔහු කතාකරන්නේ නැත.

"ඇයි කියන්නේ නැත්තේ. තවත් අර වගේ දේවල් වෙන්නද සරත්ලට ඕන. ඔයාලත් රස්සාව කරන තැනනේ මේක. ඇයි මේ."

භාවනා කතාකළේ කැක්කුමෙනි.

"කියන්න සරත්."

"මේ මිස් මේ මිහිරංග සර් තමා මේ ගන්න කිව්වේ. මම ඒකයි අත්සන් කළේ. නේත්‍රා මිස්ට කියලා තියෙන්නේ කිව්වා. ඒකයි ගත්තේ. මේ මිහිරංග සර්ගේ යාළුවෙක් කියලද කොහෙද?"

භාවනා සුසුමක් හෙළුවාය.

"කොච්චර ගත්තද?"

"ගිය මාසේ බොට්ල්ස් තුන්සීයක් දැම්මා. ෆෝ හන්ඩ්‍රඩ් එම් එල් දෙසීයයි සෙවන්ටි ෆයිව් එම් එල් සීයයි."

"තව සරත්."

"මේ මාසේ පළවෙනිදා තව බොට්ල්ස් හාරසීයක් ගත්තා."

"එතකොට සෙකන්ඩ් ඕඩර් එක

ප්ලේස් කරද්දි බැලුවද කලින් ඕඩර් එකේ කොච්චර බොට්ල්ස් ගියාද කොච්චර ඉතුරද කියලා."

ඔහු බිම බලාගත්තේය.

"ඇයි සරත් කියන්න."

භාවනා කීවාය. කෙල්ල ඉන්නේ වෙව්ලමින් මෙන්ය. කැෂියර් එකේදී අර කාන්තාවගේ බැණුම් සියල්ල අසාගෙන ඉන්නට වූයේ වැරද්ද සීගිරි එකේ නිසාය.

"බැලුවා මිස්"

"ඔක්කොම ගිහින්ද?"

භාවනා ඇසුවාය. සරත් කතාකරන්නේ නැත

"ඔයා කියන්නේ නෑනේ සරත්. මට කියන්න කවදද දෙවෙනි ඕඩර් එක දැම්මේ කියලා මම සිස්ටම් එකෙන් බලාගන්නම් එදාට තිබ්බ ස්ටොක්

එක"

භාවනා කීවාය. ඇත්තටම එහෙම බලාගන්නට පුළුවන.

"එදා මිස් බොට්ල්ස් එකසිය අසූවක් බැලන්ස් තිබුණා."

සරත් වැඩ වරදින්නට එන බව දැනගෙන කීවේය. රස්සාව ගැස්සී යන්නේ ඔහුගේය.

"එකසිය අසූවක් තියෙද්දියි එහෙනම් දෙවෙනි ඕඩර් එකත් දැම්මේ. එතකොට පේමන්ට්ස්."

"එයාලා චෙක් එක අරන් ගියා."

"අක්කි බැලුවේ නෑ ස්ටෝර්ස් රෙකොඩ් එක."

"මං හැමදාම බලලයි බබා චෙක් එක ඉෂූ කරන්නේ."

"එහෙම කොහොමද වුණේ."

සිදුවී ඇතිදේ භාවනා දනී.

ස්ටෝර්ස් බාර දී ඇත්තේ මලීෂාටය. භාවනා නේත්‍රා දෙස බැලුවාය. කෙල්ලෝ දෙන්නාම සිදුවී ඇතිදේ ඉවෙන් මෙන් තේරුම් ගත්තාය.

"දෙවෙනි චෙක් එක අරන් ගියේ නෑනේ තාම"

"නෑ මිස්"

"බඩු ඔක්කොම රිටන් කරන්න. බැලන්ස් එකක් තිබුනොත් එයාලට ඒක ගෙවන්න කියන්න. මේවට මිනිස්සු බැනලා යනවා ඇති හෙට අනිද්දා ඇවිත් කන්සියුමර් එකෙන් අපිව ඇරෙස්ට් කරයි. ආ සරත් මේක අරන් ගිහින් අද කරවල ටිකක් තෙල් දාලා බලන්න."

භාවනා සෙනරත් අතට පොල් තෙල් බෝතලය දී කීවාය. ඇය ඇගේ මේසයට ආවේ පුදුමාකර

කෙඩෙත්තුවකිනි. 'හිතේ හරි සතුටක් තියාගෙන ආවේ. ඔක්කොම පිච්චිලා ගියා' භාවනා සිතුවේ දුකෙනි.

රඹුක්වැල්ල මහතා ආවේ කළුකිරුණු මුහුණිනි.

"සීයා."

කෙල්ල කතාකළේය.

"කියන්න මැණික."

"හවසට සීයා වැඩක්ද?"

භාවනා ඇසුවාය. නේත්‍රාද බැලුවාය.

"ඇයි පුතේ."

"නෑ සියා. අපි හවස ටිකක් කට්ටියම ගෙනල්ලා කතාකරමුද? මේක මෙහෙම කරන්න බෑ. හෙට ඉන්ටර්වීව් එකකුත්නේ"

රඹුක්වැල්ල මහතාට පුදුමය. ඔහු මේ ඒක සිතුවා විතරය.

"තාත්තිටත් ටිකක් එන්න කියමු. එයත් ඉන්නෝන."

"ඇත්ත. තාත්තා ගියාට පස්සේ ගොඩක් ප්‍රශ්න ආවා."

භාවනාත් එය දනී. තාත්තා ගියේ සිගිරි එකේම එල්ලීගෙන ඉන්නට අමාරු නිසාය. ඔහු වෙනත් ව්‍යාපාරයක්ද කරන්න  ගත්තේ ඉන්නේ කෙල්ලෝම තුන්දෙනෙක් නිසාය.

"එයිට් තර්ටි විතර සියා. ගෙදර කරමු."

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

"සීගිරි එකට මෙහෙම වෙන්න දෙන්න බෑ සීයා."

භාවනා කීවාය.

"මේක කොච්චර ලස්සනට තිබුණ

තැනක්ද මැණික."

සීයාගේ මුහුණේ ඇත්තේ බලාපොරොත්තු කඩවූ බවක් යැයි භාවනාට සිතුණි.

"අපි කතාකරලා බලමුකෝ. තැන තැන කුටුකුටු ගාලා වැඩක් නෑ. මමනම් එහෙම ආසත් නෑ සීයා."

භාවනා කීවාය. නේත්‍රාද හිස වැනුවාය.

"ඔව්. මටත් කතාකරන්න ඕන. කෝසලළටත් පෝස්ට් එකක් දෙන්න කියලා පොඩි නැන්දා කියනවා ඒකත් කරන්න වෙනවා."

භාවනා බිම බලාගත්තාය. මේ සිදුවී ඇත්තේ එයය. 'හැමෝම මේකේ මැනේජ්මන්ට් එකට ඇවිත්. එහෙම තැනක් පාලනය කරන්න බෑ. හරියට එක්කෙනෙක් පාලනය

කරන්න ඕන' භාවනා සිතුවාය. ඒත් කරන්න දෙයක්ද නැත. සීගිරි එක මේ හැමෝටම හිමිය. දවසක සීයා මේවා කොහොම බෙදයිද කියා කිසිවෙක් දන්නේ නැත. එතෙක් සීගිරි එකට හැමෝම ඇඟිලි ගසනු ඇත. මේක ගොඩගන්නටත් බැරි ඒකය.

"සීගිරි එකට මෙහෙම වෙන්න දෙන්න බෑ සීයේ. අපි කොච්චර ආඩම්බරයෙන් උන්නද සීගිරි එක නිසා."

භාවනාගේ ඇස්වල කඳුළුය. රඹුක්වැල්ල මහතා කෙල්ල ළඟට පැමිණ ඇගේ හිස අතගෑවාය.

"ඔයාටයි අක්කටයි තියෙන කැක්කුම හැමෝටම නෑ මැණික."

ඔහු එය දනී. දවසක මේ සීගිරි එක දෙනවානම් ඒ මේ කෙල්ලෝ

දෙන්නාටය. උන් දෙන්නාගෙ ම හදවත්වල ලෝබකමක් නැත. රඹුක්වැල්ල මහතා ආදරය කළෙත් ඒ ගතිගුණවලටය.

"අපි රෑට කතාකරමු සීයේ."

"ම්. හෙට ඉන්ටර්වීව් එකත් එක්කනේ."

ඇය බැලුවාය.

"සීයා හිතන්නේ මේ හැමදේම ගන්න කෙනෙක්ට ගොඩගන්න පුළුවන් කියලද?"

"සමහරවිට හොඳ කෙනෙක්ව ගන්න පුළුවන් වෙයි."

ඔහු කීවේය.

"අපි දැන් මුහුණ දීලා තියෙන්නේ අලුත් තත්වයකටනේ මැණික. සීගිරි එක පටන් ගන්න කාලේ මේ වගේ සුපර් මාර්කට් වැහිවැහැලා නෑ. අපි

විතරයි හිටියේ. ඒත් දැන් පිරිලා. මේ ටවුන් එකේම සුපර් මාර්කට් හතක් තියෙනවා”

රඹුක්වැල්ල මහතා කීවේය.

“අලුත් විදිහට හිතන අයයි ඕන. අපි ඒක තේරුම් ගන්නෝන.”

භාවනාද හිස වැනුවාය. මේකට මොකද කරන්නේ කියා ඇයටත් හිතාගන්න අමාරුය. ඇයට හිතෙන එකම දේ මොකක්හෝ කරන හැකි ඉක්මනින් සීගිරි එක ගොඩගත යුතු බවය.

# 17

පොඩි මේස කෑල්ල හොඳින් සුළං එන සාල කෑල්ලට දේවක දාගත්තේය. ඒක ටිකක් පරණ ලියන මේසයකි. කොල්ලා එය කටු සිමෙන්ති දැමූ සාලයේ කොණකට ඇදගත්තේය. ඊටත් පසු පුටුවක්ද ගෙනවිත් තියාගත්තේය. දැන් හොඳය. මෙතන ඉඳගත් විට කෙළින්ම පේන්නේ අතුරුගිරිය වෙල් යායය. ගඩොල් බිත්ති හතර විතරක්

ඇති සාලයේ ජනේල නැත. ඒ නිසා අවට සුළඟ හරි සනීප ලෙස සාල කෑල්ලට කඩාගෙන එයි.

දේවක ඔහුගේ කුඩා ලැප්ටොප් පරිගණකයද ළඟට ගත්තේය. අද ඔහු එන ගමන් එයට රුපියල් දාහක ඩේටා පැකේජ් එකක් ඇති ඩයලොග් ඩොංගලක් අරගෙන ආවේය. දේවක හිතාගෙන ඉන්නේ අද පැය හතර පහක් ගෙන සීගිරි එකට පොඩි කතන්දරයක් හදන්නටය. නැත්නම් හෙට ගොස් වෙන්නේ සවුත්තු වී එන්නටය. අප්පච්චී නම් කිව්වේ ඉන්ටර්වීව් එකෙන් ෆේල් වුනත් සීගිරි එකට දමන්නට හැකි බවය. එහෙම කරන්නේ රංජිත් අන්කල්ට කියා බව ඔහු දනී.

එහෙත් එහෙම කාටවත් කියා

සීගිරි එකට යන්නට කොල්ලා ආස නැත. 'සීයා ගන්නවානම් මාව මගේ දක්ෂකමටයි. නැතුව වැඩක් නෑ' ඔහු සිතුවේය.

ඇත්ත කතාව සීගිරි සුපර් වැටිලා කියන එකය. වැටෙන්න ඇතුලේ හේතු වාගේම එළියේ හේතුද ඇත. නගරය පුරාම අලුත් සුපර් මාර්කට්ය. ඔවුන් පාරිභෝගිකයන්ට දෙන්නේ පුදුම හිතෙන වාසිය. ඒ එකක්වත් සීගිරි එක දී නැත. කිසිම බඩුවකට කිසිම අඩුකිරීමක් කර නැත. අඩුම ගණනේ සැමන් ටින් එකක් ගන්න කෙනෙක්ට පොඩි සැෂේ සෝස් පැකට් එකක්වත් දෙන්නේ නැත. එහෙම නොකර බිස්නස් කරන්න අද අමාරුය. හැමෝම හොයන්නේ වාසිය. මේක අත් වාසියෙන් දුවන සමාජයකි.

සීගිරි එකේ කුකුල් මස් හෙල්ලෙන්නේ නැත. ෆ්‍රීසර්වල ඒවා ගල් ගැසී තිබෙනවා ඔහු දැක්කේය. කුකුල් මස් ගෙනත් ඒවා අධි ශීතකරණවල දමා තිබෙද්දී කොච්චර ලයිට් බිලක් යනවාද?? සීගිරි එකට පාඩු විඳින්නට වී ඇතැයි ඔහුට සිතෙයි. සොසේජස් පැකට් එකක් හෙලවෙන්නේ නැත. සීගිරි එක සොසේජස් ගන්නේ පිටිනි. එහෙත් නගරයේ ඇති ප්‍රබල සුපර් මාර්කට් ඔවුන්ගේම සොසේජස් නිපදවයි. ඒ නිසා ඔවුන්ට අඩු මිලට දෙන්නට පුළුවන.

වැඩ කරගෙන යද්දී සුදු කොළය අතරින් පවා දේවකට පේන්නේ කෙල්ලවය.

"ඔයා හිනාවෙනවා හැම

පැත්තෙන්ම මට පේනවනේ. මේක පුදුම දෙයක්නේ.”

හෙට ආයෙත් ඇයව දැකගන්න ලැබෙනු ඇත. සීගිරි එකට යන්නට දැන් තවත් බලාපොරොත්තුවක් ඇත. ඒ ඇයව පේන මානයේ ඉන්නට ලැබෙන නිසාය.

“ලේසි නෑ මේ හාට් එකට වෙච්ච දේ. දෛවය තමයි.”

ඔහු සිතුවේය.

“ඔයා හෙට මොනවා හිතයිද මම ඉන්ටර්වීව් එකට එනකොට. හෙට ඉන්ටර්වීව් එකක් කියලා ඔයාට කියාගන්න පුළුවන් වෙච්ච එක හොඳයි.”

දේවක ඈත අතුරුගිරිය වෙල් යාය දෙස බලාගෙන සිතුවේය.

“ඔයා හරි හොඳ කෙල්ලෙක්

කියලා මට හිතෙනවා. කතාකරනකොට හරිම කරුණාවයි.”

කෙනෙක් ගැන මෙහෙම කවදාවත් සිතී නැත. හිතෙන එකේ හිතනවා කියා දේවක සිතුවේය. ඔහු පුටුවෙන් නැඟිට ගොස් තේ එකක් හදාගෙන ආවේය. සමහරවිට හෙටින් පසුව දවාලක ගෙදර ඉන්නවා කියන එක හීනයක් වෙන්නට පුළුවන.

“හිටියයි කියලා ඇති වැඩේ මොකක්ද? මගේ වැඩේ දවස තිස්සෙම ප්ලේන්ට් බබී ඉන්න එකනේ. එහෙම බෑ ජීවිතේ.”

දැන් ජීවිතය පටන් ගන්නට වෙලාව හරිය.

“පාන්දර නැඟිටලා උයනවා දෙන්නටම බත් දෙකක්. ඒකෙන්ම මොනවාහරි අරන් බත් කටක්

කාලායන්න පුළුවන්. නැත්නම් උදේ කෑම එකත් ඔතාගෙනම යනවා. රෑට උයන්නනම් වෙන්නේ නෑ. එන ගමන් ඉදි ආප්ප මොනවාහරි අරන් එනවා. ඒක ලේසියි."

දේවක හැමදෙයක් ගැනම සිතුවේය.

***    ***    ***    ***    ***

භාවනා ටිකක් වේලාසන අද ගෙදර ආවාය. එකක් හවස ඇති කතාබහය.

"මං ටිකක් වේලාසන යනවා අක්කි."

භාවනා අත් බෑගයද දමාගෙන පැමිණ කීවාය. උදේ සිට කෙල්ල ඉන්නේ ටිකක් කේන්තියෙන් බව ඇය

දනී.

"මේවා ගොඩක් හිතන්න එපා සුදූ. අපි බලමුකෝ."

"මට සීයා ගැන දුකයි."

"මටත්"

"තරහද මං ඔයාටත් ඒ වෙලාවේ කෑ ගැහුවා."

භවනා නේත්‍රාගේ කරවටා දෑතම යවා ඇසුවාය. කෙල්ල මෙහෙම කරන්නේ නේත්‍රාගේ පුටුවේ පත්ත උඩ ඉඳගෙනය.

"එහෙම කෑ ගහන්න ඕන. අනිත් දවසේ ඊටත් වඩා ටිකක් බරකරලා කෑ ගහන්න. මං දන්නවනේ ඔයා ගැන."

නේත්‍රා කීවාය.

"අනිත් දවසේ චෙක් එකක් ඉෂූ කරන්න කලින් මට කියන්න. මම

ස්ටෝර්ස් ගිහින් බලන්නම්. අයියයි නංගියි දෙන්නම එකතුවෙලා මේවා කරන්නේ."

භාවනා කීවාය.

"ඒත් බබා එහෙම කරන්න බෑනේ."

"ඇත්ත තමයි. හරියට හින්ට් ගහනවා ඒ ළඟින් ගියත්. මොකද අනිත් අයට බාරදීලා තියෙන සෙක්ෂන් බලන්න එන්නේ කියලා. පුදුම කටක් තියෙන්නේ."

භාවනා මේ කියන්නේ මලීෂා ගැනය.

"අපි බලමුකෝ."

"යනවා."

කෙල්ල ගියේ නේත්‍රාට හාදුවක්ද දීය. කෙල්ල එහෙමම ආවේ ඇගේ කාමරයටය. තනිවී හිතන්නට ඇති

දෙයක් ඇතිවාක් මෙන් ඇයට දැනෙයි.

"නිවාඩුවක් දාලා ඔයා ගැන හිතන්න කියලා හිත කියන්නේ ඇයි? මේ මොකක්ද වුනේ."

භාවනා සිතුවාය.

"අපි ආයෙත් හම්බවෙයිද?"

ඔහු ආයේ දවසක සීගිරි එකට එයි කියා කෙල්ලගේ හිත කියයි. 'ඔයා හරි හිතවත්ව මාත් එක්ක කතාකළේ. මං යන දිහාත් බලාගෙන හිටියේ. එයාටත් බලන්න ඕනකමක් තියෙන නිසානේ. එහෙම බලන්න ඕනේනම් සිගිරි එකට ඔයා එන්නෝන.'

"ඇයි එයාව අදත් මට මුණගැස්සුවේ?"

ඊකේ මොකක්ද දෙයක් ඇතැයි

භාවනාට දැනෙයි. 'හරි පුදුම කෙනෙක්. යනකොට බුදු සරණයි මිස් කියලා කියන්නේ අවුරුදු ගාණක් දන්න අඳුනන කෙනෙක් වගේ. එහෙම කෙනෙක් කවදාවත් මුණගැහිලා නෑ.' ඔහුගේ මුහුණුවර ළඟ ළඟ දැකගත් නිසාදෝ දැන් සිහිකරන සැනින් ඔහුගේ සමීප රුවක් හිතේ ඇඳෙයි. 'එයාව දකිද්දී කාවද මතක්වෙනවා. අනේ මන්දා'

"පද්මෝ."

කෙල්ල උඩු මහලේ අත්වැට ළඟට ගොස් පද්මාට කතාකළේ යන්තමට බඩගින්නක් එන නිසාය. කෙල්ලට එහෙම බඩගින්නේ ඉඳ පුරුදු නැත. ඉස්සරත් එහෙමය. ලාවට බඩගින්නක් එද්දී මොනවා මොනවා හෝ කන්න ඕනය.

"පොඩි බේබි."

"හරි බඩගිනියි පද්මෝ. මොනවාහරි කන්නෝන. අද බත් එක කෑවේ ටිකයි අනේ."

"රහ නැද්ද බේබි."

"රහයි අනේ. මේ සීගිරි එකේ පොඩි අවුලක් ගියා. ඒ නිසා කන්න හිතුනේ නෑ. අක්කත් අද කෑවේ ටිකයි."

"මොනවද බේබි ඕන."

"කටත් අප්පිරියයි වගේ සැරට තමා මොනවා හරි ඕන."

"හා. ගම්මිරිස් දාලා බිත්තර සැන්විචස් එකක්."

"හා. ඒක ෂෝක්. සෝසුත් එවන්න හොඳේ."

කෙල්ල ඒකට ආසය. බිත්තර තම්බා හදන සැන්විචස් කනවා නම්

තක්කාලි සෝස් ඕනමය.

"තේත් ගේන්නද ඒ ගමන්ම."

"හා."

භාවනා ඇඳුම් මාරුකරගෙන ඇඟ සෝදාගත්තාය. පසුව ඇගේ පැනල් රෙද්දෙන් මැසූ සායත් සුදු ටී ෂර්ට් එකත් දාගත්තාය. කෙල්ල එහෙමම පැන්නේ ඇඳටය. ඇගේ කාමරය හරි ලස්සනය. ඇඳ ඉදිරියෙන්ම ඇත්තේ ලස්සන කබඩ් පේළියකි. ඊට උඩින් ෆ්ලැට් රූපවාහිනියක් බිත්තියේ ගසා ඇත. එක කාලයක් කෙල්ල කළේම මේ කාමරයට වී හින්දි ෆිල්ම්ස් බලන එකය. කාළෙකින් ෆිල්ම් එකක් බලා නැත.

"හැමදේම කැපකළේ සීගිරි එකට. අනිත් අය එහෙම නෑ. එයාලා ගන්න

තියෙන ඔක්කොම ෆන් එක ගන්නවා. හැම තැනම යනවා. මායි අක්කයි තමයි සීගිරි එකට හිරවෙලා ඉන්නේ."

භාවනානම් එහෙම ඉන්නේ ඇය මේ රැකියාවට ආදරය කරන නිසාය.

"ඒකත් දැන් නැතිවෙන්න යන්නේ. කස්ටමස්ලා එන්නේ නැති සුපර් මාර්කට් එකක මොනවා කරන්නද?"

අද තුනට බලද්දී කස්ටමර් කවුන්ට් එක එකසිය අසූවකි. එය කොහෙත්ම හොඳ වැඩක් නොවේ. අද වැනි ඉරිදා දවසක සාමාන්‍ය කස්ටමර් කවුන්ට් එක හාරසීයක්වත් තිබිය යුතුය. සුපර් මාර්කට් එකකට උතුරන්නේ එවිටය.

"අපරාදේ. අද මට තිබුනේ

ඔයාගෙන් යන්නේ කොහෙද කියලා අහලා පොඩ්ඩක් ඔයාව ඩ්‍රොප් කරන්න."

භාවනාට එහෙමත් සිතෙයි. ඒත් දවස් දෙකක් පමණක් හමුවූ තරුණයෙක්ව එහෙම වාහනවලට නංවාගන්නේ කෙසේද? 'ඒ කොල්ලත් බලයි මොකද මේ කියලා. අපි කොල්ලෝ දැකලා නෑ වගේ' ඒත් ඔහු එහෙම සිතන කෙනෙක් නොවේයැයිද ඇයට සිතෙයි.

"කොහොමවුනත් එක දෙයක්. ඔයාව මතක්වෙනවා ඕනවට වැඩියි. මේක මහ අමුතු දෙයක්. දෙයා ඊස් සම්තිං"

භාවනා සිතුවාය.

"ආයේ දවසක හම්බවුනොත් ටිකක් කතාකරනවා. එහෙම

කතාකළා කියලා වෙන දෙයක් හිතන්නේ නෑනේ”

අද එහෙම කතාකරන්න තිබුණු හොඳ දවසක් නොවේද කියා භාවනාට සිතෙයි. ‘අද උදේ සාප්පුවෙත් එච්චර සෙනඟක් හිටියේ නෑ. ඔයානම් තොරතුරු කියාගෙනත් ආවා. හෙට ඉන්ටර්වීව් එකක් කියලත් කිව්වා. මායි මොනවත් කිව්වේ නැත්තේ. අපේ අලි ඔළුවනේ. යන්නම් කියලා ආවා. පොඩ්ඩක් එයත් බිල් එක ගෙවලා එනකල් ඉන්නනේ තිබුනේ’ භාවනා දැන් තැවෙයි.

“එයා තෝරගෙන තිබුනේ හරි චාම් ෂර්ට් දෙකක්. හොඳට තෝරන්න දන්නවා. සීයට තෝරපු ෂර්ට් එකත් එයා තෝරගෙන හිටියේ.

ෂර්ට් එක්ක සුදු වෙස්ට් එකකුත් තිබුණා."

කෙනෙක් ගැන මෙහෙම හිතෙන එකේ මොකක් හෝ දෙයක් තිබිය යුතු බව භාවනා දනී.

"ඇත්ත කතාව ඔයාට මම ආසයි. ඒකයි. වෙන ඔළු කතා ඕන නෑ. මම ඔයාට ඉන්ට්‍රෙස්ට්."

භාවනා හදවතට අවංකව අද සිතුවාය.

"ආයේ දකිනකල් මම ඉන්නේ ඔයාව."

කෙල්ල දෑස් පියාගත්තාය. විදුලි පංකාවේ සනීප සුළඟ මුහුණටම වදියි. ඇගේ දෙනෙත් යන්තමට පියවීගෙන ගියේ සනීපයටය.

මලීෂා හවස සීගිරි එකේ වූ පොල් තෙල් කතාව ඒ සැනින් මිහිරංගගේ

කණේ තැබුවාය.

"ඔක්කොම කරන්නේ භාවනා තමයි. අනිත් අයට එච්චර රුදාවක් නෑ. එයා ඕනවට වැඩියි. ටූ මච්."

මලීෂා බැන්නේ භාවනාටය. ඇය සීගිරි එකේ නැත්නම් මේ තරම් හිරවෙන්න ඕනත් නැත. සීයා දැන් බොහෝ දේවල් බලන්නේ නැත. ඒ නිසා නිදහසේ ඉන්නට පුළුවන. ඒත් හැමදේම බලන්නේ භාවනාය.

"එයා ඕනවට වැඩියි තමයි."

මිහිරංග කීවේය.

"කියනවකෝ. ඔයාගේ මහලොකු ලව් එකනේ. එයාට අසහනේ. ඒකනේ මේ සීගිරි එකක් බදාගෙන ඉන්නේ."

මලීෂා කීවාය.

"හරි බලමුකෝ. සීයා මොනවාහරි කිව්වද මට."

"සීයා මොනවත් කිව්වේ නෑ. ඔක්කොම පොල්තෙල් බොට්ල්ස් ටික රිටන් කරන්න කිව්වා. මෙයා බලන්න ඕන අද? භූමිතෙල් ගෑව්ව්ච ගැරඬි වගේ හිටියේ. හරියට සීගිරි එක එයාගේ කියලා හිතාගෙන ඉන්නේ."

මලීෂා කියන්නේ ඇත්ත බව මිහිරංග දනී.

"මං එයාව ෂේප් කරන්නම්කෝ. බබා ඉන්නකෝ."

"ඔක්කොටම කළින් හවස මේවට උත්තර දෙන්න වෙයි. රෑ මීටින් එකක්. ඔයාටත් කතාකරලා කියයි."

"අද රෑ. න්නෑ."

"ඔව්. මේවා ඇදෙයි. හෙට ඉන්ටර්වීව් එකක්නේ. සුපර් මාර්කට් එකට ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක් ගන්න."

"ගනී බම්බුව. මේකට මොන ප්‍රමෝෂන් මැනේජර්ස්ලද? ආවොත් උගේ කලිසමත් ගලවලා යවන්නේ."

මිහිරංග කතාකරන්නේ එහෙමය. ඔහු භාවනාට ගත්තේ මලීෂා දුරකථනයට තැබූ ගමන්මය. 'මේකී පට්ට කේස් එක. තරහ කරගන්නත් බෑ' දවසක භාවනා හිමිවිය යුත්තේ තමාටම බව මිහිරංග සිතයි. 'තාම ඉන්නේ පැකින් පිට. එහෙමම මේකී කාත් එක්කවත් අෆෙයා එකක් පටන් ගත්තේ නෑ. බලමුකෝ.' මිහිරංග භාවනාට ගත්තේ එසේ සිතාය.

"ගුඩ් ඊව්නිං බබා."

මිහිරංග කතාකළේ මේ පොල් තෙල් කතා කිසිවක් දන්නේ නැති ගාණාටය.

"ඇයි කතාකළේ?"

කෙල්ල ඉන්නේ මිහිරංග ගැන කියාගන්නට බැරි තරහකිනි. මෙහෙමවත් කතාකරන්නේ මේ පවුල්වල ඇති බැඳීම වෙනුවෙනි. ප්‍රශ්න ඇතිකරගන්නට ඇය කැමති නැත. එහෙම ප්‍රශ්න දාගෙන ඉන්නත් අමාරුය. 'කරුමෙට ඔක්කොම ඉන්නේ එකටනේ මෙතන.' එහෙම කළේ සීයාය. ඔහු සිතුවේ තමාගේ දරුවන් මෙන්ම දරුවන්ගේ දරුවොත් එකට වැටී ආදරෙන් ඉඳී කියාය. ඒත් හැමෝම එක වාගේ නැත.

"බබාට සනීප නෑ වගේද?"

මිහිරංග කපටිය.

"නෑ එහෙම අසනීපයක් නෑ. මම හොඳට ඉන්නේ මේ "

'අසනීප තියෙන්නේ වෙන

අයටනේ.' කෙල්ලට කියන්නට කටට එන්නේ ඒකය. ඒත් ඇය කියවන්න යන්නේ නැත.

"නෑ මේ වොයිස් එක ටිකක් අමුතුයි වගේ."

"එහෙම නෑ."

භාවනා පිළිතුරු දුන්නාය. 'මලීෂා ඔක්කොම කියලා ඇති. ඒකයි මේ හදිස්සියේ බටර් ගාගෙන එන්නේ. බලු වැඩ කරලා එයා ෂේප් කරගන්න හදන්නේ.'

"මොකක්ද කොකනට් ඔයිල් කේස් එකක් ගියාලු නේද බබා."

"ගියා නෙමේ වුණා. හෙට අනිද්දා කන්සියුමර් එකට කට උත්තර දෙන්න වෙයි සීගිරි එකට."

භාවනා කීවාය.

"ඕවා හරි කොමන් ප්‍රොබ්ලම්ස්

බබා. මොන ප්‍රඩක්ට් එක ගත්තත් කේස් තමයි."

"එහෙම කේස් නෑ හොඳ ප්‍රොඩක්ට්ස්වල. මේ ස්ටෑන්ඩර්ඩ් එකක් නැති බාල දේවල් අරන් අපියි කස්ටමස්ලගෙන් බැණුම් අහන්නේ. ලැජ්ජ නැති වැඩ."

භාවනා කීවේ අප්පිරියාවෙනි.

"ගන්න හැම ප්‍රඩක්ට් එකම ට්‍රයිකරලා බලලා ගන්න බෑනේ බබා. මොකද අපි ඔයිල් සාම්පල් එකක් අරන් පපඩම් බැදලා හොඳද කියලා බලන්නද? වට් ටු ඩූ."

"මෝඩ කතා කියන්න එපා මිහිරංග අයියේ. හොඳ ප්‍රඩක්ට් එකක් අඳුනගන්න එහෙම පපඩම් බැද බැද ඉන්නෝන නෑ. හොඳ කම්පනි එකක් කවදාවත් එහෙම

කරන්නේ නෑ. එයාලට කීර්තිනාමයක් තියෙනවා රැකගන්න. මේ ඇහින්ද්‍රාස්ලගෙන් බඩු ගත්තාම තමයි ඔක්කොම දේවල්."

කෙල්ල කීවාය. 'මේකි එක්ක කතාකරලා බේරගන්න බෑ.' මිහිරංග සිතුවේය.

"මම දන්නේ නෑ. හවස මීටින් එකක්. ඇවිත් කියන්නකෝ. මට මේවා අදාල නෑ."

භාවනා කීවාය.

"රෑ මේ පොඩි පාටියකුත් තියෙනවා බබා අපේ එකෙක්ගේ. කොල්ලෝ ටික මට එන්නම කියලා තියෙන්නේ."

මිහිරංග කීවේය.

"මම දන්නේ නෑ. සීයට කියන්න. මම නෙමේනේ සීගිරි එකේ මැනේජින්

ඩිරෙක්ටර්."

මිහිරංග සුසුමක් හෙළුවේය.

"ඕකේ. මොනවද කරන්නේ බබා."

"මුකුත් නෑ. මම තියනවා"

භාවනා තැබුවේ මිහිරංග සමඟ කතාකරන එක වදයක් නිසාය. මිහිරංග විසන්ධි වූ ඇමතුම දෙස බලාගෙනම උන්නේය. ඊටත් පසු දුරකථනය දෙස බලාගෙන යටිතොල හපාගත්තේය. 'බලමු භාවනා. මේ මිහිරංග එහෙම ලේසියෙන් සෙකන්ඩ් වෙන කෙනෙක් නෙමේ.' ඔහු තමාටම කියාගත්තේය.

# 18

හවස පහ හය වෙද්දී හෙට සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය ගැන දේවක හොඳට හිතාගත්තේය. එතනදී තමාට කතාකරන්නට වෙන බව ඔහු දැනගෙන උන්නේය. කොල්ලා කියන්නට ඇති දේ ලස්සනට හදාගත්තේය.

"මගේ කතාව ටිකක් අම්හිරිවෙයි සීයේ. සීගිරි එකේ අද තත්වය මට

ඔයාට කියන්න වෙනවා. ඒක ටිකක් දුක හිතෙන කතාවක්. එහෙම කියලා තමයි ඒ වලට කරන දේවල් ගැන කියන්න වෙන්නේ."

දේවක සිතුවේය. කොල්ලා පොඩි මේස කෑල්ලෙන් නැඟිට්ටේ ඔහු ලැප්ටොප් පරිගණකයත් වසා දමාය.

"පොඩි වොෂ් එකක් දාගෙන ප්ලේන්ටියක් බොන්න ඕන."

පරිසරය පුරාම ඇත්තේ හැන්දෑ ලස්සනය. අතුරුගිරිය වෙල්යායට ලස්සනට බැසගෙන යන ඉරේ ලා රත වැටී තිබුණි. දේවක ඒ දෙස ටික වෙලාවක් බලාගෙන උන්නේය.

"හෙට ඉන්ටවිව් බෝඩ් එකේ කවුරු ඉඳීද දන්නේ නෑ. සීයා කොහොමත් ඉඳී. වෙන කවුද?"

දේවකට සිතාගන්නට

අමාරුය. ඔහු පොඩි ළිඳෙන් ඇඟ සෝදාගත්තේය. වතුර ටික රත්තරන් වාගේය. ඉන් එන්නේ තුනී සීතලකි. ඇඟට ෆිට් එකක් එන්නේ එහෙම ඇඟ සෝදාගත් විටය. දේවක ඇඟ සෝදාගෙන විත් ඇඳගත්තේ පරණ ඩෙනිම් කොට කළිසමත් සුදු වෙස්ට් එකත්ය. එහෙම ඇන්ඳ විට කොල්ලා පොඩි එකෙක් වාගේය.

ජීවන් ආවේ ඔහු සේවය කරන ඉදිකිරීමේ සමාගමේ වෑන් රියෙනි. ඔහු වෑන් එක ඉල්ලාගෙනම ආවේ හෙට කොල්ලාව බස් එකේ යවන්නට බැරි නිසාය. උදේ යන ගමන් කොල්ලාව සීගිරි එකෙන් දාගෙන යා යුතුය.

“අප්පච්චි වෑන් එකෙන්ම ආවද?”

“ජීවම්ගෙන් මම වෑන් එක

ඉල්ලගෙන ආවා පුතේ ඔයාව හෙට බස්සගෙන යන්න ඕනනේ."

දේවක හරි ආදරෙන් අප්පච්චි දෙස බැලුවේය. 'මං ගැන විතරයි හිතන්නේ' ඔහු සිතුවේය. එහෙම අප්පච්චිලා හිඟ බව කොල්ලා දනී.

"මොකද කළේ?"

"දොළහේ ඉඳලා පොඩි රිපෝට් එකක් හැදුවා අප්පච්චි. හෙට ඉන්ටර්වීව් එකේදී කියන්න. නිකම්ම ගිහින් සටිෆිකට් ටික දික්කරන්න බෑනේ."

ජීවන් හිස වැනුවේය.

"ඔයාගේ සීයා එහෙම දික්කළා කියලා ගන්නෙත් නෑ පුංචි මහත්තයෝ. එයත් බිස්නස් කප්පිත්තෙක්"

ජීවන් කීවේය. දේවකද හිස

වැනුවේය.

"මම පිලාවුඩ්ස් එකෙන් හොඳ බුරියානි දෙකක් අරගෙන ආවේ. ඒක මුස්ලිම් හෝටලයක්. හොඳ සුවඳයි."

"මට ආවා සුවඳ?"

දේවක සිනාසී කීවේය. නුවර සිටිද්දීත් අප්පච්චිත් පුතාත් ඉඳහිට බුරියානි දෙකක් ගෙනවිත් කයි. දේවක පුංචි දවස්වල ජීවන් ගේන්නේ එක බුරියානි එකකි. ඔහු ඉන් තුන් කාලක්ම කවන්නේ කොල්ලාටය. ඉස්කෝලේ ඇඳගෙන ගිය කොට කලිසම ඇඳගෙන උඩුකය නිරුවතින් තමා ළඟ ඉඳගෙන බුරියානි කෑ පුංචි එකාව ජීවන්ට සිහිවිය. 'කොල්ලා ලොකුවුනේ බලාගෙන ඉන්නකොට සුදු නෝනා' ඔහු මේ කියන්නේ ඔහුගේ මැරිච්ච බිරිඳටය.

"අප්පච්චි වොෂ් එකක් දාගන්න. මම ටී එකක් හදන්නම්."

"සමෝසා දෙකකුත් ඇති. ඒක කාලම බොමු."

දේවක සිනාසුණේය. අප්පච්චිට ඇත්තේ එහෙම හොඳ කල්පනාය. ඒවා කියා දී ඇත්තේ අම්මා විය යුතුය. ජීවන් කවදාවත් දවල්ට බත් එකක් කෑවොත් මිසක ආප්පයක්වත් මඟින් කන්නේ නැත. ඔහුට එහෙම කන්න අමාරුය. කද්දී කොල්ලාව සිහිවෙයි. තද බඩගින්නක් තිබුණාද ජීවන් කරන්නේ එළවළු රොටි දෙකක් හෝ ඔතාගෙන විත් කොල්ලාත් එක්ක කන එකය.

දේවක ටී දෙකක් හදන්නට ගත්තේය. ඔහු ඉන්නේ දවල්ටත් නොකාය. තාම උදේට වැටී ඇත්තේ

උදේ සයිවර් හෝටලයෙන් කෑ ඉඳි ආප්ප ටික විතරය. අතරමඟට තේ දෙක තුනක් බිව්වේය. අද දවසටම අමුතු බඩගින්නක් නාවේ හිතේ තිබූ එක දෙයක් නිසාය. ඒ ඇයය.

"සීගිරි එකට කොහොමහරි යන්න හිතෙන්නේ ඔයා නිසා මට ඔයාව ලස්සන  මල්ටි කලර් හීනයක් වගේ. ඇයි දන්නේ නෑ මෙච්චරම මතක්වෙන්නේ."

කෙල්ලටත් එහෙමම ඔහුව සිහිවෙන බව දේවක සිහිනෙකින්වත් හිතන්නේ නැත. මේ වෙලාවේ භාවනා ඉන්නේ ඇගේ කාමරයේ ඇඳ මත ඉඳගෙන දෙපාවල නිය පැහැ ගන්වමිනි. අද ඇය ලස්සන කියුටෙක්ස් පාටක් ගත්තාය. ඒක ලස්සන දෙපාවල නියවලටය. දුඹුරු

පැහැයට හුරු ගඩොල් පැහැගත් මේ කියුටෙක්ස් එක කෙල්ල ගල්වන්නේ එක් පාදයක් උඩට ගෙනය. මේ වෙලාවේ කවුරු හෝ කෙනෙක් කාමරයට ආවානම් කෙල්ලගේ ලස්සන ලස්සනට බලාගන්නට තිබුණි.

කියුටෙක්ස් ගල්වන එක භාවනාවක් වැනි දෙයකි. තියෙන පාට රිමූ කර නිය කපා පිරිසිදුකර අලුත් පාටක් ගල්වා ඉන්පසු ටොප් කෝඩ් එකක් ගල්වා ඒවා වියලෙන තුරු බලාගෙන සිටීම එවැන්නකි.

අද මේ තරම්ම හිත බර සීගිරි එකේදී වූ පොල් තෙල් කතාව නිසාම නොවේ. වෙනත් දෙයක් නිසාය.

"ආයේ ඔයාව දකිනවානම් ඒ සීගිරි එකේදී විතරයි. ඔයා එයි."

ඇයට නිකමට සිතෙයි.

"ඔයා ආවේ ඊයේ. සමහරවිට නෙක්ස්ට් සැටඩෙත් එයි."

එහෙත් ඔහු එනතුරු කියා සීගිරි එකේ පැත්තකට වී බලාගෙන ඉන්නද? එහෙම කරන්නේ ඇයි.?

"කරන්නේ හිතට කිසිම සැනසීමක් නැති නිසා."

භාවනා ඇයගේ සිතට බැන කීවාය.

"ඔයාගේ මොකක්ද හුරුපුරුදු ගතියක් තියෙනවා. ඒක පුදුමම දෙයක්නේ ඇයි ඒ?"

දේවක යනු තමා දැකලාවත් නැති පොඩි නැන්දාගේ එකම පුතා බව භාවනා දන්නේ නැත. කෙල්ල මියගිය නර්මදාව දැක ඇත්තේ ඡායාරූපවලින් පමණි. ඇයට

ඇත්තේ හරි අංහිසක ලස්සනකි. ඇගේ ඡායාරූපයක් මේ නිවසේ මෙන්ම සීගිරි එකේ සීයාගේ කාමරයට යන තැන කොරිඩෝවේද ගසා ඇත.

"දවසක පොඩි අක්කට කියලා ෆ්‍රෙන්ච් මෙනිකියු එකක් කරගන්න ඕන. එයාගේ නේල් හරි ලස්සනයි."

එච්චර හැඩදාගෙන තමා කොහේ යන්නද කියා අනික් අතට භාවනා සිතුවාය.

"ඔන්න කවුරුහරි මේ අත අල්ලගෙන පැයක් දෙකක් බල බල ඉඹ ඉඹ ඉන්නවානම් මම ෆ්‍රෙන්ච් මෙනිකියු නෙමේ ඉටලි මෙනිකියු හරි කරනවා."

කෙල්ල එහෙමත් සිතුවාය. එහෙම සිතද්දීත් සිහිවෙන්නේ ඔහුවය.

"අනේ වෙඩින් රින්ග් එකක් තිබුනෙත් නෑ. එයාට එහෙම මැරිකරන වයසකුත් නෑ අනේ. අනික අප්පච්චිට කිව්වේ එහෙනම් මම උයන්නේ නෑ කියලනේ. නැත්නම් කියනවනේ එහෙමනම් මම කියන්නම් එයාට උයන්න එපා කියලනේ. එහෙම ආරංචියක් ආවේ නෑ ඔයාගේ කතාවෙන්."

භාවනා සිතුවාය.

"හරි මැරිකරලා නෑ කියමුකෝ. ඒත් ඔයාට ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් නැතිවෙන්න බෑනේ. නේද? මේ ලස්සන කොල්ලනේ."

හදවත පුරා ආයෙත් අර අමිහිරි දුක පැතිරීගෙන යයි.

"බලමුකෝ."

හැමදේම වෙන්නේ දෛවයේ ලියා

ඇති විදිහටද නැත්නම් දෙවියන්ගේ කැමැත්තට අනුවද කියා භාවනා සිතුවාය. 'මොන දේ වුණත් මම කැමති කෙනෙක් වෙන්නත් ඕන. එහෙම නැත්නම් දෙවියෝ කැමති වුනත් මම කැමති නෑ.' කෙල්ල අන්තිමට සිතුවාය.

# 19

බටර් කේක් එක ඇණවුම් කර එය කෑලිවලට කැපුවේ භාවනාමය. අද රඹුක්වැල්ල පවුලේ සියල්ලන්ම එකතුවෙන දවසකි. එහෙම දවසක් ඉස්සරනම් ලස්සනය. මේ අද උස් මහත්වී ඉන්නා දරුවෝ සියල්ලන්ම පොඩිය. ටිකක් හෝ ලොකුවට උන්නේ නේත්‍රාය. ඒත් දැන් ඔක්කොම ලොකු මිනිස්සු වී ඇත. එහෙම වූ එක අපරාදේ කියා භාවනාට සිතෙයි.

ඒත් ඇය අද මේ බටර් කේක් කපා පද්මාත් සමඟ අයිස් කෝපි හැදුවේ එය තමාගේ යුතුකම යැයි කියා සිතාය. අද කට්ටියටම එන්න කියා ටිකක් කතාකරමු කිව්වේ තමාය. ඒනිසා සැළකිය යුත්තේද තමා කියා ඇයට සිතෙයි. බටර් කේක් එක රස පාටය. කෙල්ල එය කෑලිවලට කපද්දී අයින් කෑලි කෑවාය. බටර් කේක් එකේ රසම අයින් කෑලිය. බටර් කේක් එක කපද්දී කෙල්ලට මතක්වූයේද දේවකවය. 'එයා ඊයේ සීගිරි එකේ තිබුණ බටර් කේක් එක ගැන කිව්වේ රහසින් වගේ. පිටිපස්සේ ඉන්නේ කස්ටමගේ ට්‍රොලියේ බටර් කේක් එකක් තියෙනවා ඒක අයින් කරන්න කියලා හරි මනුස්සකමින් එහෙම කිව්වේ. අපට නරකක් වෙයි කියලා.

කොහොම උනත් ඔයා හොඳ කෙනෙක්. එහෙම හිතෙනවා මට.' තමාට සිතෙන දේවල් එහෙම ලේසියෙන් වැරදෙන්නේ නැතැයි කියා විශ්වාසයක් කෙල්ලගේ ඇත. 'මේ වගේ රස බටර් කේක් එකක් සීගිරි එකේ තිබුනොත් දවසකට සීයක් විතර විකුණන්න පුළුවන්. කොහෙද ඉතින් ඒවා කරන්නේ. මම කේක් බේක් කරන්නද' භාවනා සිතුවාය.

ඉඳුනිල් ආවේ කෙල්ල කේක් කපා ට්‍රේ එකට අසුරද්දීය.

"අනේ මම කරනවනේ කිච්චනම් මැණික."

ඉඳුනිල් කෙල්ලට වැඩදෙන්නේ නැත. ඒ ඇය වගකිව යුතු රැ කියාවක් කරන නිසාය. ඇයට පමණක් නොව කෙල්ලෝ

තුන්දෙනාටම ඇය වැඩක් දෙන්නේ නැත. තාරකානම් වැඩක් දුන්නද කරන්නේද නැත. ඒත් භාවනා එසේ නොවේ. ඇයට හිතුනොත් ඇය කුස්සිය දෙවනත් කරගෙන උයයි. නැත්නම් ඩෙසට් එකක් හදයි.

"නිකං කැපුවා අම්මා. රස බටර් කේක් එකක්. මේ."

භාවනා අම්මාට බටර් කේක් කෑල්ලක් කැව්වාය.

"ම්. රසයි තමයි."

"මං සිකුරාදට හැමදාම ගේන්නම් එකක්. අපිට කන්න පුළුවන්."

ඉඳුනිල් සිනාසුනාය.

"අද ඔක්කොම එනවද?"

"ම්. සීගිරි එකේ පොඩි පොඩි ප්‍රශ්න වගයක් තියෙනවා අම්මා. පොඩිත් නෑ. ඇත්තම කියනවානම්

සීගිරි එක වැටිලා තියෙන්නේ. එහෙම වෙන්න දෙන්න බෑනේ."

"අනේ ඒක මොන අපරාධයක්ද ඔයාලා හැදුනේ සීගිරි එකෙන්"

"ඒක අම්මා අපි කිව්වට හැමෝම කියන්නේ නෑ. ඒ හැඟීම හැමෝටම නෑ."

කෙල්ල ඒ කවුද කියා කිව්වේ නැත.

"අපි සේල්ස් අප් කරන්න ඕන. ඒකට ස්ටාෆ් එකට අලුතින් කෙනෙක් දෙන්නෙක් ගන්නෝන. හෙට ඉන්ටර්වීව් එකක් ඒකත් අද කතාකරන්න තියෙනවා."

ඉඳුනිල් අසරණව සිනාසුනාය. මිලින්ද පැන්ට්‍රියට ආවේ ඇඳගෙන ආ ඇඳුම පිටින්මය. ඔහු කරන්නේ අපනයන අංශයේ ව්‍යාපාරයකි. එය

පටන් ගත්තේ මෑතකදීය.

"අද අම්මයි දුවයි දෙන්නම කුස්සියෙද?"

මිලින්ද කීවේ සිනාසීය.

"තාත්තලා වේලාසන ගෙදර එනවානම් දුවලත් වැඩකරනවා."

භාවනා ඇඟට පතට නොදැනී කීවාය.

"කොල්ලෝ තුන්දෙනෙක් හිටියනම් මමත් ගෙදරට වෙලා පත්තරයක් බලලා මැච් එකක් බලලා ඉන්නවනේ."

මිලින්ද කීවේය. භාවනා අම්මා දෙස බලා සිනාසුනාය.

"මං ගැන බයවෙන්න එපා. මගේ කොල්ලා දැවැද්දක් ඉල්ලන්නේ නෑ. ඔයාගෙන් මාව විතරක් ඇවිත් ඉල්ලයි දවසක."

කෙල්ලගේ මුවින් මේ කතාව පිටවිය. මිලින්ද ගැස්සිමෙන් ඉඳුනිල් දෙස බැලුවේය.

"එහෙම කතාවක් යනවද? අම්මා මට මොනවත් කියලා නෑනේ."

මිලින්ද ඇසුවේය. භාවනා මුවට අතක් තබාගත්තාය.

"මං කිව්වේ ඉන්න කොල්ලෙක් ගැන නෙමේ අනේ. දවසක එන කෙනෙක් ගැන."

භාවනා කීවාය. මිලින්දට සැකය.

"කවුද දන්නේ කොහෙන් හරි කෙනෙක් හොයාගෙනද කියලා."

මිලින්ද කීවේය.

"මගේ තාත්තා හොර වැඩ නෑනේ. මම එහෙම කෙනෙක් හම්බවෙච්ච දවසට කෙළින්ම ගෙදරට එක්කගෙන එනවා. මම එහෙමයි. ඔයා ඒ ගැන

බයවෙන්න එපා. මොකටද හැංඟිලා බයේ ලව් කරන්නේ. ගෙදරටම එන්න කියනවා"

කෙල්ල කියන්න තියෙන දේ කෙළින්ම කීවාය. ඔහොම කියා තියෙන එක පහසුය. මිලින්දට සිනාග යේය. එහෙම දුවෙක් හිතන එකත් වාසනාවකි.

"අක්කට වෙච්ච දේවලුත් හිතේ තියාගෙන දවසක තීරණ ගන්න."

මිලින්ද කීවේ ඒ පැත්ත මේ පැත්තද බලාය. මේවා නේත්‍රාට ඇසුනොත් ඔහුට දුකය.

"අක්කට උනත් තාත්තා මෙහෙම වෙන්න දෙන්න බෑ. අපි බලමුකෝ. දවසක එයාටත් මේ ලෝකේ ලස්සන දකින්න වාසනාවක් තියෙයි. බුදුවරු නැහැ තමයි. ඒත් පසේ බුදුවරු හරි

උපදිනවනේ."

කෙල්ල කියන්නේ පුදුම කතාය.

"ආ ඔයාටත් කේක් කෑල්ලක්. පද්මා තාත්තට තේ හදන්න."

භාවනා මිලින්දට කේක් කැව්වාය. ඉඳුනිල් බලාගෙන උන්නේ ආදරයෙනි.

"මොකද සීගිරි එකේ වෙන්නේ මැණික?"

මිලින්ද රහසින් මෙන් ඇසුවේය. කෙල්ල සියල්ල කෙටියෙන් කීවාය.

"මේක තාත්තා අතෑරලා දාලා වගේ ඉන්න එපා. ඔයාගේ තාත්තා ආදරෙන් හදපු දේනේ. එහෙම වෙනකොට මටත් දුකයි. මං හරි ආදරෙයි සීගිරි එකට. ඔයාලා දෙන්නටයි  අක්කලා දෙන්නටයි සීයටයි වගේ මං සීගිරි එකටත් හරිම

ආදරෙයි."

කෙල්ලට ඔය ටික කියද්දී ඇඬුණි. මිලින්ද කෙල්ලගේ හිස අතගෑවේය.

"අපි බලමුකෝ. සුපර් මාර්කට් වැහි වැහැලනේ ඒකනේ මේ ඔක්කොම."

"ඒත් අපි මේවා නැති කාලේ පටන් ගත්ත එකක්. අපිටත් කස්ටමර්ස්ලා උන්නා. කෙනෙක් තාත්තා තෝරගත්ත දෙයක් අලුත් ඒවා දැක්කා කියලා අතාරින්නේ නෑ. දැන් තාත්තා අලුත් නෝනලා පාර දිගට දැක්කා කියලා මේ නෝනව අතාරින්නේ නෑනේ. එහෙම කරන අයත් ඉන්නවා. ඒත් හැමෝම එහෙම නෑ."

භාවනා පහදා දුන්නාය. මිලින්ද හිස වැනුවේය.

"මගේ ඉස්කෝලේ ළමයි මට කිව්වේ සීගිරි එකේ භාවනා කියලා. ක්ලාස් එකේ කොල්ලෝ මට කිව්වේ සීගිරි එකේ සුදු ගර්ල් කියලා. මේකට කියන්නේ සීගිරි ගෙදර කියලා. දවසක සීගිරි එක නැතිවුනොත්. එදාට මොකද වෙන්නේ. අපේ කතාව එහෙම ඉවරවෙන්න බෑ. කොහොමත් බෑ."

භාවනා මේ ටික කිව්වේ මිලින්දගේ හිත මේ පැත්තට ගන්නටය. කෙල්ල ගියේ ඔහුට තවත් කේක් කෑල්ලක් කවාය.

# 20

සුරංගිත් ඇයගේ පුතා වූ මිහිරංගත් මලීෂාත් තවම ආවේ නැත. රුවන්ති දැනට නතරව ඉන්නේ මහගෙදරම නිසා ඇය වේලාසනම කෝසළුවත් රැගෙන ආවාය. අලුත් සරමට සුදු අත් කොට කමිසය ඇඳගෙන රඹුක්වැල්ල මහතා ආවේ සියල්ලන්ම පැමිණ ඇතැයි සිතාය. එහෙත් සුරංගිත් මිහිරංගත් මලීෂාත් පැමිණ උන්නේ නැත.

"කෝ මේ මිහිරංගලා මැණික."

භාවනාට බැලුණේ නේත්‍රා දෙසය.

"කියලනේ තියෙන්නේ සීයා. දැන් එයි."

'එයාලා මෙහෙට එන්න කලින් තව බෝඩ් මීටින් එකක් දානවා ඇති' භවනාට නිකමට සිතුණි.

"ඔයත් ආපු එක හොඳයි වේලාසනම."

රඹුක්වැල්ල මහතා කීවේ මිලින්ද දෙස බලාය. ඔහු සිනාසුණේය.

"කෝසළ කියනවා තාත්තේ එයා සෑහෙන වගකීම් ටිකක් ගන්නම්ලු සීගිරි එකේ. එයාට පුළුවන් ඔය තියෙන ප්‍රශ්න ටික විසඳන්න. මිහිරංගලගේ කිසිම උගත්කමක් නෑනේ. ඒකනේ."

රුවන්ති කියාගෙන ආවාය.

රඹුක්වැල්ල මහතා බැලුවේ මිලින්ද දෙසය. ඔහු සිනාසුණේය.

"ඉන්නකෝ ටිකක් රුවන්ති. මෙයාලත් එනකල් අපි කතාකරමු. හැමෝම වගකීම් ගන්න ඕන. එක්කෙනෙක් කියලා නෙමේ. මේක ඔයාලා හැමෝගෙම."

රඹුක්වැල්ල මහතා කීවේය. 'ලස්සනට අහගත්තා සීයගෙන්' භාවනා සිතුවාය. කෝසළ උන්නේ මේ හැන්දෑවේ කෙල්ලගේ ලස්සන බලමිනි. ඇය ඇඳගෙන උන්නේ ඩෙනිම් ත්‍රී ක්වාටර් එකට සුදු ටී ෂර්ට් එකය. එය ඇඳගෙන සුදු රබර් සෙරෙප්පු දෙක දමාගෙන උන් ඇගෙ න් මේ හැන්දෑවේ පේන්නේ කියා විස්තර කරන්නට බැරි වෙනස්ම ලස්සනකි. ඇය උන්නේ කුෂන් පුටුවේ

ඉඳගෙන රෝද පුටුවේ උන් නේත්‍රාගේ උකුලට අතක් දාගෙනය.

"අක්කිව මම පුටුවෙන් තියන්නද? ඔහොම ආමාරුනේ."

"මේක පහසුයි බබා. කමක් නෑ."

නේත්‍රා කීවාය. සුරංගිත් මිහිරංගත් මලීෂාත් ආවේ තරමක් හොඳට ඇඳගෙනය. 'ඔය එන්නේ බැටෑලියන් එකම. මෙහේ පාටියක් කියලා හිතාගෙනද මේ ඇඳගෙන එන්නේ.' භාවනා සිතුවාය.

"පුතාගේ යාළුවෙක් ආවා ඔස්ට්‍රේලියා ඉඳලා. ඉතින් ටිකක් ඉඳලා ආවේ. එයාට එහේ යන්න කතාකරනවා."

සුරංගි ආව හැටියේ කීවාය. රුවන්ති නළල රැළිකරගත්තාය. මිහිරංගගේ යාළුවෙක් ආව

බව ඇත්තය. ඒත් ඔහු ආවේ ඔස්ට්‍රේලියාවේ සිට නොවේ. බැංකොක් සිටය.

"ඉඳගන්නකෝ."

රඹුක්වැල්ල මහතා කීවේය. මලීෂා ඇඳගෙන විත් තිබුනේ ඩෙනිම් ජීන්ස් එකකි. පුදුමයකට මෙන් ඇය ඊට ටී ෂර්ට් එකක් ඇඳ එය යට කරගෙන බෙල්ට් එකක්ද දමාගෙන උන්නාය. 'පිස්සුනේ' භාවනා සිතුවේ නේත්‍රාගේ අතක් තදකරමිනි. එහෙම කළ විට කියන්නේ මොකක්ද කියා අක්කා දන්නා බව කෙල්ල දනී.

"හැමෝටම එන්න කිව්වේ සීගිරි එක ගැන කතාකරන්න. මේකට මෙහෙම වෙන්න දෙන්න බෑ මම හැමදේම ගොඩනැගුවේ මේ සීගිරි එකෙන්. මේක ලස්සනට තිබුණකාලේ

අපි රජවරු වගේ හිටියේ. ඔයාලාගේ හැමදෙයක්ම මම ලස්සනට කළේ මේ සීගිරි එක නිසා. මේ ගෙවල් දොරවල් හැදුවා හැමෝටම වාහන අරගෙන දුන්නා. මේ දරුවන්ට ඉගැන්නුවා. දැන් මේ දරුවෝ ලොකු මහත්වෙලා එයාලගේ වැඩ හෙට අනිද්දා එන්නේ. එහෙම වෙනකොට අපි හොඳ තැනක ඉන්න ඕන. බංකොලොත්වෙච්ච සුපර් මාර්කට් එකක කට්ටියක් කියලා කතාවක් අහගෙන මේ දරුවෝ පිටට දෙන්න බෑ. ඒක ඔයාලා දැනගන්න ඕන. ඇත්තම කතාව කියනවානම් සීගිරි එක වැටිලා. ගොඩක් වැටිලා. රටේ ආර්ථිකේ හොඳ නෑ කියලා හිතලා මාත් අවුරුද්දක් දෙකක් බැලුවා ඒත් වටේ තියෙන හැම සුපර් මාර්කට් එකකටම සෙනඟ උතුරනවා.

අපිට කස්මර්ස්ලා එන්නේ නෑ. අද කස්ටම කවුන්ට් එක දෙසීය විස්සයි. කලෙක්ෂන් එක එකයි අසූවයි. ඒක හොඳටම මදි. අපි වැටිලා. ඇත්ත කතාව ඒකයි. ඇයි මෙහෙම වුනේ කොහොමද මේක වුනේ මොකක්ද කරන්න ඕන. ඒ දේවල් අපි කතාකරන්න ඕන මේක අපේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"තාත්තා මගේ කොල්ලගෙනුයි කෙල්ලගෙනුයි හරියට වැඩක් ගන්නේ නෑ. කොල්ලව දාලා තියෙන්නේ මේ රාක්ක බලන්න. කෙල්ලව දාලා තියෙන්නේ ස්ටෝරුවට. ඉතින් කවුද මේවා කරන්නේ."

සුරංගි කීවාය. රඹුක්වැල්ල මහතා නළල රැළිකරගත්තේය. ඔහුට බැලුනේ මිලින්ද දෙසය.

භාවනා යටිතොල හපාගත්තාය. ඇය මිහිරංග දෙසවත් මලීෂා දෙසවත් බැලුවේ නැත. කෙල්ල ඉන්නේ බිම බලාගෙනය. 'කියන දෙයක් කියපුදෙන්කෝ එයාලා.' ඇය සිතුවාය. නේත්‍රා කෙල්ලගේ අත තදකර කීවේත් නිෂ්ශබ්දව ඉන්න කියාය.

"මිහිරංගව දාලා තියෙන්නේ රාක්ක බලන්න නෙමේ ලොකු නංගි. පුතාට බාරදීලා තියෙන්නේ සේල්ස් සෙක්ෂන් එක. ඒක රාක්ක බැලීමක් නෙමේ. ස්ටෝර්ස් කියන්නෙත් එහෙම නරක තැනක් නෙමේ. ඒක තමයි හදවත සුපර් මාර්කට් එකක."

මිලින්ද සාවධානව කීවේය.

"අද කස්ටමර් කෙනෙක් චූටි මැණිකගේ මූණටම කෑගහලා ගියා.

කන්සියුම එකට පැමිණිලා කරනවා කියලා ගියේ. සමහරවිට කරන්නත් පුළුවන් ඒ අපිට උන්න හොඳ කස්ටමර්ස්ලා.”

රඹුල්වැල්ල මහතා කීවේය.

“සීල් කරපු බොට්ල්ස්වල තියෙන පොල්තෙල් හොඳද නරකද කියන්න මට බෑනේ සීයේ. අලුත් සප්ලයර්ස්ලව අපි ට්‍රයි කරන්න ඕන. එහෙම නැතුව බෑනේ. සීයා ගිහින් බලන්න කීල්ස්වලට. එයාලා ළඟ මන්චි බිස්කටුත් තියෙනවා බැලිබනුත් තියෙනවා තව මේ පොඩි පොඩි බිස්කට් කම්පනිවල බිස්කටුත් තියෙනවා. එහෙමයි.”

මිහිරංග කීවේය. ‘කට උත්තරේ හදාගෙන ආව මිනිහා’ භාවනා සිතුවාය.

"මිහිරංග. මම පුතේ අවුරුදු තිහක් තිස්සේ මේක කරගෙන යන මිනිහෙක්. ජෝන් කීල්ස්ලා ෆුඩ් සිටිලා ලංකාවේ සුපර් මාර්කට් පටන් ගන්න හිතුවේවත් නැති කාලේ මම මේක පටන් ගත්තේ. ඒ කාලේ ජෝන් කීල්ස්ලා ටුවරිසම් කරන්නේ. ෆුඩ් සිටි කරන සිලෝන් තියටර්ස්ලා ෆිල්ම් කරන්න බඩු දෙනවා. එහෙම මට මේ සප්ලයර්ස්ලා අඳුනගන්න හැටි කියලා දෙන්න ඕන නෑ."

රඹුක්වැල්ල මහතා කීවේ දුක්බරවය.

"එතන තිබුණ ප්‍රශ්නේ අලුත් සප්ලයර් කෙනෙක්ව ගත්ත එක නෙමේ මිහිරංග අයියේ. අලුත් සප්ලයර් කෙනෙක්ගෙන් පොල් තෙල් බොට්ල්ස් හත්සීයක් ගත්ත එක.

ඒකයි ප්‍රශ්නේ. අපි අලුත් සප්ලයර් කෙනෙක්ගෙන් ගන්න ඕන සාම්පල් කොන්ටිටි එකක්. බොටිල්ස් දොළහක් විසි හතරක් වගේ හොඳනම් බඩු මූව් වෙනවා නම් තව ගන්නවා. අනික බොටිල්ස් එකසිය අසූවක බැලන්ස් එකක් තියෙද්දී එයාට චෙක් එක ඉෂූ කළා. තව තුන්සීයක් ගත්තා. පොල් තෙල් කියන්නේ ටික කාලයක් තියෙනකොට මුඬුවෙන ප්‍රොඩක්ට් එකක්. අපි ඒක දැනගන්න ඕන."

භාවනා හරි අමාරුවෙන් කීවාය. සුරංගිගේ කට ඇදවීගෙන ගියේය.

"ඇයි ඉතින් පොඩි දුව සේල්ස් එක අරන් කරන්නේ නැත්තේ. අයියට දෙන්න කැෂියර් එක."

සුරංග කීවාය. භාවනා සිනාසුනාය.

"පොස්ට් බෙදුවේ මම නෙමේ නැන්දේ. සීයා මට දුන්න දේ මම කරනවා."

භාවනා කීවාය.

"ඒවලත් හෙණ කේස්නේ. අපිත් ඉන්නේ සීගිරි එකේනේ."

මලීෂා මොබයිල් එක ඔබමින් කීවාය. කෙල්ල තනිවී ඇති බව නේත්‍රා තේරුම් ගත්තාය. ඇය කෙල්ලගේ අත මිරිකා රෝද පුටුව ඉස්සරහට ගත්තාය. භාවනාගේ ඇස්වල කඳුළුය.

"දැන් මල්ලිට ඕන මොන සෙක්ෂන් එකද කියන්න. මලීෂාත් කියන්න කෝසළ මල්ලිත් කියන්න. මෙතන සීයා ඉන්නවා තාත්ති ඉන්නවා. නැන්දලත් ඉන්නවා අපි තීරණය කරමුකෝ."

නේත්‍රා කීවාය.

"මං කැෂියර් එක කරන්නම්. මට ඒක ලේසියි. මේ කරවල ගඳ ගහන ස්ටෝර්ස්වල මට ඉන්න බෑ. හවස් වෙද්දී ළඟ ඉන්න බෑ ගඳයි. අඳුරු ගුහාවක් ඒක."

මලීෂා කීවාය.

"මිහිරංගත් කියන්න."

නේත්‍රා කීවාය.

"මම දන්නේ නෑ."

ඔහු කීවේය. භාවනා රඹුක්වැල්ල මහතා දෙස බැලුවාය.

"මම සීයා සේල්ස් එකයි ස්ටෝර්ස් එකයි දෙකම බලන්නම්. මට පුළුවන්. මම ඒකට ආසයි."

භාවනා හැමෝවම පුදුමයට පත්කරමින් කීවාය. මේ තරම් ආශාවෙන් කරන කැෂියර් සෙක්ෂන්

එක ඒ තරම්ම පහසුවෙන් ඇය අත්හරී කියා කිසිවෙක් සිතුවේ නැත.

"දැන් මොකද කියන්නේ. කැමතිද මලීෂා ඒක දෙන්න නංගට."

නේත්‍රා ඇසුවාය.

"එනිතිං. මට මොකද? මට බෑ ස්ටෝර්ස් කරන්න."

ඇය කීවාය.

"කෝසළ මොනවද කරන්න කැමති. කියන්න. සීයට කියන්න දැන්. මොන දේ කතාකරන්නත් කලින් සීයා අපි මේ පෝස්ට් ටික වෙන්කරලා දීලා ඉමු. සීයා මටත් කියන්න. මට සීගිරි එකේ සිකියුරිටි කවුන්ටර් එක දුන්නත් මම කරනවා. පාර්සල් අංශය දුන්නත් මම කරනවා."

නේත්‍රා කීවාය. ඇගේ දෑස්ද තිබුනේ යන්තමට බොඳවීය.

රඹුක්වැල්ල මහතා මිලින්ද දෙස දුක්බරව බැලුවේය.

"දැන් චූටි මැණිකා කියනවනේ එයා ස්ටෝර්ස් එකයි සේල්ස් සෙක්ෂන් එකයි බලන්නම් කියලා. මිහිරංග පර්චසින් ගන්නවද?"

මිලින්ද ඇසුවේය.

"ඔව් පුළුවන්."

ඒක ටිකක් අනියම් ලෙස හම්බකරන්නට හැකි අංශයකි. අලුත් සප්ලයර්ස්ලා පර්චසින් මැනේජර්ට හොඳ පගාවන් දෙයි. සමහරවිට කොමිෂන් එකක් පවා දෙයි. බොහෝ ආයතන විනාශ වූයේ හොඳ පර්චසින් එකක් නැති නිසාය. අවශ්‍ය නැති බඩුවලින් වෙළඳ සැල් පිරුණේ ඒ නිසාය.

"හොඳයි මිහිරංගට තාත්තේ අපි

පර්චසින් දෙමු."

මිලින්ද කීවේය. රඹුක්වැල්ල මහතා හිස වැනුවේය. මිලින්ද මෙතනදී මූලික වී වැඩකරනවා නම් සහනයක් යැයි ඔහුට සිතෙයි.

"හැබැයි මිහිරංග පර්චසින් කරන්න ඕන සේල්ස් සෙක්ෂන් එක කියන දේ. එයාලා එපා කියන දේ ඔයාට පර්චස් කරන්න බෑ සේල්ස් පැත්ත දන්නේ වෙන කෙනෙක්නේ. හරි. පිටින් ගන්න හැම ඇල්පෙනිත්තට පවා සේල්ස් සෙක්ෂන් එකේ කෙනයි ස්ටෝර්ස් අංශයේ කෙනයි එකවුන්ට්ස් සෙක්ෂන් එකේ කෙනයි අත්සන් කරන්න ඕන පස්සේ කියන්න බෑ මම දන්නේ නෑ අරයා ඕඩර් කළේ කියලා."

මිලින්ද මිහිරංගව හිරකළේය.

“ඉස්සර පර්චසින් කළේ මම. හැබැයි මම පර්චසින් කළේ ඔයාගේ සීයා ඉල්ලන දේ. මොකද සීයා තමයි සේල්ස් බැලුවේ. අපි හැමදාම හවස සේල්ස් රිපෝර්ට් එක බලලා පර්චසින් ඕඩර් හදනවා.”

මිලින්ද කීවේය. රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

“කෝසළ.”

මිලින්ද කතාකළේය. කෝසළ බැලුවේ අම්මා දෙසය.

“කෝසළ බලන්න සුපර් මාර්කට් එකේ ටෙක්නිකල් පැත්ත. කම්පියුටර්ස් විස්සක් විතර තියෙනවා. කැෂියර් මැෂින් හතරක් තියෙනවා ෆ්‍රීසර්ස් තියෙනවා. කූල් කැබිනට් තියෙනවා. ලයිට් සිස්ටම් එක තියෙනවා. ඒ සී හයක්

තියෙනවා. ඒ ඔක්කොම ඔයා බලන්න. ඒක වගකිව යුතු දෙයක්.”

මිලින්ද කීවේය.

“ඒක මේ ටෙක්නීෂියන් කෙනෙක්ගේ වැඩක්නේ අයියේ.”

රුවන්ති පැන කීවාය.

“නෑ නංගි ඒක වැරදියි. කෝසළ යටතේ ටෙක්නීෂියන්ස්ලා හතර දෙනෙක් ඉන්නවා. එයාලවත් පාලනය කරගෙන ඒවා බලන්න ඕන.”

මිලින්ද කීවේය.

“ඒක ඕන නෑ. කෝසළට දෙන්න මැනේජ්මන්ට් සයිඩ් එකේ වැඩක් එයාට අවබෝධය තියෙන්නේ ඒ ගැනයි. හොඳට තීරණ ගනී. මෙතන නැත්තෙත් එහෙම කෙනෙක්නේ.”

රුවන්ති කීවාය.

“එතකොට ටෙක්නිකල් පැත්ත

බලන්නේ කවුද මෙතන?”

මිලින්ද හැමෝම දෙස බලා ඇසුවේය. භාවනා සිනාසුනාය.

“මම ඒක බලන්නම් තාත්තා. දැණුත් බලන්නේ මම. ෆ්‍රීසර් එකක් වැඩකරන්නේ නැත්නම් මාව තමයි හොයාගෙන එන්නේ. මට ඒක බලන්න පුළුවන් කවුරුවත් ඒක බාරගන්නේ නෑනේ”

භාවනා කීවාය. රඹුක්වැල්ල මහතා සිනාසුනේය. කෙල්ල දැන් වගකීම් තුනක් ගත්තාය.

“රයිට්. කෝසළට බලන්න පර්සනල් මැනේජ්මන්ට් එක. ඔක්කොම ස්ටාෆ් එක පනස් හතරක් ඉන්නවා. ඔයාට ඒ ඔක්කොම බාරයි. එයාලගේ සැලරීස් ලීව් එතකොට රිසයින් වුණාම අලුතින් අරන්

දෙන්නෝන. එන සේවක ප්‍රශ්න විසඳන්න ඕන. එයාලගේ ආරක්ෂාව බලන්නෝන. නයිට් වැඩකරන කොට ඩිනර් ඇරේන්ජ් කරන්න ඕන. ඊ පී එෆ් බලන්න ඕන ඒවා වෙලාවට යනවද කියලා බලන්නෝන. කව්රුහරි සේවකයෙක් කම්කරු එකේ පැමිණිල්ලක් දැම්මාම සීගිරි එක වෙනුවෙන් කම්කරු එකට යන්නෝන. හරි. ඒක කරන්න."

මිලින්ද කීවේය. සීගිරි එකේ ඉන්නට තිබුනේ තාත්තා කියා භාවනාට සිතුණි.

"මොකද කෝසළ කියන්නේ?"

කෝසළ ටිකක් වෙලා ගත්තේය. තමා හිරවී ඇතිබව ඔහුට තේරුණි.

"මට මාමා මේ මයිනර් ස්ටාෆ් එකත් එක්ක වැඩකරලා පුරුදු නෑ."

කෝසළ කීවේය. මිලින්ද සිනාසුණේය.

"ඔයා කියන්නේ ඒකත් නංගිටම බලන්න කියලද? දැන් කෙල්ල සෙක්ෂන් තුනක් ගත්තනේ."

මිලින්ද කීවේය.

"ප්‍රශ්නයක් නෑ තාත්තා. ඒකත් මායි අක්කයි බලන්නම්. කොහොමත් ඒවා බලන්නේ අක්කයි මායි සීයයි තමයි."

භාවනා කීවාය.

"කෝසළ මලීෂා එක්ක කැෂියර් එක බලන්න. කෙඩ්‍රිට් කාඩ් පැත්තත් බලන්නෝනනේ."

රඹුක්වැල්ල මහතා අවසානයට කීවේය. කෝසළ බැලුවේ අම්මා දෙසය.

"දැන් හරි. අපි බලමු මේ සේල්ස්

වැඩිකරගන්න මොනවද කරන්න පුළුවන් කියලා."

මිලින්ද කීවේය.

"හෙට පුතා මම ඉන්ටර්වීව් එකකුත් කෝල් කරලා තියෙන්නේ මාකටින් ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක් ගන්න."

රඹුක්වැල්ල මහතා කීවේය.

"ඒක හොඳයි තාත්තා. අපි බලමු හොඳ කොල්ලෙක්ව ගන්න."

මිලින්ද කීවේය.

"පිස්සුනේ සීයා. මෙතනට මේ පිටින් පොරවල් අරන් මාකටින් හදන්න බෑනේ. ඒකට අලුතින් ඉන්වෙස්ට් කරන්න ඕන. පබ්ලිසිටි කරන්න ඕන."

මිහිරංග දන්නා මිනිහා වාගේ කීවේය. රඹුක්වැල්ල මහතා

සිනාසුනේ මිලින්ද දෙස බලාය.

"ඔයා දන්නේ නැති පැත්තක් තියෙනවා මිහිරංග. එහෙම පබ්ලිසිටි දීලා සේල්ස් හදන්න බෑ. අනික අපි දැන් ඉන්වෙස්ට් කරන කාලේ නෙමේ. ඒවා කරලා ඉවරයි."

මිලින්ද කීවේය. මිහිරංග බිම බලාගත්තේය. 'නිකං සවුත්තුවෙනවා. තාත්තියි සීයයි මේක හදපු අය එයාලටත් පිටින් යන්න එනවා.' භාවනා සිතුවාය.

"එක කාලයකුත් මතකද තාත්තට අපේ සේල්ස් වැටුණා."

මිලින්ද ඇසුවේය.

"ඔව් අසූ හතේ අසූ අටේ ජේ වී පී කලබල දවස්වල."

"ඒ කාලේ ගොඩක් සේල්ස් වැටුණා. සේල්ස් ආයේ හදන්න

ප්ලෑනක් හැදුවේ ඔයාලගේ නැතිවෙච්ච පොඩි නැන්දි. මිහිරංගගෙයි කෝසලළගෙයි පුංචි.”

මිලින්ද කීවේය. භාවනා පුදුමයෙන් බැලුවාය.

“නැන්දි මොනවද තාත්ති කළේ.”

භාවනා උනන්දුවෙන් ඇසුවාය.

“එයාට අපිට වගේ නෙමේ. හරි සියුම් දැණුමක් තිබුනේ. ඔය හැමදේ සපිරි නාමය සුපිරි කියන ස්ලෝග න් එක හැදුවෙත් එයානේ. නේද තාත්තේ.”

රඹුක්වැල්ල මහතාගේ දෙනුවන් තෙත්විය. මේ වෙලාවේ ඉන්නට තිබුනේ නර්මදා යැයි ඔහුට සිතුණි. ‘මට හිටපු හොඳම කෙල්ල මට නැතිවුණා. ජීවන් දැන් කොහේ ඉන්නවද දන්නේ නෑ’ රඹුක්වැල්ල

මහතා සිතුවේ වේදනාවකිනි.

"මොනවා කළාද කියලා දැන් මතකත් නෑ චූටි මැණික."

"පව් ඉන්න තිබුණා එයා."

නේත්‍රා දුක්බරව කීවාය. ඇයව මතක ඇත්තේ නේත්‍රාට පමණි. ඒ දවස්වල නේත්‍රාද  පුංචිය.

"අපි ලක්ෂ හයක් ඉක්මවලා සේල්ස් අප් කරන්න ඕන. එහෙම වෙන්නනම් කස්ටමර් කවුන්ට් එක හය හත්සීයක් වෙන්න ඕන. මේ කා පාක් එක පිරිලා ඉතිරිලා යන්නෝන."

මිලින්ද කීවේය.

"මමනම් කියන්නේ අපි වෙන බිස්නස් එකකට යන්නෝන මේකෙම එල්ලිලා ඉන්න ඕන නෑනේ දැන් මරු බිස්නස් තියෙන්නේ."

මිහිරංග කීවේය. රඹුක්වැල්ල

මහතා කේන්තියෙන් බැලුවේය.

"මෙතන පිස්සු කියවන්නෙපා මිහිරංග. සීගිරි එක වහන්න නෙමේ අපි අද මේ එකතුවුනේ. මේ කෙල්ලයි කිව්වේ අද හැමෝම ගෙනල්ලා කතාකරමු කියලා ඒ සීගිරි එක නග්ගන්න. වෙන බිස්නස් එකක් ඕනනම් මිහිරංග ගිහින් කරගන්න. මම මැරෙනකල් ඒවා කරන්න බෑ."

රඹුක්වැල්ල මහතා කේන්තියෙන් කීවේය.

"එහෙම වෙන්න දෙන්නෙත් නෑ සීයේ. අපේ බබාලත් මේ සීගිරි එකේ වැඩකරන්න ඕන."

භාවනා කීවාය. රඹුක්වැල්ල මහතා කෙල්ල දෙස බැලුවේ ආදරයෙනි.

"ඇයි හැමෝටම එක වගේ

කැක්කුමකින් මේක ගැන හිතන්න බැරි?"

ඔහු ඇසුවේය.

"හැමෝටම එක වගේ ලැබෙනවානම් හැමෝම එහෙම කැපවීමෙන් වැඩකරයි නේද"

සුරංගි කීවේ රුවන්ති දෙසත් බලාය. රඹුක්වැල්ල මහතා අසරණව බැලුවේ මිලින්ද දෙසය.

"මෙතන කාටවත් සීගිරි එකෙන් වැඩිපුර එන්නේ නෑ නංගි. මම මේ වෙන දේකුත් කරන්නේ මට ඉන්නේ කෙල්ලෝම තුන්දෙනෙක් නිසා. උන් තුන්දෙනා ගැන මට බලන්න ඕන. එහෙම වැඩිපුර ලැබෙනවානම් මට එහෙම කරන්න ඕන කමක් නෑනේ."

"මමයි අක්කයි ඕනනම් අපේ සැලරි ෂීට් එක ගෙනත් පෙන්නන්නම්.

අපිට ලැබෙන්නෙත් හැමෝටම දෙන සැලරි එක තමයි. මම සීගිරි එකෙන් පොඩි ෂැම්පු එකත් ගත්තත් ගන්නේ මගේ අතින් ගෙවලා."

භාවනා කීවාය. භාවනා දිග හුස්මක් ගත්තාය.

"මේක බෙදාගන්නේ කොහොමද කියන එක නෙමේ දැන් තියෙන ප්‍රශ්නේ. බෙදාගන්න හරි සීගිරි එක තියෙන්න ඕන. මේක නැතිවෙන්න යන්නේ. ඒකයි මෙතන කතාකරන්න ඕන. සීගිරි එකට මෙහෙම වෙන්න දෙන්න බෑ. ඒක අපේ."

කෙල්ල හරි කැක්කුමකින් කීවාය.

"නර්මදා නැතිවෙලා දැන් අවුරුදු විස්සක් විතර වෙනවා. මේ කතාවම කෙල්ල මට කිව්වා. මෙහෙමම. ඒ මම සීගිරි එක බෙදන්න ගිය වෙලේ.

ඒක බෙදන්න එපා කිව්වා."

රඹුක්වැල්ල මහතා කීවේ අප්‍රමාණ වූ දුකකිනි. ඔහු හිස බරකර කඳුළු පිසදාගත්තේය. ' ඔයා කොහොම කෙනෙක්ද පොඩි නැන්දි. අනේ ඔයා ජීවත්වෙලා උන්නේ නෑනේ. කොහොමද එච්චර හොඳ ඔයාවම නැතිවුනේ. කෝ එතකොට ඔයාගේ මහත්තයා. තෙකුත් හිටියලු කෝ දැන් එයාලා' භාවනා සිතුවාය. ඒ ගැන පසුව අක්කාගෙන් ඇසිය යුතුයැයි ඇය සිතාගත්තාය. භාවනා බැලුවේ සාලයේ කොණක වූ පවුලේ ඡායාරූප ගොන්නේ ගසා තිබූ නර්මදා නැන්දාගේ පින්තූරය දෙසය. 'හරි අහිංසක ලස්සනක් නැන්දිට තිබිලා තියෙන්නේ.' ඇය සිතුවාය.

හෙට සීගිරි එකට ඉන්ටර්වීව්

එන්නේ ඒ නර්මදා නැන්දාගේ පුතා බව කෙල්ල දන්නේ නැත. සිගිරි එකේ කිසිවෙක් දන්නේද නැත. කොල්ලා එන්නේ මැරිච්ච අම්මාගේ ආත්මයද එක්කය.

***   ***   ***   ***   ***

"සීගිරි එක විකුණලා ඒ සල්ලි බෙදලා දෙනවානම් කට්ටියම කැමතියි වගේ. මේක හදන්න කාටවත් රුදාවක් නෑ බබා."

නේත්‍රා කීවේ රෑ කෙල්ල ඇයගේ ඇඳට ආව වෙලාවේය. භාවනා ආවේ අක්කාටත් එක්කම නෙස්කැෆේ දෙකක් හදාගෙනය. සුදු පාට කොට්න් රෑ ඇඳුමට කෙල්ල ප්‍රින්සස් කෙනෙක් වාගේය.

"මටත් අද හිතුණා. මේක විකුණාගෙන කන්න තමයි හැමෝටම ඕන. මෙතන ටවුන් එකේ මැදනේ. අක්කර බාගයක් විතර තියෙනවා ඉඩම හැමෝම දන්නවා මේක කෝටි ගාණකට දෙන්න පුළුවන් කියලා. සුපර් මාර්කට් කරන කම්පනි එකකින්ම ගනී කෝටි ගාණක් දීලා."

නේත්‍රා කෙල්ලගේ බාහුව පිරිමැද්දාය. නේත්‍රා ඉන්නේ දෙපා සනීපයට කොට්ටයක් මත තබාගෙනය.

"අක්කා"

"ම්."

"අක්කට පොඩි නැන්දිව මතකයිද?"

භාවනා ඇසුවාය.

"අනේ මට හොඳටම මතකයි.

මට පණ වගේ එයා. පුංචි කාලේ මාව නාවන්නෙත් එයා. මාව කුවු කව කව නාවන්නේ. මේ ලෝකේ අම්මට පස්සේ මම දැකපු හොඳම කෙනා තමයි නර්මදා නැන්දි. මං කිව්වේ සුදු නැන්දි කියලා."

නේත්‍රා කීවාය.

"මේ ඉන්න ඔක්කොටම වඩා එයා හොඳ කෙනෙක්. ගොඩක් හොඳ කෙනෙක්. උන්නනම් අද ඔයාව බදාගෙන ඉඳී එයා එහෙමයි. එයා නැතිවෙනකොට මං හිතන්නේ ඔයා අම්මගේ බඩේ"

මේ ටික කියද්දී නේත්‍රාගේ දෙනෙත් තෙත්වීගෙන ගියේය.

"පව්. සීයා කවදාවත් වැරදි කරන කෙනෙක් නෙමේ. ඒත් ඒක එයාගේ අතින් වෙච්ච ලොකු වැරැ

ද්දක්. ජීවන් අන්කල් ගොඩක් හොඳ කෙනෙක්. ඒත් හරි දුප්පත් නුවර කොල්ලෙක් ඒ දවස්වල."

නේත්‍රා ඒ කතාව දැනගෙන උන්නාය.

"පචි. දැන් කොහේ ඉන්නවද දන්නේ නෑ ජීවන් අන්කල්."

"නැන්දිට පුතෙක් උන්නලු නේද අක්කේ."

"ම්. මට යන්තමට වගේ තමයි ඒ මල්ලිව මතක. එකපාරක් දෙපාරක් නැන්දි එක්කගෙන ආවා. සීයා ඒ දවස්වල එන්න එපා කියලනේ තියෙන්නේ. හොරනේ කොල්ලවත් වඩාගෙන එන්නේ. අවුරුදු එකහමාරක් දෙකක් ඇති ඒ දවස්වල ඒ මල්ලට"

නේත්‍රා කීවාය.

"හැමදේම එපා කියලා නැන්දි ජීවන් අන්කල් එක්ක ගියේ. ඒත් මේ සීගිරි එකට වැඩියෙන්ම ආදරේ කළේ එයා. ඒ දවස්වල හරිම ලස්සනයි."

"මී පොටෝ එකේ ඉන්නේ."

ඇය ඉන්නට තිබුණා කියා භාවනාටත් සිතෙයි.

"නැන්දිගේ පුතත් දැන් ගොඩක් ලොකු ඇති. ඔයාට වඩා අවුරුද්දක් දෙකක් වැඩිමල් මම හිතන්නේ."

භාවනා අක්කාගේ වතට බරවීගෙන යන්තමට දෑස් පියාගත්තාය. ඇය ළඟ හරි උණුසුම්ය. නේත්‍රා කෙල්ලගේ හිස පිරිමැද්දේ ආදරයෙනි.

"මට හරි බයක් දැනෙනවා අක්කේ. සීගිරි එක වැහෙයි කියලා."

භාවනා කීවාය. ඒ බය ඇගේ

හිතට ආවේ අදය. මේ හවසය.

"බලමු බබා. එහෙම වෙන්න දෙන්න බෑනේ."

කෙල්ල සුසුමක් හෙළුවාය.

"සමහරු එනවා. ප්‍රාතිහාර්යයක් කරන්න පුළුවන් අය. බලමුකෝ."

නේත්‍රා කීවාය.

# 21

මිහිරංගත් මලීෂාත් පමණක් නොව සුරංගිත් ගෙදර ආවේ දැවෙමිනි.

"භාවනායි මාමයි සීයයි කතාවෙලා මේක කළේ. අපි දෙන්නට කටුව ගහන්න මේ යන්නේ. වෙන දෙයක් නෙමේ. භාවනාටයි නේත්‍රාටයි ඕන සීගිරි එකේ අයිතියයි පාලනයයි දෙකම එයාලට ගන්න. මේ බොරු කැක්කුමක් පෙන්නන්නේ සීයගේ හිත

ගන්න."

මලීෂා කීවාය. ඇගේ කතාව සුරංගිද අනුමත කළාය.

"ඔව් වෙන දෙයක් නෙමේ. මම අද ඉවසුවා නැත්නම් තාත්තටයි දුවලටයි හොඳ දෙකක් මම කතාකරලා එන්නේ."

සුරංගි කීවේ වෙව්ලමිනි.

"භාවනා කොහොමත් ටිකක් අලි ඔළුවෙන් තමයි ඉන්නේ. බලමු අම්මා."

මිහිරංගද කීවේය.

"කොහොමත් සීගිරි එකේ වැඩි කොටසක් අපිට එන්නෝන. ඒක වැහුවත් මට කමක් නෑ. කෝටි ගාණක් එතන තියෙනවා."

සුරංගි කීවාය.

"සියා මේවා කවදාවත් බෙදන්නේ

නෑ එකපාරක් බෙදන්න ගියා. ඒත් කොහෙද? අර මැරිච්ච පුංචි සාලේ අඬ අඬ දෙවනත් කලා මෙතන සීගිරි එක බෙදන්න එපා කියලා."

"මේක දෙල් කරලා තියෙන්නේ එයා තමයි."

මිහිරංග කීවේය.

"ඕක කඩාගෙන වැටෙන්නම තමයි ඕන. එතකොට ඕක බෙදලා දානවා. අපේ කොටස හොඳ ගාණකට දෙන්න පුළුවන්."

මිහිරංගද හිස වැනුවේය.

"මේක අම්මා කීල්ස් එකට හරි ෆුඩ් සිටි එකට හරි දුන්නානම් අපි ගොඩ. රෙන්ට් කළත් ඒ රෙන්ට් එකෙන් කාලා ඉන්න පුළුවන් මරු ප්ලේස් එකනේ මේක."

සුරංග හිස වැනුවාය.

"භාවනාට ඕන දේවල් ඔතන කරන්න එහෙම දෙන්න එපා. එයා ගාණට වැඩියි."

"ඒක මම බලාගන්නම්."

මිහිරංග කීවේය.

"ඔයා බලාගන්නේ කොහෙද ගෑණී ඔයාවත් කපනවනේ."

"ඒ මේ පොල් තෙල් කේස් එකක් නිසා හලෝ."

භාවනා තමාව කපනවා කියා අසාගන්නට මිහිරංග කැමති නැත.

"අරයත් පුතාවත් දිග්කරගෙන එන්නේ හොඳකම නෙමේ.මැනේජ් මන්ට් එකේ පෝස්ට් එකක් දෙන්නලු. කෝසළ දන්න මැනේජ්මන්ට්."

"එයා සද්ද නැතුව වැඩ.මහගෙ දර දිගටම ඉඳී වගේ."

"එහෙම කොහොමද? මහගෙදරත්

හැමෝටම අයිතියි.ඒවත් ගාණට බෙදෙන්න ඕන."

සුරංගි ඉන්නේ සියල්ලටම ඇහ ගසාගෙනය.

"සිගිරි එකෙන් අයින්වෙන්න එහෙම එපා. කොහොමහරි අල්ලගෙන යන්නෝන. අපේ කොටස ගන්නකල්. අන්තිමට ඒක භාවනාටයි නේත්‍රාටයි ලියයි. එහෙමයි සීයා."

සුරංගි දෙන්නාටම අනතුරු ඇඟෙව්වාය. 'බලමුකෝ.මගේ කොටසයි කෙල්ලගේ කොටසයි දෙකම මම ගන්නේ.එක ගලෙන් කුරුල්ලෝ හතර පස් දෙනෙක් බාන මිනිහෙක් මම.' මිහිරංග තමා ගැන සිතාගෙන ඉන්නේ එහෙමය.

***  ***  ***  ***  ***

දේවකට නින්දක් කියන නාමයක් අද යන්නේ නැත. එහෙම වෙන්නේ හෙට ඇති සීගිරි එකේ සම්මුඛ පරීක්ෂණය නිසාද කියා ඔහු දන්නේ නැත. නැත්නම් හෙට ඇයව දකින්න හැකිවෙන නිසාද කියාද දන්නේ නැත. කුමක් හෝ නිසා මේ ඇස් නිදාගන්නේ නැත.

දැන් වෙලාව රෑ එකොළහය. දේවක යළිත් වතාවක් හෙට සීගිරි එකට ගෙනයන රිපෝට් එක දෙස බැලුවේය. මේක හෙට පෙන්වන්නේ නැත. ඒත් මෙහි ඇත්තේ හෙට සම්මුඛ පරීක්ෂයේදී කියන්නට මෙහි ඇති දේවල්ය. ඒ නිසා ටිකක් බලාගත යුතුය.

"සීගිරි එකේ රස්සාව දෙනවානම්

මම අනිද්දා ඉඳලා රස්සාවට යන්න කැමතියි. එහෙමම එන්න කියන එකක් නෑ."

දේවක සිතුවේය. පිළිවෙලකට රස්සාවක් කරන්න හරිම ආසය. හැමදාම කළේ එක එක සමාගම්වල කොන්ත්‍රාත්ය.

"අප්පච්චිත් දවස් හතේම වැඩනේ. මටත් එහෙම රස්සාව කරන්න පුළුවන්. ඉරිදට ගෙදර හිටියා කියලා ඇති දෙයක් නෑ. එහෙම දවසක සුපර් මාර්කට් එකේ ඉන්නයි ඕන. ඕෆ් එකක් ඕනවෙච්ච දවසක ගන්න පුළුවන් නේ."

එච්චර කැපවීමෙන් සීගිරි එකේ වැඩකරන්නට යන්නේ ඇයි? එයට ඇති සම්බන්ධය නිසාද? නැත්නම් වෙන දෙයක්ද? දන්නේ නැත.

"ඔක්කොටම කලින් ඔයා කවුද කියලා දැනගන්නෙයි මට ඕන මම නමවත් දන්නේ නෑනේ."

කොල්ලා දිග සුසුමක් හෙළුවේය. මේ ඇතිවෙන දැවිල්ල එච්චර හොඳ නැත.

"ආයේ නුවර පදිංචියට යන්න අප්පච්චිගෙත් අදහසක් නෑ වගේ. ඇතිවෙන්න නුවරත් හිටියනේ. කොළඹ හොඳයි. නුවර වගේම සන්සුන් නෑ. ඒත් මොකක්ද තියෙනවා. මෙහේ පොඩියට ගෙයක් හදාගත්තොත් ගොඩම තමයි. අප්පච්චිටයි මටයි ලස්සනට ඉන්න පුළුවන් බතක් හදාගෙන කරවල ටිකක් තෙල් දාගෙන"

ඒත් හැමදාම එහෙමත් ඉන්න බැරිවෙන බව කොල්ලා නොදන්නවා

නොවේ. ජීවිතය වෙනස් වෙයි.

"ඒක එදාට බලමුකෝ."

දේවක දෑස් පියාගත්තේය. නින්ද යන්නේ නැත්තේ කල්පනාව නිසාය. ඔහු කල්පනා නොකර ඉන්නට බැලුවේය. අමාරුත් ඒකමය.

# 22

වෙලාව පාන්දර හතරය. මොකක්දෝ හේතුවක් නිසා භාවනාට මේ මහ පාන්දරම ඇහැරුණි. එච්චර පාන්දර ඇහැරී මොනවා කරන්නද කියා කෙල්ල සිතුවාය

"ඔන්න මගේම කියන්න කෙනෙක් උන්නානම් පාන්දර කියලා බලන්නේ නෑ. මම කෝල් ගහලා ගහලා ඇහැරවනවා පිස්සව. නිදිමතේ කියයි මොකද බබා මේ පාන්දර

ඇහැරගෙන නිදාගන්නකෝ. කියලා. මම එහෙම නිදාගන්න දෙන්නේ නෑ. දිගටම කතාවට අල්ලගන්නවා. මොකෝ කෝල් එක එයා කට් කරන්නද ඒවා බෑ මාත් එක්ක. ලව් නම් ලව්."

තමා හිතන්නේ මහ පුදුමාකාර දේවල් කියා කෙල්ලට සිතුණි.

"එහෙමත් හිතන්නෝනනේ."

ඇය නාන කාමරයට ගොස් මුහුණ ටිකක් තෙමාගෙනම ආවාය. පසුව යළිත් පොරවනයද පපුවටම ගෙන ඇඳට ආවාය.

"මොකෝ මේ අද? හතරයි දහයයි මෙච්චර උදෙන්. ඊයේ නිදාග න්නකොටත් එකොළහත් පැනලා."

මෙහෙම වෙන එකේ මොකක්හෝ තේරුමත් තිබිය යුතුය. ඇය ඇඳ

ඉහත්තාවේ චාජ් වෙන්නට ගසා තිබූ ඇගේ ජංගම දුරකථනය ගෙන නිකමට එය බැලුවාය. කිසිවෙකුගෙන් කෙටි පණිවිඩයක්වත් නැත. මිස් කෝල් එකක්වත් නැත.

"මට කවුරු එස් එම් එස් එවන්නද එව්වොත් ඉතින් ඩයලොග් එකෙන් තමයි. ක්‍රෙඩිට් ලිමිට් එක්සිඩ් වෙලා කියලා."

භාවනා දුක්බරව සිතුවාය. දවසක මේ ෆෝන් එකට කෙටි පණිවිඩ වැස්සක් වහිනවා දකින්නට ඇය ආසය. මිස් කෝල් විසි තිස් ගණනක් තියෙනවා දකින්නට ඇය ආසය.

"එහෙම වෙන්නනම් ඉතින් සෑහෙන ආදර කැක්කුමක් තියෙන වයින් බට්ටෙක්ව හොයාගන්න වෙනවා. තත්පරෙන් තත්පරේ මාව

මතක්වෙන. නැතුව බෑ."

ආදරය කරන්නත් ආස එහෙම කෙනෙක්ටය.

"කන් හැන්දකින් වගේ ආදරේ ලබන්න මම ආස නෑ.පොල් කටු හැන්දකින් උනත් මදි මට. මී. සවලකින්. ඒත් මදි. ලැබෙනවානම් ඉතින් අර ජේ සී බී බැකෝ එකකින් වගේ තමයි."

භාවනා ඇගේම තොල් පට තදකරගත්තේ සිනායන්නට ආව නිසාය. ඇය කාමරයෙන් පිටවී පිය ගැය පෙළේ මඳ දුරක් පැමිණ පැන්ට්‍රිය දෙස බැලුවාය. පද්මා ඇහැරලානම් එහි විදුලි පහන දැල්වෙයි.

"පද්මෝ."

කෙල්ල කතාකළේ හිමිහිටය.

නැත්නම් අනිත් අයටත් ඇහැරෙයි.

"පොඩි බේබි."

ඇය සිනාසුනාය.

"මට තේ පද්මෝ."

"අද වේලාසන බේබි."

"දන්නේ නෑ අනේ වේලාසන ඇහැරුණා. ගේන්න හොඳේ."

පද්මා හිස වැනුවාය. භාවනා එහෙමම පැමිණ ඇගේ අල්මාරිය විවර කළේ සාරියක් තෝරන්නටය. අද සඳුදාය. එහෙම දවසට කෙල්ල අඳින්නේ ඇයට ඇති ලස්සනම සාරියකි. ඇරත් අද ඉන්ටර්වීව් එකකි. ඒනිසා හොඳ සාරියක් ඇඳිය යුතුය. 'ඉන්ටවි කරන බෝඩ් එකට සියා මාවත් ගනීද දන්නේ නෑ.' භාවනා සිතුවාය.

ඇය තෝරා ගත්තේ ක්‍රීම් පාට

සාරියය. එය අද වැනි සඳුදාවකට ලස්සනය. මෝස්තරය චාම්ය. ඇත්තේ චොකලට් පාට සිහින් ප්ලේන් මෝස්තරයකි. එහි සාරි ජැකට් එක ඇත්තේද ඒ චොකලට් පැහැයෙන්මය.

"ඔෆිස් එකේ ඉන්න ගමන් සුපර් මාර්කට් එක පැත්තෙත් රවුමක් දාන්න ඕන. කොයි වෙලාවක හරි එයා එනවා. මට එහෙම හිතෙනවා එදා මම යනවා බලාගෙනත් උන්නේ."

භාවනා සිහිකළාය.

"දේවක පුංචි නිළමේ"

ඇය සිතින් කීවාය.

"අද කැෂියර් එකේ කෙල්ලෝ ටිකට බලලා පොඩි ට්‍රීට්මන්ට් එකක් දෙනවා. මම කැෂියර් සෙක්ෂන් එක අද හවස බාරදෙනවා මලීෂාටයි

කෝසළ අයියටයි."

භාවනා සිතුවේ දුකෙනි. ඇය මේ කැෂියර් සෙක්ෂන් එක කළේ හරි ආසාවෙනි.

"කමක් නෑ. මම සේල්ස් බලනවා. ඒකටත් මම ආසයි. මට දෙයක් කරන්න පුළුවන්."

භාවනා එසේ සිතා සිත සනසාගත්තාය.

"මම මට පුළුවන් උපරිමයෙන් සේල්ස් අප් කරනවා. හොඳ ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක්ව ලැබුනොත් එයත් එක්ක එකතුවෙලා වැඩකරනවා."

භාවනා සිතාගත්තේ එහෙමය. අද සම්මුඛ පරීක්ෂණයක් ඇත්තේ ඒ ප්‍රමෝෂන් මැනේජර්ව ගන්නටය.

*** *** *** *** ***

පුදුමයකට මෙන් දේවකද අද හතරේ සිට අවදියෙනි. පාන්දරම ඇහැරුණු නිසාදෝ දේවක ඉතිරිව් තිබූ රතු කැකුළු හාල් ටිකක් ගෙන පොඩි කිරිබතක් හදන්නට ගත්තේය. ඒ කොල්ලාගේ ප්‍රියතම කෑමය. කිරිබත් කන්නට ලුණු මිරිසයක් ඔහුට ඇතිය. පුංචි කාලයේ අප්පච්චිට කියා රෑටත් කිරිබත් ඉල්ලාගෙන කෑවා කියා යන්තම් මතකයක් දේවකට ඇත.

කිරිබත් හදන්නට ඕනා අද නොවේ. රස්සාව ලැබුණු පසුය. ඒත් අදම කිරිබත් හදන්නට හිතුන ඒකේ මොකක්ද විශේෂත්වයක් ඇතැයි කොල්ලාට සිතෙයි. දේවක කැකුළු

හාල් ටික ලිපේ තබා පිටි කළ පොල් කිරි හැදි දෙක තුනක් දමා පොල් කිරි හදාගත්තේය. අමාරුම වෙලාවක දේවකත් ජීවනුත් පාවිච්චි කරන්නේ පිටිකළ පොල් කිරිය. ඒය පහසුය.

"රස්සාව කරන්න ගත්තාම දවල් කෑම එක එක්කෝ හදාගන්න වෙනවා. නැත්නම් කඩෙන් තමයි කන්න වෙන්නේ. එන විදිහකට බලනවා."

ජීවිතයේ හැමදෙයක්ම එහෙම සැළසුම්කරන්න අමාරුය. එහෙම කරන්න ඕනත් නැතැයි දේවකට සිතෙයි. 'එන හැටියකට ගහ උළුවස්සා කියලනේ තියෙන්නේ. බලමුකෝ.' තාම මේ අප්පච්චිලාගේ පුතාලාගේ ජීවිතයේ එහෙමම පිළිවෙලක් නැත. එහෙම නැත්තේ

ගෑණු අතක් ගෑවෙන්නේ නැති නිසාය. දෙන්නා පුළු පුළුවන් විදිහට ජීවිතය හදාගෙන යති.

දේවල් විනාඩියෙන් දෙකෙන් ලුණු මිරිස හැදුවේය. එය මහ දෙයක් නොවේ. ලුණු මිරිසට දෙහි ගෙඩියක් වැඩි නැත. ලුණු මිරිසේ රස එන්නේ අලුත් දෙහි රේණු වලිනි. ඒ නිසා දෙහි රේණු පනින්නට දෙහි බෑය මිරිකිය යුතුය. හොඳ ලුණු මිරිසක් සමඟ ඕනානම් බත් කන්නත් පුළුවන. එහෙම කන්නනම් මුරුංගා කිරි හොද්දක් ඕනය. ඉස්සර එහෙම හදා අප්පච්චී තමාට බත් කැව්වා කොල්ලාට මතකය.

කිරිබතත් තවා කෑලිත් කපා දේවක කෝපි ටිකක් හදාගත්තේය. දැන්මම අප්පච්චීව ඇහැරවන්න

ඕනා නැත. දේවක අද ඉන්ටර්වීව් එකට ඇඳගෙන යන්නට ඉන්නේ සුදු පසුබිමේ සිහින් නිල් ඉරක් ගිය කමිසයය. එයට තද නිල් පැහැගත් ටයි පටියක් ලස්සනය. මේ දෙකම ගත්තේ ඊයේ ෆැෂන් කලෙක්ෂන් එකෙනි. මේ කමිසයම ඇය සීයාටත් ගත්බව දේවක සිහිකළේය. එහි සයිස් එක තෝරාදුන්නේ දේවකය. කෙල්ල දේවකව දැක්කේ ඒ වෙලාවේදීය.

සම්මුඛ පරීක්ෂණය ඇරඹෙන්නේ උදේ නමයටය. ඒත් අටහමාර වෙද්දි සීගිරි එකට යනවා කියා දේවක සිතාගත්තේය. වේලාසන යන තරමට හොඳය.

අද තමාගේ ජීවිතයේ දෛවෝපගත දවසක් කියා දේවකට

නිකමට සිතෙයි. හැම දවසක් ගැනම එහෙම හිතෙන්නේ නැත. මේ ජීවිතයේ හැරවුම් දවසකි. කොල්ලාව ඕනවටත් වඩා හෙල්ලී ඇත්තේ ඒ නිසාය. නිකමටවත් සීගිරි එකෙන් තමාව ගත්තේ නැත්නම් මේ සියල්ල වතුරේය.

"ඒත් ඔයා ඔයාගේ මුණුපුරාව ගන්නවා සීයේ. මට ඒක විශ්වාසයි."

දේවක සිතුවේය. ඔහු කෝපි උගුරක් බී පාන්දර පරිසරය දෙස බලාගෙනම උන්නේ එසේ සිතාගෙනය. පරිසරයේ ඇත්තේ යාන්තම් ඇළිරියකි.

*** *** *** *** ***

"නමයට ඉන්ටර්වීව් එක. ඔයයි

අක්කයි මිහිරංගයි මාත් එක්ක ඉන්න ඕන. මිහිරංගටත් කියන්න මැණිකෙ."

උදේ පාන්දරම රඹුක්වැල්ල මහතා කෙල්ලට කීවේය.

"මං කියන්නම් සීයා. තාත්තිවත් තියාගන්න බලමුකෝ."

භාවනා කීවාය.

"මං කිව්වා මැණිකෙ. උදේ තාත්තට හාබර් එකට යන්න වෙලා නැත්නම් ඉන්නවලු."

"ම්."

තාත්තා මේ දුක් විඳින්නේ කෙල්ලෝම තුන්දෙනෙක් ඉන්නා නිසාය. ගෑණු ළමයි එච්චරම බරකි. ඒ අතින් තාත්තා පව් කියා භාවනාට සිතෙයි.

දැන්මම ඇඳගන්නට වේලාසන වැඩිය. භාවනා නිකමට තාරකාගේ

කාමරයට ගියාය. පුදුමයකට මෙන් ඇය අද වේලාසනම ඇහැරීගෙන උන්නාය.

"උදෙන්ම කොල්ලා එක්ක චැට් කරනවා වගේ."

භාවනා කීවේ තාරකා කකුල් දෙකත් ඇඳ උඩටම ගෙන ඇගේ ලැප්ටොප් එක දිගහැරගෙන ඉන්නවා දැකය. ඇය අඳින කෙටි රෑ ඇඳුම අඳින්නේ නැතුවම උන්නානම් හොඳය. ඒත් ඇයට ඇති හැඩ ඇඟට අඳින්නත් ඕනා එහෙම යැයි භාවනාට සිතෙයි. 'ඉඩක් තියෙන වෙලාවක මාත් පොඩ්ඩක් එක්සසයිස් එකක් කරන්නෝන' භාවනා සිතුවාය.

"මොන චැට්ද බන් මුන් එක්ක. ඇති චැට් චැට් කමු කිට් කැට්."

තාරකා ලස්සනට කීවාය.

"එමිරේට්ස් එකේ ඉන්ටර්වීව් දාලා තියෙනවද කියලා බැලුවේ."

තාරකා කීවාය.

"ඇයි දැන් ශ්‍රී ලන්කන් එකටනේ යනවා කිව්වේ."

"හරි බන්. හදිස්සියේ එමිරේට්ස් සෙට් වුනොත්. මල් නේ."

"ම්."

"මොනවා උනත් මම ලබන මාසේ ඉඳලා උඩ"

භාවනා සිනාසුනාය. ඇයගේ ප්‍රාර්ථනාව හරියන්නම ඕනා කියා කෙල්ල පැතුවාය.

"දැන් ස්ටඩීස් වැඩ ඔක්කොම ඉවරයි."

"ම්. ඉවරයි බබා. ඉන්ග්‍රිලිෂ් කෝස් එකත් ඊයේ ඉවරවුණා."

ගුවන් සේවිකාවක් වන්නට ඇය

දුෂ්කර ගමනක නියැලුනාය.

"ඊයේ මොකද අර කට්ටිය වටවෙලා බබා."

භාවනා සිනාසුනාය. පසුව ඇය කෙටියෙන් සියල්ල කීවාය.

"දවසක සීයා උඹටයි උඹේ කොල්ලටයි සීගිරි එක දෙනවා. බයවෙන්න එපා."

තාරකා කීවාය. භාවනාගේ දෙනෙත් උඩ ගියාය.

"එහෙම දීලා හරියන්නේ නෑනේ. සීගිරි එක හැමෝගෙමනේ."

"එහෙම කියලා හැමෝටම දෙන්නත් බෑනේ. දෙයක් හරියන්නේ එක්කෙනෙක් කරනකොට. හවුලේ බෑ."

පොඩි අක්කාගේ කතාව ඇත්ත කියා භාවනාටත් සිතෙයි.

"මගේ එහෙම තණ්හාවක් නෑ සුදූ."

කෙල්ල කිව්වේ දුක්බරවය.

"එහෙම අතාරින්නත් එපා. මේගොල්ලෝ ලස්සනට ඇවිත් අයිතිකරගනී. උඹට ලැබෙනවටයි මමනම් ආස."

භාවනා සිනාසුනාය.

"සැටඩේ මොකද කරන්නේ."

භාවනා ඇසුවාය.

"නතිං."

"මාත් එක්ක ෂොපින් යන්. මට ඔයාට කියලා ඇඳුම් ටිකක් තෝරගන්න ඕන."

තාරකාට තරම් ඒවා ලස්සනට තෝරන්නට වෙන කාටවත් බැරිය. ඇය තෝරන්නේ ලස්සන ඇඳුම්ය.

"අනේයන් බබා. මම ලස්සන කිට්

ටිකක් තෝරලා දෙන්නම්."

තාරකා කීවාය.

"මේ."

"ඇයි බබා?"

"අක්කා එක්කත් ටිකක් කතාකරන්න. පව්."

භාවනා කීවේ රහසින් මෙනි. තාරකා හිස වැනුවාය.

"පව් තමයි. මට මේ ළඟදී කොහෙදිද හදිස්සියේ උඹවයි අක්කවයි මතක්වුණා. ඇඬුණාත් එක්ක සුදූ."

තාරකා කීවේ දුක්බරවය. භාවනා ඇයගේ දෙපා පිරිමැද්දාය. ඒවා වෙල්වට් මෙන් සිනිඳුය. එහෙම වෙන්නේ අනවශ්‍ය රෝම සියල්ල ඉවත්කර බොඩි පොලිෂින් එකක් කර ඇති නිසාය. 'මං පොලිෂ් කරන්නේ

කාට පෙන්නන්නද?' කෙල්ලට සිතෙන්නේ එහෙමය. පෙන්නන දවසට එහෙම පොලිෂ් කරගන්නවා කියා ඇය සිතුවාය.

"එහෙනම් සැටඩේ හරි හොඳේ."

"ම්."

"මාත් එක්ක ෂොපින් ගිහින් ලන්ච් එකත් ගමු."

"වාව්. මම මරු තැනකට එක්කගෙන යන්නම් ලන්ච් එකට."

භාවනා නැගිට්ටේ තාරකාව උම්මා එකක්ද දීය.

"කිස් කරලා සුදූ මෙහෙම මූණට අත තියලා චුට්ටක් බලාගෙන ඉඳලා ලව් යූ කියන්නෝන."

තාරකා ඒක ලස්සනට කියලා දුන්නාය. භාවනා හිස වැනුවාය.

"එතකොට."

"එතකොට එයා ලව් යූ ටූ බබා කියලා රිප්ලයි කිස් එක දෙනවා."

භාවනා ඇගේ කාමරයට ගියේ සිනාබරවය. ඒ සිනහව සෑහෙන වෙලාවකට ගියේ නැත. 'මම කවදද එහෙම කිස් එකක් දෙන්නේ. මට කවදද එහෙම රිප්ලයි කිස් එකක් ලැබෙන්නේ.' කෙල්ල හිතන්නේ එහෙමය.

භාවනා මිහිරංගගේ ජංගම දුරකථනයට ගත්තේ සීයා කියූ පණිවිඩය කියන්නටය. නැත්නම් මේ ලස්සන පාන්දර ඇය මිහිරංගට ගන්නේ නැත. සහෝදරයෙක් ලෙස භාවනා මිහිරංගට මේ ළඟක් වෙනතුරු ඇත්තටම ළෙන්ගතුව උන්නාය. එහෙත් දැන් දැන් මිහිරංග යන්නේ එහෙම පිරිසිදු පාරක

නොවේ. භාවනා එහෙම අපිරිසිදු චරිතවලට කැමති නැත.

ඒත් කරන්න දෙයක් නැත. මිහිරංග පමණක් නොව කෝසළද ඇයට එකය. පිරිමි සහෝදරයන්ව තරහා කරගන්න ඕනා නැත.

"ගුඩ් මෝනිං බබා. කෙල්ලට උදේම මාව මතක්වෙලා තියෙන්නේ."

එක රින්ග් එකක් යන්නටත් පෙර මිහිරංග ෆෝන් එකට ආන්සර් කළේය. 'ඒක බෙල්ලේ එල්ලගෙන ඉන්නවා ඇති' ඇයට සිතුණි.

"ගුඩ් මෝනිං මිහිරංග අයියේ."

භාවනා කීවාය.

"ඉතින් ඉතින් බබා. මේ දැන් ටිකකට කලින් මට ඔයාව මතක්වුණා."

ඒ ඇයි කියා අසන්නට භාවනා

ගියේ නැත.

"මේ සීයා පණිවිඩයක් කිව්වා මිහිරංග අයියේ. ඒක කියන්නත් එක්ක ගත්තේ."

"මොකක්ද?"

"උදේ අර ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක්ව ගන්න ඉන්ටර්වීව් එක. ඔයත් ඉන්නෝන කිව්වා. අනිවාර්යයෙන්ම."

"මං ඕන නෑනේ බබා නේ. ඔය ප්‍රමෝෂන් මැනේජර්ස්ලා අරන් සීගිරි එක හදන්න බෑ බබා. මං කියන දේ සීයා පිළිගන්නේ නෑනේ."

භාවනා මේ පාන්දර තර්ක කරගෙන ගියේ නැත.

"ඉන්න වෙයි මිහිරංග අයියේ. මම දන්නේ නෑ."

"ඕකේ ඕකේ. මං එන්නම්. ස්ටුපිඩ්

වැඩනේ. හවස මොනවද බබා කරන්නේ."

මිහිරංග කතාවට ආවේය.

"හවස ගෙදර අයියේ. මහන්සිනේ."

"යන්කෝ රවුමක්."

"අනේ බෑමේ දවස්වල එච්චර හිතක් නෑ."

"ඇයි ඒ?"

"මන්දා. මං තියන්නම් හොඳේ. නයින් වලට ඉන්ටර්වීව් එක. බායි."

කෙල්ල හරි ඉක්මනින් ෆෝන් එක තැබුවාය. ඕනවට වඩා කතා ඕනම නැත.

# 23

දේවක සුදු කමිසයට තද නිල් පැහැගත් ටයි පටියද පැළඳ යන්තමට මෙන් ජෙල් ටිකක් ගාගෙන කොණ්ඩයද සකසාගෙන ආවේය. ජීවන් කොල්ලා දෙස මඳ වෙලාවක් බලාගෙනම උන්නේය. කොල්ලාගේ මේ ලස්සන දැක්කේ කාලයකට පසුය. තමාට ඉන්නේ කොතරම් ලස්සන අහිංසක පුතෙක්ද කියා ජීවන්ට සිතෙයි. මේ නර්මදාමය.

"ඇයි අප්පච්චි?"

ජීවන් බලාගෙනම සිටිද්දී දේවක ඇසුවේ ලැජ්ජාවෙන් මෙන්ය.

"නෑ මම මේ හිතුවේ පුංචි මහත්තයෝ."

"ඔව් අප්පච්චි."

"සීගිරි එකට එක්කෝ යන්නේ නැතුව ඔයාව රඟපාන්න යැව්වොත් හොඳයිනේ කියලා."

දේවක ලැජ්ජාවෙන් මෙන් සිනාසුණේය.

"අද නළුවන්ගේ ලොකු අඩුවක් තියෙනවනේ."

ජීවන් කීවේය.

"අප්පච්චි මට පල් එක දාන්නේ."

ඔහු සිනාසුණේය.

"පල් කළා නෙමේ අද ලස්සනයි.

මේ කමිසෙයි ටයි එකයිත් ලස්සනයි.”

දේවක සිනාසුනේය.

“රස්සාව ලැබුණාම අපි තව ඇඳුම් ටිකක් ගමුකෝ.”

දේවක හිස වැනුවේය.

“මම කිරිබත් ටිකක් හැදුවා අප්පච්චි කාලම යන්.”

“ම්. මට ටිකක් නින්ද ගියා.”

“මට නින්ද ගියේම නෑ අප්පච්චි.”

“මේකට එච්චර බයවෙන්න එපා.”

ජීවන් ආදරෙන් කිවේය.

“එහෙම බයක් නෙමේ අප්පච්චි. මන්දා.”

කිරිබත් බෙදුවේ දේවකය. අප්පච්චිත් පුතාත් කිරිබත් කෑවේ හිටගෙනමය.

“ලුණු මිරිස රහට ඇවිත්

තියෙන්නේ."

"නියමයි නේද අප්පච්චි."

"ම්. එහෙම තමයි හදන්නෝන. ලුණු කෑලි හැපෙන්න."

ජීවිතයේ මේ පුංචි පුංචි දේවල් අහුවෙන කෙනාට ජීවිතයේ සාර්ථකත්වයත් ලේසියෙන්ම අසුවෙන බව ජීවන් දනී. සාර්ථකත්වයේ රහස ඒකය. ජීවන් එය කොල්ලාට පොඩි කාලයේදීම කියා දුන්නේය. මේ පත්තුවී ඇත්තේ ඒ පොඩි වැඩය.

කොල්ලා කිරිබත් කා සාලයට ආවේය. ජීවන් ආවේ වෑන් රියේ යතුරද අරගෙනය.

"අප්පච්චි."

දේවක ගියේ කටු සිමෙන්ති පොළොවේ දණගසා අප්පච්චිට වඳින්නටය. ඒත් ජීවන් කොල්ලාව

නැඟිට්ටෙව්වේය.

"මී. දළඳා සමිඳු පිහිටයි. හොඳින් ඉන්ටර්වීව් එකට ෆේස් කරන්න. අම්මටත් වඳින්න පුංචි මහත්තයෝ."

දේවක ඒක කළේ හරි ආසාවෙනි. නර්මදාගේ පින්තූරය ගඩොල් බිත්තියේ මැදම ගසා ඇත. කොල්ලා අම්මාගේ මුහුණම අතගා වැන්ඳේය. ජීවන්ගේ දෙනෙත් යන්තමට තෙත්විය.

"මී. යන්."

ජීවන් වාහනය ගත්තේය. දේවක පැමිණ වෑන් රියේ ඉදිරිපස අසුනට බරවිය. අප්පච්චි රියදුරු අසුනේ සිටියදී හරි ලස්සනයි කියා දේවකට සිතුණි.

"අප්පච්චිටම කියලා එයාලා වාහනයක් දැන් දෙන්න එපැයි."

ජීවන් සිනාසුනේය.

"මං පුංචි මහත්තයෝ වාහන ඉල්ලන්න යන්නේ නෑ. එයාලා දන්න හැදුවා. ඒත් මම ගත්තේනෑ. දවසක මට ලෝන් එකක් ගන්න වෙනවා. පොඩි ගේ කෑල්ලක් අපිට හදන්න. ඒ නිසා වෙන දේවල් ඉල්ලන්න යන්නේ නෑ."

දේවක හිස වැනුවේය.

"තිබ්බනම් මරු නේද අප්පච්චි."

ජීවන් හිස වැනුවේය.

"මෙහෙම යන්කෝ. අපිට බැරිවෙන එකක් නෑ."

ජීවිතය හිතන තරම්ම පහසු නැත. ඒත් කොල්ලා වෙනුවෙන් දෙයක් කර තැබිය යුතුමය. දහයක් පහළොවක් නැත. ඉන්නේ මේකා පමණි. ජීවන් යන මඟ වූ 'ධාතුමළු

විහාරය' අසළ වාහනය ටිකක් නතරකළේය.

"යන් පුංචි මහත්තයෝ. බැහැලා පඬුරක් දාලාම යන්."

දේවකද බැස්සේය. සීගිරි එකට යන මේ ගමන කොතරම් වැදගත් ගමනක්ද කියා දේවක අද තේරුම් ගත්තේය.

"බයවෙන්න එපා. සීයා ඔයාව අද ගන්නවා."

ජීවන් කීවේය. එහෙම වෙයි කියා විශ්වාසයි දේවකගේද හිතේ ඇත.

සීගිරි එක ළඟට එන්නට මහ වෙලාවක් ගියේ නැත. ජීවන් නිදහස් තැනක වාහනය නවත්වාගත්තේය.

"පුංචි මහත්තයෝ."

"අප්පච්චි."

"නිකමටවත් මගේ නම කියන්න

එපා. අප්පච්චි මොනවද කරන්නේ කියලා ඇහුවොත් කියන්න ප්‍රයිවට් ෆර්ම් එකක වර්ක් කරනවා කියලා. හොඳද?"

"හොඳයි අප්පච්චි."

"අම්මා මොකද කරන්නේ කියලා අහයි."

"එතකොට."

"අම්මා මීට අවුරුදු විස්සකට කලින් නැතිවුණා කියන්න එපා මේ ළඟකදී නැතිවුණා කියන්න. එයාලට නිකමට හරි සැකයක් එන්න පුළුවන්. ඔයාට තියෙන්නේ අම්මගේම මූණ නිසා."

ජීවන් කීවේය. දේවක හිස වැනුවේය.

"අපි නුවර කියන්න එපා. කුරුණෑගල කියන්න."

දේවක සියල්ලටම හිස වැනුවේය.

"මී. තුණුරුවන් සරණින් යන්න. ඉවරවෙලා මට කෝල් කරන්නකෝ."

"හොඳයි අප්පච්චි"

කොල්ලා බැස්සේ ගියරය මත තිබූ ජීවන්ගේ අත මත ටික වෙලාවක් අත තබාගෙන ඉඳය. දෙමව්පියන්ගේ ශරීරවලින් දරුවන්ගේ ජීවිතවලට එහෙම ආශිර්වාද තරංගයක් එන බව දේවක විශ්වාස කළේය. ඔහු අත ටික වෙලාවක් අප්පච්චිගේ අත මත තබාගෙන උන්නේ එය ගන්නටය. එය ඇගේ ලේවලට එනවා ඔහුට දැනුණි.

දේවක යන දෙස ජීවන් ටික වෙලාවක් බලාගෙන උන්නේය.

"කොල්ලා ගියා සුදු නෝනා. දැන් ඔයාගේ වාරේ. බලන්න ටිකක්."

ජීවන් කීවේ ඔහුගේ මියගිය

බිරිඳටය. මේ මොහොතේ ඇය කොල්ලා සමඟ බව ජීවන් දනී.

දේවක සීගිරි එකේ විශාල කා පාක් එක මැදින් ඇවිදගෙන ගියේය. තවම සුපර් මාර්කට් එක විවෘතකර නැත. එහි කාර්යාල පරිශ්‍රය ඇත්තේ සුපර් මාර්කට් එක කොණකය. කොල්ලා එහි වීදුරු දොරට අතක් තැබුවේය. සීගිරි එකට ආ පළමු දවසේ ඇතිවූ අමුත්ත අදද දේවකට දැනුණි. ඔහු වටපිට බැලුවේය. නැත. කිසිවෙක් නැත.

"ඔයා මං ළඟ නේද සුදු අම්මේ?"

කොල්ලා රහසින් මෙන් මිමිණුවේය. 'ඔයා මං ළඟ ඉන්නවා අම්මේ. මට ඒක දැනෙනවා.' දේවක හදවතින්ම සිතුවේය. සීගිරි සුපර් මාකට් එකේ දල්වා

තිබුනේ විදුලි පහන් කිහිපයක් පමණි. සේවකයන් දෙතුන් දෙනෙක් රාක්ක අතර රැඳී උන්නෝය. දැන් වේලාව අටහමාරය. සුපර් මාර්කට් එක නමයට විවෘත කරනවානම් මේ මොහොත වෙද්දී ලොකු කලබලයක් ඇතුලේ තිබිය යුතුය. ඒත් එහෙම කලබලයක් නැත. නගරයේ ඇති අනෙකුත් තරඟකාරී සුපර් මාර්කට්වල සේවකයන් මේ වෙද්දී කැෂියර් පොයින්ට්ස්වලටත් පැමිණ ඇත. සීගිරි එක පුරාම ඇත්තේ මොකක්ද සීතල මලානික බවකි.

"සීගිරි එක එයාලගේ දවසේ පළවෙනි කස්ටමර්ව පිළිගන්න තාම ලෑස්ති නෑ. එහෙම වෙන්න බෑ."

මේ මොහොතේදීත් සීගිරි එක

ඇතුළෙන් එන්නේ මොකක්ද මුඬු ගඳකි. එහෙම වෙන්නේ විෂබීජ නාශක යොදා සුපර් මාර්කට් එකේ බිම පිරිසිදු කර නැති නිසාය. මස් මාළු ඇති ෆ්‍රීසර් සුද්ද කර නැති නිසාය. එළවළු තබා ඇති කූලින් කැබිනට් පිරිසිදු කර නැති නිසාය. දේවක සියල්ලම සිතේ සටහන්කරගත්තේය. පළවෙනි ගනුදෙණුකරවා සීගිරි එකට එන්නට තව ඇත්තේ පැය කාලයක් බාගයක් පමණි.

කාර්යාලය ඇත්තේ සීගිරි එකේ කැෂියර් කවුන්ටර්වලට වම් පසිනි. එතන ඇති වීදුරු දොරෙන් ඇතුල් වූ විගසම ඇත්තේ රඹුක්වැල්ල මහතාගේ කාමරයය. 'ඉන්ටර්වීව් එක ගැන අහන්නවත් කවුරුවත් පේන්න නෑනේ' දේවක ඒ පැත්ත

මේ පැත්ත බැලුවේය. කොල්ලා අද ආවේ තරමක් ලොකු කළු ෆයිල් කවරයත් අරගෙනය. එහි ඇත්තේ ඔහුගේ අලෙවිකරන සහතිකපත් හා කළ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්වල වාර්තාය. මොනවා පේනවා හෝ රස්සාව ගත යුතුය.

"මේ අද ඉන්ටර්වීව් එකක් තියෙනවා. කොහේටද මම යන්න ඕන."

දේවක ඇසුවේ හදිස්සියේ ආ ආරක්ෂක නිළධාරියාගෙනි.

"ආ අද ඉන්ටර්වීව් එකක්ද?"

"ඔව් ඉංග්‍රීසි පත්තරේ දාලා තියෙනවා. අද තියෙන්නේ."

"සර් ටිකක් ඉන්න. තාම භාවනා මිස්වත් ඇවිත් නෑ. දැන් එයි."

දේවක හිස වැනුවේය. භාවනා

මිස් කියන්නේ කාටද කියා දේවක සිතුවේය. 'එයාටද' දන්නේ නැත. සීගිරි එකේ විදුලි පහන් දැල්වූයේ දැන්ය. සම්මුඛ පරීක්ෂණයට තවත් දෙතුන් දෙනෙක් ආවෝය. දේවක ඔවුන් දෙස බැලුවේ පරිස්සමිනි. 'සෑහෙන ලොකු කට්ටිය වගේ ඇවිත් තියෙන්නේ. සමහරවිට සුපර් මාර්කට් දෙක තුනක එක්ස්පීරියන්ස් ඇති' ඒත් දේවකට බියක් දැනුනේ නැත. සම්මුඛ පරීක්ෂණයට මේ වෙද්දී දේවකත් සමඟ දොළොස් දෙනෙක් පැමිණ තිබුණි. ඒ අතරින් ලාබාළම දේවකය. දේවක පරිස්සමින් වෙජිටබල් කූලින් කැබිනෙට්ටු දෙස බලාගෙන උන්නේය. තවම ඒවා කිසිවක් මාරුකරන්නේ නැත. 'උදේකට අලුත් වෙජිටබල් ටිකක් දාන්න ඕනනේ. ඊයේ තිබුණ

වෙජිටබල් ටික එහෙමම සේල් කරන්න බෑනේ.' ඔහු මේ සියල්ල බලාගෙනය. 'රැක්ස්වල බඩු ගොඩක් අපිළිවෙලයි. කවුරුවත් ඒවා හදන්නේ නෑ. අලුත් ස්ටොක්ස් රැ ක්ස්වලට දැමිල්ලකුත් නෑ. සීගිරි එකට මෙහෙම වෙන එක අහන්න දෙයක් නෙමෙයි. කස්ටම කෙනෙක් හැමවෙලාවේම කැමති ඊයේ දැක්කට වඩා වෙනස් සුපර් මාර්කට් එකක් අද දකින්න මොකක්හරි වෙනසක් කරලා තියෙන්න ඕන. මිනිස්සු එකම එක්ස්පීරියන්ස් එක විඳින්න සාමාන්‍යයෙන් කැමති නෑ. එතකොට හරි ඒකාකාරීයි' කොල්ලා සිතුවේය.

කාර්යාල සහයකයෙක් පැමිණ සම්මුඛ පරීක්ෂණයට ආ අයට ප්ලාස්ටික් පුටු කිහිපයක් ගෙනවිත් තැබුවේය.

"ඔෆිස් එක තවම ඇරලා නෑ. සර්ලා ඉඳගෙන ඉන්න."

බොහෝ දෙනා ඉඳගත්තත් දේවක ඉඳගත්තේ නැත. ඔහු පැත්තකට වී සියල්ල දෙස බලාගෙනම උන්නේය. කැෂියර් යුවතියන් පැමිණ කැෂියර් මැෂින් අසළ අස්කරන්නට ගත්තෝය. ඔවුන් තමා දෙසත් බලනවා දේවක බලාගෙනය.

කැෂියර් මැෂින් අසළ වූ දුරකථනය නාදවිය. එය ගත්තේ අනූජාය.

"ගුඩ් මෝනිං මිස්."

කතාකළේ භාවනාය. දේවක ඇමතුමට කන්දීගෙන උන්නේය. 'එදා මේ ගර්ල්ස්ලා මිස් කියලා කතාකළේ එයාට තමා. සමහරවිට මේ කතාකරන්නේ එයා වෙන්න ඇති'

දේවක සිතුවේය. අද ඇය සීගිරි එකට එන්නේ නැද්ද??

"ඉන්ටර්වීව් එකට ගොඩක් ඇවිත්ද අනූ."

අනූජා සම්මුඛ පරීක්ෂණයට ආ අය දෙස බැලුවාය. ඇගේ දෙනෙත් අවසානයට නතරවූයේ දේවකගේ මුහුණ මතය. දේවක යන්තමට සිනාසුනේය.

"ඔව් මිස්. දාසයක් දාහතක් විතර."

අනූජා කීවාය.

"හරි බබා. මම දැන් එනවා."

භාවනා කීවාය. සම්මුඛ පරීක්ෂණයට මුළින්ම ආවේ දේවකය. එය කාර්යාල කාර්ය සහායක සටහන් කරගෙන තිබුණි. සීගිරි සුපර් මාර්ට් විවෘත කරන්නට තිබුනේ

මිනිත්තු කිහිපයක් පමණි. එය විවෘත කරන්නේ භාවනා පැමිණ පාස් වර්ඩ් දී කැෂියර් මැෂින් ඕන් කළ පසුය. ඉන් පසු දවසේ ෆ්ලෝට් එක කැෂියර්ලාට දිය යුතුය. ෆ්ලෝට් එක යනු දිනපතා කැෂියර්වලට ලබාදෙන මුදලය. සාමාන්‍යයෙන් එය රුපියල් දස දහසකි. එය ලබාදෙන්නේ මාරු සල්ලි වලිනි. 'සැම දේ සපිරි නාමය සුපිරි.' දේවක සීගිරි එකට එද්දීම ගසා ඇති එහා තේමා පාඨය යළිත් කියවූයේය. මේ වචන නර්මදාගෙ ය. අදින් වසර විසි පහකට පමණ පෙර සීගිරි එක අරඹද්දී මේ තේමා පාඨය හැදුවේ ඇයය. 'ඔයාට පුදුම හිතක් තියෙන්න ඇත්තේ අම්මේ. ඒත් අම්මේ ඔයා ප්‍රාර්ථනා කරපු සීගිරි එක අද නෑ. අද සීගිරි එකට මොකක්ද වෙලා. සීගිරි එකේ

හැමදේම නෑ. ඒකේ නාමය සුපිරිත් නෑ. ඔයාගේ තාත්තා. ඒ කියන්නේ මගේ සීයා මට එක අවස්ථාවක් දුන්නොත් අම්මේ මම ඔයාගේ තේමාව එහෙමම ආයෙත් හදනවා.' දේවක සිතින් කීවේය.

දේවක සීගිරි හී දොරකඩ අසළට ගියේ නිකමටය. භාවනා කාරයෙන් බැස ආවේ ඒත් සමඟය. චොකලට් පැහැගත් බෝඩරයක් ගිය බටර් පැහැගත් සාරිය ඇඳගෙන ආ යුවතියව එකවර හඳුනාගන්නට දේවකට ටික වෙලාවක් ගියේය. 'එයා තමයි. අනේ දෙයියනේ තියෙන ලස්සන.' දේවක සිතුවේය. යුවතිය තවම ඇගේ අඩුම කුඩුම වාහනයෙන් ගනී. 'ඔයා සීගිරි එකේ ස්ටාෆ් එකේ කෙනෙක් වෙන්න බෑ. එහෙම කෙනෙක් මෙහෙම කා එකකින්

එන්නේ නෑ. ඔයා මේ සීගිරි පවුලේ කෙනෙක් මිස්' දේවක සිතින් කීවේය. කෙල්ල ඇගේ සුදු අත් බෑගය කරට දමාගෙන තවත් බෑගයක් අතින් ගෙන වාහනය දොර ඇගේ බඳෙන් වැසුවේය. ඒ වැඩේ හරි හුරතල් යැයි කොල්ලට සිතුණි.

භාවනා සීගිරි එකට එන්නට ආවේ ඉනුත් පසුය. ඇය සීගිරි එක දෙස බැලුවේ තොල්පට යන්තමට මුව තුළට ගෙන මෘදුව තවරාගත් තොල් ආලේපනය සමබර කරමිනි. සීගිරි එක ඇතුලේ ඉන්නා අයව හරිහැටි පේන්නේ නැත.

භාවනා එද්දීම ආරක්ෂක නිළධාරියා සීගිරි හී වීදුරු දොර විවර කළේය. දේවක උන්නේ ඒ අසළ වම් පසය. භාවනා දෙනෙක්

එසවූයේ නිකමටය.

දෙදෙනාගේ දෑස් ගැටුනේ නොසිතූ වෙලාවකය. දෙපාන්තයේ සිට ආ ගින්දරක් පපුව දක්වාම එනවා දේවකට දැනුණි. එයම එලෙසම භාවනාටද දැනුණි. 'අනේ එයා. ඇයි මේ අද මෙහෙම.' භාවනා සිතින් ඇසුවාය. කොල්ලා ආවේ සම්මුඛ පරීක්ෂණයට බව ඇය තවම දන්නේ නැත.

මුළින්ම තුනී සිනාවක් මුව මත රඳවාගත්තේ දේවකය. භාවනා ලොකු හුස්මක් පපුවට ගත්තාය. 'කවුද දන්නේ අද මෙ උදේ පාන්දරම ඔයාව දකින්න ලැබෙයි කියලා' ඇය සිතුවාය. හදවත විසින් දකින්නට බලාපොරොත්තුවෙන් උන් රුවක් නොසිතූ මොහොතක දකින්නට

ලැබෙද්දී හදවතට දැනෙන හැඟීම කුමක්ද??

"ගුඩ් මෝනිං මිස්."

දේවක කීවේ උණුසුම් ලෙසය. යුවතිය සිනාසුනේ එවිටය. 'අද ඇඳගෙන ඇවිත් තියෙන්නේ එදා ෆැෂන් කලෙක්ෂන් එකෙන් ගත්ත ෂර්ට් එක. ඒකට ලස්සන ටයි එකක් ඇඳලා. හරි ලස්සනයි. හරිම අහිංසක ස්මාට් ලස්සනක් තියෙන්නේ.' ඇය තත්පරයක් තුළ සිතුවාය.

"ගුඩ් මෝනිං. ඇයි බඩු ගන්න ගියේ නැද්ද තාම."

ඇය ඇසුවාය. කෙල්ල සිතුවේ ඔහු සීගිරි එක විවෘත කරන තුරු මෙතන ඉන්නවා ඇතැයි කියාය.

"මම මේ මිස්."

දේවකට කියවෙන්නේද නැත. 'හරි වැඩක්නේ. කෝ වචන'

"ඇයි කියන්න."

"නෑ මිස්. මේ මම අද ආවේ බඩු ගන්න නෙමේ."

කෙල්ලගේ පපුව ගැහෙන්නට ගත්තේ එවිටය.

"නැත්නම්."

දේවක සැහැල්ලුවෙන් සිනාසුනේය. 'කෙල්ලෝ ටිකත් බලාගෙන ඉන්නවා මෙතන ටෙලි නාට්‍යයක ෂූටින් යනවා වගේ මුන්ට පිස්සුනේ'

"මම අද ආවේ මිස් මේ සීගිරි එකේ තියෙන ඉන්ටර්වීව් එකට. මම මිස්ට ඊයේ කිව්වේ."

භාවනාට අදහාගන්නට නොහැක. 'ඉන්ටර්වීව් එකක් කිව්වට සීගිරි

එකේ කියලා කිව්වේ නෑනේ දෙයියනේ. මේක හරි පුදුමයිනේ'

"මේ සේල්ස් ප්‍රමෝෂන් මැනේජර් පෝස්ට් එකට."

භාවනා ඇසුවාය.

"ඔව් මිස්. සන්ඩේ ටයිම්ස් එකේ ඇඩ්වටයිස් කරලා තිබුනේ. ඒකට ආවේ."

මේ පොඩි කොල්ලා සේල්ස් ප්‍රමෝෂන් මැනේජර් වෙන්නේ කොහොමද කියා ඇය සිතුවාය. ඒත් කෙල්ලගේ හිතට මේ සියල්ල පරයා මොකක්ද දැනෙයි. එය කුමක්ද කියා තේරෙන්නේ නැත. ඇත්තටම තේරෙන්නේ නැත.

"ආ ඇත්තඳ ටිකක් ඉන්න. නයින් තර්ටි පටන් ගන්නවා."

"හරි මිස්."

"මේ. විෂ් යූ ඕල් ද බෙස්ට්. මම ඇතුළට යන්නම්."

"තැන්කියු මිස්."

යුවතිය එහෙමම ඇතුළට ගියේ කැෂියර් කෙල්ලෝ දෙසවත් බලන්නේ නැතුවය. වෙනදාට ඇය එහෙම නොවේ. එන්නේ කැෂියර් කෙල්ලෝ ටිකට සිරික්කිය දාගෙනය. ඇඳගෙන ඉන්නා සාරියේ ලස්සන මුලින්ම ඇය අසාගන්නේ කෙල්ලෝ ටිකගෙනි. ඒත් අද ඇයට කෙල්ලෝ ටිකට ගුඩ් මෝනිං කියන්නටවත් මතක් වූයේ නැත.

"ඇයි අනූ මිස් එහෙම"

කැෂියර් කෙල්ලෙක් ඇසුවේ අනූජාගෙනි. ඇය ඉඟි බසින් කීවේ දන්නේ නැතැයි කියාය.

"මිස් අපිත් එක්ක තරහවෙලා

වගේනේ. ගුඩ් මෝනිං කියලාවත් කිව්වේ නෑනේ.”

කෙල්ලෝ ටික බැලුවේ දේවක දෙසය. හරියට මේ සියල්ල කළේ ඔහු කියා ඔවුන් සිතන්නාක් මෙන්ය. කොහොමත් ලස්සනට සිනාවීගෙන ආ කෙල්ල එකවර ගැස්සී ගියේ ඔහුව දුටුව පසුය.

දේවක කාටත් නොපෙනෙන්නට ඔහුගේ පපුව ටිකක් ඇත්තටම අතගාගත්තේය. රිදෙන්නේම වම් පැත්තය. ‘ඇයි මේ කියලා තේරෙන්නේ නෑනේ. මගේ අම්මේ පපුව.’ දේවක පපුවෙන් ගත් හුස්මක් පිටතට පිම්බේය. නැත්නම් පපුව ගිනිගනී කියා කොල්ලාට සිතුණි. ‘ඔයා මලක් නෙමේ මල් වත්තක්නේ මිස්.’ ඔහුට හිතෙන්නේ එහෙමය.

සීගිරි හී සිට වේගයෙන් කාර්යාල කාමරයට ආ භාවනා නැවතුනේ ඇගේ මේසයේය. ඇගේ දෙපා තවමත් වෙව්ලන්නාක් මෙන්ය. මේක විශ්වාස කරන්නට අමාරු දෙයකි. ඔහුව දුටු දවසේ සිට ඔහු ගැන සිතුව තරම් දන්නේ මේ පපුවය. එහෙම කෙනෙක් ගැන බරට හිතූ බවක් මේ පපුවේ කළින් සඳහනක් නැති.

"කවුද දෙයියනේ දන්නේ මේ පිස්සා සීගිරි එකට ඉන්ටර්වීව් එයි කියලා. මෙහෙටම. ඇයි ඒ?"

භාවනා සිතුවාය.

"එදා එයා පළවෙනි දවසේ සීගිරි එකට ආවේ මේ ඉන්ටර්වීව් එකට එන්න හිතාගෙනමද? එහෙම ඔයා ආවේ සීගිරි එකේ තත්වේ බලාගෙන

යන්නද?"

භාවනා සිතුවාය.

"එහෙම නැත්නම් ඔයා සීගිරි එකට එනවා කියලා හිතුවේ කොහොමද?"

ඔහු ඊයේ ෆැෂන් කලෙක්ෂන් එකේදී හමුවූ වෙලාවේ හෙට ඉන්ටර්වීව් එකක් කියා කියූ බව භාවනාට මතකය.

"අපි ගන්නේ ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක්ව. ඒක ටිකක් ලොකු පෝස්ට් එකක්නේ ඔයාට එච්චර වයසකුත් නෑ. වැඩිම වුනොත් විසි හතරක් විසි පහක් ඇති එහෙම ලාබාළ කෙනෙක් කොහොමද අරම පෝස්ට් එකක් කරන්නේ."

සම්මුඛ පරීක්ෂණය කරනා බෝඩ් එකේ තමාත් ඉන්නා බව භාවනා දනී.

"ඒත් අද ඔයාගේ මූණේ තියෙන්නේ හරි විශ්වාසයක්. ඊයේ අලුතින් ගත්ත ෂර්ට් එකත් ඇඳගෙන ඇවිත් ඉන්නේ මම සීයට ගෙනත් දුන්නෙත් ඒ ෂර්ට් එකමයි. එහෙම අලුත් කමිසෙකුත් ඇඳන් ආවේ."

භාවනා තවමත් ඉන්නේ මේසයට බරවූ ගමන්ය. ඇගේ අත් බෑගය තවමත් කරේය. කෙල්ලට ටිකක් කලන්තෙත් වාගේය.

"ගුඩ් මෝනිං මිස්."

අනූජා ආවේ කැෂියර් මැෂින් ඔන් කරන්නට පාස් වර්ඩ් ගන්නම නොවේ. ගුඩ් මෝනිං කියන්නේවත් නැතුව මිස් ගියේ ඇයිදැයි බලන්නටය. කෙල්ල පියවි සිහියට ආවේ අනූජාගේ හඬිනි.

"ආ ගුඩ් මෝනිං අනූ."

කෙල්ල කිව්වේ කලබලයෙනි.

අනූජාට පුදුමය.

"ඇයි මිස්."

භාවනාගේ මුහුණේ වූ නොසන්සුන් බව දැක ඇය ඇසුවාය.

"ඇයි අනූ. මුකුත් නෑ."

භාවනා කීවේ දෙනෙත් සඟවාගෙනය. වෙනදාට කෙල්ලගේ මුහුණේ මැවෙන සිනහව අද නැත.

"නෑ මිස් අසනීපෙන් වගෙත්."

'ඇත්තටම මට සනීප නෑ වගේ තමා. උදේ පාන්දරම මේ පිස්සෙක්ව දැක්කනේ සීගිරි එකේ දොරකඩදීම.' භාවනා සිතුවාය.

"එහෙම නෑ අනූ."

"මිස් පාස්වර්ඩ්."

එයත් අමතක වූ බව දන්නේ දැන්ය.

"යන්. සොරි මට අමතක වුණා."

කෙල්ල එන්නට ආවේ ඇගේ අත් බෑගයත් කරේ දාගෙනමය. අනූජා එය දැක්කාය.

"මිස්."

"ඇයි ළමයෝ. මිස් මිස් ගාන්නේ."

"නෑ මේ බෑග් එක."

අනූජා භාවනාගේ කරේ තවමත් එල්ලෙන අත් බෑගය පෙන්වූයේ බියෙනි. භාවනාට ලැජ්ජා සිතුණි. 'මොනවා වෙලාද මට අද' ඇය තමාටම බැණගත්තාය.

"යන් අනේ."

භාවනා කීවේ අත් බෑගය කරෙන් ගෙන මේසය මතට දමාය. කෙල්ල සීගිරි එකට ආවේ නෙත් කරකවමිනි. දේවක උන්නේ සීගිරි එකේ පැත්තකට වීය. සම්මුඛ

පරීක්ෂණයට විසිදෙනෙක් පමණ පැමිණ උන්නෝය. ඒ අතරින් ලාබාළම කොල්ලා වූයේ දේවකය. භාවනා ආවේ ඔහු දෙස යන්තමට බලාගෙනය. දේවක ගෞරවාන්විතව සිනාසුණේය. කෙල්ලට හිතුණේ තමාගේ පය පැටලී දැන් දැන් සීගිරි එකේ බිම හතරගාතෙන් වැටෙයි කියාය.

# 24

භාවනා ලස්සනට අඩි තබමින් කැෂියර් එකට ඇවිදගෙන ආවාය. හැමෝගේම ඇස් තිබුනේ ඇය වෙතය. කෙල්ල තරමක් උස නිසා සාරියට ඇය ලස්සනය. උරහිස දක්වා වැටෙන්නට දැමූ කෙටි වරළස ඇගේ මුහුණට ගෙන ආවේ වෙනස්ම පෙනුමකි. දමාගෙන උන් චූටි හීල් එක නිසා ඇය යද්දී සිහින් හඬක් දෙපයින් එයි. 'මං දිහාමද බලාගෙන

ඉන්නේ' භාවනා සිතුවේ වේගයෙන් කැෂියර් මැෂින් තුනට පාස් වර්ඩ් දෙමිනි. අද කෙල්ල වෙනදා වාගේ නොවේ. වෙනදාට දෙන දේශනයද අද නැත. එහෙත් ඇය පාස් වර්ඩ් දී කැෂියර් කෙල්ලෝ තුන්දෙනාට ළඟට කතාකළාය. කෙල්ලෝ තුන්දෙනා භාවනා ළඟ එක පෙළට හිටගත්තාය. 'බ්‍රීෆ් එකක් කරන්න වගේ යන්නේ ඔයා' දේවක එය දැක සිතුවේය. එය හොඳ දෙයකි. දවසේ වැඩ පටන් ගන්නට පෙර එහෙම කෙටි දේශනයක් තැබිය යුතුය. සේවකයන්ගේ හදවතට සේවය ගැන එන්නේ එවිටය.

ඒත් කෙල්ල කියනා කිසිවක් මෙතනට ඇසෙන්නේ නැත. අද භාවනා කතාකරන්නේ වෙනදා මෙන් උස් හඬින් නොවේ.

"කිසිම වෙලාවක කස්ටමස්ලා මෙතන බලාගෙන ඉන්න වෙලාවක කැෂියර් එක කවුන්ටර් ක්ලෝස් කරන්න එපා. ඊයේ එහෙම දෙයක් වුණා. මම කැමරා එකෙන් බලාගෙන. තරින්දි තමයි එහෙම කළේ. නයෝගේ ලයින් එකේ කස්ටමස්ලා හතර දෙනෙක් කියු එකේ උන්නා. ඔයා කවුන්ටර් එක ක්ලෝස් කරලා ගියා."

භාවනා කීවාය. තරින්දිට පුදුමය. භාවනා එහෙමය. හැකි හැම වෙලාවකම ඇය කැෂියර් පොයින්ට්වලට සවිකර ඇති සීසීටීවී කැමරා දසුන් නරඹයි. එහෙම නැරඹුවේ නැති වුවද නරඹන බව කැෂියර් කෙල්ලන්ට දනවයි. කෙල්ලෝ ටික හරියට වැඩේ කරන්නේ එවිට බව ඇය දනී.

"සොරි මිස්."

"ආයේ එහෙම කරන්න එපා. නයෝ ඊයෙත් මොබයිල් එක කැෂියර් එක යට තියාගෙන ආන්සර් කළා. මම එහෙම කරන්න එපා කියලා තියෙනවා. ගන්න කෝල් එකක් ලන්ච් අවර් එකේදී ගන්න. බෝයි ෆ්‍රෙන්ඩ්ට කියන්න කියන්න තියෙන දෙයක් එස් එම් එස් කරලා තියන්න කියලා. එහෙම නැතුව මේ රස්සාව කරන්න බෑ. කැෂියර් එකේ කෙනෙක් මොබයිල් එකට ආන්සර් කරන්න බෑ."

නයෝමි වරද පිළිගත්තාය.

"හරි සීගිරි එකේ අපි ලංකාවේ තියෙන ඉන්න හොඳම කැෂියර් ගෲප් එකයි. ඒක අදත් හෙටත් එහෙමයි. එකඟද?"

භාවනා ඇසුවාය.

"එකඟයි මිස්."

කෙල්ලෝ ටික තරමක උස් හඬින් කීවෝය. දේවක සියල්ල බලාගෙ නය. 'ඔයා කැෂියර් එක ලස්සනට කරනවා.' ඔහුට සිතුණි.

"තව වැදගත් දෙයක් කියන්න තියෙනවා. මම කැෂියර් ඩිපාට්මන්ට් එක බලන අන්තිම දවස අද?"

කෙල්ලෝ ටිකගේ ඇස් උඩ ගියේය. භාවනා යටතේ ඔවුන් සේවය කළේ ආසාවෙනි. කොච්චර බැන්නද භාවනා කෙල්ලෝ ටිකට හරි ආදරේය. ඒ බව කෙල්ලෝ ටික දැනගෙන උන්නෝය. හවසට කාටත් හොරා තල ගුලියක් හෝ ගෙනවිත් දෙන්නේ ඒ ආදරයටය.

"අනේ ඇයි මිස් ඒ?"

අනූජා ඇසුවාය. භාවනා යන්තමට සිනාසුනාය.

"මිස් මැරිකරන්නද යන්නේ."

නයෝ ඇසුවාය. භාවනා ඇයට රැව්වාය.

"මම මැරිකරන්නේ නෑ දැන්මම. කැෂියර් සෙක්ෂන් එක ඊයේ මලීෂා මිස්ට බාරදුන්නා. අද ඉඳලා කැෂියර් සෙක්ෂන් එක බලන්නේ මලීෂා මිස්. මම සේල්ස් බලන්නේ."

කෙල්ලෝ ටිකගේ මුහුණු අඳුරුවීගෙන යනවා භාවනා බලාගෙ නය. ඇයටත් දුකය. ඒත් මේ සීගිරි එකේ කොයිකත් ඇයට එකය.

"අනේ ඇයි මිස් එහෙම."

"ඒක මැනේජ්මන්ට් එක ගත්ත තීරණයක්. මට මොනවත් කරන්න බෑනේ එහෙම කියලා මාත් එක්ක

කතාවත් කරන්නේ නැතුව ඉන්න එපා. හොඳද? මේ කාලය තුළ මට මේ සෙක්ෂන් එක කරගෙන යන්න ඔයාලා ගොඩක් උදව් කළා. ඒකට මම අද ඔයාලට ස්තූති කරනවා. ඒ සහයෝගය එහෙමම මලීෂා මිස්ටත් දෙන්න. එයා අද ඇවිත් ඔයාලට කතාකරයි. මාත් එක්ක වැඩකරද්දී කරපු සමහර වැරදි ආයේ කරන්න යන්න එපා."

කෙල්ල නොකියා කීවේ මලීෂා කියන්නේ තමා නොවේ කියාය. ඒ ගැන කෙල්ලෝ ටික දැනගෙන උන්නෝය. 'එයා නල්ල මලේ කෙනා මොකට මේ සෙක්ෂන් එකට එනවද දන්නේ නෑ' නයෝමි සිතුවාය.

"හොඳයි එහෙනම් වැඩකරගෙන යන්න."

භාවනා අවසානයට කීවාය. කෙල්ල හැරුණේ කැෂියර් මැෂින් තුනෙන්ම ඇය ලබාදී තිබූ පාස් වර්ඩ් එක ඉවත් කරගෙනය. මලීෂා පැමිණි මේ මැෂින් වලට අලුතින් පාස් වර්ඩ් එකක් දෙනු ඇත. කැෂියර් සෙක්ෂන් එකේ කෙල්ලෝ ටික බලාගෙන උන්නේ යන්තමට තෙත්වූ දෙනෙත්වලිනි. ඒ ඇස් දෙස බලන්නට භාවනා නොගියේ ඇයටත් දුක හිතෙන නිසාය.

කෙල්ල යළිත් එද්දී යන්තමට දෙනෙත් ඔසවා බැලුවාය. දේවක තමා දෙසම බලාගෙන ඉන්නවා කෙල්ල දැක්කාය. 'මොනවා වුනත් මම ඔයාට හදවතින්ම සුබ පතනවා.' සම්මුඛ පරීක්ෂණයට පැමිණ උන් බොහෝ දෙනා සුපර් මාර්කට් ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ය. ඇතැමෙක්ට

අවුරුදු පනහක් පනස් පහක් පමණ වන්නට ඇත. ඔවුන් දෙස බලද්දී භාවනාට බියකුත් දැනුණි. 'ඔයාට මේ ෆීල්ඩ් එකේ තියෙන එක්ස්පීරියන්ස් එක මොකක්ද' ඇය සිතින් ඇසුවේ දේවකගෙනි. සීයා බලන්නේ ඒ අත්දැකීම්ය. නැතුව මුහුණින් පෙනෙන ස්මාට් ගතිය නොවේ.

ශ්‍රේතා ආවේ රෝද පුටුවෙනි. තරින්දි දුවගෙන ගොස් දොරකඩදීම රෝද පුටුව බාරගත්තේ සීගිරි හී ආරක්ෂක නිළධාරියාගෙනි. ඇය කොහොමත් එන්නේ භාවනාට පසුවය. කෙල්ල ටිකක් වේලාසන එන්නේ කැෂියර් ඔන් කරන්නට ඕනා නිසාය.

"ගුඩ් මෝනිං මිස්."

තරින්දි කීවේ රෝද පුටුවේ

හැඩලයට දෑතම යවමිනි.

"ගුඩ් මෝනිං දරුවෝ."

අද නේත්‍රා සැරසී උන්නේ චාම් අළු පැහැගත් සාරියකිනි. ඇය සාරිය අඳින්නේ අම්මාගේද උදව් ඇතිවය. ජීන්ස් එකක් හෝ ගවුමක් ඇන්ඳානම් ඇයට පහසුය. ඒත් අද වැනි සම්මුඛ පරීක්ෂණයකුත් ඇති දවසකට එහෙම අඳින්න හොඳ නැත.

"අනේ බලන්නකෝ මිස් අපේ මිස්ව කැෂියර් සෙක්ෂන් එකෙන් අයින් කරලනේ. මලීෂා මිස්ව දාලා. අනේ මිස් ඇයි එහෙම කළේ. අපිට අපේ මිස් ඕන"

තරින්දි කීවාය. අනුජාත් එතන උන්නාය. නේත්‍රා සිනාසුනේය.

"ඔයාලගේ මිස් වෙන කොහේවත් ගියේ නෑනේ ළමයෝ. මෙතනනේ

ඉන්නේ. හැමෝ එක්කම වැඩකරන්න ඉගෙන ගන්නෝනනේ. මිස් හැමදාම ඔයාලට ආදරෙයි.”

නේත්‍රා කීවාය. කැෂියර් එකෙන් කෙල්ලට අයින් වෙන්නට වූයේ ඊයේ ඇතිවූ කතාව නිසාය. නේත්‍රාටත් ඒකට දුකය. ඒත් සියල්ල බාරගත යුතුය. කරන්නට දෙයක් නැත.

භාවනා සම්මුඛ පරීක්ෂණයට ආ අය දෙස බලාගෙනම ගියාය. දේවක නේත්‍රා දෙස බලාගෙන උන්නේ වෙනස්ම බැල්මකිනි. ‘පව් ඒ මිස් ඩිසේබල් වෙලා. ලස්සන මිස් කෙනෙක්. කොහොමද මෙහෙම වුනේ’ දේවක සිතුවේය. ඔහු මෙහෙම සිතද්දී නේත්‍රාගේ ඇස් තිබුනේ දේවක වෙතය. මොකක්දෝ හේතුවක් නිසා නේත්‍රා

දේවක සමඟ සිනාසුනාය. දේවකද සිනාසුනේය. නේත්‍රාගේ සිතට විස්තර කරන්නට බැරි අමුත්තක් දැනුණි. ඒ කවරක්දැයි කියන්නට ඇයම දන්නේ නැත. 'ඒ මල්ලිව දැකලා පුරුදුත් වගේ' නේත්‍රාට සිතුණි. මේ ඇවිත් ඉන්නේ ඇගේ ළමා වියේ ඇය වඩාත්ම ආදරය කළ සුදු නැන්දිගේ එකම පුතා බව නේත්‍රා දන්නේ නැත. ඇයට දැනෙන මේ හුරුපුරුදු බවත් ඒකමය. ඒත් අවුරුදු විස්සක අතීතයක් හදවත එකවර හඳුනාග න්නේ නැත.

නේත්‍රා යද්දී භාවනා උන්නේ සම්මුඛ පරීක්ෂණයට මේසය සූදානම් කරමිනි. එය කරන්නේ රඹුක්වැල්ල මහතාගේ කාමරේය. කෙල්ල තවත් පුටු දෙක තුනක් එක පෙළට තබා ඉන්ටර්වීව් එකට මේසය ලෑස්ති

කළාය.

"හරි වස්තුවේ. ඔයාට පින්."

නේත්‍රා කීවේ තරින්දිටය. භාවනා බැලුවාය.

"බබා."

"අක්කි."

"කෙල්ලෝ ටික අඬනවා පැටියෝ."

නේත්‍රා කීවේ කැෂියර් කෙල්ලෝ ටික ගැනය.

"මටත් හරි දුකයි. මම උන්ගේ මූණවත් අද බැලුවේ නෑ."

ඒ සඟවාගත් කඳුළු එන්නේ දැන්ය.

"දැන් අඬන්න එපා ඔය මේක් අප් එකත් යනවා. උන් ඔයාට හරි ආදරෙයි."

"මාත්. මෙයා කොහොම කෙල්ලෝ

ටිකට සළකයිද දන්නේ නෑ."

භාවනා කීවේ ටීෂූ එකකින් ඇගේ දෙනෙත් තවමිනි.

"ඉන්ටර්වීව් එකට කට්ටිය ටිකක් ඇවිත් වගේ නේද බබා."

"ඔව්. විස්සක් විසි දෙකක් ඇවිත් හිටියා."

"අපිට කෙනෙක්ව බලලා ගන්න පුළුවන් වෙයි."

අක්කා ඔහුව දැක්කාද කියා භාවනා සිතුවාය.

"එක්ස්පීරියන්ස් තියෙන කට්ටිය ඇවිත් වගේ."

"ම්. පොඩි කොල්ලෙකුත් ඇවිත් හිටියා."

නේත්‍රා කීවාය. 'අක්කා කියන්නේ එයා ගැන.' භාවනා සිතුවාය.

"ම්. මාත් දැක්කා."

"අපි බලමු."

නේත්‍රා කීවේ කෙල්ලගේ වතට පිරිමැදය.

"අද සෝ බියුටිෆුල්."

භාවනා සිනාසුනාය.

# 25

පුදුමයකට මෙන් රඹුක්වැල්ල මහතා අද සීගිරි එකට එන්නට ඇන්දේ කෙල්ල ඊයේ ගෙනවිත් දුන් අලුත් කමිසයය. එය භාවනා ඊයේ ගත්තේ ෆැෂන් කලෙක්ෂන් එකෙනි. එය තෝරාගන්නට දේවකද ඇයට උදව් කළේය. රඹුක්වැල්ල මහතා අලුත් කමිසය ඇන්දේ අද ඉන්ටර්වීව් එකක් නිසාම නොවේ. කෙල්ල දෙයක් ගෙනවිත් දුන් විට එය අගය

කරන බව කෙල්ලට පෙන්විය යුතුය. අහිංසක හිතට සතුටක් එන්නේ එවිටය. රඹුක්වැල්ල මහතා එය දැනගෙන උන්නේය.

දේවක ඇඳගෙන ආවේද ඒ මෝස්තරයේම කමිසයකි. වෙනසකට තිබුනේ ඔහු එයට ටයි පටියක් පැළඳගෙන සිටීම පමණි. රඹුක්වැල්ල මහතා ටයි පටි පළඳින්නේ කළාතුරකිනි.

"ගුඩ් මෝනිං සර්."

රඹුක්වැල්ල මහතා සීගිරි එකට එද්දී මුලින්ම හමුවෙන කැෂියර් කෙල්ලෝ ටික ඔහුට පැතුවෝය. දේවක බැලුවේ එවිටය.

"ගුඩ් මෝනිං දරුවනේ."

රඹුක්වැල්ල මහතා කීවේ කරුණාබර ලෙස සිනාසෙමිනි.

‘එහෙනම් ඔයයි මගේ සීයා. අම්මගෙ ම මූණනේ. හරි කරුණාවන්ත පාටයි. ඇයි ඔයා මගේ අප්පච්චිව එපා කිව්වේ සීයේ’ කොල්ලා ඇසුවේ කාර්යාලය දෙසට එන රඹුක්වැල්ල මහතා දෙස බලාගෙනය. මේ එන්නේ ඔහුම බව දේවකට ඉවෙන් මෙන් දැනෙයි. ඇරත් ඊයේ මේ කමිසය කෙල්ලට තෝරාදුන්නේ තමාය. ‘ඒ කියන්නේ මේ ඔයාගෙත් සීයා. එතකොට ඔයා මගේ’ දේවක ඉන් එහාට සිතන්නට ගියේ නැත. එක දෙයක් පමණක් විශ්වාසය. කෙල්ල මේ සීගිරි පවුලේ කෙනෙකි. ඒත් කාගේ කවුද කියා දේවක දන්නේ නැත.

රඹුක්වැල්ල මහතා ආවේ සම්මුඛ පරීක්ෂණයට ආ සියල්ලන්ම දෙස බලා සිනාසෙමිනි.

"ගුඩ් මෝනිං."

ඔහු සියල්ලන් දෙසම බලා කීවේය. බොහෝ දෙනා ඔහුටද පෙරළා සුබ පැතුවෝය. දේවක කාර්යාලය තුළට යන ඔහු දෙස බලාගෙනම උන්නේය. 'අප්පච්චි කිව්වා හරි. සීයා හරි කරුණාවන්ත කෙනෙක්' දේවක සිතුවේය.

ඉන්ටර්වීව් එකට ආ හැමෝම පැමිණ ඇත්තේ හොඳ සූදානමකිනි. හැමෝගේම අතේ සෑහෙන තරම් බර ෆයිල් විය. සමහරු ඉන්ටර්වීව් එකට ආවේද ඔවුන්ගෙ ර්ම කාරයකය. 'ලේසිවෙන එකක් නෑ. සමහරු සුපර් මාර්කට්වල වැඩකරන අය.' එහෙම කතාවක් ඔවුන් අතර වූ කතාබහෙන් දේවක තේරුම් ගත්තේය. ඔවුන් බොහෝ

දෙනා දේවක දෙස බැලුවේ තරමක සමච්චලයකිනි. අලෙවි ප්‍රවර්ධන කළමණාකරුවෙක් වෙන්නට ලේසි නැත. දේවක වාගේ ලාබාළ කොල්ලෙක්ට එය කොහොමටත් අමාරුය. හැමෝම බලන්නේ අදාල ක්ෂේත්‍රයේ අත්දැකීම්ය. 'කමක් නෑ බලමුකෝ.' දේවක එහෙම ලේසියෙන් සටන අත්හරින කෙනෙක් නොවේ.

රඹුක්වැල්ල මහතා කාමරයට එද්දී භාවනා උන්නේ ඔහුගේ මේසය අස්කරමිනි. ඔහුව දකිද්දී කෙල්ලට පුදුම සිතුණි. ඈය බලාගෙනම උන්නාය.

"ඇයි මැණික"

භාවනා සිනාසුනාය. 'සීයත් අද ඇඳන් ඇවිත් තියෙන්නේ එයා ඇඳන් ආපු කමිසෙමයි. පුදුමයි' භාවනා

සිතුවාය.

"ෂර්ට් එකට සීයා රිෂි කපූර් වගේනේ."

භාවනා කීවාය. රඹුක්වැල්ල මහතා සිනාසුනේ පොඩි ළමයෙකු සේය.

"ඔයාට හොඳට තෝරන්න දන්නවා."

ඔහු කීවේය. එහෙත් මේ කමිසය තේරුවේ තමා නොවන බව කියන්නට ඇයට ඕනා විය. තෝරපු කෙනා දැන් ඉන්නේ සීගිරි එකේය.

"තැන්කියු සීයා."

"අපි ඉන්ටර්වීව් එක පටන් ගන්නෝන මැණික. කෝ අක්කයි මිහිරංගයි."

"අක්කි ආවා සීයා. මිහිරංග අයියා තාම නෑ."

"ඉක්මනට එන්න කියන්න. මිනිස්සු බලාගෙන ඉන්නවා."

භාවනා ඇගේ ජංගම දුරකථනයෙන් මිහිරංගට ඇමතුමක් ගත්තාය.

"මේ ළඟ බබී."

කෙල්ලට ආස නැත්තේම මේ කතාවය.

"සීයා කිව්වා ඉක්මනට එන්න කියලා."

භාවනා එපමණක් කියා දුරකථනය විසන්ධි කළාය. සීයා මිහිරංගව ඉන්ටවිව් බෝඩ් එකට තියාගන්නේ යුතුකමක් ලෙස පමණක් බව භාවනා දනී. 'නැත්නම් එයයි මායි කරන ඉන්ටර්වීව්' ඇය සිතුවාය. කෙනෙක්ව ඉන්ටවිව් කළ යුත්තේ කෙනෙක් ගැන හොඳට තේරුම්

ගන්නට හැකි කෙනෙකි. 'එයාට එයා ගැනවත් තේරෙන්නේ නැතුව ඇති තව කොහෙද අනිත් අයව තේරුම් ගන්නේ.'

"සීයා."

"පුතේ."

"ඊයේ කලෙක්ෂන් එක ගිය සතියේ සන්ඩේට වඩා ටුවෙන්ටි තවුසන්ඩ් අඩුයි. මෙහෙම වෙන්න බෑ."

භාවනා කීවාය. ඇය එය ගණන් බැලුවේ අද උදේ පැමිණ්ය.

"ම්. අපි බලමු මැණික ප්ලෑනක් හදන්න. බැරිවෙන එකක් නෑ. හොඳ කෙනෙක්ව අපි ගමුකෝ ඉස්සෙල්ලා."

භාවනා හිස වැනුවාය.

"මේ සේල්ස් අප් කරන්න මැණික සාමාන්‍ය කෙනෙක්ට බෑ. ටිකක්

වෙනස් විදිහට හිතන කෙනෙක් ඕන. අපි නිකමට ගමු පුතේ මේ හෝටල් කෑල්ලක් ගැන. ඔය කෑම තියෙන්නේ."

"ඔව් සීයා."

"හෝටලේ පාන් හැමදාම ඉතුරයි කියන්නකෝ."

"ම්."

"එතකොට පුතේ පාන් ඉතුරුවෙන එකට පාන් ප්‍රමෝට් කරලා බෑ. ඒකට පුතේ හෝටලේ විකුණන පරිප්පු කරිය තමයි මාකට් කරන්න ඕන. පරිප්පු කරිය මාකට් වෙනකොට නිකම්ම පාන් යනවා. පරිප්පු කන්නේ පාන් එක්කනේ. ඒක හිතන්න කෙනෙක් ඕන."

භාවනා හිස වැනුවාය. ඇයට සිහිවූයේ එළියේ ඉන්ටවීව් එකට

ආ දේවකවය. 'ඔයාට ඒක කරන්න පුළුවන්ද' දන්නේ නැත. ඒත් එහෙම වේවා කියා ඇය පැතුවාය. ඔහු වාගේ කෙනෙක් මේ සීගිරි එකට එනවාට එච්චර ආස ඇයිදැයි කෙල්ලම දන්නේ නැත.

"අක්කටත් එන්න කියන්න. අපි ඉන්ටර්වීව් එක පටන් ගමු."

රඹුක්වැල්ල මහතා කීවේ කාමරයට ආ මිහිරංගව දැකය. භාවනා පපුවට අතක් තියාගත්තාය. හදවතට අසාමාන්‍ය බරක් දැනෙන්නේ ඇයිදැයි භාවනාට තේරෙන්නේ නැත. 'ඔයාම ආවනේ ඉන්ටවීව් එකට. ඇයි එහෙම වුනේ. දැන් පපුව ගිනිගන්නේ මගේනේ.' කවදාවත් මෙහෙම කා නිසාවත් මේ පපුව ඇවිලී නැත. ලේසියෙන් එහෙම

මේ හදවත ගිනිගන්නේ නැති බව භාවනා දනී. ඒත් අද සීගිරි එකේදී ඔහුව දුටු මොහොතේ සිට හදවතට බරය.

"අක්කා එන්න යන්. සීයා ඉන්ටවීව් එක පටන් ගන්න යන්නේ."

භාවනා කීවේ සෝ බරවය. නේත්‍රා බැලුවාය. කෙල්ලගේ මුහුණ ටිකක් වෙනස්ය. නේත්‍රා සිතුවේ ඒ අද කැෂියර් එක බාරදුන් නිසා කියාය. රෝද පුටුව තල්ලු කරගෙන ගියේ භාවනාය. ඒ යන අතරතුර නේත්‍රා භාවනාගේ අත පිරිමැද හිස හැරවූවාය.

"ඇයි බබා."

භාවනා කිසිවක් නැතැයි කියන්නට මෙන් සිනාසෙන්නට උත්සහ කළාය.

"කියන්නකෝ. ඇයි මී?"

අක්කාගෙන් කිසිවක් සඟවාගෙන නැත. ඒත් අද හිතේ ඇති බර ඇයටවත් කියන්නට බැරි එකකි.

"එහෙම නෑ අනේ."

නේත්‍රා සිනාසුනේ කරුණාවෙනි. කෙල්ල තාම පුංචි යැයි ඇයට සිතෙයි. ඔය වයසට එහෙමය. සමහර දේවල් වෙන්නේ හේතුවක් ඇතිවම නොවේ.

මිහිරංගව දැක නේත්‍රා ටික වෙලාවක් බලාගෙන උන්නාය. මිහිරංග සිනාසුනේ ඇස් කරකවමිනි.

"ගුඩ් මෝනිං අක්කා."

මිහිරංග කීවේය. නේත්‍රා සිනාසුනාය.

"ගුඩ් මෝනිං. ඇයි මල්ලියේ මෙහෙම ඇඳන් ආවේ ඉන්ටර්වීව්

එකකුත් තියෙන දවසේ. පිළිවෙලට ෂර්ට් එකක් යටකරලා ඇඳගෙන එන්න ඕනනේ."

නේත්‍රා කීවේ මිහිරංග ඇඳගෙන උන් කළු පැහැගත් ඩෙනිම් කළිසමත් එය උඩින් දමාගෙන උන් කමිසයත් දැකය. භාවනා අත් බැඳගෙන තොල්පට තදකරගත්තාය. 'එයා කරන ඉන්ටර්වීව්.' කෙල්ල සිතුවාය.

"එහෙම අවුලක් නෑ. මේ දවස්වල එක්සකටිව්ස්ලා අඳින්නේ මෙහෙම තමයි."

මිහිරංග ඇඟට පතට නොදැනී කීවේය. භාවනා තොල්පට තදකරගෙන සිනාසුනාය. 'එයා එක්සකටිව්ස්ලා දැකලා නෑ එහෙනම්.' කෙල්ලට එකවරම හිත පුරා ඇළුනේ එළියේ ඉඳගෙන ඉන්නා

දේවක අද ඇඳගෙන ඉන්නා අයුරුය. ‘මොකක්ද ශාන්ත පිළිවෙලක් ඔයාගේ තියෙනවා. ඒක විස්තර කරන්න මම දන්නේ නෑ.’

“හොදයි හොඳයි. යන්කෝ.”

නේත්‍රා කීවේ මිහිරංග සමඟ කතාකරන එලක් නොවන බව දැනීය. කිසිළෙසකවත් මිහිරංග තමාගේ බාල මස්සිනා විය නොහැකි යැයි නේත්‍රා සිතාගත්තාය. ‘කෙල්ලගේ පපුව හොල්ලන්න මිහිරංගට බෑ.’ නේත්‍රා කෙල්ල ගැන ඕනවටත් වඩා දනී.

“සීයා මාස්ටර් පොරවල් ටිකක් ඇවිත් වගේ හැබැයි.”

මිහිරංග රඹුක්වැල්ල මහතාගේ කාමරයට පිවිසෙමින් කීවේය. රඹුක්වැල්ල මහතා සිනාසුනේය.

"අපි බලමු. ඔයාට පුතේ පුටුවට එන්න අමාරුද?"

රඹුක්වැල්ල මහතා ඇසුවේ නේත්‍රාගෙනි. කෙල්ලව එහෙම රෝද පුටුවක තියාගෙන ඉන්න රඹුක්වැල්ල මහතාට දුකය.

"මම එන්නම් සීයේ. බබා අල්ලන්න."

නේත්‍රා භාවනාගේ වතට වාරුවී රෝද පුටුවෙන් පුටුවට මාරුවූවාය.

"සීයගේ ෂර්ට් එක හරිම ලස්සනයි."

නේත්‍රා කීවාය. රඹුක්වැල්ල මහතාට බැලුවේ භාවනා දෙසය. 'එයත් අද ඇඳගෙන ඉන්නේ මේ ෂර්ට් එකමයි' භාවනා සිතුවාය.

"අපේ චූටි මැණික මට ගෙනාපු ෂර්ට් එකක් ලොකු පුතේ."

නේත්‍රා සිනාසුනාය.

"අපි එහෙනම් පටන් ගමුද? මම ඉන්ටවිව් කරනවා. මොකක්හරි ප්‍රශ්නයක් අහන්න හිතුනොත් ඔයාලාත් අහන්න. ම්."

"හොඳයි සීයේ."

නේත්‍රා කීවාය. 'මමනම් අද කට අරින්නේ නෑ දෙයියනේ' භාවනා සිතාගත්තාය.

"රූපරත්න."

රඹුක්වැල්ල මහතා කතාකළේ කාර්යාල සහයකායටය.

"ලොකු මහත්තයා."

"ආපු පිළිවෙලට එවන්න. එක්කෙනෙක් ගිහින් අපි කතාකරනකල් අනිත් කෙනාව එවන්න එපා. තේරුණාද?"

"හොඳමයි."

භාවනා පපුවම පුරවාගෙන හුස්මක් ගත්තාය. කෙල්ල උන්නේ රඹුක්වැල්ල මහතාට වම් පසිනි. ලා බටර් පැහැයට හුරු ගුරු පාටකින් හැඩගැන්වුණු කෙල්ලගේ නිය අද වෙනදාටත් වඩා ලස්සනය. මුදුගිල්ලේ පැළඳගෙන ඉන්නා සුදු ගලක් ඇල්లූ කුඩා මුදුව නිසා අත තවත් ලස්සනය. ඇය ඉන්නේ දෑතම මේසය මත තබාගෙන යන්තමට දෑස් පියාගෙනය. 'ඔයා කීවෙනියටද දන්නේ නෑ ආවේ. මගේ අම්මේ මගේ පපුවේ තියෙන බරක්.' භාවනා සියල්ලන්ටම නොතේරෙන්නට ලොකු හුස්මක් ගෙන එය ටිකෙන් ටික පපුවෙන් මුදාහැරියාය.

රූපරත්න සම්මුඛ පරීක්ෂණයට ආ පිරිස අතරට ආවේය.

"ඉන්ටර්වීව් එක පටන් ගත්තා. මුලින්ම ආවේ මේ මහත්තයනේ. යන්න."

රූපරත්න කීවේ දේවකටය. දේවක නැඟිට්ටේ ඔහු ෆයිල් එකත් අරගෙනමය. සීගිරි සුපර් මාර්ට් හී කාර්යාල පරිශ්‍රයට පිවිසෙන්නට ඇත්තේ කුඩා පිළිග ැනීමේ කවුන්ටරයකට පසුය. එතන ලස්සනට මේසයක් දමා මල් බඳුනක් තබා ඇත. මේසයට ඉහළින් සීගිරි සුපර් මාර්ට් යනුවෙන් ගැසූ රන්පැහැගත් අකුරු පේළියක් ඇත. ඒ දෙපස ඇත්තේ සීගිරි පවුලේ අයගේ පින්තූර ගැසූ දිග බිත්තියය. රඹුක්වැල්ල මහතාගේ කාමරය ඇත්තේ ඉන් පසුය.

"මම යනවා අප්පච්චි යනවා

අම්මේ.”

කොල්ලා වීදුරුෑ දොරට අතක් තැබුවේ එසේ මුමුණාමිනි. ජීවිතේ හැම වැදගත් මොහොතකම ඔහු අම්මාවත් අප්පච්චීවත් සිහිකරයි. මෙතෙක් දවසක් එහෙම සිතා කළ දෙයක් වැරදී නැත.

# 26

"අතන රූම් එක මහත්තයා. කෙළින්ම යන්න."

රූපරත්න කොල්ලාට රඹුක්වැල්ල මහතාගේ කාමරය පෙන්වූවේය. දේවක ඔහු දෙස කරුණාබරව බලා ඇවිදගෙන ආවේය. එත තැනකදී දේවකගේ දෙපා නැවතුණේය. ඒ සීගිරි පවුලේ පින්තූර අතර වූ ඔහුගේ අම්මාගේ පින්තූරය දැකය. කොල්ලාගේ දෙනෙත් යන්තමට

මෙන් තෙත්ව ගියේය. දේවක එදෙස බලාගෙනම උන්නේය. වීදුරු දොරෙන් එහා උන් රඹුක්වැල්ල මහතාත් භාවනාගේ මේ සිදුවීම බලාගෙනය. 'දෙයියනේ මුළින්ම එන්නේ එයා. ඒත් ඇයි මේ පිස්සා එන්නේ නැතුව අපේ ෆැමිලි ෆොටෝස් දිහා බලාගෙන ඉන්නේ' භාවනා සිතුවාය.

"ඔහොම යන්න මහත්තයා."

දේවක නැවතීගෙන නර්මදාගේ පින්තූරය දෙස බලාගෙන සිටිද්දී රූපරත්න කීවේය. මේ ඇවිත් ඉන්නේ මියගිය නර්මදාගේ එකම පුතා බව සීගිරි එකේ කිසිවෙක් දන්නේ නැත.

"හා අන්කල්."

ඔහු රූපරත්න දෙස බලා සිනාසී දොර වෙත ගියේය. සුදු පැහැගත්

වීදුරු දොර අතරින් කොල්ලා භාවනාව ලස්සනට දැක්කේය. 'ඔයත් ඉන්ටවීව් බෝඩ් එකේ ඉන්නවනේ මිස්. පුදුමයි.' දේවක සිතුවේය. දේවක වීදුරු දොරට අත තැබුවේ ඇය දෙස යන්තමට බලාගෙනය. 'වාසනාවන්ත මූණනේ' දේවක සිතුවේය.

දේවක දොර ඇරගෙන සම්මුඛ පරීක්ෂණය කරන මේසය ඉදිරිපිටට ආවේය. කොල්ලා ඇඳගෙන ඉන්නේ තමා ඇඳගෙන ඉන්නා කමිසයම බව රඹුක්වැල්ල මහතාට සිතාග න්නට වැඩිවෙලාවක් ගියේ නැත. එය නේත්‍රාද දැක්කාය. ඇය භාවනා දෙස බලා සිනාසුනේ දෑසින් එය පෙන්වමිනි. කෙල්ලගේ වැඩි ප්‍රතිචාරයක් නැත.  රඹුක්වැල්ල මහතාට කොල්ලාව දුටුවනම

මොකක්ද වූවාක් මෙන් විය. එය තේරුම් කරන්නට අමාරු දෙයකි. එවැනිම දෙයක් නේත්‍රාටද විය.

දේවක ලස්සනට සිනාසුණේය. 'හරියට දැකලා පුරුදු හිනාවක්' නේත්‍රා සිතුවාය. ඒත් ඒ සිනහව කාගේද කියා ඇයට තේරෙන්නේ නැත.

"ගුඩ් මෝනිං සර්."

දේවක මුළින්ම ආචාර කළේ රඹුක්වැල්ල මහතාටය.

"ගුඩ් මෝනිං. ඉඳගන්න."

"ගුඩ් මෝනිං මිස්. ගුඩ් මෝනිං සර්. ගුඩ් මෝනිං මිස්."

දේවක පිළිවෙලින් නේත්‍රාටත් මිහිරංගටත් අවසානයට භාවනාටත් කීවේය. කෙල්ල 'ගුඩ් මෝනිං' කියා තොල් මැතිරුවා පමණි.

"ඉඳගන්න."

නේත්‍රා කරුණාබරව කීවාය.

"තැන්කියු මිස්."

දේවක ඉඳගත්තේ හතරදෙනා දෙසම එක බැල්මකින් බලාය. 'ඔයා දිහා බැලෙනවා වැඩියි මිස්' ඔහු සිතුවේය. ඒත් කෙල්ලට ටිකක් සතුටුය. මෙහෙම ඉඳිද්දී ඔහු දෙස ටිකක් ඕනාකමින් බලාගෙන ඉන්නට පුළුවන.

"මම සර් දේවක. දේවක පුංචි බණ්ඩාර."

දේවක කීවේය. ඔහුගේ කටහඬ මේ දිනවල යන හඬ කැවූ කොරියානු නාට්‍යයක රජතුමාගේ කටහඬ වාගෙ 'යි කියා කෙල්ලට සිතෙයි. තමාට සිතෙන දේවල් පුදුමයැයි පසුව ඇය සිතුවාය.

මිහිරංග දේවක දෙස බලාගෙන උන්නේ සමච්චලයෙන් මෙන්ය. ‘මේ මොන ගං බයියෙක්ද මූ දන්න සේල්ස් ප්‍රමෝෂන්. වර්ඩ් එකක් දෙකක් කතාකරලා හරවලා යවන්න තියෙන්නේ’ ඔහු සිතුවේ එහෙමය.

“අපිට දේවක ගැන පොඩි විස්තරයක් කියන්නකෝ. මී. කොහෙද ඉගෙනගත්තේ. අම්මා තාත්තා කවුද?”

රඹුක්වැල්ල මහතා කීවේය. මොකක්ද හේතුවක් නිසා කොල්ලාගේ විශේෂත්වයක් ඇතැයි රඹුක්වැල්ල මහතාට නිකමට සිතුණි. එහෙත් එය සිතිවිල්ලක් පමණි. දේවක එයට පිළිතුරු දුන්නේ පරිස්සමිනි. ජීවන් කොල්ලාට කියා එව්වේ එහෙම ඇඟවෙන්නේ නැති විදිහට

කතාකරන්න කියාය.

"මගේ අප්පච්චී කන්ස්ට්‍රක්ෂන් ෆර්ම් එකක වැඩකරන්නේ සර් කන්ස්ට්‍රක්ෂන් සුපවයිසර් කෙනෙක් විදිහට."

දේවක පරිස්සමින් කීවේය.

"මගේ අම්මා සර් මේ ළඟදී නැතිවුණා. අප්පච්චියි මායි විතරයි ඉන්නේ."

දේවක දුක්බරව කීවේය.
අම්මා ළඟදී නැතිවුණා කියා කීවේ යන්තමට හෝ සැකයක් එයි කියාය. භාවනාගේ පපුවට ඇල්පෙනිති තුඩකින් ඇන්නාක් මෙන් විය. 'අනේ පව්. ඒක තමයි ඊයේ අප්පච්චි ෆෝන් කරපු වෙලාවේ කිව්වේ මම එහෙනම් උයන්නේ නෑ කියලා. අප්පච්චියි පුතයි උයාගෙන කනවා ඇති. එත.

කො කෝ වයිෆ්.' භාවනා සිතුවේ ඇත්තටම ඔහු විවාහක කෙනෙක් කියාය.

"දේවකගේ ගෙවල් කොහෙද?"

නේත්‍රා ඇසුවාය.

"මම මිස් අතුරුගිරියේ. ඊට කලින් අපි හිටියේ කුරුණෑගල."

මහනුවර ගැන දේවක විශේෂයෙන් කියන්න ගියේ නැත.

"ම්. මැරිකරලද දේවක?"

ඒ ප්‍රශ්නය සීයාම ඇසූ එක හොඳයි කියා භාවනාට සිතුණි.

"අනේ නෑ සර්. එහෙම නෑ."

ඔය වචන ටික කියද්දී දේවකගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවිය. 'නරක දෙයක් ගැන ඇහුවා වගේනේ මූණ රතුකරගත්තේ.'

"හොඳයි දේවකට සේල්ස්

ප්‍රමෝෂන් ෆීල්ඩ් එකේ තියෙන එක්ස්පීරියන්ස් මොනවද?"

රඹුක්වැල්ල මහතා ඇසුවේය. කොල්ලා ප්‍රියමනාපය. අවංක පාටය. අහිංසකය. ඒ සියල්ල ඇත්තය. එහෙත් හොයන්නේ අලෙවි ප්‍රවර්ධන කළමණාකරුවෙකි. කෙල්ල අඩවන්ව ඔහු දෙස බලාගෙන උන්නාය. දේවක මුළින්ම ඔහුගේ සහතික පත් ටික පෙන්වූවේය. 'ඔයා මොන මොනවා හරි කරලා එහෙනම්.'

"මම සර් ඩයලොග් පෝස්ට් පේඩ් පැකේජ් හත්දාහක් කැන්ඩිවල විතරක් සේල් කළා. ෆ්‍රෙෂ් කනෙක්ෂන්. මේ ඒකට ලැබුණු මාකටින් ස්ටාර් ඇවොඩ් එක."

දේවක ඔහුගේ අලෙවිකරන අත්දැකීම් ගැන කීවේය.

"අපි සේල් කරන්නේ සිම් කාඩ් නෙමේ. අපි සුපර් මාර්කට් එකක්. මොනවද සුපර් මාකට් ෆීල්ඩ් එකේ එක්ස්පීරියන්ස්. වෙන ඒවා වැඩක් නෑ."

මිහිරංග තදින් කීවේය. 'ඒක මහ ගොන් කතාවක්. බිස්කට් විකුණන්නයි සිමෙන්ති විකුණන්නයි කියලා දෙවිදියක දක්ෂයෝ නෑ. මෙයා දන්න මාකටින්' භාවනා සිතින් බැණ්නාය.

"මම දන්නවා සර්. මම සේල් කරලා තියෙන්නේ සිම් කාඩ් විතරක් නෙමේ. මේ කඳුරට හවුසින් ස්කීම් එකේ හවුසස් එකසිය ගාණක් මම සේල් කරලා තියෙනවා. මේ තියෙන්නේ. එතකොට මේ පියෝ ටීවී කනෙක්ෂන්ස්."

දේවක පැහැදිලි කළේය.

"අපි අහන්නේ සුපර් මාර්කට් එක්ස්පීරියන්ස් ගැන."

මිහිරංග යළිත් ඇසුවේය.

"විකුණන්නේ මොකක්ද කියන එක එච්චර වැදගත් නෑ කියලා සර් මම ඉගෙන ගෙන තියෙන්නේ. ඒක විකුණන කලාවයි මම ඉගෙන ගත්තේ. ඒක වෙජිටබල් උනත් ටයර් ගිනි පෙට්ටි උනත් කමක් නෑ."

දේවක කීවේ සන්සුන්වය. 'ඔයා මාරයිනේ. මිහිරංග අයියා ලස්සනට අහගත්තා. නොදන්න දේට කට දාන්නේ නැතුව පැත්තකට වෙලා හිටියානම් අඩුම ගානේ කාඩ් එකවත් බේරෙනවා'

"ඔව්. අපි කතාකරමු දේවක මේ වගේ සුපර් මාර්කට් එකක ප්‍රමෝෂන් එක ගැන තියෙන අදහස ගැන. මි."

මිහිරංග භාවනාට දැසින් කීවේ මේ වැඩකට නැති කතාවක් බවය. භාවනා බිම බලාගත්තාය. මිහිරංග දේවකත් සමඟ කරන කතාව ගණනකටවත් ගන්නේ නැතිව මොබයිල් ෆෝන් එක ඔබන්නට ගත්තේය.

"මට සර් පැය කාලක් දෙන්න පුළුවන්ද ටිකක් කතාකරන්න."

දේවක රඹුක්වැල්ල මහතාගේ දෑස් දෙසම බලාගෙන ඇසුවේය. ඇවිත් ඉන්නේ ලේසි පාසු පුතෙක් නොවන බව නිකමට මෙන් රඹුක්වැල්ල මහතාටද දැනෙයි. ඉන්ටවීව් බෝඩ් එකේ ඉන්නා කෙනෙක්ට අරම කිව්වේද ඒ නිසාය. බය නැත්තේ දක්ෂයෝය. අදක්ෂයෝ හරිම බයය. රඹුක්වැල්ල මහතා එය

දනී.

"ඔව් පුළුවන්. ගෝ හෙඩ්"

රඹුක්වැල්ල මහතා කීවේය. මිහිරංග නළල මිරිකාගත්තේ 'මේක මළ චාටරයක්යැයි' කියන්නාක් මෙන්ය.

"මම සර් මේ සේල්ස් ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක් ඉල්ලලා තියෙන වේකන්සි ඇඩ් එක දැක්කට පස්සේ පෙරේදා සීගිරි එකට ආවා සර්"

දේවක කීවේය.

"ඔව් ඒක හොඳ දෙයක්."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මම ආවේ සැටඩේ සර්. සුපර් මාර්කට් එකකට හොඳට කස්ටමස්ලා එන දවසක් එදා. වීක් එන්ඩ් එක පටන්ගන්න දවස"

"ම්."

"ඒත් සර් සීගිරි එකට එහෙමම සෙනඟක් ඇවිත් හිටියේ නෑ. කා පාක් එක ටිකක් පාළුවට ගිහින් තිබුණේ. මෙච්චර ලස්සනට හදපු සීගිරි සුපර් එකට එහෙම කස්ටමස්ලා නෑවිත් ඉන්න හේතුවක් නෑ සර්. ගොඩක් සුපර් මාර්කට්වල නැති සිංහල ලාංකික පාටක් සීගිරි එකට තියෙනවා. ඒක හදවතට දැනෙන ගතියක් තියෙනවා සර්. මෙතනට. මම කිව්වේ මට දැනිච්ච දේ. ඒක සීගිරි එකට ගොඩවෙනකොටම දැනෙන දෙයක්. සීගිරි එකේ තේමාව දකිනකොට හිතෙන දෙයක්. අපේ ගතියක් දැනෙනවා. දන්න අඳුනන නෑගේකට ආවා වගේ හැඟීමක් දැනෙනවා. තමන්ගේ ගතියක්"

රඹුක්වැල්ල මහතාට පුදුම සිතුණි. ඔහු සීගිරි එක අරඹද්දී සිතුව දේත්

ඒකය. සිංහල ගතියය. අපේ කමය. අහිංසක බවය.

"ම්."

'ඔයා එහෙනම් හැමදේම දැනගෙන ආවේ. පුදුමයි' භාවනා දෑස් අඩවන් කරගෙන අසාගෙන උන්නාය.

"ඒත් සීගිරි එකට ක්‍රව්ඩ් එක ඇවිත් නෑ. මොකක්හරි ප්‍රශ්නයක් තියෙනවා කියලා මට දැනුණා සර්. ඒක ගොඩක් ලොකු ප්‍රශ්නයක් නෙමේ පොඩි පොඩි දේවල් ටිකක්. හරිගස්සන්න පුළුවන් දෙයක්. වී කැන් චේන්ජ්"

රඹුක්වැල්ල මහතා බැලුවේ නේත්‍රා දෙසය. මෙහෙම කියද්දී හදවතට නිවනක් දැනෙයි.

"මොනවද දේවක දැක්කේ

කියන්නකෝ?"

නේත්‍රා ඇසුවාය.

"මේකයි මිස්. ඕනම සුපර් මාර්කට් එකක තියෙන බඩු සුපර් මාර්කට් එකට පිටින් තියෙන කඩවල්වලින් පොළවල් වලින් ගන්න පුළුවන්. සමහරවිට සුපර් මාර්කට් එක දෙන මිළටත් වඩා අඩුවෙන්."

"ම්."

"ඒත් එහෙම තියෙනවා කියලා දැනගෙනත් ඇයි කස්ටමකෙනෙක් සුපර් මාර්කට් එකකට එන්නේ. එයාට පහසු නිසා. මේ ෂොපින් එක්ස්පීරියන්ස් එකට එයා ආස නිසා. ඒ සී කරපු සුපර් මාර්කට් එකක් ඇතුලේ වෙනමම ෂොපින් එක්ස්පීරියන්ස් එකක් ගන්න එයා ආස නිසා. එයාට ඕන කරන

හැමදේම එක තැනක එක විදිහකට තියලා තියෙන නිසා. පොඩි කල්පනාවක් දාගෙන මාකටින් කරන්න පුළුවන් නිසා”

දේවක කියාගෙන ආවේය.

“දැන් ඔයා හදන්නේ අපට සුපර් මාර්කට් ගැන උගන්නන්නද?”

මිහිරංග ඇසුවේය. ‘එයාට කට පියාගෙන ඉන්න බෑ.’ භාවනා සිතුවාය.

“ඉන්න සර්. මම තාම කතාව පටන් ගත්තේ නෑ. සීගිරි එකේ එම් ඩීට සුපර් මාර්කට් කරන කලාව උගන්වන්න මට බෑ සර්. සීගිරි එක මම දන්න විදිහට පටන් අරන් තියෙන්නේ මම ඉපදෙන්නත් කලින්. ඒ වගේම ලංකාවේ අද සුපර් මාර්කට් කරන කම්පනි ඒවා

ගැන හිතන්නත් කලින්. ජෝන් කීල්ස්ලා ඒ දවස්වල ටුරිසම් කළේ. පුඩ් සිටිලා සිලෝන් තියටර්ස් කලේ. එයාලා කවදාවත් සුපර් මාර්කට් ට්‍රේඩ් එක ගැනවත් එදා හිතලා තිබුනේ නෑ. ඒක මම දන්නවා.”

දේවක කීවේය. ‘ආයෙත් ඇණගත්තා පැත්තකට වෙලා ඉන්නේ නැතුව එයා එනවා උදැල්ල දාන්න’

රඹුක්වැල්ල මහතා බලාගෙ නම උන්නේය. කොල්ලාගේ දැණුම පුදුමය.

“ඒත් සර් ප්‍රින්සස් කෙනෙක් වගේ ඉන්න ඇක්ට්‍රස් කෙනෙක්ගෙත් පොඩි පොඩි අඩුපාඩු තියෙනවා. ඒවා දන්නේ ෆිල්ම් එකේ ඩිරෙක්ටර් නෙමේ. ඇක්ට්‍රෙස්ව මේක් අප් කරන මේක් අප් ආටිස්ට්. එයා

නිළියගේ තියෙන පොඩි පොඩි අඩුපාඩු ලස්සනට නොපේරෙන්න වහලා එයාව ආයෙත් ප්‍රින්සස් කෙනෙක් කරනවා. ඒකයි මම කියන්නේ. හැමදාම දකින දේ අඩුපාඩු පේන්නේ නෑ. ඒත් පිටින් ඉන්න කෙනෙක්ට ඒක හොඳට පේනවා. ඒකට ටිකක් එයාව ක්ලෝස්ලි ස්ටඩි කරන්න ඕන. හරියට අර මේක් අප් ආටිස්ට් ලස්සන ඇක්ට්‍රස්ට කරනවා වගේ”

දේවක සන්සුන්ව කීවේය. ඇවිත් ඉන්නේ සාමාන්‍ය කෙනෙක් නොවන බව දැන් රඹුකැවැල්ල මහතා දනී. කොල්ලා කියන දේවල් ඇත්තය. තර්කානුකූලය.

“දේවක කියන්නකෝ.”

නේත්‍රා කීවාය. ඇයටත් ඕනා

කොල්ලාගේ කටින් මේ කතාව අසාග න්නටය. එහෙම හැම කෙනාටම ඇහුම්කන් දීගෙන ඉන්න ආසාවක් එන්නේ නැත.

"මට මිස් සීගිරි එකට ඇතුල්වෙච්ච හැටියේම දැනිච්ච දේ තමයි චුට්ටක් පාළුයි කියලා. මොකක්ද සිරියක් අසිරියක් නැති ගතියක් පෙනුනා. මම හිතන විදිහට මිස් සුපර් මාර්කට් එකක් ඇතුලේ පොඩි කානිවල් එකක ගතියක් තියෙන්න ඕන. එහෙන් මෙහෙන් අතරින් පතරින් බැබලෙන ගතියක්. මම කියන්නේ මේ ලයිට්ස් දාන්න ඕන කතාවක් නෙමේ. අපි කියන්නේ සෝබාව දේ මෙපුර සිරි විසිතුරු බලන් මිතුරු මඟ පියකරු වූ. කියලා. මේක එකම සල්පිළක් වෙන්නෝන මිස්. එක එක කතන්දර

සුපර් මාර්කට් එක ඇතුලේ තියෙන්න ඕන. මල්ටි ස්ටෝරීස් තැනක්. සිල්ලර කඩේ වගේ එක සිම්පල් ස්ටෝරි එකකින් සුපර් මාර්කට් එකක් රන් කරන්න බෑ මිස්. කතාව පාට කරන්නම වෙනවා"

"කියන්න බලන්න එකක් දෙකක්."

නේත්‍රා කීවාය.

"සීගිරි එකේ ස්ටාෆ් එක ඔහේ තැන තැන හිටියේ මිස්. එහෙම කියලා එයාලා සේල් එක ප්‍රමෝට් කරන්නේ නෑ. මම එදා දැකපු විදිහට දොළොස් දෙනෙක් හිටියා එහෙම කැරකි කැරකි. ඒ අය අතරින් හතර දෙනෙක් හිටියේ මොබයිල් කෝල්ස් වල. ඒ ශ්‍රමය සර් අපරාදේ කියලා මට හිතෙන්නේ. එක්කෙනෙක්ව අපට දාන්න පුළුවන්

ස්පෙෂල් වෙජිටබල් ඔයිල් එකක් ප්‍රමෝට් කරන්න. ඔයිල් කම්පනි එකට කතාකළොත් එයාලා අපිට සම්පූර්ණ සහය දෙයි. අපි ටේබල් එකක් දානවා සර්. එතන ලස්සනට පොඩි ගෑස් එකක් තියලා අපි ඔයිල් පෑන් එකක් රත්කරලා මොනවාහරි පොඩි දෙයක් ෆ්‍රයි කරකර දෙනවා. ඒ ටේබල් එකේ පැත්තකින් අපි වෙජිටබල් ඔයිල් එකත් තියනවා. අපි හිතමු සර් අපි ෆ්‍රයි කරලා දෙන්නේ කට්ලට් එකක් කියලා. ඒ කොස්ට් එක අපරාදේ යන්නේ නෑ. එදාට අපිට වෙජිටබල් ඔයිල් දෙසීයක් තුන්සීයක් සේල් කරන්න පුළුවන්. තව මම දැක්කා අපි ගෙනාපු චිකන් සෑහෙන ප්‍රමාණයක් තියෙනවා. අපිට පුළුවන් ස්පෙෂල් චිකන් කරියක් හදන්න හවසට.

හදලා පොඩ් සාම්පල් එකකුත් කස්ටමස්ලට දෙන්න. මෙන්න මේ චිකන් වලින් හදපු කරිය කියලා. ඒ සුවඳින් සුපර් මාර්කට් එක පිරෙනවා සර් එතකොට. අපිට ස්පෙෂල් චිකන් කරියක් රුපියල් එකසිය පනහකට වගේ දෙන්න පුළුවන්. ලස්සන කප් එකක. හිතන්නකෝ එන දෙසිය දෙනෙක් මේ සුවඳ චිකන් කරිය ගත්තා කියලා සර්.. එතනම කලෙක්ෂන් එකට රුපියල් තිස්දාහක් ඇඩ් වෙලා. එක චිකන් කරියකින්. හිතන්නකෝ එතනම අපි පොල් රොටි හදනවා කියලා. අද රෑට පොල් රොටියි චිකන් කරියි කියලා බෝඩ් එකකුත් දානවා. මමනම් ගන්නවා සර්.. සීගිරි එකේ සබන් නම් ඇත්තෙම නෑ සර්. නමුත් අපිට යුනි ලීවර්ස්ලත් එකක් කතාකරලා ඒකත්

ප්‍රමෝට් කරන සේල්ස් ටේබල් එකක් දාන්න පුළුවන්. මම සීගිරි එකේ වෙජිටබල් කෝනර් එක අදත් දැක්කා සර්. කිසිම පිළිවෙලක් නෑ. බෙල් පෙපර් ළඟ අමුමිරිස්. අමුමිරිස් වලට පස්සේ තක්කාලි. ඊට පස්සේ මුරුංගා. ආයෙත් කොත්තමල්ලි කොළ. එහෙම ලස්සන නෑ සර්. උඩරට එළවළු ලස්සනට උඩින් තියන්න පුළුවන් අලුත් සදාල කොළ එක්ක බෙල් පෙපර් තත්කාලි කොත්තමල්ලි කොළ මින්චි සැල්දිරි තියන්න පුළුවන්. අපිට පුළුවන් එතනම කොස් කපන්න.”

“වට් කොස් කපන්න සීගිරි එක අතුලේ.”

මිහිරංග ඇසුවේය.

“ඔව් සර්. කොස් කපන්න අපිට ගෑනු කෙනෙක් හොයාගන්න පුළුවන්.

දවස් පඩියට. එයා බිම ලස්සනට පැඳුරක් දාගෙන බංකුවක වාඩිවෙලා කොස් ගෙඩි විස්සක් තිහක් දවසකට කපයි. කොස් මඳුළු වෙනම කොස් මැල්ලුම් වෙනම. සුපර් මාර්කට් එකට එන කෙනා කොස් මැල්ලුම් ගන්න ආයේ පොළට යන්නෝන නෑ නේ සර්. නේද? බලන්නකෝ ඒක කරලා එතන සෙනඟ පිරෙයි. මොකද කවුරු කොහොම කිව්වත් තවමත් අපි කන්නේ නියම සිංහල කෑම. කරවල හොද්දක් එක්ක කොස් මැල්ලුමක්. කිරි කොස් මාළුවක් එක්ක ගං කුකුල් මස් කරියක්. වෙජිටබල් සෙක්ෂන් එක වෙනම මාකට් එකක්. එතන පොඩි දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයක් කරන්න වෙනවා. හරිම ලේසියි. ඒ සිරිය අපට එතනට දෙන්න පුළුවන්නම් වෙජිටබල්

ගන්නම වෙනම කස්ටමර් රේන්ජ් එකක් හැදෙනවා. ෂැම්පූවලට වඩා අපිට වෙජීවලින් හොයන්න පුළුවන්. ඒකයි ඇත්තම කතාව. සියයයට එකසිය පනහක් ලාබයි”

මිහිරංග සිනාසුණේ සමච්චලයෙනි. ඒත් කෙල්ල ඒක මවාගත්තාය. ‘ඔයා කොහොමද මෙහෙම හිතුවේ’ භාවනා සිතුවාය.

“තව පුතා.”

රඹුක්වැල්ල මහතාගේ මුවින් ඒ වදන් පිටවිය. සීයා කොල්ලාට පුතා කීවේ නිකමට නොවන බව නේත්‍රා දනී. භාවනා බැබලෙන දෑසින් නේත්‍රා දෙස බැලුවාය.

“මම සර් සැටඩේ සීගිරි එකේ තිබ්බ බටර් කේක් එකක් ගත්තා සර්. හවසට ප්ලේන්ටියක් හදාගෙන

කන්න. ඒක නියම කෑමනේ සර්"

කොල්ලා ඒක ලස්සනට කීවේය. රඹුක්වැල්ල මහතා සිනාසුනේ ඔහුද බටර් කේක් සමඟ ප්ලේන්ටී බොන්න ආස නිසාය. භාවනා සීයාගේ දෙතොලතර ඇඳුණු ලස්සන සිනාව දැක්කාය. 'ඔයා ෂොක්නේ' ඇය සිතුවාය.

"ඒත් සර් ඒ ආශාව එතනම ඉවරයි."

'එයා එදා ගත්ත බටර් කේක් එකේ ඩේට් එක්ස්පයර් ඒකනේ එදා මට රහසින් කිව්වේ' භාවනා සිතුවාය.

"ඇයි?"

නේත්‍රා ඇසුවාය.

"බටර් කේක් එකේ ඩේට් එක්ස්පයර් සර්. දවස් තුනක් වෙනවා

එක්ස්පයර් වෙලා. මට පුදුම හිතුණා කවුරුවත් මේවා චෙක් කරන්නේ නැද්ද කියලා. පුස් ගඳ ගහන කේක් එකක් සර් තිබ්බේ. එක ලේඩි කෙනෙක් ඩේට් බලන්නේ නැතුව කේක් එක ගත්තා මට දුක හිතුණා එළියට ගියානම් හොඳ නැති නිසා මම මිස් කෙනෙක්ට කිව්වා ඒක අයින් කරන්න කියලා කැෂියර් එකේ.”

දේවක කීවේ භාවනා ගැන සඳහන් කරන්නේ නැතුවය. ‘ඇයි ඔයා මට කිව්වා කියලා කිව්වේ නැත්තේ.’ එහෙම කිව්ව එක හොඳයි කියා ඇයද සිතුවාය.

“සීගිරි එකට එනකොටම සර් ලොකු රැක්ස් තියලා වීව් එක බ්ලොක් කරලා. එන කස්ටමර්ට එකපාරම එයාපෝට් ටර්මිනල්

එක වගේ සුපර් මාර්කට් එකේ වීව් එක පේන්න ඕන. නමුත් සීගිරි එකේ වීව් එක බ්ලොක් කරලා. රැක්ස් මැදම තියලා. එහෙම බෑ. අපි මේ සැණකෙළිය එකපාරම දෑස් නිලංකාරවෙන්න එයාලට පෙන්නන්න ඕන. එයාව එතකොට තමයි වශීවෙන්නේ. ඒ වශීය වැඩකරනවා සර්. සර්ට මේක මම කියන්න ඕන නෑ. සර් මේක හදලා තියෙන්නෙත් එහෙම තමයි. නමුත් සර් අලුත ගෙනා මනමාලිත් පස්සේ දැලි කුණු පෙරාගෙන ඉන්නවා වගේ සීගිරි එකේ අසිරියට මොකක්ද වෙලා"

කොල්ලා දිගටම කතාකරයි. කිසිවෙක් කතාවක් නැත.

"සීගිරි එකේ සර් ඉඩ ඕන තරම් අපිට ඕන එක මික්සරයයි අවන්

එකයි හොඳ බේකරි වැඩ දන්න දෙන්නෙකුයි විතරයි අපිට ෂෝක් බේකරි කෝනර් එකක් පටන් ගන්න පුළුවන්. උදේට රස මාළු පාන්. හවසට උණු උණු අච්චු පාන්. කර කර ගා හැපෙන රෝස් පාන්. ඩයබිටික් අයට රසම රස කුරක්කන් පාන්. එතකොට දවස ගානේ දාන බටර් කේක්. චොකලට් කේක්. ඩෝ නට්. එක පාන් ගෙඩියක් බේක් වෙන සුවඳ ඇති සර් මේ සීගිරි එක පුරවන්න. පාන් පිච්චෙන සුවඳ තරම් මිහිරි සුවඳක් තවත් නෑනේ සර්. ඒත පුදුම සෙන්ට් එකක්නේ සර්"

කොල්ලා කියන විදිහට රඹුක්වැල්ල මහතාගේ කටට කෙළත් ඉනුවේය. ඇත්තය. උණු උනු පාන් සුවඳ හරිම මිහිරිය. බේකරියක් ළඟින් ගියත් ඇතිය.

"ඒකෙන් සර් කලෙක්ෂන් එකට තව රුපියල් පහළොස් දාහක් විසිදාහක් එකතු කරන්න පුළුවන්. හවසට සර් මේ පාරේ ලක්ෂ ගාණක් යනවා. මේ කා පාක් එක තියෙන්නේ පාර අද්දර. කා පාක් එක නිකං ක්‍රිකට් ග්‍රව්න්ඩ් එකක් වගේ ලොකුවට තියෙනවා. මෙහේ කූල් කබඩ් වල චිකන් කකුල් නිකං එක්ස්පයර් වෙනවා."

"ඉතින්."

මිහිරංග ඇසුවේය.

"ඉතින් සර් අපි දාමුකෝ චිකන් කකුල් දෙසීයක් විතර දාලා හවසට බාබකියු එකක් එළියේ. ලොකු පන්දම් හයකුත්ගහලා. මේ කොල්ලෝ දෙන්නෙක් ඇතිනේ. බේකරි සෙක්ෂන් එකෙන් නියම බන් දෙනවා. බන්

දෙකයි ග්‍රිල් කරපු චිකන් කකුලයි වෙජිටබල් සැලඩ් එකයි සෝස් කප් එකයි. රුපියල් හාරසීයයි. සෙනඟ ඇදෙයිනේ. නිකං මොකටද සොසේජස් එක්ස්පය වෙලා අහක දාන්නේ. මම ආපු දවසේ එහෙම ගොඩක් අහක දැම්මා. මීට් සෙක්ෂන් එකෙන්. මම දැක්කා. ඇයි එහෙම එක්ස්පය වෙනකල් ඉන්නේ අපි දානවනේ හොඳ සොසේජස් බන් එකක්. අඩුවට අම්මලා පොඩි උන්ට අරන් දෙයිනේ යන ගමන්. දාමුකෝ සෝස් රැල් රැල් හිටින්න”

මිහිරංග කට අයාගෙන උන්නේය. භාවනා දැන් එකක් දනී. ‘ඔයාව සීයා අරන් ඉවරයි දේවක. ඒක ෂුවර්. මම දන්නවා සීයා ගැන’ භාවනා සිතින් කීවාය.

"අද සුපර් මාර්කට් එකට බල මාළු ආවද කියන්න සර්."

දේවක ඇසුවේය. 'ඔයා පුදුම දේවල් අහන්නේ' භාවනා සිතුවාය.

"ආවද මිහිරංග?"

රඹුක්වැල්ල මහතා ඇසුවේ මිහිරංගගෙනි. සේල්ස් බලන්නේ ඔහුය.

"දවසගානේ එන්නේ නෑනේ සීයා. මොකටද දැන් මෙතනට බල මාළු."

"නෑ සර් මට ආපු ප්‍රයිස් එක දැනගන්න."

"කීයද ආපු ගාණ මිහිරංග."

රඹුක්වැල්ල මහතා යලිත් ඇසුවේය. 'එයා දන්න බල මාළු ප්‍රයිස් එක.'

"මට මතක නෑ සීයා. කීයක් එනවද?"

දේවක ටික වෙලාවක් මිහිරංග දෙස බලාගෙන උන්නේය. 'මූ මොකෙක්ද මේ. මං දිහා බලාගෙන ඉන්නේ.' මිහිරංග සිතුවේය.

"අද සර් බල මාළු කිලෝ එකක් රුපියල් හාරසිය පනහයි. මම බලාගෙන ආවේ. හොඳ මාළු තොග අද මාළු මාකට් එකට ඇවිත් තියෙන්නේ. අපිට කෑලි කපපු බලමාළු අද ගන්න පුළුවන් සර් පන්සීයකට. හොඳ රතු මාළු කුට්ටිය"

"ඔව් දේවක. ඒත් මොකටද?"

නේත්‍රා ඇසුවාය.

"අපි දානවනේ මිස් ෆිෂ් සෙක්ෂන් එක ළඟ ඇඹුල් තියල් ටේබල් එකක් අලුත් මැටි ඇතිළි පන්සීයක් ගෙනත්. අපි ඇඹුල් තියල් පේස්ට්

එකක් හදලා දානවා එක දිගට බල මාළු ඇඹුල් තියල්. අපිට එක ඇඹුල් තියල් ඇතිළියක් මාකට් කරන්න පුළුවන් හාරසීයකට ඒත් අපි දෙනවා තුන්සීයකට. හොඳට ලාබයි ඒකෙන් ෆිෂ් සෙක්ෂන් එකත් ප්‍රමෝට් වෙනවා. කලෙක්ෂන් එකත් වැඩිවෙනවා. එහෙම කරන්නේ කලෙක්ෂන් එක නිසාම නෙමේ. අර අපි කියපු අසිරිය මේක ඇතුලේ හදාගන්න ඕන නිසා. නිකං මීගමුවේ මාළු මාකට් එකේ තියෙන කලබලය අපි මෙතන පොඩියට මවන්න ඕන. ඒකට කස්ටමර් ආසයි. ඒ දඩිබිඩියට. මෙතන නැත්තේ ඒක. ටීවී දහයක් දාලා හිරුයි දෙරණයි ඔහේ දදා තිබ්බා කියලා ඒ අසිරිය එන්නේ නෑ මිස්"

බලාගෙන උන්නාය. 'ඔයා කොහෙද හිටියේ මෙච්චර කල් දේවක.' ඇය ඇසුවේ සිතිනි.

"මේ සීගිරි එක මාස තුනකින් ගොඩගන්න පුළුවන් සර්. ඒක කරන්නම පුළුවන්. සීගිරි එකට සෙනඟ අඩුවුනේ මේ වැඩිවෙච්ච අනිත් සුපර් මාර්කට් නිසා නෙමේ. මේක ඇතුලේ කතන්දරයක් නිසා. සීගිරි එකේ හොඳ පර්ෆියුම් නෑ. සබන් නෑ. මිල්ක් පවුඩර් නෑ. අලුත් සෝස් වර්ග කිසිම දෙයක් නෑ, තායි චිලී සෝස් එක නෑ. එතකොට ගාලික් චිලී සෝස් එක නෑ. ඩාක් සෝයි එක නෑ. චයිනිස් වයින් විනිගර්එක නෑ. එක ෆොරින් පර්ෆියුම් එකක් නෑ. මොයිස්චරයිසින් ක්‍රීම් එකක් නෑ. ගානියර් කන්ඩිෂනර් එක නෑ. ඒක ඕනමයි. කොනේඩ් කලර් කරන අයට

ගාන්න කියන්නේ ඒක සර්. එතකොට සැනිටරි පෑඩ් තියෙන්නේ එක වර්ග යයයි. ඒකත් ලූප් වර්ගය. ඒත් ගෑනු ළමයි වැඩියෙන් යූස් කරන අලවන වර්ගය නෑ."

මේ නිරීක්ෂණය පුදුමාකාර යැයි භාවනාට සිතුණි. ඔහු සීගිරි එකේ උන්නේ පැයක් එකහමාරක් වැනි කාලයකි. ඒ කාලය තුළ ඔහු මේ සියළු වැරදි හඳුනාගත්තේ කෙසේද? ඔහු කියන්නේ ඇත්තය. කිසිවෙක් දැන් ලූප් සනීපාරක්ෂක තුවා පාවිච්චි කරන්නේ නැත.

"සීගිරි එකට ෆිෂ් සප්ලයි කරන කෙනා කවුරුහරි මෙතනට කරන්නේ ලොකු වංචාවක්. මිනිස්සු හැමදාම හොයන්නේ එකම විදිහේ මාළු වර්ග ටිකක් සර්. තලපත් කෙලවල්ලෝ

පරව් තෝර වගේ ලොකු මාළුයි හුරුල්ලෝ සාලයෝ සුද්දෝ පරා පැටව් හාල් මැස්සෝ වගේ පොඩි මාළුයි. ඒත් සීගිරි එකේ ගිය සෙනසුරාදා තිබුනේ හුරුල්ලෝ හතර පස් දෙනෙක් විතරයි. අනිත් සේරම පියා මැස්සොයි සූඩයොය් ගල් මාළු වර්ගයකුයි තව මොනවද වගයකුයි. එහෙම ෆ්‍රිෂ් කවුන්ටරයක් කරන්න බෑ සර්. නොදන්න  මාළු කවුද ගන්නේ”

දේවක මේ සියල්ල බියක් නැතුව කීවේය. මිහිරංග උන්නේ සද්ද නැතිවය. මාළු සප්ලයි කරන්නේ මාකට් එකේ නන්දනය. ඔහු දාන මාළු ගැන මිහිරංග බලන්නේ නැත. එහෙත් මාසයකට සැරයක් නන්දනගෙන් එන කොමිෂන් එක වෙලාවට ඔහු ගනී.

"හොඳට යන හාල් වර්ග සර් විස්සක් විතර තියෙනවා සුදු කැකුළු සම්බා කැකුළු රතු කැකුළු රතු සම්බා කැකුළු කීර සම්බා සූදුරු සම්බා එතකොට නිපුන සුපිරි සම්බා කීර කැකුළු. මාතර රතු තිස්ස රෝස කැකුළු. ඒ මොනවත් අපි ළඟ නෑ සර්. ඇයි එහෙම වුනේ කියලා දන්නේ නෑ. තියෙන්නේ සුණු සහල් වගේ කැඩිච්ච සම්බා හාලකුයි එලොවටත් නැති මෙලොවටත් නැති කැකුළු හාලකුයි. හාල් සප්ලයි කරන අය ඕනතරම්නේ සර්. අපිට හොඳ කොමිෂන් එකක් ගන්න පුළුවන්. අනික අපි වැඩිපුරම කන්නේ බත්නේ. ඒත් සීගිරි එකේ වැඩිපුරම තියෙන්නේ ඉටිපන්දම්. රැක් එකක් පුරවලා ඉටිපන්දම්. මේ පැත්තේ ලයිට් යනවද බකට් පත්තු කරනවද

කියලා මම දන්නේ නෑ"

භාවනා තොල්පට තදකරගත්තාය. මේ සියල්ල ඇත්තය. කෙල්ලට පුදුම ඔහුගේ දැණුම ගැනය. 'එයා කියන්නේ ඇත්ත පෑඩ් පැකට් එකක් ඕනවුණාම මමත් පිටින් ගෙන්න ගන්නේ. අපි ළඟ අලවන එක නෑ. පෑඩ් පැකට් එක ගැනත් එයා දන්නවා මාතර කැකුළු ගැනත් දන්නවා. පුදුම ඒකනේ'

"සීගිරි එක සති දෙකක් වහන්න ඕන සර්. මම හිතන දේ. වහලා අපි අලුතින් පටන් ගන්න ඕන. අලුත් විදිහකට එන කෙනාට හිතෙන්න ඕන දැන් තියෙන්නේ අලුත් වෙච්ච එයාලා ගැන හිතන එයාලට ඇත්තටම සුපිරි දේ දෙන

සීගිරි එකක් කියලා එළියේ යන කෙනාට හිතෙන්න ඕන. නේද සර්? එයාට හිතෙන්න ඕන මේක ඇතුලේ මොකක්ද වෙනවා කියලා. ඒක දකින්න තමා එයා එන්නේ. ඒ නිසා මේක ඇතුලේ සර් අපිට මොනවා හරි කරන්න වෙනවා බැබලෙන දෙයක්. තරු විසිවෙන දේවල් ටිකක්. කීල්ස් තිබුණාට වෙන සුපර් මාර්කට් තිබුණාට මේක බහින්න හේතුවක් නෑ සර්. හැම එකකටම මාකට් ෂෙයා එකක් තියෙනවා. භෘතිය සන්තුෂ්ලට කැමති අය ඉන්නවා. ඒ රටේම අජිත් මුතුකුමාරණය අස අයත් ඉන්නවා. ඔය අතරේ මරියසෙල්ට ආස අය ක්ලැරන්ස්ස අදහන අයත් ඉන්නවා. ඒ වෙනස තියෙනවා. සීගිරි එකට වෙනම මාකට් ෂෙයා එකක් තියෙනවා. මෙතන ඇතුලේ

මොනවාහරි කරන්න වෙනවා. දේදුණු වර්ණ දෙයක්. අපේම දෙයක්. ඒ කලබල සැණකෙළිය මැව්වොත් අපිට ගොඩ එන්න පුළුවන් සර්. එහෙම වුනොත් ෂැම්පූ එක ගන්න එන කෙනා මෙහෙන් යන්නේ ඒක අමතක වෙලා වෙන දේවල් ටිකක් අරගෙන. දැනටනම් එහෙම දෙයක් නෑ සර්. තියෙන්නේ දවස් තුනක් පරණ වෙච්ච වෙජිටබල් ටිකකුයි කුණුවෙච්ච පොල් ගෙඩි දාසයකුයි කැඩිච්ච හාල් ටිකකුයි එක්ස්පය වෙච්ච කුකුල් මස් ටිකකුයි කිසිම බ්‍රෑන්ඩ් එකක් නැති බඩු ටිකකුයි මුඬු වෙච්ච පොල් තෙල් බෝතල් ටිකකුයි විතරයි සර්. සර් මාව මේ පෝස්ට් එකට ගත්තත් නැතත් මේ ඇත්ත සර්ට කියලා යන්නයි මම ආවේ”

දේවක ඔහුගේ කතාව නිමාකළේ

එසේ කියාය.

"සීගිරි එක."

මිහිරංග මොකක්ද කියාගෙන ආවේය.

"මිහිරංග ඉන්න."

රඹුක්වැල්ල මහතා මිහිරංගව නැවැත්තුවේය. භාවනාට පුදුම නැත. ඇයගේද පපුව තිබුනේ හිරවීය. නොවේනම් හිරිවැටීය. පපුවට එහෙම කම්පනයක් දැනුනේ කාළාන්තරයකට පසුවය. පුදුමය. ඇත්තටම පුදුමය.

රඹුක්වැල්ල මහතා ටික වෙලාවක් ඔහුගේ අතේ තිබූ පෑනෙන් දේවකගේ ඇප්ලිකේෂන් එක මතට තට්ටු කරමින් උන්නේය.

"දේවක."

රඹුක්වැල්ල මහතා කතාකළේ ගැඹුරු හඬකිනි. දැන් ඔහුට තිබුනේ

එක ප්‍රශ්නයක් පමණි. ඔහු මේ අහන්න යන්නේ ඒකය.

"ඔව් සර්."

දේවක උන්නේ සාමාන්‍ය ලෙසටය. රඹුක්වැල්ල මහතා සිනාසුනේය. දේවකද සිනාසුනේය.

"පුතා කොහෙන්ද ඔය ෂර්ට් එක ගත්තේ?"

දේවක ලැජ්ජාවෙන් මෙන් සිනාසී බිම බලාගත්තේය.

"මේ සර් මම ෆැෂන් කලෙක්ෂන් එකෙන් ගත්තේ. මේ ඉන්ටවීව් එකට එන්නම කියලා."

කොල්ලා අවංක ගැයි රඹුක්වැල්ල මහතාට යලිත් සිතුණි. නේත්‍රා එක බැල්මකින්ම දේවක දෙස බලාගෙන උන්නාය. භාවනාගේ හදවතට මොකක්ද සැනසීමක්

දැනෙයි. 'සීයා ඔයාව අරන් ඉවරයි දේවක. බයවෙන්න එපා. මයි කන්ග්‍රැජුලේෂන්ස්' ඇය දැන්මම ඔහුට සිතින් සුබ පැතුවාය.

"පුතා සීගිරි එකට එනවා නම් කොච්චර සැලරි එකක් බලාපොරොත්තුවෙනවද?"

රඹුක්වැල්ල මහතා ඇසුවේය. 'අනේ දෙයියනේ ඔයා ලොකු සැලරි එකක් කියයිද දන්නේ නෑ දැන්. අපිට ගෙවන්න බැරිතරම් ලොකු ගාණක්.' භාවනා සිතුවාය.

"මම සර් එහෙම සැලරි එකක් බලාගෙන ආපු ගමනක් නෙමේ මේ. සීගිරි එකෙන් මේ පෝස්ට් එකට දෙන සැලරි එක මොකක් උනත් මම ඒක බාරගන්න ලෑස්තියි. ඒක එච්චර ලොකු දෙයක් නෙමේ. මම මේ

චැලේන්ජ් එක බාරගන්න ආසයි සර්. මගේ පළවෙනි රස්සාව”

දේවක කීවේය. නේත්‍රාට පුදුමය.

“මේකයි දේවක. එහෙම බෑනේ. අපි කෙනෙක්ව අපොයින්ට් කරන්නේ සැලරි එක ගැන කතාකරලා. ඔයාගෙන් නෙමේ අපි හැමෝගෙන්ම අහනවා. සාමාන්‍ය වර්කර් කෙනෙක් ගත්තත් එහෙමයි එක්සකටිව් කෙනෙක් ගත්තත් එහෙමයි. කියන්න. ප්‍රශ්නයක් නෑ.”

නේත්‍රා කීවාය. දේවක සිනාසුනේය. ‘ඒකටත් හිනාවෙනවනේ මේ පිස්සා. හිතාගෙන ඉන්න සැලරි එකක් කියන්නනේ තියෙන්නේ’

“නෑ මිස්. මට එහෙම ලොකු සැලරි එකක් අවශ්‍ය නෑ. මම ආවේ මේ එක්ස්පීරියන්ස් එක ගන්න. ඒක

රුපියල් හත් අට දාහක් උනත් දහ දොළොස් දාහක් උනත් ප්‍රශ්නයක් නෑ."

දේවක පැහැදිලිව කීවේය. 'ඔයා හරි පුදුම කෙනෙක්නේ. ඇයි එහෙම කිව්වේ.'

"දේවක ට්‍රාන්ස්පෝට් මොනවාහරි බලාපොරොත්තු වෙනවද?"

රඹුක්වැල්ල මහතා ඇසුවේය. සමහරු එහෙමය. ආපු ගමන් වාහන බලාපොරොත්තු වෙයි.

"මම මේ එහා පැත්තේ ඉන්නේ සර්. අතුරුගිරිය බස් එක යන්නේ අපේ ගේ ඉස්සරහින්. මට ඒකේ එන්න පුළුවන්. මට ඒ ඇති. මට දෙන සැලරි එකයි වාහනයි ගැන නෙමේ සර් ප්‍රශ්නේ තියෙන්නේ. මෙතනට ඇවිත් මට කරන්න තියෙන

දේයි"

රඹුක්වැල්ල මහතා සිනාසුනේය. කළාතුරකින් දුර්ලභ අය ලැබෙයි. ඔහුට සිතුනේ එහෙම දෙයකි.

"හොඳයි දේවක. අපි ඔයාට පුතා අද හවස කෝල් එකක් දෙන්නම්. ම්. එහෙම වුනොත් ඇවිත් මාව හම්බවෙන්න හෙට."

රඹුක්වැල්ල මහතා කිවේය. දේවක ප්‍රසන්න ලෙස සිනාසුනේය.

"හොඳයි සර්. මට මේ වෙලාව දුන්න එකට සර්ට ගොඩක් ස්තූතියි. තැන්කියු මිස් තැන්කියු සර්."

දේවක සියල්ලන්ටම කීවේය. ඔහු අවසානයට බැලුවේ භාවනා දෙසය.

"තැන්කියු මිස්."

ඔහුගේ දෑස්වල මොකක්ද දිස්නයක් තියෙනවා භාවනා

දැක්කාය.

"පුතේ දේවකගේ ෆෝන් නම්බර් එක ගන්න."

රඹුක්වැල්ල මහතා කීවේය. භාවනා පෑන අතට ගත්තාය.

"මම ඇප්ලිකේෂන් එකේ දාලා තියෙනවා මිස්. අප්පච්චිගෙයි මගෙයි දෙන්නගෙම නම්බර්ස් තියෙනවා. උඩින්ම තියෙන්නේ මගේ නම්බර් එක මිස්"

භාවනා හිස වැනුවාය. ඔහු යන දෙස සියල්ලන්ම බලාගෙන උන්නෝය. එහෙත් මිහිරංග පමණක් උන්නේ වෙන සිහියක මෙන්ය.

"අවුරුදු විසිපහක මගේ බිස්නස් ජීවිතේ මෙහෙම කොල්ලෙක්ව මම මේ දැක්කමයි ලොකු පුතේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මටත් හරි පුදුමයි සීයේ. අපිටම තෝරලා වචලා වගේ නේද?"

භාවනාගේ පපුවට මොකක්ද වූවාක් මෙන්ය.

"මේ නිකං භාල් පාරුවෙක් සීයේ. ඉන්ටර්නෙට් එකට ගියාම මේ වගේ අයිඩියා දාස් ගාණක් හොයාගන්න පුළුවන්. ඒ ටික කට පාඩම් කරගෙන ඇවිත් ඔය කිව්වේ. මෑන් දන්න මාකටින් එකක් නෑ."

මිහිරංග කීවේය. ඒ තරම් කැත කතාවක් තවත් නැතැයි භාවනාට සිතුණි.

"මිහිරංග."

රඹුක්වැල්ල මහතා කතාකළේ ගැඹුරු හඬකිනි.

"ඔයාට එහෙනම් මීට කලින් ඉන්ටර්නෙට් එකෙන් ඒවා

හොයාගෙන ඇවිත් අපිට කියන්න තිබුණානේ. මේ කොල්ලා කියපු දේවල් ටික කරන්න තිබුනනේ. මම හිතන්නේ නෑ සුපර් මාර්කට්වල කොස් විකුණන කතා ඉන්ටර්නෙට් එකේ තියෙනවා කියලා. ඇරත් අද බල මාළු ප්‍රයිස් එක අරගෙන ඒකෙන් ඇඹුල් තියල් හට්ටි පන්සීයක් හදන කතාවක් ඉන්ටර්නෙට් එකේ නෑ. නේද?”

මිහිරංගට කට උත්තර නැති විය. භාවනා ඇගේ මුවට ආ සිනහව මැඩගත්තේ හරිම අමාරුවෙනි.

“සීයේ”

කතාකළේ නේත්‍රාය.

“කියන්න ලොකු පුතේ.”

රඹුක්වැල්ල මහතා කීවේය.

“අපි හොයපු කෙනා අපිට ලැබුණා. ඩන්. ඒ ගැන සැකයක් නෑ.

අපි මේ කොල්ලව ගන්නම ඕන. පුළුවන්නම් හෙටම. පරක්කු කරන්න බෑ"

භාවනාට මොකක්ද විය. අක්කා එහෙමම කියාවී යැයි ඇය සිතුවේ නැත.

"ම්. මම අරගෙන ඉවරයි ලොකු පුතේ දේවකව. කොල්ලව අපොයින්ට් කරන්න විතරයි දැන් තියෙන්නේ."

රඹුක්වැල්ල මහතා කීවේය. දේවකගේ අංකය ගෙන ඔහුට දැන්මම මේ සුබ පණිවිඩය එස් එම් එස් කරන්නට තරම් ඇයට සිතෙයි.

"ඔයා මැණික මොකද කියන්නේ?"

රඹුක්වැල්ල මහතා ඇසුවේය. කෙල්ල කොල්ලාට උඩින්ම කැමති බව නේත්‍රා දනී.

"මේ ආවේ සීයේ."

"ම්."

"නෑ මම කියන්නේ."

"හරි පුතේ ඔයාට හිතෙන දේ කියන්න. ප්‍රශ්නයක් නෑ."

'මොකද මේකී කෙකරගාන්නේ' මිහිරංග සිතුවේය.

"නෑ මේ ආවේ සාමාන්‍ය කෙනෙක් නෙමේ සීයේ. මට එහෙම හිතෙනවා. මට තියෙන බය එයා ඇත්තටම සීගිරි එකට එයිද කියලයි. මේ ලොකු සුපර් මාර්කට් කම්පනි එකක් එහෙම එයා ගැන දැනගත්තොත් ලොකු ගාණක් දීලා උස්සනවා. මට තියෙන බය එහෙම වෙයිද කියලයි. අඩුම ගානේ ලක්ෂයක් දීලා හොඳම වාහනයක් දීලා එයාව ගන්නවා. මේ දැණුම හරිම රෙයා සීයා. සීයා කිව්වේ ඇත්ත. බල මාළු ඇඹුල්

තියල ගැනයි කෙල්ලෝ අඳින අලවන සනීපාරක්ෂක තුවා ගැනයි කොස් කපන එක ගැනයි එකම ඔළුවක නෑ"

භාවනා කීවාය. 'රෙද්ද තමයි' මිහිරංග සිතින් කිවේය. ඒත් රඹුක්වැල්ල මහතා හිස වැනුවේය. ඔහුටත් තිබෙන බය ඒකය.

"ම්. එහෙම අයව එයාලට රත්තරන් වගේ පුතේ. මේ සාමාන්‍ය කෙනෙක් නෙමෙයි තමයි. මොකක්හරි දෙයක් කොල්ලගේ තියෙනවා."

"එහෙම වෙන්න කලින් අපි ද්වේකව සීගිරි එකට ගමු සීයේ."

"ම්. අපි අනිත් අයවත් ටිකක් බලමුකෝ. හරවලා යවන්න බෑනේ"

"කොලිෆිකේෂන්ස් තියෙන උන් ටික එළියේ ඉන්නේ සීයේ. බලන්නකෝ."

මිහිරංග කීවේ දැඩි අප්‍රසාදයකිනි. දේවකට දුටු වෙලාවේ සිට මිහිරංගට ඔහුව රුස්සන්නේ නැත. 'මූ ආවොත් මෙතන අලි බුවා වෙන්න යයි.ඒවා කොහෙදසීගිරි එක අපේ.උඹට එහෙම වුනොත් දවස් දෙකයි එන්න දෙන්නේ.' මිහිරංග සිතාගත්තේය. ඒවට දෙන්නට හොඳ හොඳ කිරිපැණි ඔහු ළඟ ඇතැයි ඔහු සිතුවේය.

# 27

දේවක සීගිරි සුපර් හී කාර්යාලයෙන් පිටවූයේ යළිත් වතාවක් ඔහුගේ අම්මාගේ පින්තූරය දෙස බලාගෙනය. 'කියන්න තියෙන දේ මම කිව්වා අම්මේ. ඉතුරුටික තියෙන්නේ සීයගේ අතේ' දේවක සිතින් කීවේය.

කොල්ලා සීගිරි එකෙන් පිටවූයේ හැරී හැරී සීගිරි සුපර් එක දෙස බලමිනි. කැෂියර් එකේ කෙල්ලෝ

ටික ඕනාකමින් මෙන් දේවක දෙස බැලුවෝය. දේවක ඔවුන් හා සිනාසුනේ සුහද ලෙසිනි.

"යන්නම් නංගිලා."

දේවක කැෂියර් එකේ කෙල්ලෝ ටිකට කියාගෙන ගියෝය. කෙල්ලෝ ටික සිනාවූයේ කිචි බිචි ගාමිනි. 'සමහරවිට මාව ගන්න එකකුත් නෑ. අර හිටපු අනිත් සර් මාව කපන්නමයි බැලුවේ. මිස්ලා දෙන්නානම් එහෙම නෑ. ඔයානම් වචනයක්වත් කතාකළේ නෑ. පුදුමයි. මම හිතුවා මගෙන් මොනවාහරි අහයි කියලත්' දේවක සිතුවේය.

ඔහුට මඟ දිගට මැවෙන්නේම ඇයවය.

"ඔයාව මුළින්ම දකිද්දී මම හිතුවා මට කතාකරගන්නත් බැරිවෙයි

කියලා."

ඒත් එහෙම වූයේ නැත. කියන්නට හිතාගෙන උන් දේවල් හිතුවාටත් වඩා හොඳට කියවිණ. කොල්ලා අප්පච්චීට ඇමතුමක් ගත්තේ පාරට ආ පසුය.

"පුංචි මහත්තයෝ. මොකද වුණේ?"

දේවක කතාවම කීවේය.

"ෂා. මාරයිනේ. ඔයාව සීයා ගන්නවා පුතේ. මම එයා ගැන දන්නවා. එයාට ඔයාව නොගෙන බෑ ඔය ටික කිව්වට පස්සේ. එයා ආසම ඔය "

ජීවන් කීවේය.

"බලමු අප්පච්චි."

දේවක කීවේය.

"කවුද තව ඉන්ටව් බෝඩ් එකේ

හිටියේ?"

"මම කිව්වේ අප්පච්චි අර ලස්සන මිස් කෙනෙක් ගැන. එයා හිටියනේ ඉන්ටවිව් කරන බෝඩ් එකේ. තව අවුරුදු තිහක විතර මිස් කෙනෙකුත් හිටියා. තව ඔළු පොරකුත් හිටියා නිකං ලෝකල් බහුභූතයෙක් වගේ."

ඉන්ටවිව් බෝඩ් එකේ ඉන්නට ඇත්තේ මිලින්දගේ කෙල්ලෝ දෙන්නා විය යුතුය. අනිත් කෙනා කෝසලද නැත්නම් මිහිරංගද කියා ඔහුට හිතාගන්න අමාරුය.

"අපි බලමුකෝ මහත්තයෝ."

"ඔව් අප්පච්චි. අප්පච්චි සයිට් එකකද?"

"ඔව් පුතේ මේ වැල්ලවත්තේ. මොනවද දැන් දවල්ට කන්නේ."

දේවකට දුක සිතුණි. 'මම කන

එක ගැන විතරයි එයත් හිතන්නේ එයා කන්නේ නෑ’

“රවුමක් කැරකිලා තෝසයක් කාලාම යනවා අප්පච්චි. හවසට මම උයන්නම් මොනවාහරි.”

දේවක කීවේය.

“නැත්නම් මම ආප්ප අරන් එන්නද?”

“බත් ටිකක් කමු අප්පච්චි. මම හදන්නම්. අප්පච්චි එන්නකෝ”

දේවක කීවේය. යන්න කියා තැනක් නැත. ඒත් දේවක නිකමට ටවුම පුරා ඇවිද්දේය. දැන්මම කන්න බඩගින්නක් නැත. ඔහු පොත් හලකට ගොඩවී පොතක් බලන්නට ගත්තේය.

“ඇත්තටම මට එයාලා හවස කෝල් එකක් දෙයිද? නැත්නම් අර

ඇවිත් හිටපු අය අතරත් දක්ෂයෙක් ඉන්න බැරිද? එහෙම කෙනෙක්ව ගන්නත් පුළුවන්නේ.”

හැමදේම දෛවයට බාරදෙන්නට නොහැක. ඒත් මේ වගේ දේවල් දෛවයට බාරදෙනවා ඇරෙන්නට කළ හැකි අන් දෙයක් නැත. දේවක වෙලාව බැලුවේය. වෙලාව එකොළහට කාලය. හවස් වෙන්නට තව පැය පහක් හයක් ඇත. ජීවිතයේ ගෙවා දමන්නට අමාරුම පැය හතර පහ ඒක කියා දේවකට සිතුණි. ඒත් කරන්න දෙයක් නැත. ‘ගෙදර ගිහින් ප්ලේන්ටියක් හදාගෙන අමාරුවෙන් ඉන්නවා.’ ඔහු සිතුවේය.

දැන් තෝසේ කන්න හිතක් නැත. ඒ නිසා දේවක මඟ බේකරි හෝටලයෙන් රෝස් පාන් දෙකක්

අරගෙන ගෙදර ගියේය.

"එයාලා මාව මම කියපු දේවල් අනුව ගත්තේ නැත්නම් මම ආයෙත් වෙන මාර්ගයකින් සීගිරි එකට යන්න හිතන්නේ නෑ. මගේ ගමනක් මම යනවා."

දේවක සිතාගත්තේය.

*** *** *** *** ***

භාවනාත් නේත්‍රාත් රඹුක්වැල්ල මහතාත් උන්නේ සම්මුඛ පරීක්ෂණයට ආ 'සුපර් මාර්කට්' පප්පලාව ඉන්ටවීව්කර හති වැටීය. සමහරු ජනප්‍රිය සුපර් මාර්කට්වල අවුරුදු දහය දොළහ හිටි අයය. ඒ සුපර් මාර්කට් වාසනාවන්තය. ඒ මේ අය දැන් එහි නැති නිසාය.

‘මෙයාලා අස්වුණාට පස්සේ වෙන්න ඇති එයාලා මේ තරම් නැග්ගෙ’ භාවනාට සිතුණි. ඒත් සමහරුන්ව මිහිරංග පමණක් උනන්දුවෙන් ඉන්ටව් කරන්නට විය. ඔහුට ඒත්තු ගන්වන්නට ඕනා වූයේ මේ අය දේවකට වඩා කොච්චර දක්ෂද කියාය. ඒත් ඒ හැම විකටම ඔවුන් මොකක්හෝ භූතයක් කියෙව්වෝය. පල් වූයේ මිහිරංගවය.

“රූපරත්න තව කීදෙනෙක් ඉන්නවද අනේ.”

භාවනා ඇසුවාය. ‘කෙනෙක්ව තෝරගත්ත එකේ තව මොනවාද’ ඇයට සිතුනේ එහෙමය. එහෙත් රඹුක්වැල්ල මහතා ප්‍රතිපත්ති ගරුකය. ඔහු හැම කෙනෙක් සමඟම වචනයක් හෝ කතාකළේය.

"මිස්ටර් සෙනවිරත්න. මොකක්ද ඔයාට සේල්ස් ප්‍රමෝට් කරන්න යෝජනා කරන්න පුළුවන් අපිට."

රඹුක්වැල්ල මහතා ඇසුවේ ආ කෙනෙක්ගෙනි. ඔහු කණ්නාඩි දෙක ගැලවූයේ සෑහෙන බරපතල කතාවක් කියන්නට මෙන්ය.

"මිස්ටර් රඹුක්වැල්ල."

ඔහු කතාකළේ එහෙමය.

"ඔව්."

"ඇයි අපි ඇඩ්වටයිසින් අමතකම කරලා ඉන්නේ.  අපි ඒකට ලොකු බජට් එකක් හදන්න ඕන. කවුරුවත් සීගිරි එක ගැන දන්නේ නෑ. ඇයි ඒ. නෝ ඇඩ්වටීස්මන්ට්. නෝ ටීවී ඇඩ්. නෝ පේපර් ඇඩ්. කොහොමද කස්ටමර් දන්නේ සීගිරි එක ගැන. මමත් දැනගත්තේ මේ වේකන්සි එක

නිසා. යූ නෝ."

රඹුක්වැල්ල මහතාට දුක සිතුණි. ඔහුට සිහිවූයේ දේවකගේ කතාවය. 'සීගිරි එකේ එම් ඩීට සුපර් මාර්කට් කරන කලාව උගන්වන්න මට බෑ සර්. සීගිරි එක මම දන්න විදිහට පටන් අරන් තියෙන්නේ මම ඉපදෙන්නත් කළින්. ඒ වගේම ලංකාවේ අද සුපර් මාර්කට් කරන කම්පනි ඒවා ගැන හිතන්නත් කළින්' දේවක කීවේ එහෙමය. 'ඒ පොඩි එකා දන්නවා සීගිරි එක ගැන. මෙයා දන්නේ නෑ.' රඹුක්වැල්ල මහතා සිතුවේය.

"මිස්ටර් සෙනවිරත්න. අපිට ඇඩ්වටයිසින් කරන්න ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක් ඕන නෑනේ. ඇඩ් ඒජන්සියට කතාකළාම ඇඩ් කරනවා.

ඔයාට මොනවද කරන්න පුළුවන්.”

රඹුක්වැල්ල මහතා අසද්දී ආපු කෙනාට කට උත්තර නැතිවෙයි.

“අපි දන්නවලා එවන්නම් එහෙම වුනොත් ඇවිත් කතාකරන්න”

රඹුක්වැල්ල මහතා කියන්නේ කරුණාවෙනි.

“ඔක්කොටම කලින් සර් මේ සිගිරි කියන නම අයින් කරන්න ඕන.”

තව කෙනෙක් කීවේය.

රඹුක්වැල්ල මහතාට යකා නැග්ගෙ ය.

“ඒක කියන්නද මේ මහත්තයා ආවේ?”

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

“නෑ සර්. මේ නමේ කිසිම මොඩන් ගතියක් නෑ බලන්නකෝ කාගීල්ස් ෆුඩ් සිටි. කීල්ස් ලාෆ්ස්. කෝනල්ස්.

එතකොට"

"හරි ඇති."

ඔහුට යන්නට වූයේ ඔය කතාව නිසාය. කිසිම කෙනෙක් මේ සීගිරි එකේ සේල්ස් නංවන එක උපක්‍රමයක් කීවේ නැත. කිව්වේ අර පොඩි එකා පමණක් කියා රඹුක්වැල්ල මහතාට සිතුණි.

"ඒ අන්තිම කෙනා බේබි."

රූපරත්න කියද්දී භාවනාට සැනසීමක් දැනුණි.

"අම්මේ ඇති යන්නම්. මම සීයා වොෂ් රූම් එකට දුවලා එන්නම්."

කෙල්ල නැඟිට්ටේ එසේ කියාය.

"ඕක හිරකරගෙනම හිටියද පැටියෝ."

"මෙයාලා කියන ඒවට තව ටිකෙන් ඇඟේම යනවා."

කෙල්ල සිනාබරව කියාගෙන ගියාය. රඹුක්වැල්ල මහතා සිනාසුනේය. ටිකක් වෙහස වුවද ඔහුට අද සතුටු දවසකි.

"අපිට මුලින්ම ආපු කොල්ලා විතරයි හොඳ ලොකු පුතේ."

"ඒකනේ කොල්ලා මුළින්ම ආවෙත් සීයේ. අපි එයාව ගමු."

භාවනා දුවගෙන ආවේ සාරියත් හදමිනි. ඒ ටිකට මොනවද කිව්වේ කියා ඇය සිතුවාය. 'එයා ගැන මොනවාහරි කිව්වද දන්නේ නෑ'

"කොන්දත් රිදෙනවා සීයේ අදනම්."

රඹුක්වැල්ල මහතා සිනාසුනේය.

"අද වරුවක නිවාඩුවක් ගන්නකෝ එහෙනම්. අමාරුනම්"

භාවනා සිනාසුනාය. 'එහෙම

නිවාඩුවක් අරගෙන හිතන්නත් දෙයක් තියෙනවා වගේ අනේ' කෙල්ලට කියන්නට සිතෙන්නේ එහෙමය.

"මම තාම මට බාරදුන්න සෙක්ෂන්වල වැඩ බාරගත්තෙත් නෑ සීයේ. ස්ටෝරුව පැත්තේ ගියේ නෑ. සේල්ස් බැලුවෙත් නෑ. උදෙන්ම මේක තිබුණානේ."

"ඒ පත්වීම් සමහරවිට වෙනස් වෙන්න පුළුවන්. මම සීගිරි එක අලුතින්ම හදනවා."

රඹුක්වැල්ල මහතා කීවේය. 'සීයා එහෙම කියන්නේ එයා අරම කිව්වට පස්සෙද' මිහිරංග උන්නේ ජංගම දුරකථනයත් ගෙන යන්නට බලාගෙනය. ඔහුගේ හිතට අද එච්චර හරි නැත.

"සීයා කියන්නේ."

"අර ආපු දේවක කිව්වා වගේ පුතේ අපිට සතියක් විතර වහන්නත් වෙයි සමහරවිට සති දෙකක් විතර. එහෙම හොඳයි කියලා මටත් හිතෙනවා. තාත්තා එක්කත් කතාකරලා තීරණයක් ගන්න ඕන."

රඹුක්වැල්ල මහතා කීවේය. නේත්‍රා සිනාසුනාය.

"ඒක හොඳයි කියලා සීයේ මටත් හිතුණා මට සීයට කියන්න බය හිතුණා."

නේත්‍රා කීවාය.

"අපි බලමු."

රඹුක්වැල්ල මහතා නැඟිට්ටේ එසේ කියාය.

"මිහිරංග අයියේ මලීෂාට කියන්න අද කැෂියර් ක්ලෝස් කරන්න කියලා බලලා. මම අද ඒක බලන්නේ නෑ."

භාවනා කීවාය.

"දැන් සීයා කිව්වේ ඒවා චේන්ජ් කරනවා කියලා. බබාම බලන්නකෝ."

"තාම එහෙම කළේ නෑනේ මලීෂාට බලන්න කියන්න. මම කෙල්ලන්ට කියලත් ඉවරයි අයියේ."

භාවනා කීවාය. මිහිරංග නැඟිට්ටේ නළල රැළිකරගෙනය.

"මම එක දෙයක් විතරක් කියන්නම් අක්කේ."

මිහිරංග කීවේ මේසයට බරවීය. නේත්‍රා හිස වැනුවාය.

"හෙට අනිද්දා වෙද්දී සීගිරි එකක් නෑ. බලන්නකෝ. අනාග න්නවා කියන්නේ ලස්සනට අනාග න්නවා. බලන්නකෝ කොස් කපලා ඇඹුල් තියල් දාලා සීගිරි එකේ. කොහෙද යන හැළ ගෙම්බෙක් ඇවිත්

කියෙව්වා කියලා සේල්ස් නඟින්නේ නෑ. ඒවට වෙන මාකටින් වැඩ තියෙනවා. කොස් කපන්න. කපන්න ඕන උගේ."

මිහිරංග කුණුහරුපයක් කියාගෙන යන්නට හැරුණේය.

"මිහිරංග මල්ලී."

නේත්‍රා කතාකළාය. මිහිරංග හැරුණේය. භාවනා උන්නේ කේන්තියෙනි. 'තියෙන කුහකකම මේ'

"ඇයි."

"මේ සීගිරි එක මල්ලී එහෙම ලේසියෙන් වහන්නේ නෑ වැහෙන්නෙත් නෑ වැහෙන්න දෙන්නෙත් නෑ. කොස් කපලා නෙමේ. පොල් ගාලා හරි අපි මේක ගොඩගන්න ඕන. මේක අපේ. අලුත් අදහස්වලට එන්න ඉඩදෙන්න

ඕන ඒවා අපි ළඟ නැත්නම් අපි ගෙවලා හරි ඒ අදහස් ගන්න ඕන. ඒකයි ක්‍රමේ. සිද්ධාලේප මාකට් කළේ සිරීපාදේ යන මිනිස්සුන්ට සීතලට සිද්ධාලේප නළලේ ගාලා නල්ලතන්නියේදී. ඒවා තමයි පත්තුවෙන්නේ. නැතුව වෙන මාකටින් නෑ මේක සිංහල රටක්. අපිට හරක් මස් කපලා අද්දන්න බැරි මාකට් එකක් කොස් කපලා අද්දන්න පුළුවන්. අර පොඩි එකා ඇවිත් කිව්වේ ඒක. එයා මාකටින් ඉවක් තියෙන හොඳ සිංහල කොල්ලෙක්"

නේත්‍රා ඔය ටික කීවේ කිය යුතුම නිසාය. ඒ ටික කියද්දී ඇයව වෙව්ලන්නට විය. මිහිරංග ගියේ නළල උඩට ගෙන 'ඕන දෙයක්' කියන්නාක් බඳුවය.

"බලමුකෝ. අපිත් ඉන්නේ මේ සීගිරි එකේනේ."

ඔහු දොර ළඟදී කීවේය. නේත්‍රා දෙයක් කියන්නට යද්දී භාවනා ඇයව වැළක්වූවාය.

"කතාකරලා තේරුමක් නෑ අක්කේ."

භාවනා හිමිහිට කීවාය. නේත්‍රා උන්නේ කෙල්ලගේ අතක් අල්ලාගෙනය.

"බබා."

නේත්‍රා කතාකළාය.

"අක්කේ."

"අද කවුද බබා ඒ ආවේ."

නේත්‍රා ඇසුවේ වචන බරකරගෙනය. භාවනා සිනාසුනාය.

"ඇයි අක්කා එහෙම අහන්නේ."

"පුදුම මල්ලි කෙනෙක්. මංදා. මටනම් ඒකා ගැන හරි ආදරයක් ආවා."

නේත්‍රා කීවේ අවංකවය. භාවානාගේ සිතට සතුටක් දැනුණි.

"එයා සැටඩේ සීගිරි එකට ආවා අක්කේ."

"ඔබා දැක්කද?"

"ම්. මම ෆේස්වොෂ් හැලුවේ එයාගේ කමිසේ තමයි. බටර් කේක් අයින් කරන්න කියලා හිම්හිට එයා කිව්වෙත් මටම තමයි."

නේත්‍රාට පුදුම නැත.

"කොල්ලා අපි ළඟට එයි නේද?"

"එයා එයි අක්කේ. මට එහෙම හිතෙනවා. අපි හිතුවේ මැජික් එකක් කරන්න පුළුවන් කෙනෙක් එන්න ඕන කියලා. මේ එයා වෙන්න ඇති"

භාවනාගේ මුහුණ දෙස නේත්‍රා බලාගෙනම උන්නාය. 'කෙල්ල කවදාවත් කවුරුවත් ගැන මෙහෙම කතාකරලා නෑ'

"පව්. අම්මත් නැතිවෙලාලු. අප්පච්චියි කොල්ලයි තනියම ඉන්නේ. නේද බබා."

"ම්."

"ඒකා කියපු දේවල්වලට තාමත් මගේ ඇඟ හිරිවැටිලා. අපිට කවදාවත් හිතිච්ච නැති දේවල්."

"පුදුම හිතක්."

කෙල්ල කිව්වේ එපමණය.

"මී එහෙම නැත්නම් කොහොමද දන්නේ කෙල්ලෝ අඳින්නේ අලවන සැනිටරි පෑඩ් කියලා. ඇඹුල් තියල් දාන්නේ බල මාළු වලින් කියලා. එළියේ බාබකියු එකක් දාන්න කියලා.

කොල්ලා මවන සීගිරි එක දකින්න මටත් ආසයි. මේ වගේ සීතල ගුහාවක් නෙමේ ඒ."

"බැබැලෙන දිලිසෙන සීගිරි එකක් නේද අක්කේ."

"ම්. සීයා කොල්ලාව ගන්නවා."

නේත්‍රා එය දනී.

"ඔක්කොටම වඩා කොල්ලා හරි අහිංසක පාටයි."

"අහිංසකයි. ඒත් එයා එහෙම ඔළුව පාත්කරන්නෙත් නෑ. බයක් නැතුව මිහිරංග අයියා එක්ක කතාකරගෙන ගියා."

"මාවත් හිරිවැටිලා ගියා. ඉන්ටව් බෝඩ් එකේ අය එක්ක එහෙම තර්ක කරගෙන යන්නේ නෑ. එන උන් ඔළුව පාත්කරගෙන ඉන්නේ."

"මෙයාව කරකවලා අත්ඇරියා

වගේ ඇති. ඒකයි ඔය තදවෙලා ඉන්නේ. මෙතනට දක්ෂ අවංක කොල්ලෝ එනවට ආස නෑ."

"ඒකමයි මටත් තියෙන බය. මූ මහ එපාකරපු එකා."

නේත්‍රා පමණක් නොව භාවනාත් මිහිරංගගේ හැටි දනී.

"බලමුකෝ අක්කේ. මේක එයාටම ගිය රට නෙමේනේ."

"ඔව්. කොල්ලා කතාකළේ සීගිරි එක ගැන හරි කැක්කුමකින්. අනේ මේ කෝසළ හරි මිහිරංග හරි වෙනුවට ඒ වගේ කොල්ලෙක් මේ පවුලේ ඉන්න තිබුනේ."

භාවනා බැලුවාය. පසුව ඇය සිනාසුනාය.

"ඇයි බබා?"

"නෑ මුකුත් නෑ."

"උඹ අද හරි වෙනස්."

"එහෙම නෑ. මට අද ලීව් එකක් ඕන."

"ඔයාට ආයෙත් කැෂියර් එක දෙයි සීයා."

"එහෙම ඕන නෑ. මට සේල්ස් පැත්ත බලන්නත් පුළුවන්. මේක හැදෙනවානම් මම ඩෝ මන් හරි වෙනවා අක්කා. මට ආසයි එන එන කස්ටර්මව ආයුබෝවන් සර්  කියලා ඩෝ එක ළඟ පිළිගන්න. දුන්නානම් මම ඒකත් කරනවා"

සීගිරි එකට එන්නට දැන් වෙනදා නැති ආශාවක් පපුවට ඇවිත්ය. ඔහුව ගන්නේ කවදාද? එය තීරණය කරන්නේ සීයාය.

"ඇයි අද හාෆ් ඩේ එකක් බබා?"

දුන්නේ නැත.

"නිකං. චුට්ටක් ඇඟටත් හරි නෑ."

"ඇයි අද?"

"මී. වෙන්න ළඟයි."

'ඔයා දන්නේ කොහොමද කෙල්ලෝ යූස් කරන්නේ අලවන ඒවා කියලා. සමහරවිට කෙල්ල කියන්න ඇති. නැත්නම් කොල්ලෝ ඕවා දන්නවායෑ.' භාවනා සිතුවාය. 'එහෙමත් නැතුව ඇති. ඔයා හැමදේ ගැනම දන්නවා.' පසුව ඇය සිතුවාය. නැත්නම් හිතට නිවනක් නැත.

# 28

දේවක ළිඳෙන් නාගෙන ආවේ දැන්ය. උදෙත් නෑව බව කොල්ලාට සිහිවූයේ වතුර බාල්දි විස්සක් පමණ ඳාගත් පසුය. 'දෙපාරක් නෑවා කියලා මොනවාවත් වෙන්නේ නෑනේ' දේවක දිගටම නෑවේ වතුර ටික රත්තරන් වගේ නිසාය. අලුත් ඉර එළිය ලස්සනට පොඩි ළිඳට වැටී තිබුණි. ළිඳ ළඟ වූ මැයි මාර ගහේ අතු කොළ අස්සෙන් ඉර එළිය ළිං දිය

මත සිතුවමක් ඇඳ තිබුණි. ඒ චලි රේඛා මැදිනුත් කොල්ලාට පේන්නේ ඇයවය.

දේවක බයටම අද නාන්න ආවෙත් ෆෝන් එක අරගෙනය. 'සීගිරි එකෙන් කොයි වෙලාවක කෝල් එකක් එයිද දන්නේ නෑනේ,'

නාගෙන විත් දේවක ඇඳගත්තේ ඔහුගේ පැරණිම ඩෙනිම් කොට කලිසමකුත් සුදු ටී ෂර්ට් එකත්ය. සනීප දැන්ය. ඒත් හිතට තාම එහෙමට කියා සනීපයක් නැත. හිතන්නට දාහක් දේවල් ඇත්තාක් මෙන් හිත බරය.

"හදිස්සියේවත් එයාලා මාව සීගිරි එකට ගත්තොත් මම වචනවලින් මවපු දේ එයාලට ඇත්තටම මවලා පෙන්නන්න වෙනවා."

දේවක ඒකට බය නැත. හිතාගෙන ඉන්න දේවල් මවන එක තරම් අපූරු වැඩක් තවත් නැත. 'හැම මිනිහෙක්ගේම ඇතුලේ සාමාන්‍ය මිනිහෙක් ඉන්නවා. එයාව එළියට ගන්නයි ඕන. එළියෙන් පේන කෙනාට නෙමේ අපි දෙයක් දෙන්න ඕන. ඇතුලේ ඉන්න කෙනාටයි. එහෙම වුනොත් ගොඩ.' දේවක සිතන්නේ එය පමණි.

දේවක ඇවිත් රස්නෙට වැඩි සීනි ප්ලේන්ටියක් හදාගත්තේය. රෝස් පාන් එක කනවානම් කන්නට ඕනා වැඩි සීනි ප්ලේන්ටියේ පොඟවාගෙන නය. රස එවිටය. දේවක තේ එකත් රෝස් පාන් එකත් අරගෙන සාලයට ආවේය. හායි ගා ඇර ඇති ගඩොල් බිත්ති අතරින් සුළඟ කඩාගෙන එයි. ඔහු රෝස් පාන් වාටියක් කඩාගෙන

තේ එකේ පොඟවාගෙන කෑවේය.

"අපි ළඟ තියෙන පින්තූරෙටත් වඩා සීගිරි එකේ තිබුණ පින්තූරේ අම්මා ලස්සනට ඉන්නවා. හිනාවීගෙනම. පව්."

දේවකගේ බඩ පපුව දාගෙන ගියේය.

"එයාලට ඔයා නැති අගේ දැන් දැනෙනවා ඇති. මාව සීගිරි එකට ගත්තොත් අම්මට පෙනි පෙනී මට වැඩකරන්න පුළුවන්. ඔයාට වැඳලම වැඩ පටන් ගන්නත් මට පුළුවන්."

දේවක සිතුවේය.

"මගේ අම්මා ඔයාගේ කවුද? එක්කෝ නැන්දා වෙන්න ඕන ඒත් නැත්නම් පුංචි අම්මා හරි ලොකු අම්මා හරි. එතන නෑකම් මහ ගොඩක්. මට එකපාර තේරුම්ගන්න

බෑ"

තාම මොනවත් දන්නේ නැත. අද ඇමතුමක් ආවේ නැත්නම් සීගිරි එකත් එක්ක බැඳුණු කතාව අදින් අවසානය. අන්තිම රෝස් පාන් වාටියක් ඔහු තේ එකේ පොඟවාගෙන කෑවේය. අමාරුම දේ හවස් වෙනතුරු ඉන්න එකය. තාම දහවල් එකහමාරය.

"රස්සාව ලැබුනොත් අප්පච්චිගේ ඔළුවේ තියෙන බර අඩුකරන්න පුළුවන් එයත් ලේසි පාසු ගේමක් නෙමේ දෙන්නේ එයා නුවර ගේත් විකුණලා ආවේ මං ගැන හිතලයි."

දැන් උදාවී ඇත්තේ තමාගේ වාරයය.

මොනවා හිතන්නත් සීගිරි එකෙන් කතාකළ යුතුය. ඒකටත් තව පැය

තුනක් ඇත. ජීවිතයේ බොහෝ දේවල් වෙනුවෙන් බලාගෙන ඉන්නට සිදුවෙයි. ඒ වෙලාවට කරන්නට ඇත්තේ හිත සන්සුන් කරගෙන බලාගෙන හිඳීමම පමණි.

"මට කතාකරනවානම් කතාකරන්නේ කවුද? සමහරවිට ඔෆිස් එකේ කවුරුහරි කතාකරයි. වෙන කවුරු කතාකරන්නද?"

දේවක සිතුවේය. හිත කියන්නේ ඇය කතාකරයි කියාය. 'සීයා නම්බර් එක ගන්න කියලා කිව්වෙත් එයාටමයි. එහෙම එකේ කෝල් එකක් දෙනවානම් එයාම කතාකරයි.' සීගිරි එකත් සමඟ බැඳුණු කතාව එකකි. ඇයත් සමඟ මේ බැඳෙන කතාව තවත් එකකි. 'ඔයාව දැකපු දවසේ හිතම ගැස්සිලා ගියා. එතකොට

මම දන්නේ නෑ ඔයා සීගිරි එකේ කෙනෙක් කියලා.' දේවක ලොකු හුස්මක් ගත්තේය.

කොල්ලාට අද උයන්නටත් හිතක් නැත.

"අපරාදේ අප්පච්චි ආප්ප ගේන්නද කියලා අහපු වෙලේ ගේන්න කියන්න තිබුණා."

ඒත් සයිට් විස්සක පමණ ගිනි අව්වේ යන එක අප්පච්චීව හවසට ආප්ප කඩවල රස්තියාදු කරන එකත් පව්ය. ඇරත් නුවර මිනිස්සු එහෙමම කඩ කෑම කන්නේ නැත. ටිකක් හවස් වී මොනවා හෝ හදනවා කියා දේවක සිතාගත්තේය. හවස් වෙද්දී ෆෝන් එකේ බැටරියේ චාජ් මදිවෙයි කියා සිතා දේවක චාජරයද ගැසුවේය.

"ගන්නවද නැද්ද කියලා ඒ වෙලාවේම කියන්න තිබුණානේ සීයේ. එහෙමනම් මේ ගින්දර නෑනේ."

එච්චරම ගින්දරක් පපුවට ගන්නේ අහවල් එකටද කියා දේවක සිතුවේය. කිසිම දෙයක් ගැන ඕනවට වඩා බලාපොරොත්තු තියාගත් විට ලැබෙන්නේ දුකය. කතාවට කියන්නේ එහෙමය. ඒත් බලාපොරොත්තුවක් නැති මේ ජීවිත කෑල්ලට මේ ලැබුණ බලාපොරොත්තුවත් ලේසි නැත.

දේවක නැඟිට්ටේ එකම තැනකට වී ඉඳගෙන ඉන්නට බැරි අමාරුවකිනි. පාළුවක් දැනෙන වෙලාවක කතාකරන්නවත් කෙනෙක් නැත.

*** *** *** *** ***

දේවකටත් වඩා පිච්චි පිච්චී උන්නේ භාවනාය. ඇය උදේ සිට ඉන්නේ කහඹිළියා ගෑවුනාක් මෙන්ය. කෙල්ල වරුවක නිවාඩුවක් ගෙන ගෙදර ආවේද සීගිරි එකට වී එක විදිහකට ඉන්නට බැරි නිසාය.

රඹුක්වැල්ල මහතා තවම දේවකට කතාකරන්න කියා කෙල්ලට කිව්වේ නැත. ඇරත් ඔහුට කතාකරන්න කියා තමාටම කියාවී කියා ඇයට සැකයක්ද ඇත.

"සමහරවිට සීයාම කතාකරයි. නැත්නම් අක්කට කියයි කතාකරන්න කියලා. මට කියන එකක් නෑ කියන්න කියලා."

භාවනා සිතුවාය. උදේ සිට කිසිම දෙයක් සිතා නැත. සිතෙන්නේද

නැත. සිතෙන්නේම දේවක ගැනය. මේක පුදුම දෙයක් කියා භාවනා සිතුවාය.

"හරියට එයා ගුරුකමක් වශියක් කරගෙන ආවා වගේනේ. ඒත් එහෙම නෑ. වශියක් කරගෙන ආවානම් අරම ඒවා කියන්නේ නෑනේ."

භාවනා දෑස් පියාගෙන සිතුවාය. හිතේ ඇති මේ සිතිවිලි අවංකව කතාකරන්න කෙනෙක් උන්නානම් හොඳය. ඒත් එහෙම අමාරුය. කාටහෝ මේක කිව්වොත් තමාට පිස්සු කියා සිතන බව භාවනා දනී.

"ඉන්ටර්ව් එකට ආව කොල්ලෙක් ගැන හිත හිත ඉන්න එක පිස්සුවක් තමයි අනේ."

කෙනෙක් මෙහෙම හිතේ නිවන නැතිකළාමය. වෙලාවකට භාවනාට

ඔහුත් සමඟ කේන්තිය. ලස්සනට නිස්කලංකයේ පාඩුවේ උන් තමාගේ සැනසීම නැති කළේ ඔහුය.

"එයාට ගාණක්වත් නෑ. තැන්කියු මිස් කියලා යන්න ගියා. දැන් කෙල්ලත් එක්ක ඇති ෂෝක් එකට. අලවන ඒවා අලව අලව මෙතන අපි පිච්චෙනවා."

කෙල්ලෙක්ව මෙතනට ආවේ කොහොමද කියා භාවනා දන්නේ නැත. ඒක තමාගේ මවාගැනීමක් පමණක්ද?

"එයා බැඳලා කියලත් හිතාගත්තේ මමමනේ. බලන් ගියාම එයා අප්පච්චි එක්ක තනිවෙච්ච කොල්ලෙක්"

මේ ලෝකයේ දුටු පිරිසිදුම පිරිමි මුහුණ දැක්කේ ඔහුගෙන් යැයි

භාවනාට සිතෙයි. ඒ මුහුණ මවාග න්න ඕනා නැත. හිත මැද ඔහුගේ ෆිල්ම් කටවුට් ප්‍රමාණයේ පින්තූරයක් ඇඳී ඇත.

සීයාට කතාකර අහන්නත් මොකක්ද වාගේය. වෙන දෙයක් ගැනනම් අහන්න කෙල්ල පසුබටවෙන්නේ නැත. එහෙත් දේවක පුංචි බණ්ඩාර ගැන අහන්න මොකක්ද වාගේය.

"මේ කෙල්ලට පිස්සුද කියලා සීයා බලයි. එයා කියන වෙලාවක කියයි. මෙතන තියෙන්නේ වෙන අමාරුවක්."

භාවනා නිකමට මෙන් ඇගේ ජංගම දුරකථනය අතේ තියාගෙන එබුවාය. කතාකරන්න කියා කෙනෙක් නැත. කතාකරන්න ඇත්තේ වන් වන් නයින් වලට පමණි. ඒ පොලිස් හදිසි

ඇමතුම් සේවයය. ඒත් නැත්නම් ෆයර් බ්‍රිගේඩ් එකටය. ඒ කියන්නේ ගිනි නිවන හමුදාවටය. කතාකර කියන්නට ඇත්තේ හිතක් හෝ ගා ගිනි ගන්නවා කියාය. නිවන්නට එන්න කියාය. එහෙත් ගිනි නිවන හමුදාව හිතේ ගින්දර නිවන්නට එන්නේ නැත.

"අර ආපු නාකි පප්පෙක් ගත්තානම් මේ කිසි ගින්දරක් නෑ. මේ දේවකයෙක් ගන්න ගිහින් මමයි පිච්චෙන්නේ."

ඔහුට කතාකරන්න කියා තමාට කිවහොත් කතාකරන්නේ කොහොමද කියා භාවනා සිතුවාය. එහෙම විදිහක් ගැන හිතෙන්නේම නැත.

රඹුක්වැල්ල මහතා කෙල්ලට කතාකළේ ඒ වෙලාවේය. භාවනාට

සිහියක් නොවීය. ඇයට ඇමතුම සම්බන්ධකරගන්නා බටින් එක පවා ඔබා ගන්නට බැරිවූයේ අත වෙව්ලන්නට වූ නිසාය.

"මේකට තමයි කියන්නේ අසහනේ කියලා. වෙන දෙයක් නෙමේ."

ඇය තමාටම බැණගත්තේ එහෙම කියාය.

"සීයේ."

භාවනා කතාකළේ උගුරින් මෙනි.

"ඇයි මැණිකා. සනීප නැද්ද?"

රඹුක්වැල්ල මහතා ඇසුවේ කෙල්ලගේ කටහඬ අමුතුවී තිබූ නිසාය. 'සනීප නෑ තමයි. කිසිම සනීපයක් නෑ. හැදුනයින් හැදුනේ නෑ මෙහෙම අසනීපයක් පිස්සු.' භාවනා තමාටම කියාගත්තාය.

"ආ නෑ සීයා. මේ චුට්ටක්

ඇලවෙලා හිටියා. කියන්න සීයා."

භාවනා කීවාය.

"අපි අර කොල්ලට කතාකරන්න ඕන මැණික"

රඹුක්වැල්ල මහතා කීවේය.

"කොල්ලට කිව්වේ සීයේ."

කෙල්ල නොදන්නා ගාණට ඇසුවාය.

"උදේ අපි ඉන්ටවීව් කළේ පුතේ. දේවක."

"ආ සීයේ. අපි කතාකරලා මොකද කියන්නේ දේවකට"

භාවනා ඇසුවාය. කෙල්ල කතාකරන්නේ කාමරය පුරා ඇවිදිමිනි. එක විදිහකට ඉන්නට බැරිලෙස හිත අවතැන් කළේ දේවකමය.

"කොල්ලට හෙට උදේ ඇවිත්

මාව හම්බවෙන්න කියන්න මැණිකෙ. අපි හෙට කතාකරලා දවසක් කියමු දේවකට එන්න."

භාවනාට පුදුම නැත.

"මම කියන්නම් සීයා. උදේ නයින්වලට විතර."

"ම්. අපි මන්ඩේ ඉඳලා කොල්ලට එන්න කියමු මේකව ඉක්මනට ගන්නෝන."

භාවනා සිනාසුනාය. සීයා එහෙම හදිස්සියේ කිසිම කෙනෙක්ව ගන්නේ නැත. බොහෝ විට අලුතින් එන කෙනෙක්ට එන්න කියන්නේ පළවෙනිදා සිටය. එහෙත් අද ඒ ප්‍රතිපත්තිය රඹුක්වැල්ල මහතා කැඩුවේය.

"එයාට වෙන මොනවා හරි කියන්න ඕනද සීයේ?"

"කිව්වේ මැණික."

"නෑ එයාව අපි තෝරගත්තා කියලා."

"ඉඟියෙන් වගේ මැණික කියන්න. අපි හෙට ඔෆීෂියලිම කියමුකෝ"

"ම්. මම එයාට කතාකරන්නම් හවස්වෙලා සීයේ."

භාවනා කීවාය.

"කොල්ලා අපි ගාවට ආවොත් ඒක ලොකු ජයග්‍රහණයක් පුතේ. එහෙම කෙනෙක්ව තමයි අපිට ඕන"

"ඔව් සීයේ."

"ඒත් මට තාම පුදුමයි මේ කොල්ලා ගැන හරියට සැලරි එකක්වත් කිව්වේ නෑ. බේරිලා හිටියා පුදුමයි දේවක."

"අපි ගාවටම එන්න එයාටත් හිතෙනවා ඇති සීයේ. සමහරු

එහෙමනේ. ඔය මේ සංසාර පුරුදු කියලත් කියන්නේ "

"මී. කොල්ලව දැකලා තියෙනවත් වගේ."

'සීයාටත් එහෙම හිතෙනවද? අක්කිත් කිව්වා එහෙම හිතෙනවා කියලා. මටනම් එයාව දැක්ක වෙලාවේ ඉඳලා හිතෙනවා. කවුද වගේ කියලත් හිතෙනවා.' භාවනා සිතුවාය.

"එහෙනම් කියන්න."

භාවනා ඇමතුම විසන්ධිකර ටික වෙලාවක් දෑස් පියාගෙන උන්නාය. 'දැන් දේවක ඔයාගේ දෛවය මගේ අතේ. චුට්ටක් ඉඳලා තමයි ඔයාට කතාකරන්නේ. මම එහෙමයි. මාව පිච්චුවානම් මාත් පුච්චනවා.' භාවනා කාමරයෙන් පිටවී ඉහළ මාළයේ ලී

වැට ළඟට ආවාය. එතනට ගිය විට පහළ සාලයත් පැන්ට්‍රියේ කොටසතුත් පෙනෙයි.

"පද්මා."

පද්මා කුස්සියේ සිට දුවගෙන ආවාය.

"මට රස තේ එකක් ඕන."

"ගේන්නම් බේබි."

"කන්න මොනවත් නැද්ද අනේ."

හවසට කෙල්ලට තේ බොනවිට කන්න මොනවාහරි ඕනමය.

"ලොකු මහත්තයා ගෙනාපු හැලප වගයක් තියෙනවා බේබි."

"හැලප කනවද අනේ. කේක් නෑ."

පද්මා සිනාසුනාය.

"නෑනේ බේබි. ක්‍රීම් ක්‍රැකර් ගෙ
ේන්නද ජෑම් ගාලා."

"මී. ස්ට්‍රෝබෙරි ජෑම් හොඳේ."

භාවනා ෆෝන් එක එහෙමම චාජරයට ගසා ගියේ ඇඟ ටිකක් සෝදාගන්නටය. අතුරුගිරිය පැත්තේ පොඩි ගඩොල් ගේ කෑල්ලක එක කොල්ලෙක් මේ ඇමතුම එනතුරු පිච්චෙන බව භාවනා දන්නේ නැත. කොල්ලාට එක විදිහකට ඉන්නට පවා බැරිව එහේ මෙහේ ඇවිදින බව ඇය දන්නේ නැත.

එහෙම දන්නවානම් මේ තේ හදන්න කිය කියා ඇඟ සෝදන්න යන්නේ නැත. ඒත් භාවනාට ඕනා නිස්කාංසුවේ දේවකට කතාකරන්නටය. කා ළඟවත් ඔහුගේ අංකය නැත. කෙල්ල ආවේ දේවකගේ ඇප්ලිකේෂන් එකත් අරගෙනමය. 'මේ පිස්සා සීයාට

ගත්තොත්.' භාවනාට නැති බයක් ආවේය.

ඇය ඉක්මනට ඇඟ සෝදාගෙන ආවේ ඒ නිසාය. සැහැල්ලු ගවුමක් දාගෙන ආ භාවනා හරි බරි ගැසී ඇඳ කොණක වාඩිවූවාය. අද අම්මා ගෙදර නැත. ඒ නිසා කාමරයට එන්නට කෙනෙක් නැත. කෙල්ල ක්‍රීම් ක්‍රැකර් එකක් කා තේ උගුරක්ද බිව්වාය. පද්මාගේ තේ එක රත්තරන් කියා ඇයට සිතුණි. ඇයට තරම් රසට කිරි තේ හදන්නට කාටවත් නොහැක.

භාවනා උන්නේ වේලාසනම ඔහුගේ අංකය ෆෝන් එකේ මතකයට දමාගෙනය. ඇය ඉන් අංකය ගත්තාය. 'මෙච්චර හිතලා මතලා පෙරුම් පුරලා ඇඟත් සෝදලා

ඇවිත් කාටවත් මම කතාකරලානම් නෑ දේවක. මෙච්චර වෙච්ල වෙච්ල ගන්න ෆස්ට් කෝල් එක මේ.' භාවනා ඔහුගේ අංකය එබුවේ එසේ සිතින් කියාය.

# 29

ඇමතුම එද්දී දේවක උන්නේ කරවල බැඳුමකට ලූණු කපමිනි. ඔහු සිතුවේ කරවල තෙල් තමා පරිප්පු හදා අතේ පොල් සම්බෝලයක් හදන්නටය. ඊයේ පෙරේදාත් කෑවේ එහෙමය. එහෙත් මේ අප්පච්චීටත් පුතාටත් කවදාවත් කරවල කා එපාවෙන්නේ නැත. දෙන්නාම කරවල බැඳුමට ඒ තරම් ආසය.

ජංගම දුරකථනය නාදවෙන හඬින් කොල්ලා උඩ ගියේය. දේවක ෆෝන් එක අතට ගත්තේ වෙව්ලමින් මෙන්ය. 'සීගිරි එකෙන්ද?' ඔහු දෙවියන් සිහිකර ගත්තේය. කොහොමත් ඇමතුම එන්නේ දන්න අංකයකින් නොවේ.

හිතන්නේ නැතුවම දේවක ඇමතුම සම්බන්ධකරගත්තේය.

"හෙලෝ."

ඔහු කතාකළේ මෘදුවය. ඒ පැත්තෙන් කතාවක් නැත.

"හෙලෝ. කවුද කතාකරන්නේ?"

දේවක ඇසුවේය.

"මේ දේවක පුංචි බණ්ඩාරද?"

කෙල්ල ඇසුවාය. කතාකරන්නේ ඔහු බව ඇය දනී.

"ඔව් මිස්. කතාකරනවා. මේ සීගිරි

එකේ මිස් නේද?”

මේ කතාකරන්නේ සීගිරි එකෙන්ම බව දේවක දැන් දනී. ‘ඔයානේ මිස් කතාකරන්නේ’ ඔහු සිතින් කීවේය. ‘මගේ වොයිස් එක කොහොමද අඳුනගත්තේ.’ ඇයට පුදුමය.

“මම භාවනා රඹුක්වැල්ල. සීගිරි එකෙන් තමයි.”

‘අනේ දෙයියනේ ඔයා භාවනාද?’ දේවක පපුව අතගාගත්තේය. ‘ඔයා දිහා බලාගෙන භාවනා කරන්න පුළුවන් තමයි.’

“මම කෝල් එකක් එනකල් බලාගෙන මිස් හිටියේ.”

දේවක අවංකව කීවේය. ඔහුගේ කටහඬේ මහා අවංක බවක් ඇතැයි කෙල්ලට සිතුණි.

“මම මේ පණිවිඩයක් කියන්න

කතාකළේ”

“හා මිස්.”

භාවනා බිත්තිය දෙස බලාගෙන තනිවම සිනාසෙයි. ‘මිස් කියන ලස්සන’

“හෙට ඇවිත් සීයව මීට්වෙන්න. සීයා කිව්වේ අද ඔයාව ඉන්ටවීව් කළේ. රඹුක්වැල්ල සර්ව.”

“දන්නවා මිස්. මම මෙහෙම ඇහුවට මොනවත් හිතන්න එපා මිස්. මාව සිලෙක්ට් කළාද?”

කෙල්ල සිනාසුනාය. ඒ සිනාව දුරකථන රැහැන් දිගේ ආවේ සුන්දර ලෙසය.

“මොකද හිතන්නේ. සිලෙක්ට් කරලා කියලා හිතනවද?”

ඇය ඇසුවාය. පසුව තොල් පට තදකරගෙන අසාගෙන උන්නාය.

"මම මිස් සීගිරි එකේ වැඩකරන්න හරි ආසාවෙන් ඉන්නේ. ඒකයි. සිලෙක්ට් කළොත් ඒක ලොකු දෙයක්."

දේවක කීවේය.

"සුපර් මාර්කට් කම්පනි ඕන තරම් තියෙනවනේ. බ්‍රාන්ච් දෙතුන් සීය එයාලගේ තියෙන්නේ. යන්න පුළුවන්නේ. ඇයි සීගිරි එකටම එන්න හිතන්නේ."

භාවනා ඇසුවාය. 'ඒක දිග කතාවක් මිස්.'

"ඒක හරියටම කියන්න තේරෙන්නේ නෑ මිස්. මම මේ උයන ගමනුත් කල්පනා කළේ ඇයි කෝල් එකක් එන්න මෙච්චර පරක්කු කියලා."

දේවක අවංකව කීවේය.

"දැන් උයනවද ඔය?"

භාවනා ඇසුවේ යාළුවෙක්ගෙන් අසන්නාක් මෙන්ය. එහෙම කතාවලට ඇය ආසය. ඒ වෙලාවට මේ කතාකරන්නේ සීගිරි එකට ගන්න අලුත් ප්‍රමෝෂන් මැනේජර් කියා ඇයට සිතෙන්නේ නැත. ඇයත් සෑහෙන කාලයක සිට බලාගෙන ඉන්නේ මෙහෙම කයියක් ගහන්නටය.

"ඔව් මිස්. රෑට තමයි උයන්නේ. අප්පච්චියි මායිනේ. පොඩියට කුකින් පාරක් දානවා ඉතින්"

"මොනවද ඉතින් ඔය උයන්නේ?"

ඇයට ඇසුණි. 'ඔයා මොනවා හිතනවද දන්නේ නෑ. මටත් පිස්සු' කෙල්ල සිතුවාය. 'ඔයා හරි පුදුම කෙනෙක්නේ මිස්. ඒවත් අහනවා' දේවක සිතුවේ එහෙමය. ඒත් මේ

කතාවට දේවක පුදුම ආසය.

"අද මිස් මේ කරවල තෙල් දාලා පරිප්පු හදනවා. පස්සේ පොල් සම්බෝලයක් හදනවා. සුදු හාල් බත් හදනවා."

කෙල්ල කෙළ ගිල්ලාය. සමහරවිට ඇය කෙළ ගිලින හඬ දුරකථන රැහැන් දිගේ ඔහුට ඇසෙන්නටත් ඇත. 'මං ආසම මෙනූ එකනේ හදන්නේ.'

"ෂෝක් මෙනූ එකක්නේ හදන්නේ. ඔය ඉතින්  දැන් උයනවා එහෙම"

ඇය කීවාය. දේවකට පුදුමය.

"අප්පච්චිගෙයි මගෙත් ෆේවරිට්ම මෙනූ එක මිස් මේ. සතියට දවස් තුනක්ම අපි කන්නේ මෙහෙම. මොකක්හරි තෙල් දාගන්න ඕන. ඊයේ රෑට මම සැමන් තෙල් දැම්මා"

දේවක කීවේය. කෙල්ල දැන්

ඉන්නේ ඇඳ මත නොවේ. කාමරයේ වූ කුඩා මේසයේ ඉඳගෙනය. ඇය දැන් තැන් දහයකට පමණ ගියාය. ඒ යන්නේ කෙළත් ගිලින ගමන්ය. ඇයටද බැදුමක් නැතුව කන්න අමාරුය.

"මම අහපු දේට හරියට උත්තර දුන්නේ නෑ. ඇයි සීගිරි එකටම."

"සීගිරි එකේ වැඩකරන්න ආසාවක් ආවා මිස්. ඇයි කියන්න දන්නේ නෑ. මට වැඩකරන්න ලැබුනොත් ඒක ලොකු වාසනාවක්."

දේවක කීවේය.

"මම පොඩි දෙයක් කියන්නම්. ම්."

"හා මිස්. කියන්නකෝ."

කොල්ලාට කියවිණ. 'ඔයා ෂෝක්නේ' ඇය හුස්මක් පපුවට ගෙන සිතුවාය.

"ඒ බලාපොරොත්තුව ඉෂ්ඨවෙයි. මි."

කෙල්ල කිව්වේ ඔහු පව් කියා සිතුන නිසාය. එච්චරම ආසාවෙන් ඉන්නා දේ නොකියා ඉන්නට කෙල්ලට හිතෙන්නේ නැත. ඒවා මානුෂික අපරාධ ය.

"තැන්කියු මිස්. ගොඩක් පින්. තැන්කියු සෝ මච්"

භාවනාගේ පවා දෑස් තෙත්විය. ඇය දෑස් පිසදාගත්තාය.

"හැබැයි මේ"

"කියන්න මිස්."

"අර ඇඹුල් තියල් හට්ටි පන්සීයත් දාන්න වෙයි. කොස් කපන්නත් වෙයි සීගිරි එකේ තියලා. එළියේ බාබකියු එකත් දාන්න වෙයි. බැබලෙන සීගිරි එක හදලා පෙන්නන්න වෙයි. හොඳද

කටින් කියනවා වගේ නෙමේ හොඳේ. ඒවා මවන්න වෙයි ඔයාට"

"දන්නවා මිස්. මම එහෙම වුනොත් මිස් ඇඹුල් තියල් හට්ටි විතරක් නෙමේ. සීනි සම්බෝල බෝතලුත් දානවා මිස්. සීගිරි එකේ පැත්තකින් පොඩි බුක් කවුන්ටරයකුත් දානවා. සුපර් මාර්කට් එකක් ඇතුලේ තියෙන පළවෙනි බුක් ෂොප් එකත් දානවා. අද මේ මම හිතපු දෙයක් ඉන්ටවීව් එකට ගිහින් එන ගමන්"

"බුක් කවුන්ටරයක් කිව්වේ."

"පොඩි බුක් ෂොප් එකක් මිස්. එහෙම පුළුවන්. ඒකෙන් මිස් වෙනමම ආදායමක් එනවා."

ඒ බුක් කවුන්ටරය කරන්නේ තමා යැයි භාවනා දැන්මම සිතාගත්තාය.

"එහෙම ෂෝක් තමයි හැම

පොතක්ම තියෙන්න ඕන."

"ඔව් මිස්. සීඩී ඩීවිඩීසුත් තියෙනවා. හරිම කියුට්"

කෙල්ලට දැන් ඔහු සීගිරි එකට එනතුරු ඉවසිල්ලක් නැත.

"ඇත්තටම මිස් මාව තෝරගත්තද?"

"මම කියන දේ විශ්වාස නෑ ඒ කියන්නේ නේද?"

"ගොඩක් විශ්වාසයි මිස්. මට පුදුමයි."

"සීයා ෂර්ට් එක ගැනත් ඇහුවා නේද?"

"ඒකනේ මිස්. සර්ට ඒක ලස්සනට තිබුණා නේද මිස්."

ඔහුත් සමඟ පැයක් වුව කතාකරන්නට පුළුවන් කියා භාවනාට සිතෙයි.

"මගේ ජීවිතේ අහපු සුබම ආරංචිය කිව්වේ මිස්. ඒකට මිස්ට ගොඩක් තැන්කියු. ඇත්තටම පින්. මට මේ කෝල් එක කවදාවත් අමතක වෙන්නේ නෑ මිස්. නෙවර්"

දේවක කීවේය. 'ඇයි සීගිරි එකට එන්න මෙච්චර ආස' තවමත් ඒකට හරි උත්තරයක් ඔහු කිව්වේ නැත.

"මිස්"

"කියන්න."

"මිස් එතකොට භාවනා රඹුක්වැල්ල. සර්ගේ."

"මී. සර්ගේ මිණිපිරී මම. සර්ගේ පුතාගේ දුව. අර හිටියේ මගේ අක්කී. එයා නේත්‍රා රඹුක්වැල්ල. එතන හිටපු අනිත් සර් තමයි මිහිරංග. මගේ නැන්දගේ පුතා."

භාවනා කීවාය. 'එතකොට ඔයා

මගේ මාමගේ පොඩි දුව. පුදුමයි.'

"ඇයි එහෙම ඇහුවේ?"

"අනේ නෑ මිස්. මම දන්නේ නැති නිසා. මේක පවුලේ බිස්නස් එකක්නේ මිස්. දැනගන්න ඕනනේ"

කොල්ලා කීවේය.

"මන්ඩේ ඉඳලා සර් එන්න කිව්වොත් එන්න පුළුවන්නේ නේ."

භාවනා ඇසුවාය.

"හෙට ඉඳලා එන්න කිව්වත් පුළුවන් මිස්. මම ලෑස්තිවෙලා ඉන්නේ එන්න."

"සීයා කියයි එන දවසක්. හෙට ඇවිත් කතාකරගන්න"

"හොඳයි මිස්."

දුරකථනය තියන්නට දෙන්නාටම හිතෙන්නේ නැත.

"නිවාඩුවක් නැතුව වැඩකරන්න වෙයි ආවාම. සීයා කැමතිම නෑ එහෙම නිවාඩු ගන්නවට."

"එහෙම නිවාඩු ඕන නෑ මිස්. මට සන්ඩෙත් වැඩකරන්න පුළුවන් අප්පච්චිත් ගොඩක් වෙලාවට දවස් හතේම වැඩ. ගෙදර තනියම ඉන්නකොට මටත් හරි පාළුයි. නිකං ප්ලේන්ටි බිබී අරවා මේවා හප හප මෙතන කාලේ කනවා. නානවා කනවා ප්ලේන්ටි බොනවා. හරිම පල් වතුර ජීවිතේ මිස්"

දේවක කීවේය. තමාට ආත්මයම කියවෙන්නේ ඇයිදැයි දේවකම දන්නේ නැත.

"ඔහොම තමයි හැමෝම කියන්නේ. චීත් ගර්ල් ෆෙන්ඩ් කතාකළාම දුවනවා ඔක්කොම

වැඩදාලා. අපට හොඳ එක්ස්පීරියන්ස් තියෙනවා ඕවා ගැන"

කෙල්ල කීවාය.

"එයා කතාකළොත් එහෙම දුවන්න ඕන තමයි මිස්. ජීවිතේම ඉන්න බලාගෙන ඉන්න කෙනානේ ඉතින්. මට කතාකරන්නේ නැතුව වෙන කාට කතාකරන්නද?"

දේවක ඔය ටික ඔහොමම කීවේය. කෙල්ලගේ පැත්තක්ම ඇවිලීගෙන ගියාය. 'කෙල්ලට එච්චරම ආදරේද? ඒ කියන්නේ ගර්ල් ෆෙන්ඩ් කෙනෙක් ඉන්නවා' භාවනා සිතුවේ සිතිවිලි අවතැන් වෙද්දීය.

"ඒකනේ එහෙම වුණාම ඉතින්."

භාවනා කීවේ අසරණ දුක්බර හඬකිනි. කෙල්ල ඇඳෙන් පැමිණ ඉඳගත්තේ කරකැවිල්ලක් වාගේ ආ

නිසාය.

“තාම ඉතින් එහෙම කරදරයක් නෑනේ මිස්. ඒ නිසා ගාණක් නෑ.”

දේවක ගත් කටටම කීවේය.

“ඒ කිව්වේ.”

“නෑ මිස්. එහෙම කරදර කරන්න කෙනෙක් ගැන තාම නම් ආරංචියක් නෑ. ඒකයි.”

ළඟ හිටියානම් ඔහු ගුටි කනවා කියා භාවනාට සිතුණි. ‘මාත් එක්ක විහිළුත් කරන්න පටන් අරන්. පිස්සෙක් මේ’ ඇය සිතුවාය.

“එහෙම ඉන්නවානම් ඒ වැඩ නිවාඩු දවසක දාගන්න. සීයා කියයි සේරම.”

“එහෙම නෑ මිස්. මට නිවාඩු ඕනත් නෑ, මට ඕන සීගිරි එකේ වැඩකරන්න විතරයි.”

භාවනා සිනාසුනාය. 'ඇයි අරම කිව්වාම එච්චරම ගිනිගත්තේ මාව' ඇයම එය දන්නේ නැත.

"මම හෙට කීයටද එන්නෝන මිස්?"

භාවනා මඳක් කල්පනා කළාය.

"මට ඒක කිව්වේ නෑ. මම සීයාගෙන් අහලා කියන්නම්. සෙවන් තර්ටි විතර. සීයාගේ අපොයිමන්ට් අනුව තමයි. අහලා මම කෝල් එකක් දෙන්නම්"

රඹුක්වැල්ල මහතා කිව්වේ කොල්ලට උදේ එන්න කියාය. කෙල්ල ඒක නොකිව්වේ තව පාරක් ඔහුට කතාකරන්නට අවස්ථාවක් හැදෙන නිසාය. 'මේක ලෙඩක් සුදූ' ඇය තමාටම කියාගත්තාය.

"මම කෝල් එකක් දෙන්නද

මිස්ට."

"මී. එපා මම අරගෙන කියන්නම්."

"හොඳයි මිස්."

"මම තියන්නම්."

"හොඳයි මිස් බුදු සරණායි මිස්ට. කෝල් එකක් දුන්නට මිස්ට ගොඩක් ස්තූතියි"

කෙල්ල පපුවට අතක් තියාගත්තාය.

"බුදු සරණායි."

භාවනා කීවේ ඇසෙන නොඇසෙන හඬකිනි. කොල්ලෙක්ට ඇය මේ එහෙම පැතුවාමය. භාවනා එහෙමම ඇඳේ වැතිරී කොට්ටයක් බදාගත්තාය.

"කියපු ලස්සන අරක. ගර්ල් ෆ්‍රෙන්ඩ් ගැන ඇහුවාම. එයා කතාකළොත් එහෙම දුවන්න ඕන

තමයිලු. ජීවිතේම ඉන්න බලාගෙන ඉන්න කෙනාලු. මට කතාකරන්නේ නැතුව වෙන කාට කතාකරන්නද? පුදුමයිනේ. එහෙම හිතන කොල්ලොත් ඉන්නවා එහෙනම්. කතාකරපු ගමන් දුවගෙන එන අය ඉන්නවද එහෙම. ඔක්කොම වැඩදාලා."

ඔහු එහෙම කෙනෙක් යැයි භාවනාට සිතෙයි.

"එයාගේ ගර්ල් ෆෙන්ඩ් හරි වාසනාවන්තයි එහෙනම්. මාත් ආස එහෙම කෙනෙක්ට. ප්‍රසිඩන්ට් හවුස් එකේ හිටියත් මම කතාකළාම ඔක්කොම වැඩදාලා දුවගෙන එන්නෝන. ඇයි සුදූ කියාගෙන. එහෙම කෙනෙක්ට මම මගේ පණ උනත් දෙනවා. පණ උනත්."

භාවනා සිතුවාය. ඒත් එහෙම කෙනෙක් හොයන එක ඊට වඩා පණ යන වැඩකි. අමාරුම ඒකය.

"හෙට එන වෙලාව නොකිව්ව එක හොඳයි. පව්."

භාවනා සිතුවාය.

"ටිකක් රෑ වෙලාම ගන්නවා. දැන් ඉතින් පණිවිඩේ කිව්වනේ. හරි සතුටින් හිටියේ ඒක අහලා. ඇයි එච්චරම ආසාවක් සීගිරි එකට එන්න."

ඒකට හේතුවක් ඇතැයි කෙල්ලට සිතෙයි.

# 30

දේවකට ටික වෙලාවක් වෙල්
යාය දෙස බලාගෙනම උන්නේය.
ඔහුගේ දෑස් යන්තමට මෙන් තෙමීගෙ
ාස් ඇත. ටිකකට කලින් භාවනා
කතාකර කියූ පණිවිඩයෙන් පසු
තාමත් කොල්ලාට සිහි එලවා ගත
නොහැක. මේ හෙල්ලී ගොස් ඉන්නේ
ඒකය.

ඇයගේ වචන ඔහුට ඇසෙන්නාක්
මෙන්ය. පුදුම ඇයම කතාකර ඒක

කීමය.

"ඔයා භාවනා. මගේ මාමගේ දුව. පුදුමයි. භාවනා. භාවනාවක්ම තමයි."

සීගිරි එකට තමාව අරගෙන ඇති බව දැන් දේවක ඉන්තේරුවෙන්ම දනී. බොහෝ විට සඳුදා සිට තමා වැඩය. කෙල්ල නොකියා කිව්වේ ඒකය.

දේවක පැමිණි අම්මාගේ පින්තූරය දෙස මොහොතක් බලාගෙන උන්නේය.

"මාව සීයා සීගිරි එකට ගත්තා අම්මේ. ඔයාගේ අයියගේ පොඩි දූ දැන් කතාකරලා මට ඒක කිව්වා. ඒක හොඳ සරුංගලේ අම්මේ"

දේවක අම්මාට කීවේය.

"එයාව අම්මා දන්නවද?

භාවනාව."

ඇත්තම කතාවනම් භාවනාට මේ නම දැම්මේද නර්මදා බවය. නේත්‍රාට ඒ නම දැම්මේද ඇයමය. සීගිරි කියන නම යෝජනා කළේද නර්මදාමය.

කොල්ලා උන්නේ සතුට කියාග න්න කෙනෙක් නැතිවය. සීගිරි එකට යන්නට මේ තරම් ආසාවක් උපන්නේ කොහොමද කියා ඔහුම දන්නේ නැත.

අප්පච්චීට දැන්මම කතාකර කියනවානද කියා දේවක සිතුවේය. කියන්නට ඉන්නේ ඔහු පමණි. දේවක අප්පච්චීට ගත්තේය.

"අප්පච්චී."

කොල්ලාගේ කටහඬින්ම ජීවන් යමක් තේරුම් ගත්තේය.

"කියන්න පුංචි මහත්තයෝ."

"සීගිරි එකෙන් කතාකළා අප්පච්චී."

"කතා කළාද පුංචි මහත්තයෝ?"

"ඔව් අප්පච්චි. භාවනා රඹුක්වැල්ල කියලා මිස් කෙනෙක් කතාකළේ. මං අර කිව්වේ."

ජීවන්ට පුදුමය. කොල්ලාට කතාකර ඇත්තේ මිලින්දගේ පොඩි දුවය. කෙල්ලව ජීවන් වඩාගෙනද ඇත. නර්මදා මිය ගියේ ඇය උපන් අලුතය.

"ඔයාගේ මාමගේ දුව අම්මගේ අයියගේ පොඩි දුව පුතේ. මම කෙල්ලව වඩාගෙනත් තියෙනවා."

ජීවන් කීවේය. කොල්ලාට මේ කතා පුදුමය. 'ඔයා ඒක දන්නවානම් මිස්.'

"මොකද කිව්වේ පුංචි

මහත්තයෝ?"

"මාව සීගිරි එකට අරන් අප්පච්චි."

ජීවන්ගේ දෑස් තෙත්විය. ඔහුට බැලුනේ උඩය. තම මියගිය බිරිඳ ඉන්නේ උඩ බව ඔහු දනී. 'කොල්ලව තාත්තා අරන් සුදු නෝනා.' ඔහු කීවේය.

"ඔයාව ගන්නවා කියලා මම දන්නවා පුංචි මහත්තයෝ."

"ඒකනේ අප්පච්චි කිව්වේ."

"මොකද කිව්වේ ඉතින්?"

"හෙට ඇවිත් සීයව මීට්වෙන්න කිව්වා."

"ඉක්මනට ඔයාට එන්න කියයි. එහෙම වෙනවා."

ජීවන් කීවේය. ලේ සුවඳ අන් හැම සුවඳකටම වඩා දැනෙයි. සමහරවිට

රඹුක්වැල්ල මහතාටත් එහෙම දැනෙන්නට ඇත.

"අප්පච්චී එන්නකෝ."

"මං ඉක්මනට එනවා. ඔයා උයන්න ගත්තද?"

"ඔව් අප්පච්චි. මේ කරවල තෙල් දාන්න ගත්තා."

"මාත් මොනවාහරි අරන් එන්නම්."

දේවක ආසාවට ගේ පුරා ඇවිද්දේය. හැන්දෑ අඳුර යන්තමට දැන් වැටී ඇත.

*** *** *** *** ***

දේවකව සිගිරි සුපර් එකට ගන්නට යන බව මිහිරංග ස්ථිරවම දැනගත්තේ මලීෂාගෙනි. ඒ කතාව දැන් සීගිරි එක පුරා හෝ හෝ ගා

යයි.

"උඹව ගන්නද යන්නේ?"

"ඔව්. කවුද අයියේ පොර."

මලීෂා ඇසුවේ එසේය. මිහිරංග මොහොතක් කල්පනා කළේය. 'උඹට සීගිරි එකට එන්න තියන්න බෑ. සීයත් උඹර කරේ තියාගෙන යන්න බලාගෙන ඉන්නේ උඹ උදේ දාපු ටොක් එකට මෙයා උඩ ගිහින් ඉන්නේ.' මිහිරංග සිතුවේය.

"මං ඇවිත් කියන්නම්."

මිහිරංග හදිස්සියේම වාහනයේ යතුරත් ගෙන කා පාක් එකට ගියේය. ඔහු වාහනයට ගොඩවෙන්නටත් පෙර අංකයකට ගත්තේය.

"මචං තුෂා. උඹ කොහෙද?"

මිහිරංග ඇසුවේ ඔහුගේ සමීපම මිත්‍රරෙක්ගෙනි.

"හරි. මම එන්නම්. පොඩි වැඩක් තියෙනවා බං කරන්න. පොඩි ගේමක්."

"දෙමුකෝ ගේමක්නම්. මේ දවස්වල කිසි වැඩක් නෑ බං. වරෙන් වරෙන්."

මිහිරංග දුරකථනය තබා වේගයෙන් වාහනය සීගිරි කා පාක් එකෙන් පිටතට ගත්තේය. කළ යුතු දේ ඔහු දැනගෙන උන්නේය.

"උඹට මේ සීගිරි එකේ පස් ගාගන්න තියන්නේ නෑ. කොස් කපන හිඟන්නා. උඹ ඉන්ටව් බෝඩ් එකේදීත් මාවමයි කැපුවේ. පරයා දන්නේ නෑ මම කවුද කියලා."

මිහිරංග වෙව්ලුවේය.

"මේ සීගිරි එක හදනවානම් හදන්නෙත් අපි කඩනවානම් ඒක

කරන්නෙත් අපි. එක එකාට මෙතන ඇවිත් ජිම්නාස්ටික් දාන්න තියන්නේ නෑ. සීයට කතන්දරේ සෙට් වුණාට පස්සේ මේවා තියෙන්නේ නෑ. එදාට මේවා අපේ අතේ."

මිහිරංග සිතුවේ රඹුක්වැල්ල මහතා හෙට අනිද්දා මිය යන බවය. එහෙත් ඔහු හැමෝටම වඩා නිරෝග ීව උන්නේය.

"උඹ මෙතනට එන්න කලින් වැඩක් දෙන්න ඕන. ආයේ ඇඩ්‍රස් නැතිම වෙන්න වැඩක් දුන්නාම හරි. මෙයාලා බලාගෙන ඉඳියි උඹ එනකල් සීගිරි එකේ කොස් කපන්න."

ඔහුට කරන්නේ කුමක්ද කියා මිහිරංග සිතුවේය. මිහිරංග දැනගෙන උන්නේ කෙනෙක්ව නවත්වන්නට හැකි එක ක්‍රමයක්

පමණි. ඔහු මේ පාවිච්චි කරන්නට යන්නේ එයය.

"උඹ ඉන්නේ කොහෙද? මට මතක හැටියට අතුරුගිරියේ මිනිහා ඉන්නවා කිව්වේ. ඇඩ්‍රස් එක අතට ගන්න ඕන."

මිහිරංග සිතුවේය. ඔහු සිතුවේ දේවකගේ අයදුම්පත ඇත්තේ සීගිරි එකේ කියාය. ඒත් ඒක දැන් ඇත්තේ කෙල්ල ළඟය. මොකක්ද හේතුවක් නිසා භාවනා එය අරගෙනම ආවාය. මිහිරංග යළිත් සීගිරි එකට ගියේ දේවකගේ ලිපිනය ගන්නටය. එය ඇත්තේ අයදුම්පතේය.

"කොර ගෑණි පහවෙද්දී ඕෆ් වෙනවා. ඊට පස්සේ අදිනවා ඔෆිස් එක."

මිහිරංග කොරගෑණි කිව්වේ

නේත්‍රාටය. මිහිරංග කුඩා වියේදී ඔහුගේ නැපීස් පවා මාරුකළේ නේත්‍රාය. ඔහු කොල්ලාව වඩාගෙන හැමතැනම ගියේය. ඒ පිරිමි සහෝදරයෙක් නැති අඩුව පියවාග න්නටය. එහෙත් දැන් මිහිරංග නේත්‍රාව ගණන් ගන්නේ නැත. ජීවිතේ බොහෝ දේවල් අහිමිවෙනවා බලාගෙන උන් නේත්‍රාට මේ දුක හුරුය.

නේත්‍රා හිස ඔබාගෙන පර්චෙසින් ඕඩර්ස් කිහිපයක් පරීක්ෂාකරමින් උන්නාය. මිහිරංග කාර්යාලයට පැමිණ ඇය ඉන්නවා දැක නැවත ගියේය. නේත්‍රා එය දැක්කාය. 'මොකද ඒ මාව දැකලා ගියේ' ඇය සිතුවාය.

ටික වෙලාවකින් මිහිරංග යළිත්

ආවේය.

"ඇයි මල්ලී?"

"නෑ අක්කේ මේ අද ඉන්ටවීව් ආපු අයගේ ඇප්ලිකේෂන් ෆයිල් එක කොහෙද දන්නේ නෑ මගේ යාළුවෙක්ගේ තාත්තා කෙනෙකුත් ඇවිත්. ටිකක් බලන්න කියලා කිව්වා."

මිහිරංග කීවේය. නේත්‍රා සිනාසුනාය.

"වැඩක් නෑනේ මල්ලී. සීයා කෙනෙක්ව ගත්තනේ. අර ආපු බෝයිව දේවකව."

නේත්‍රා කීවාය.

"අරන් බලන්න කියන්නකෝ. බලමුකෝ ඔය දෙකයි පනහේ උන් සීගිරි එක හදන හැටි. මට දෙන්නකෝ ෆයිල් එක."

"මම ළඟ නෑ සීයගේ රෑම් එකේ ඇති."

නේත්‍රා ගාණක් නැතිව කීවාය. මිහිරංග යනවා ඇය ටික වෙලාවක් බලාගෙන උන්නාය. 'කොල්ලා සීගිරි එකට එනවට ආසම නෑ වගේ. ලේසිවෙන්නේ නෑ අලුත් කොල්ලට වැඩකරන එක.' ඒත් දේවක සාමාන්‍ය කොල්ලෙක් නොවේ. ඒ නිසා නෙත්‍රාට සැනසීමක් දැනුණි.

මිහිරංග ඇප්ලිකේෂන් ෆයිල් එක අතට ගෙන බලාගෙන ගියේය.

"පර බල්ලා. උගේ නම දේවක."

මිහිරංග පෙරළ පෙරළා හෙව්වත් දේවකගේ අයදුම්පත ඔහුට ලැබුනේ නැත.

"උගේ ඇප්ලිකේෂන් එක නෑනේ මෙතන. කෝ ඒක."

දේවක රඹුක්වැල්ල මහතාගේ ෆයිල්ද එහෙන් මෙහෙන් ඇද බැලුවේය. ඒ කිසිවක ඔහුගේ අයදුම්පත තිබුණේ නැත.

"උගේ ඇප්ලිකේෂන් එක මේ ෆයිල් එකෙන් අයින් කරලා. බලමු එහෙනම්."

දැන් ඒක සොයා තේරුමක් නැත.

"කමක් නෑ. මූට එන්න කියන දවසක් ඇතිනේ ජොබ් එකට එද්දාට එන්නේ මෙතන ස්ටෑන්ඩ් එකෙන් බැහැලනේ. බලගමුකෝ. උඟට සීගිරි එකට පය තියන්න දෙන්නේ නෑ. එච්චරයි. තුෂාලා ලස්සනට ගේම දෙයි. උන් පුරුදුවෙන්න වැඩකරන උන් නෙමේනේ."

දෙකක් ඇන්න විට දේවක සීගිරි එකට එන එක නවත්වන්නට පුළුවන්

කියා මිහිරංගට විශ්වාසය.

"උඹ වැඩ බාරගන්න එන දවස බලාගන්න ඕන."

සීගිරි එක හදන්න බැරිය. අවශ්‍ය වෙන්නේ එය බෙදාගන්නටය. ඉක්මනට සීගිරි එක බංකොලොත්වෙනවා දකින්නට මිහිරංග ආශා කළේය. එය නුදුරු දිනයකම වෙන බව ඔහු දනී. කාටවත් ඒක වළක්වන්නට අමාරුය.

# 31

දේවක උන්නේ වෙන සිහිනයකය. ඔහු කල්පනා කළේ ඔහුගේ දැණුමෙන් සීගිරි එක ලංකාවේ නමගිය සුපර් මාර්කට් එකක් කරන්නටය. එය ලේසි දෙයක් නොවන බවද ඔහු දැනගෙන උන්නේය. පාරිභෝගිකයෙක්ගේ වාහනයක් එහෙම ලේසියෙන් තැනකට හැරවෙන්නේ නැත.

එහෙත් මේක කෙසේ හෝ කරනවා කියා දේවක සිතාගත්තේය. එහෙම

බැරිවුවහොත් සීගිරි එකට ගිය ලෙසින්ම අස්වීමේ ලිපිය දී ආපසු එනවා කියා ඔහු සිතුවේය. දිනන්නට බැරි සටන් බිමක කඩුව වනා තේරුමක් නැත. ඔහු එහෙම කැමති නැත.

"ඒත් ඊට කළින් අන්තිම හුස්මවෙනතුරු ෆයිට් කරනවා."

ඔහු සිතුවේය. පොළේ මිනිස්සු මෑකරල් විකුණන්නේ ඈට වඩා මෑ හොඳයි කියාය. එහෙම කෑ ගසා සුපර් මාර්කට් එකකට සෙනඟ අද්දන්න අමාරුය. කළ යුත්තේ සියුම් වැඩය.

දේවක ළිඳට ගොස් ඇඟ සෝදාගෙන ආවේ නිස්කලංකයේ තව ටිකක් කල්පනා කරන්නට සිතාගෙනය. හෙට හෝ අනිද්දා නොවේනම් සඳුදා

උදේ සිට තමා සීගිරි එකේ අලෙවි ප්‍රවර්ධන කළමණාකරු බව ඔහු දනී. එය ලේසි පාසු තනතුරක් නොවේ. සේල්ස් ප්‍රමෝෂන් කළමණාකරුට සේල්ස් වැඩිකරන්නට නොහැකිනම් ඒ පඩියවත් අතින් ඇල්ලීමට අයිතියක් නැත.

"එක දුකයි තියෙන්නේ. අප්පච්චි ගෙදර එන වෙලාවට බත් කටක් උයලා තියන්න වෙන්නේ නෑ. පහට ඕෆ් වෙන්න බෑ. අඩුම ගානේ හත වෙනකල්වත් සීගිරි එකේ ඉන්න වෙනවා."

ඒත් කරන්න කියා වෙන දෙයක් නැත. වගකීමක් බාරගත්තානම් එය කළ යුතුය. කෙල්ල කීවේද එයමය. 'ඇඹුල් තියල් හට්ටි පන්සීයක් දාලා පෙන්නන්න වෙයි. එළියේ බාබකියු

දාලා දෙන්න වෙයි. හොඳද' භාවනා කීවේ එහෙමය.

"මම ඒ අභියෝගයට හරි කැමතියි මිස්."

දේවක සිතෙන හැමදේම සටහන් කර තබාගත්තේය. සීගිරි එකට ගියපසු වැඩකරන්නට වෙන්නේ කොළ බලාගෙන නොවේ.

ජීවන් ආවේ හයට පමණය. ඔහු එන ගමන් උණුවෙන් ආප්ප ටිකක්ද දමාගෙන ආවේය. කොල්ලා ආප්ප කන්න රුසියෙකි. වෑන් රියෙන් බසිද්දීම ජීවන් දැක්කේ දොරකඩ කටු සිමෙන්ති පඩියට වී කල්පනා කරන කොල්ලාවය. ජීවන්ගේ පපුව හෝස් ගා ගියේය. 'පව්. දැන් හිතට ටිකක් බරත් ඇති. වගකීමක් පපුවට ආවාම එහෙමයි. තාම පොඩි එකානේ' ජීවන්

සිතුවේ එහෙමය.

"අප්පච්චී."

ජීවන් සිනාසී කොල්ලාගේ කරට අතක් දමාගත්තේය.

"එහෙනම් සීගිරි එකට ගියා. ඔයාගේම හයියෙන්."

ඔහු කීවේය.

"හෙට සීයා ඇවිත් හම්බවෙන්න කියලා අප්පච්චී."

"කීයටද?"

"මේ කතාකරපු මිස් කිව්වේ සීයාගෙන් අහලා කියන්නම් කියලා."

"ඒ ඔයාගේ නංගි. මාමගේ දුව."

"නෑකම් කියන්න බෑනේ අප්පච්චි."

"ම්. බෑ තමයි. අපි දැනට මෙහෙම යන්."

"හොඳ ළමයෙක්."

ජීවන් සිනාසුනේය. කොහොමත් මිලින්දගේ පවුල ගැන ජීවන්ගෙ ද සිතේ ඇත්තේ ප්‍රසාදයකි. ඔහුගේ බිරිඳ ඉඳුනිල්ද හොඳ ගැහැණියකි. ජීවන්ට හොඳටම මතක නේත්‍රාවය. ඇය දැන් ඉන්නේ රෝද පුටුවක බව ජීවන් දනී.

"මොනවද හිත හිත හිටියේ."

"මම මවලා පෙන්නපු දේ එයාලට ඇත්තට මවලා දෙන්න ඕනනේ අප්පච්චී."

"ම්. ඒකයි වැදගත්ම දේ. ඔයාට පුළුවන්. ඔයාට "

ජීවන් කීවේය. ඒ වචන කොල්ලාගේ හිතට ශක්තියක් විය.

"එහෙම තමා මාත් හිතන්නේ අප්පච්චී."

"ඒත් ලේසිවෙන්නේ නෑ

මහත්තයෝ. ඔක්කොම එක වගේ නෑ."

"මට තේරෙනවා අප්පච්චී. එතන පොරක් මාව කැපුවා."

"බලමුකෝ. මම ආප්ප ගෙනාවා."

"දාමු හොඳ ස්ට්‍රෝං ටී දෙකක්."

කොල්ලා කීවේය. ජීවන් සිනාසුනේය. දෙන්නා කොහොමත් කන්නේ නමය පමණ වීය. දේවක කේතලය ලිපේ තබා ආප්ප පාර්සලට ලෙහුවේය. හොඳ උණු ආප්පය. ඔහු වාටියක් කඩාගෙන කෑවේය.

"හාල් පිටි දාන කම්පනි එකක් එක්ක කතාකළානම් අපිට ආප්පත් දාන්න බැරි නෑ එයාලගේ ආප්ප පිටිනේ මාකට් වෙන්නේ. ඒකත් බලන්න ඕන. මාරයි ආප්ප දාලා දුන්නොත්. කට්ට සම්බෝල එක්ක.

කුළුබඩු දාන මාස් කම්පනිය හොඳ කට්ට සම්බෝලයක් දානවා එයාලවත් වැඩේට කතාකරගන්න පුළුවන්. අපට සාම්පල් බක්කියක් දෙන්න කියලා. ඒ වෙලාවේ ආප්පයක් කාලා හොඳනම් කස්ටම අරගන්නවනේ. උදේට කිරිබතක් හැදුවා කට්ට සම්බෝල බෝතලේ තිබ්බා. අන්න කතාව."

දේවක ලස්සනට එය පාදාගත්තේය. මේ සියල්ල කරන්නට වෙන්නේ තමාටය. එහෙත් ඒ හැම එකක්ම කරන්නට පෙර එයට අනුමැතිය ගන්නට ඕනය. ඒකට පොඩි රිපෝට් එකක් හදා දෙන්නට ඕනය. දේවක ඒවා ලස්සනට ඉගෙනගෙන ඇත.

"ලොකු මහන්සියක් කියලා දැනෙන එක්ක නෑ මිස්. ඔයා ඉන්නවනේ ළඟක

පාතක. මූණ ටිකක් බලාගත්තම හරි සැනසීමයි.”

එහෙම සිතන්න තමා කවුද කියා දේවක පසුව සිතුවේය. ‘ඒ පාර කෙල්ලගේ කොල්ලා ඇවිත් මාව ඇඹුල් තියල් දායි. මගේ කෙල්ලට බැල්ම දානවා කියලා. මේක මලක්නේ. ලස්සන කොල්ලෙක් ඇති’ ඔහු ලෝබකමින් සිතුවේය.

“අප්පච්චී.”

දේවක ආප්ප අරගෙන ආවේ ලුණු මිරිස් මැදට දමාය. ඔහුද ලුණු මිරිස් මැදට දමා ආප්පයක් දෙකට නවාගත්තේය. ආප්ප කන නියම පැටින් එක මේකය.

“අපි දෙන්නම ගියාම දවල් ගේ පාළුයිනේ. මම හිතුවේ පුතේ හේරත්ට ටිකක් එන්න කියන්න.”

හේරත් ජීවන්ගේ දුර නෑවෙන කෙනෙකි. ඔහු විවාහ වී නැත. ඒ දවස්වල බොහෝ ටික උන්නේ ජීවනුත් කොල්ලාත් ළඟය.

"ඒක මරු අදහස අප්පච්චි. අනේ එන්න කියන්න. අපටත් පාළු නෑනේ හොඳ මනුස්සයා. රෑට කෑම ටිකත් හදලා තියයි ෂේප් එකේ. හේරත් මාමා අපිත් එක්ක ඉන්නත් හරි ආසයි"

"මම හෙටම එන්න කියන්නම්. සීගිරි එකෙන් පහට එන්න බෑ. ඔයාට හතට අට වෙනකල් ඉන්න වෙනවා මුළදී."

අප්පච්චීගේ තේරුම් ගැනීම පුදුමය. 'අම්මා හැමදේම දාලා ඔයා එක්ක ආවේ ඒකනේ.' දේවක සිතුවේය.

# 32

"අපට ෂෝක් කොල්ලෙක් හම්බවුණානේ ලොකු පුතා"

රඹුක්වැල්ල මහතා රෑ මිලින්දට කීවේ දේවක ගැනය. ඒ වෙලාවේ නේත්‍රාත් භාවනාත් ඒ අසළ විය. නේත්‍රා පරිස්සමින් කෙල්ල දෙස බැලුවාය. 'ඒකා ගැන කියනකොට මේකීගේ මූණ හරි එළියයි' නේත්‍රා ඉවෙන් මෙන් සිතුවාය. මේ ඇගේම බාල නංගීය. කෙල්ල බලද්දී නේත්‍රාට

තේරෙයි.

"හොඳයිනේ තාත්තා. අපි ගමුකෝ ඉතින්."

රඹුක්වැල්ල මහතාගේ විස්තරය අසාගෙන ඉඳ මිලින්ද කීවේය.

"කොල්ලට කිව්වා නේද මැණික."

රඹුක්වැල්ල මහතා ඇසුවේ භාවනාගෙනි. 'මේකීට කියලා තියෙන්නේ කොල්ලට කතාකරන්න කියලා. ආල වට්ටම් දාලා කියන්න ඇති' නේත්‍රා සිතුවේ ආදරයෙනි. ඇගේ හැටි නේත්‍රා දනී.

"ඔව් සීයේ. හෙට එයි. එයාගේ ජීවිතේ අහපු සුබම ආරංචියලු මට පිනුත් දුන්නා."

'කතාව දුර ගිහින් වගේ' නේත්‍රා සිතුවාය.

"හොඳ කොල්ලෙක් පුතා. අපට

දෙයක් කරන්න පුළුවන්.”

එතනට රුවන්ති ආවේ බීබීසි වාර්තාකාරියක මෙන්ය.

“එන එන එකාව එහෙම ගත්ත ගමන්ම විශ්වාස කරන්න එපා තාත්තේ. මොන දේ කළත් මේ අපේ කොල්ලෝ අතේ බලතල තියන්න.”

රුවන්ති කීවාය. මිලින්ද සිනාසුනේය.

“බලතල ගන්න නෙමේ නංගි කට්ටිය ඕන වගකීම් ගන්න. එදා දැන් කෝසළට අපි වගකීම් සෑහෙන ගොඩක් දුන්නේ. කෝ මොනවත් ගත්තේ නෑනේ”

මිලින්ද ඇඟට පතට නොදැනී කීවේය. භාවනා සිනාසුනාය.

“සුදුස්සාට සුදුසු තැන දෙන්න ඕන. එතකොටයි කොල්ලෙක්ගෙන්

වැඩක් ගන්න පුළුවන්."

රුවන්ති කීවාය.

"මම දෙන දේවල් රුවන්ති දෙන විදිහට දෙන්නම්. කවුරුවත් කලබලවෙන්න ඕන නෑ"

රඹුක්වැල්ල මහතා කීවේය.

"මම ගත්තේ මට හොඳයි කියලා හිතුන කොල්ලව. මට වැඩකරන්න පුළුවන් කොල්ලෙක් වෙන්න ඕන කවුරුවුණත්. කෝසළට විතරක් නෙමේ මම හැමෝටම වගකීම් දෙන්න ඉන්නේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"සඳුදා ටිකක් එන්න පුතා. අපි පොඩි තීරණ ටිකක් ගන්න ඉන්නේ එදාට. ඔයත් ඉන්න ඕන."

"මම එන්නම් තාත්තේ. අපරාදේ ඉන්ටවීව් එකට දන්නවානම් මම

එනවා. මම දන්නේ නෑනේ මෙච්චර හොඳ කොල්ලෙක් එනවා කියලා."

මිලින්ද කීවේය.

"අපි හරියට පුදුම වුණා නේද ලොකු පුතේ."

රඹුක්වැල්ල මහතා කීවේ නේත්‍රා දෙස බලාය.

"සීයා ගත්ත තීරණය හරියටම හරි. ඒ මල්ලිගෙන් මටත් මොකක්ද දැනෙනවා. වැඩකාරයෙක්. එච්චරයි."

නේත්‍රා කීවාය. භාවනා හරි ආදරෙන් අක්කා දෙස බැලුවාය.

රෑ කෑමෙන් පසු නේත්‍රාව කාමරයට එක්කාගෙන ගියේ භාවනාය. භාවනා රෝද පුටුවෙන් හැරී කෙල්ල දෙස බැලුවාය.

"බබා."

"ම්"

"අද හරි සතුටින් වගේ."

නේත්‍රා ඇඟට පතට නොදැනී ඇසුවාය. 'අක්කට ඉව' භාවනා ඊට වඩා කපටිය.

"එහෙම විශේෂ සතුටක් කියලා නෑ."

නේත්‍රා ඇගේ අතකින් අල්ලාගත්තාය.

"ෂුව."

"ම්"

"මොකෝ ඇස් හරවන්නේ. ඇස් දෙක දිහා බලාගෙන කියන්න."

"යන්න අනේ."

නේත්‍රා සිනාසුනාය.

"අද ලස්සන ස්කට් එකකුත් ඇඳලා."

"ඉතින් මේක ගිය සැටඩෙත්

ඇන්ඳා."

"පලයන් යන්න. උඹට ළඟ තියෙන ගොරක මදි මාව තම්බන්න."

නේත්‍රා කීවාය.

"ඒ වුණාට මම ළඟ විනාකිරි තියෙනවා. ඒවටත් හොඳට තැම්බෙනවා."

කෙල්ල කීවාය. නේත්‍රා බැලුවාය.

"ඒක නෙමේ. අර මල්ලිට කතාකළාද ඉතින්."

"ම්."

කෙල්ලගේ ඇස් කැරකෙයි.

"මොනවද කියන්නේ."

"පින්ම දෙනවා. මඟින් මඟට"

"ඒකට එච්චරටම සීගිරි එකට එන එක වටිනවද?"

"ඒකනේ."

"ඇයි ඒ?"

"මම දන්නේ කොහොමද මාත් ඇහුවා."

"ආවම අහන්න ඕන අල්ලගෙන."

"මාත් ඉන්න තැන අහන්න හොඳේ."

කෙල්ල කීවාය.

"ඉතින් තව මොනවද කිව්වේ?"

"කතාකරන වෙලාවේ උයනවලු."

"අනේ මේකා."

"ම්. එයා තමයි උයන්නේ. පස්සේ මම ඇහුවා මොනවද ඉතින් අද හදන්නේ කියලා."

"ඒවත් ඇහුවාද?"

"නිකම්ම ඇහුණා අනේ."

"උඹත් මරුනේ. එඟ එම් එකකින් වගේනේ."

"පස්සේ මට ලැජ්ජත් හිතුණා."

"ගාණක් නෑ කොල්ලා අහිංසකයි."

"ම්."

"ඉතින් මොනවද හදනවා කිව්වේ?"

"කරවල තෙල් දාලා පොල් සම්බෝල හදලා පරිප්පු"

"බබාගේ ආසම මෙනූ එක."

"මට කියන්නත් හිතුණා පස්සේ කිව්වේ නෑ."

"ඒ ආවේ කවුද වගේ මටත් තේරෙන්නේ නෑ ඇයි එහෙම හිතෙන්නේ කියලා?"

"හොඳ කෙනෙක් වගේ."

කෙල්ල කිව්වේ වචන බරකරය.

"මී ගිහින් නිදාගන්න. අද ගොඩක් කෑවෙත් නෑ මම බලාගෙන."

"බඩගින්නක් තිබුණේ නෑ අක්කි. ගුඩ් නයිට් බුදු සරණායි."

භාවනා කීවේ නේත්‍රාගේ මුහුණ සිපගෙනය.

"මම ටොයිලට් එකට එක්කගෙන යන්නද?"

භාවනා ඇසුවාය.

"නෑ බබා. දැන්මම යන්නේ නෑ නිදාගන්න. මට වැඩක් තියෙනවා."

"ම්."

# 33

භාවනා ඇගේ කාමරයට ආවේ සිංදුවක්ද කියාගෙනය. මේ දවස්වල සිංදු කියවෙනවා වැඩිය. ඇය ආ විගසම කළේ කැඩපත අසළට වී ඇගේම මුහුණ දෙස බලාගෙන ඉන්න එකය. 'මොකක්ද වෙලා තමයි අක්කා අහන එක පුදුමයක් නෙමේ' භාවනා සිතුවාය.

ඒත් සමඟම ඇයට සිහිවූයේ හෙට එන වෙලාව දේවකට කිව යුතු

නොවේද කියාය. කෙල්ල මේ කල් මරන්නේ ඒකටය. ඔහුට ගන්නේ ටිකක් රෑ වෙලා කියා ඇය සිතාගත්තාය. 'ලොවම නිදන මහ රෑ ඔෆිස් එකේ වැඩවලට කෝල් කරනවද? මටත් පිස්සු.' ඇයට සිතෙයි. එහෙත් හිත කියන්නේ ඔහුට රෑ වී ගන්න කියාය.

භාවනා නාන කාමරයට යන්නට පෙර නිකමට මෙන් ඇගේ ජංගම දුරකථනය දෙස බැලුවාය. එයට දේවකගේ අංකයෙන් කෙටි පණිවිඩයක් ලැබී තිබිණ. 'එයා එවලා තියෙන්නේ.' කෙල්ලගේ අත වෙව්ලයි.

"මිස්. මම දේවක පුංචි බණ්ඩාර. ඉන්ටවීව් ආවේ. මම රෑ වෙනකල් ඇහැරලා ඉන්නේ කීයටහරි මට හෙට එන වෙලාව කියන්න මිස්. බුදු සරණයි. දේවක"

කෙල්ලට පව් කියා සිතුණි. ඔහු ඒ ගැන ඉන්නේ තද බලාපොරොත්තුවකිනි. 'මට වෙනම පවක් පිරෙනවා මේ කොල්ලව අසරණ කරලා.' ඒත් ඔහුට දැන්මම ගන්න හිතෙන්නේද නැත.

"රෑ වෙනකල් ඇහැරලානේ ඉන්නවා කියන්නේ.රෑ වෙලා ගන්නවා. එතකල් මමත් ඔයාට එස් එම් එස් එකක් එවනවා."

භාවනා කෙටි පණිවිඩයක් ටයිප් කළාය.

"මම ටිකක් බිසී. රෑට ගන්නම්. භාවනා."

කෙල්ල යැව්වේ එච්චරය. තව මොනවා හෝ ටයිප් කරන්නට තිබුණා කියා ඇයට සිතුණි. 'රළුත් වැඩියි වගේ නිකං අලි පොර වගේ එහෙම

යැව්වේ' ඇය සිතුවාය. ඒත් දැන් වෙච්ච වැරද්ද නිවැරදි කරන්න බැරිය. ගිය කෙටි පණිවිඩය ගියාමය.

"ඇවිත් ගන්නවා. හෙට එන්නත් එපැයි එයා."

භාවනා සිතාගත්තාය. ඔහු එන්නටත් පෙර සීගිරි එක පුරා ඔහු ගැන යන්නේ හොඳ නාමයකි. 'ඔයාට ඇස්වහ කටවහ ටිකක් පුච්චගෙ නම එන්න වෙයි දේවක.' එහෙම වදිනවානම් වැඩියෙන්ම ඇස්වහ වදින්නේ තමාගෙන් නොවේද කියා භාවනා පසුව සිතුවාය. 'අනේ මන්දා මටත් වෙච්ච දෙයක්.'

නිවස පුරාම ඇත්තේ තද නිහඬතාවයකි. භාවනා ඇගේ රෑ ඇඳුම වතට දමාගත්තාය. විශේෂ රාත්‍රීන්හීදී කෙල්ල අඳින්නේ ඇගේ සුදු

පැහැගත් රෑ ඇඳුමය.

*** *** *** *** ***

මේ මොහොතේ දේවක උන්නේ සාල කෑල්ලේ තබා ඇති කුඩා මේසයේය. කොල්ලා වැඩය. දිගටම වැඩය. ඔහු දැන් පැයක පමණ තිස්සේ එක දිගටම වැඩය. ඔහු සීගිරි එකේ අලෙවිය වැඩිකිරීමට යෝජනා විස්සක් පමණ මේ වෙද්දී ලියා හමාරය.

උඩුකයට සුදු වෙස්ට් එකක් පමණක් ඇඳගෙන ඉන්නා දේවකට අවට ගහකොළ සිපගෙන එන සීතල සුළඟ එහෙමම දැනෙයි. වෙල්යාය පැත්තේ සිට එන සුළඟ මේ රැයේ හරි සීතලය. එහෙම වෙන්නේ සාල

කෑල්ලේ කිසිම ජනේලයක් සවිකර නැති නිසාය. මේ නිවසේ ඇති ලස්සනත් එයමම යැයි කොල්ලාට සිතෙයි.

තේ හැදුවේ ජීවන්ය. කොල්ලා තව පැයකට හමාරකට මෙතනින් නැඟිටින්නේ නැති බව ජීවන් දනී. වැඩකරන්නට ගත්විට අම්මා වාගෙ ය. ඒ දවස්වල ඇයත් එහෙමය. කොල්ලාට පිහිටා ඇත්තේ ඒ ගතිගුණය. ජීවන් වැඩ් කහට කිරි තේ දෙකක්ම හදාගෙන ආවේය.

"තේ හැදුවද අප්පච්චි?"

"ම්. වැඩේ කරගෙන යන්න."

"පොඩි ප්‍රොජෙක්ට් එකක් හැදුවේ අප්පච්චි."

"ම්. උදේ නැඟිටලා උයන්න යන්න එපා අපි යන ගමන් මෙනවා හරි

කමු."

දැන් මේ කොල්ලා ලවා උයවන්න ජීවන්ට දුකය.

"මම කුකින්වලට ආසයි අප්පච්චි. එහෙම හදනනේ නැතුව ඉන්න බෑ එහෙම වුණාම අතේ හුරුව යනවා. අනික කුකින් කරනකොට මරු කල්පනා එනවා"

ජීවන කුසලතාවයක් එහෙම මරාග න්න එක පවකි. ජීවන්ද එය හොඳින් දනී. ජීවත්වෙද්දී කොල්ලෙක්ට මේ හැමදෙකයක්ම ඕනාවෙයි.

ජීවන් ගියේ කොල්ලාගේ හිසත් පිරිමැදය. දේවක සිනාසුනේය. අප්පච්චි ඉරයි සඳයි දෙකම වී තමාගේ ජීවිතය වටේ කැරකෙනවා කියා ඔහුට සිතෙයි.

භාවනාගෙන් තවම ඇතමතුමක්

නැත. කෙල්ල මේ කල් මරන්නේ රෑ දහය පනින තුරුය. මේ යක්කු ගස් නඟින වෙලාවේ කතාකරන්නට බලාගෙන ඉන්නා තමාට ඇත්තේ එසේ මෙසේ පිස්සුවක් නොවේ යැයි භාවනාට සිතෙයි.

අවසානයේ ඇය ඇමතුම ගත්තාය. භාවනා ඇමතුම ගත්තේ ඇඳට ගොඩවී පොරවනයෙන් ගතත් පොරවාගෙනය. අද ටිකක් සීතල දවසකි.

"හෙලෝ. මම භාවනා කතාකරන්නේ"

"දන්නවා මිස්. මිස්ටත් තියෙන කරදරයක්නේ."

'හරිම කෑඳෑඳෑයක් තමයි අනේ' කෙල්ලට කියන්නට සිතෙන්නේ එහෙමය.

"එහෙම නෑ. මම පොරොන්දු වුණානේ කියනවා කියලා. සීයව අල්ලගත්තේ දැන්."

කෙල්ල ලොකු බොරුවක් කීවාය. වෙන මොනවා කියන්නද??

"නිදාගෙනද හිටියේ දේවක."

ඔහුගේ නම මුවින් පිටවෙද්දීත් අමුතුය.

"අනේ නෑ මිස්. මේ පොඩි ප්‍රොජෙක්ට් එකක් හද හද හිටියේ. හවස ඉඳලා හදනවා මිස්"

"සීගිරි එකටද?"

"ඔව් මිස්. සේල්ස් ප්‍රමෝට් කරන වැඩ ටිකක්. මම සර්ට දෙන්න ඕනනේ මිස් මගේ ප්ලෑන් එක. කතාවට කියාගෙන ගියාට මේක පිළිවෙලකට ප්ලෑන් එකක් විදිහට බජට් එකත් එක්ක දෙන්න ඕනනේ මිස්"

ඔහු ලේසි පාසු කෙනෙක් නොවේ. රස්සාවට එන්න කලින් වැඩකරන අය නැත.

"කියන්න බලන්න එකක් දෙකක්."

ඇය කීවේ දුරකථන සංවාදය තව දිග්කරගන්නටය.

"දැන් මිස් මේ එන්නේ සිංහල අලුත් අවුරුදු සීසන් එකනේ."

"ම්."

"සුපර් මාර්කට්වලට හොඳ කාලයක්. ඇත්තටම කිව්වොත් කන්සියුමර් ට්‍රේඩ් එකේ වසන්ත කාලේ"

"දන්නවා"

"අපි මිස් හිතන්න ඕන දවසකට සෑහෙන සේල් එකක් කරනවා කියලා ඒ මාසේ."

"හරි."

"අපි කියන්නේ මිස් මේ පාර සිංහල අලුත් අවුරුදු කිරිබතට සුදු කැකුළු හාල් සමඟ සීනි සම්බෝලෙට ලූණු කිලෝ එකක් අපෙන් කියලයි. ගණන් බැලුවාම මිස් ඒ දෙකටම යන්නේ එකසිය හතළිහයි තොග ගාණ බැලුවාම. අපෙන් රුපියල් දෙදාස් පන්සීයට වඩා බඩු ගන්න අයට කිරිබතට කැකුළු හාල් කිලෝ එකයි සීනි සම්බෝලෙට ළූණු කිලෝ එකයි අපි දෙනවා. අනිත් සුපර් මාර්කට් මේ වැඩේ කරන්න කලින් අපි කරන්න ඕන. එයාලට ලැජ්ජයි අපිව කොපි කරන්න. ඉතින් කස්ටමස්ලා එනවා. ඒක ෂුවර්."

භාවනාට පුදුම නැත. ඇයට හිතාගන්න බැරි මේ ඔළුව ගැනය.

"ඒක ෂෝක්නේ."

"ඒකනේ මිස්. අපි දැන්ම ඉඳලා මේක ඇඩ්වටයිස් කරන්න ඕන. තව මාස දෙකයිනේ තියෙන්නේ. ඕක ඒ පාර කටින් කට යනවා."

"ඒක තමයි."

"තව එකක් මිස්."

"ම්."

"සිංහල අවුරුද්දට කලින් අපි අපේ බේකරි සෙක්ෂන් එක පටන් ගන්න ඕන මිස්. ඒකෙන් අපි අලුත්ම රසම රස බටර් කේක් පොල් කේක් චොකලට් කේක් දාලා දෙනවා සිංහල අවුරුදු මේසෙට. සීගිරි කේක් කියලා. එයාලා ගන්නවා මිස්. ග්‍රෑම් පන්සීයේ කිලෝ එකේ දෙකේ කේක් දෙන්න ඕන. බේක් කර කර බානවා පේනකොට එයාලා ගන්නවා මිස්."

ඇයට දැන් මැවී පෙනෙයි.

"හෙට සීයට ඒක අනිවාර්යයනේ කියන්න."

"ඒක තමයි මිස් මේ ලියන්නේ. මිසුත් කියන්න."

ඔහු කීවේය.

"එහෙම බෑනේ. ද්වේවකගෙනේ අදහස ඔයාම කියන්න."

කෙල්ල දයාබරව කීවාය.

"අපි මිස් සිංහල අවුරුදු මෝජුව දාන්නම ඕන. මං කිව්වේ බටු බෝජුව මිස්. ඒක ගොඩක් දාන්න වෙයි. හැමෝටම ඒක දෙනවා අඩුවට. අපි හොඳ උයන්න දන්න ආච්චි අම්මා කෙනෙක් වැඩේට සෙට්කරගමු. හොයාගන්න පුළුවන්. එයාව දාලම දෙන්න ඕන වැඩේ. මං ප්ලෑන් කරන්නේ දවසකට බටු කිලෝ පනහකවත් මෝජුවක් දාන්න."

"කිලෝ පනහක බටු මෝජුවක්"

"ඒකත් මදිවෙයි මිස්"

කෙල්ලට මේ සියල්ල එකවර හිතාගන්නත් අමාරුය.

"දේවක"

හදිස්සියේම මෙන් ඇය කතාකළාය. කෙල්ලගේ කටහඬේ වූයේ වෙනස් බවකි. කටහඬ ආවේද උගුරෙන් මෙන්ය.

"මිස්."

"අපි ළඟටම එන්න හොඳේ."

ඇයට බියක් දැනුණි. මේක කියන්නේ ඒකය. 'ඔයා හරි හොඳ කෙල්ලෙක් භාවනා' දේවකට සිතුණි. හැම කෙල්ලෙක්ම මෙහෙම නැත. හිතුනද කියන්නේ නැත.

"අනේ මිස්. මම වෙන කොහේවත් යන්නේ නෑ මාව විශ්වාස කරන්න

මිස්”

“මී විශ්වාසයි. දැන් ගොඩක් රෑ වෙලානේ. නිදාගන්නේ නෑ.”

“දැන්ම නිදාගන්නේ නෑ මිස්. මම ටිකක් අද ඇහැරිලා ඉන්නවා. මේ අප්පච්චි තේත් හදලා ගෙනත් දුන්නා තල ගුලි එක්ක.”

භාවනා මවාගත්තාය. ‘දෙන්නා හරි ආදරෙන් ඉන්නවා වගේ. ජීවිතේ පුංචි වෙනකොට ආදරේ ලොකුවෙනවා.’ භාවනා සිතුවාය.

“හොඳ අප්පච්චි කෙනෙක්නේ ඉන්නේ.”

“මගේ පණ මිස්.”

‘තවත් පණක් ඉන්නවාද’ කියා අසන්නට කෙල්ලට සිතෙයි. ඔහු කියන්නේම නෑ කියාය. සමහරවිට එය ඇත්තත්වෙන්න ඇත.

"හෙට අටයි තිහට එන්න සීගිරි එකට. සීයා ඉන්නවා."

"හොඳයි මිස්. එනකොට වෙන මොනවා හරි ගේන්න ඕනද දන්නේ නෑ මිස්."

"ඔය අදහස් ටික අරන් එන්න ඒ ඇති. සමහරවිට මන්ඩේ ඉඳලා වැඩකරන්න පටන් ගන්න පුළුවන් වෙයි. හොඳද?"

"හොඳයි මිස්. මිස්ට ගොඩක් පින්. මෙහෙම කරදරවෙවී මට කතාකළාට."

භාවනා සිනාසුනාය.

"ඉතින් අර කරවල බැඳුණුයි පරිප්පුයි පොල් සම්බෝලයි කෑවද රෑට."

එහෙම අහද්දී දේවකට දුකය.

"අනේ කෑවා මිස්. අද සතුටට

කාගන්නත් බැරිවුණා. මිස් කෑවද?"

පුදුමය. භාවනාගේ ඇතුළු ළය ඇකිලීගෙන ගියේය. කොල්ලෙක් මෙහෙම ඇහුවාමය.

"මී. ඉඳි ආප්ප කෑවා."

ඇය කීවාය.

"මම තියන්නම් එහෙනම්. හෙට එහෙනම් එන්න."

"හොඳයි මිස්. ගුඩ් නයිට්. බුදු සරණයි."

"බුදු සරණයි."

භාවනා දුරකථනය විසන්ධිකර පපුවට පිඹ ගත්තාය. එතන පුදුමාකාර ලෙස දැවෙයි. පිච්චෙයි. ඇය ඇස් පියාගෙන මොහොතක් උන්නාය.

"ඔයා මොකක්ද මට කළේ දේවක."

ඔහුට යළිත් කතාකර අසන්නට සිතෙයි. භාවනා ඇස් පියාගෙනම උන්නාය. කෙල්ලට මතක්වූයේ ඔහු කියූ තල ගුලියත් කිරි තේ එකත්ය. එහෙම තේකක් බොන්නට නැති පෙරේතකමක් ඇයට ආවේය. කෙල්ල නැඟිට්ටේ පහළට යන්නටය.

පහත මාලයෙන් මොකක්ද ඝෝෂාවක් ඇසුනේ කෙල්ල පිටතට යන්නට හැදූ විටමය. භාවනාට ආවේ ඇගේ නැන්දා වූ සුරංගිගේ කටහඬය. සුරංගි මිහිරංගගේත් මලීෂාගේත් අම්මාය. භාවනා ටික වෙලාවක් ඉහළ මාලයේ සාලයට වී කතාව අසාගෙන උන්නාය.

# 34

"එහෙම එක එකාට බලතල දීලා මෙතන තාත්තා අපේ උන්ව පහළට දාන්න ඇයි හදන්නේ. සේල්ස් ප්‍රමෝෂන් එකට කියලා මේ කොහේවත් යන උන් ගන්නේ. ලොකු පුතා ඉන්නේ හරි වේදනාවෙන්. අද කොල්ලා මාත් එක්ක කතාකළෙත් හරි දුකෙන්. ඔක්කොම දමලා ගහලා රට යනවා කියලා කිව්වා ගිය දවසට තේරෙයි කොල්ලගේ අගේ"

සුරංගි කෑ ගැසුවාය. 'තේරෙයි තේරෙයි. යන්න දෙන්නගේ තියෙන්නේ. මොකටද මෙතන කෑ ගහන්න ආවේ' කෙල්ල තනිවම බැන්නාය. 'මේ ඔක්කොම බයවෙලා ඉන්නේ ඔයාට දේවක. අනේ ඔයාව මේ සීගිරි එකට ගන්න බැරිවෙයිද?' කෙල්ලගේ හිතට නැති බරක් ආවේය.

"දැන් එදා ඇවිත් ඔයා කිව්වේ මොකක්ද? මලීෂාට ස්ටෝර්ස් බාර දීලා කියලා මට කෑගැහුවා. පස්සේ මේ කෙල්ල අගේට කරගෙන හිටපු කැෂියර් එක මම මලීෂාට දුන්නා. මිහිරංගට පර්චර්සින් දුන්නා. තව මොනවද ඕන කියන්න."

රඹුක්වැල්ල මහතා ඇසුවේ වේදනාවෙනි. භාවනා නිහඬව ටික

වෙලාවක් උන්නාය.

"ඔය ගන්න එකෙක්ව දාන්න මිහිරංගගේ යටතට. එහෙමයි වෙන්න ඕන."

සුරංගි කීවාය. රඹුක්වැල්ල මහතා ටික වෙලාවක් නිහඬව උන්නේය.

"දැන් ගන්න හැම කෙනාවම මිහිරංගගේ යටතේද දාන්න ඕන. ආ."

රඹුක්වැල්ල මහතා ඇසුවේය. 'මෙයාව වයින් කරලා එව්වේ මිහිරංග. එයා හරි කේන්තියෙන් ඉන්නේ දේවක ගැන. බැබලෙන අහිංසක කොල්ලට බයයි' භාවනා සිතුවාය.

"මම අලුතින් ගන්න ළමයව දාලා තියෙන්නේ ලොකු දුවගේ යටතේ. එච්චරයි. ඒක කරලා ඉවරයි. නේත්‍රා

කියන විදිහට ඒ කොල්ලා වැඩ කරයි. එයාව මිහිරංග යටතටම දාන්න ඕන කියලා නීතියක් එහෙම තියෙනවද සුරංගි. ආ. හෙට අනිද්දා උඹ ඇවිත් කියයිනේ මටත් මිහිරංග යටතේ වැඩ කරන්න කියලා සීගිරි එක හැදුවේ මම. මමයි මිලින්දයි අර මැරිච්ච කෙල්ලයි. ඒ කෙල්ල අද උන්නානම් මම මේක ඒකීට දෙනවා. එච්චර දක්ෂ කෙල්ල. මේ හැමදේම එක මිටකට අරන් කරයි. කවදාවත් මගෙන් දෙයක් ඉල්ලුවේ නැති එකම කෙල්ල. ඉල්ලපු එකම දේ මට ඒකීට දෙන්න බැරිවුණා"

රඹුක්වැල්ල මහතා දරුණු වේදනාවකින් කීවේය. සීගිරි එක පිටුපස පොඩි නැන්දා සිටින බව භාවනා හරියටම දන්නේ අදය.

"ඔව් එයා කළේ. අන්තිමට හිඟන්නෙක් එක්ක පැනලත් ගියේ. අපි ගියේ වැදගත්කමට."

සුරංගි කීවාය. භාවනාට හරි අපුල දුකක් දැනුණි.

"නැතිවෙච්ච නැන්දිට බණින්න එපා ඒක පව්. ඇයි එහෙම කරන්නේ"

නේත්‍රා කීවාය.

"උඹලා ඔක්කොටම වඩා මැරිච්ච කෙල්ල හොඳයි තමයි. කවදාවත් මේවලට අයිතිය කියාගෙන ආවේ නෑ. ජීවන් නරක කොල්ලෙක් නෙමේ. මට කොල්ලව පිළිගන්නයි තිබුනේ. ඒක මගේ අතින් වෙච්ච නරකම වැරද්දක්. නරකම වැරද්දක්."

රඹුක්වැල්ල මහතා වේදනාවෙන් කීවේය. 'ජීවන්...ඒ නැන්දි මැරිකරපු අන්කල්. අක්කා කියන්නේ හරි

හොඳ මාමා කෙනෙක් කියලා. හරිම හොඳයිලු.' භාවනා සිතුවාය. කෙල්ලට හිතෙන්නේ ඇඳුමක් දාගෙන පහලට යන්නටය. එහෙත් ඇය ගියේ නැත.

"හැමෝම ඉන්න තැන මම එක දෙයක් කියන්නම්. ඒක කියන්නම ඕන. මම කවදාවත් මේ සීගිරි එක බෙදන්නේ නෑ. මිලින්ද රුවන්ති සුරංගි හැමෝම ඒක දැනගන්න. මම කවදාවත් සීගිරි එක බෙදන්නේ නෑ. කවදාවත් නෑ."

"බෙදන්නත් එපා තාත්තේ."

මිලින්ද කීවේය.

"ඔව් මිලින්ද කියන කතාවම තමා නර්මදාත් කිව්වේ. කවදාවත් සීගිරි එක බෙදන්න එපා කියලා. ඒත් මම දවසක මේ සීගිරි එක කෙනෙක්ට

දෙනවා.”

රඹුක්වැල්ල මහතා කීවේය.

“මට කවුරු තරහ වුනත් එකයි නැතත් එකයි. ඒත් දවසක මේ සීගිරි එක මම දෙන්නේ අවසන් මොහොත දක්වා මේක ආදරෙන් කරගෙන යන කෙනාටයි. එච්චරයි ඒ අයිතිය මගේ අතේ තියෙන්නේ උඹලා මගේ මරණෙට නාවත් මට කමක් නෑ. මම ගන්නේ මට හිතෙන දේ හරියි කියලා හිතෙන දේ. ඒනිසා ඉන්න පුළුවන් එකෙක් ඉන්නවානම් ඉන්න පුළුවන්. යන අයට යන්න පුළුවන් එච්චරයි. තව දෙයක්. මම තාම මැරිලා නෑ. ලේසියෙන් මම මැරෙන්නෙත් නෑ මම මගේ මුණුපුරෙක්වත් ඉස්කෝලේ එක්කගෙන ගිහින් තමයි මැරෙන්නේ. එදාට අපි බලාගමු. එතකල් මගේ

සීගිරි එක මට ඕන විදිහට කරගෙන යන්න දෙන්න.”

රඹුක්වැල්ල මහතා කීවේය. ‘සීයා පව් එයා මෙහෙම කියන කෙනෙක් නෙමේ එයාටත් දුකයි හෙණ ගහනවා මෙහෙම ප්‍රශ්න දානවට’ භාවනා සිතුවාය.

“වැඩ කරනවානම් මිහිරංගට ඇවිත් වැඩකරන්න පුළුවන් එහෙම නැත්නම් එයාගේ ජීවිතේ ගැන ගන්න තීරණයක් ඔයාලා ගන්න. මට කවුරු උන්නත් එකයි නැතත් එකයි.”

රඹුක්වැල්ල මහතා කීවේය. සීයා ඒ කිව්වේ තමාටවත් අක්කාටවත් නොවන බව භාවනා දැනී. ‘ඒත් එහෙම කිව්ව එක හොඳයි’

“අපි සීගිරි එක ගොඩගන්න ඕන. ඒක කරන්න පුළුවන් කොල්ලෙක්ව

මම ගත්තේ. එච්චරයි. සුරංගි කියනවානම් ඒක මිහිරංගට කරන්න පුළුවන් කියලා. මම මාස තුනක් දෙන්නම් මිහිරංගට ඒක කරලා පෙන්නන්න කියන්න. මාස තුනකින්. එහෙම වුනොත් එයා තමයි මිනිහා.”

රඹුක්වැල්ල මහතා කීවේය. සුරංගි කතාකළේ නැත. මිහිරංග හැන්දෑවේ අම්මා සමඟ කිව්වේ වෙන කතාවකි. ‘මේ ඉලව් සුපර් මාර්කට් එක සක්කරයා ආවත් ගොඩගන්න බෑ අම්මේ මේක ඉවරයි ගේමක් දීලා අපේ කොටස ලියාගමු එච්චරයි. මේක ඉවරයි. සීයට කරන්න පුළුවන් බම්බුවක් නෑ.’ මිහිරංග කීවේය. එහෙම කියූ තම පුතාට සීගිරි එක මාස තුනෙන් ගොඩගන්න පුළුවන් කියා සුරංගිටද විශ්වාස නැත.

"මොකද කියන්නේ සුරංගි. කරන්න පුළුවන්ද ඒක."

"තාත්තා කියන්නේ ඔය එන එකාට පුළුවන් කියලද?"

සුරංගි ඇසුවාය. රඹුක්වැල්ල මහතා බැලුවේ නේත්‍රා දෙසය.

"කොල්ලා එන්නේ ප්ලෑනක් අතේ තියාගෙන නැන්දේ. ඒකයි අපි විශ්වාස කරන්නේ. අපිට ලොකු විශ්වාසයක් තියෙනවා ඒක කරන්න එයාට පුළුවන් කියලා."

"මාස තුනකින්."

සුරංගි ඇසුවාය.

භාවනා වේගයෙන් පහළට ආවාය. කෙල්ල රෑ ඇඳුමවත් ගලවන්නේ නැතුවම ආවාය. හැමෝම බැලුවේ ඇය දෙසය.

"අද කලෙක්ෂන් එක එක්ලක්ෂ

හතළිස් දාහයි අද සන්ඩේ වෙලත්. හරිද තාත්ති. අහගෙනද නැන්දි."

භාවනා කීවාය.

"මේක කලෙක්ෂන් එකක්ද? අපි දුවන්නේ පාඩුපිට. ඒක දන්නේ නැද්ද?"

"දන්න නිසානේ කියන්නේ."

සුරංගි කීවාය.

"මේ මාර්තු. අපි මැයි අග වෙනකල් මේ අලුතින් ගන්න කෙනාට දීලා බලමු. කලෙක්ෂන් එක පහක් කරන්න බැරිනම්. අපි එයා ගැන තීරණයක් ගමු. ම්. හොඳට මතක තියාගන්න අද කලෙක්ෂන් එක එක්ලක්ෂ හතළිස් දාහයි සිල්ලර කඩේකත් මේ කලෙක්ෂන් එක තියෙනවා."

"මිනිහම කරයි. පුතා කියන්නේ

මේ ලපයි සිපයි කොල්ලෙක් කියලා.”

සුරංගි කීවාය. භාවනා සිනාසුනාය.

“එයා ඒක කරයි. මේ ඇවිත් තියෙන්නේ ලපයි සිපයි කොල්ලන්ගේ කාලේ තමා නැන්දේ.”

භාවනා කීවාය. නේත්‍රාටත් පුදුමය. ‘ඒකා ගැන එච්චර විශ්වාසයෙන් කතාකරන්නේ කොහොමද? තාම වැඩට ඇවිල්ලත් නැතුව’ නේත්‍රා සිතුවාය.

“බලමුකෝ.”

සුරංගි කීවාය.

“අපිට බලාගෙන ඉන්නම වෙනවා නැන්දේ. එහෙම කරන්න වෙනවා මිහිරංග අයියටත් කියන්න ඒක.”

ඇය කීවාය. මිලින්ද තනිවම සිනාසුනේය. පසුව ඔහු ඔහුගේ

බිරිඳ ඉඳුනිල් දෙසද බැලුවේය. ඉඳුනිල් මේ කතාවලට කොහෙත්ම සම්බන්ධවෙන්නේ නැත. ඒ ඇගේ ප්‍රතිපත්තියය. ඒක රඹුක්වැල්ල මහතා හරියට අගය කළාය. මිලින්දව හැදුවේ ඇයය.

"දවසක ඔය දෙන්නා මේවා ලස්සනට කරගෙන යන්න ඕන ඒකයි මේ කැක්කුමෙන් කතාකරන්නේ"

සුරංගි අමුතු කතාවක් කීවාය. භාවනා සිනාසුනාය.

"මම නැන්දේ තාම බඩල් දාලායන්න හිතලාවත් නෑ"

කෙල්ල ඔය ටික පමණක් කියා උඩට ආවාය. ඉන් පසු කතාවෙන දේවල් ඕනා නැත. මිලින්ද උඩට යන කෙල්ල දෙස බලාගෙනම උන්නාය. ඇගේ කතාවට ඔහුට සිනාය.

# 35

සුරංගි පැමිණ මිහිරංගටත් මලීෂාටත් හැමදේම වාර්තා කළාය.

"එහෙනම් ඒකයි කතාව."

මිහිරංග පුපුරමින් කීවේය.

"කෙහෙල්මලක් කරලනේ ඔයාලත් කසාඳ බඳිනකොට දෙන කෙහෙල්මලක් ඉල්ලගන්න එපැයි. දැන් දෙයි මේන් කියලා."

මිහිරංග බැන්නේය. ඔහු එහෙමය.

"ඔක්කොටම වඩා කතාව දාගෙන

එන්නේ භාවනානේ."

සුරංග කීවාය. ඇය කියූ සියල්ලම සුරංගි කීවාය.

"එයාටත් ගේමක් දෙන්නම වෙනවා කට වැඩියි එයාගේ."

මිහිරංග කීවේය.

"මට පේන විදිහට සීයා මේක දෙන්න හිතාගෙන ඉන්නේ භාවනාටම තමයි. ටිකක් කපටිකමෙන් වැඩකරන්න වෙනවා මිහිරංග."

සුරංගි කීවාය.

"එහෙම එයාට විතරක් දෙන්නේ කොහොමද?"

මලීෂා ඇසුවේ කේන්තියෙනි.

"එහෙම තමයි සීයගේ හැටි. එයා කිව්වොත් ඒකම තමා කරන්නේ. බලන්නකෝ. භාවනත් සීයව අල්ලගත්ත ගමන් ඉන්නේ. ඒක පුදුම

ලව් එකක්."

"මේවා අපටත් අයිතියිනේ."

"තේරෙයි ඔයාලට. සීයා දවසක අන්තිම කැමති පත්‍රයත් ලියලා මැරිච්ච දවසට මරාගෙන මැරෙන්නද එදාට."

සුරංගි අද එය හොඳින්ම තේරුම් ගත්තාය.

"ඒවා වෙන්නේ නෑ මම නිකං ඉන්නේ නෑනේ."

මිහිරංග කියන්නේ නැති පිරිමිකමක් ගනිමිනි.

"හරි භාවනා කියන්නේ කලෙක්ෂන් එක ලක්ෂ පහක් කළේ නැත්නම් ඌ ගැනත් තීරණයක් ගමු කියලනේ. බලමුකෝ ඌ කලෙක්ෂන් නග්ගන හැටි. මේ සීගිරි එකේ කලෙක්ෂන් එක ලබන මාසේ වෙද්දී හැට හැත්තෑවට

බහිනවා අම්මා. බලන්නකෝ.”

සුරංගිද හිස වැනුවාය.

“බලන්නෝන කීල්ස්වලට එහෙම ගිහින්. ඒවනේ සුපර් මාර්කට්.”

“කොහොමත් උඹට වැඩි දවසක් සීගිරි එකේ ඉන්න බෑ.”

“දෙනවකෝ හොඳ ගේමක් අයියේ.”

මේ කොහේවත් යන කොල්ලෙක්ට මෙච්චරම බයවී ඉන්නේ ඇයිදැයි සුරංගිට අසන්නට සිතුණි. එහෙත් ඇය ඇසුවේ නැත.

“භාවනාව ටිකක් යාප්පුවෙන් තියාගන්නවා මිහිරංග. එයා එක්ක ලේසිවෙන්නේ නෑ. අද උඩ ඉඳලා කඩාගෙන පහළට ආවේ එකපාර.”

“එයාට හරි කැක්කුම තමා සීගිරි එක ගැන. සමහරවිට සීයා කියලත්

ඇති ගෑණිට.”

“ඒවා කොහෙද? සීගිරි එක එයාට විතරක් දුන්නොත් බලාගන්න පුළුවන්”

මලීෂා කීවාය. මිහිරංගට කොයිකත් එකය. ‘ලේසිම දේ භාවනාව මැරිකරන එක. ඒක පට්ට කෑල්ල.’ මිහිරංග සිතන්නේ භාවනාව කසාඳ බඳින එක මහා දෙයක් නොවේ කියාය.

“සීයට ගාණක් නෑ ඔයා සීගිරි එකට නාවා කියලා ආවත් එකයි නාවත් එකයි කියලා කියන්නේ”

“එහෙම නෑවිත් ඉන්නේ නෑ අම්මේ. අපි යන්කෝ බලන්න. මෙයා මහ ලොකු සාධාරණ පොරක්ලුනේ හෙට අනිද්දා සීගිරි එක වහනවා. එතකොට ඕක බෙදන්නේ නැතුව මොනා කරන්නද? හෙණ ඇණයක්

වෙන සයිස් එකක් තියෙන්නේ.”

සීගිරි එක වහනවා කියා කියද්දී සුරංගිගේ හදවතට කිසිඳු ගැස්මක් ඇතිවෙන්නේ නැත. ඇය කවදාවත් සිගිරි එකට ආදරය කළේ නැත. සීගිරි එකට පැලෙන්නට ගියේ නර්මදාය. අවසානයට ඇගේ නමින් සීගිරි එක ඉදිරිපිට සුදු කොඩි එල්ලුනේය.

*** *** *** *** ***

රෑ භාවනාට උණ ගත්ත ගාණය. කෙල්ලට නින්ද ගියේද නැත. වෙලාව රෑ එකොළහමාරය. ඇය කිරි කෝපි එකක් බොමින් දහසක් දේ සිතුවාය.

“ඇයි මම ඔයා වෙනුවෙන් එහෙම දෙයක් කිව්වේ දේවක? ඇයි එහෙම කිව්වේ? ඔයා එන්නත් කලින් සීගිරි

එකෙන් ඔයාව අයින් කරන්න යන්නේ. එච්චරම කැක්කුමක් මට ආවේ ඇයි ඒක ගැන? කවදාවත් මම මෙහෙම කතාකරලා නෑ. කවදාවත් නෑ. නෙවර්. ඒත් මම ඔයා වෙනුවෙන් කතාකළා."

කෙල්ලව වෙව්ලන ගාණය. තමා හැමෝම ඉදිරියේ තිබ්බේ ලේසි පාසු අභියෝගයක් නොවේ.

"ඔයාට පුළුවන්ද සීගිරි එකේ කලෙක්ෂන් එක ලක්ෂ පහක් කරන්න. පුළුවන්ද දේවක? එහෙම වෙන්නම ඕන. මට හිතෙනවා ඔයා පහක් නෙමේ හතක් අටක් කරයි කියලා. ඒත් ඇයි මම ඒක මෙයාලට කියන්න ගියේ."

දේවකට එරෙහිව මේතරම් කැරල්ලක් සීගිරි එක ඇතුලෙන්ම

එන්නේ ඇයිදැයි භාවනා සිතුවාය.

"මිහිරංග ඩිම්වෙලා ඉන්නේ ඔයා එන එකට. මෙච්චර කාලෙකට සීගිරි එකට ආවේ එහෙම බයවෙන්න ඕන මිනිස්සු නෙමේ. ඒත් ඔයා. ඔයා ලේසිපාසු කෙනෙක් නෙමේ කියලා මිහිරංග දන්නවා. එයාලට ඕන හෙට අනිද්දා සීගිරි එක වහනවා දකින්න. හරි ආසයි එයාලා සීගිරි එකේ පාංශකූලේ දීලා ඊට පස්සේ ඒක බෙදාගන්න. ඒත් මමයි අක්කයි ඉන්නකල් සීගිරි එකට ඒ ඉරණම වෙන්න දෙන්නේ නෑ."

දේවකව වටින්නේ ඒ නිසාමද? දන්නේ නැත.

අක්කා ටිකකට කලින් කියූ කතාව නිසා භාවනාගේ සිත තවත් ටිකක් ගැස්සිණ.

"ඔයාට පැටියෝ ෂුවර්ද ඒකා මෙහෙම දක්ෂයෙක් කියලා. හැමෝ ඉස්සරහම කියන්න. එච්චරම විශ්වාසයෙන්. මේකට එච්චරම දෙයක් කරන්න පුළුවන්ද?"

භාවනා සිතුවාය.

"ඔයාට සුපර් මාර්කට් ෆීල්ඩ් එකේ එහෙම එක්ස්පීරියන්ස් එකකුත් නැති එකේ. ඇයි මම එහෙම හිතුවේ."

ඔහු එන්නේ හෙටය. ඒත් හෙටම ඔහුව සීගිරි එකට ගන්නේ නැත. සීයා බලා ඔහුට එන්න දවසක් කියනු ඇත. දේවක පැමිණ වැඩ පටන් ගන්නේ ඉනුත් පසුවය. මේ දවස්වල මිනිස්සු සල්ලි අදින්නේම නැත. ඒ තරමට මිනිස්සුන්ට අමාරුය.

බොහෝ විට කස්ටමස්ලා බඩු අල්ලනවා විතරය. ගන්නේ නැත.

රාක්කවල ඇති දෙයක් ට්‍රොලියට දමාගන්නට පෙර ඔහුන් දහසක් දේ සිතති. වෙදානට බී ලූණු කිලෝ එකක් ගත්ත කෙනාත් දැන් ගන්නේ දෙසිය පනහය. ෂැම්පූ බෝතලයක් ගත්ත කෙනා දැන් ගන්නේ සැෂේ පැකට් එකකි. දේවක සීගිරි එකට එන්නේ එහෙම කාලයකය.

ඒත් ඔහු විශ්වාසයෙන් කියන්නේ ඒක කරන්න තමාට පුළුවන් බවය. පුදුමම දේ ඔහුට එය කරන්නට පුළුවන් බව තමාට දැනීමය.

"කොහොමත් ඔයා සීගිරි එකට ආවට පස්සේ පැත්තකට එක්කගෙන ගිහින් මට තියෙනවා දෙකක් කතාකරන්න. මේ දේ ඔයා දැනගන්නම ඕන. ඔයා වෙනුවෙන් මම මෙහෙම අවධානමක් ගත්තා කියන

එක. ඒක ලේසි පාසු දෙයක් නෙමේ දේවක. කොහෙත්ම ලේසි නෑ."

දැන් ඔහුට තතාකර ඒ ගැන කියන්නට භාවනාට සිතෙයි. එහෙත් කොල්ලාව එහෙම බයකරන එක සාධාරණ නැත. පිටියට එන්නට පෙර 'උඹ අද සෙන්චරියක් ගහන්නම ඕන. නැත්නම් උඹව ටීම් එකෙන් අයින් කරනවා' කියා කියන්නට නොහැක. මේ කියන්නේ එහෙම කතාවකි.

"ඒත් මට හිතෙන්නේ ඔයා සෙන්චරියක් නෙමේ ඩබල් සෙන්චරියක් ගහයි කියලයි."

දේවක. ඔහු කෙහේ සිට ආවාද? භාවනා දෑස් පියාගෙන සිතුවාය.

"ඔයාට ටිකක් දුක් විඳින්න වෙයි. සමහරවිට ඔයත් එක්ක ඒ දුක විඳින්න මාත් එයි. ඒක සීගිරි එක

වෙනුවෙන් විඳින දුකක්ද නැත්නම් වෙන දෙයක් වෙනුවෙන් විඳින දුකක්ද කියලා මම දන්නේ නෑ"

කෙල්ලට නින්ද ගියේ ඕවා සිතමින් සිටිද්දීය.

ඒත් සීගිරි එකේ සියල්ලන්ම නින්දට ගිය මේ රාත්‍රියේ එක කොල්ලෙක් සීගිරි එකේ හාස්කමක් මවන්නට තට්ට තනියම ගඩොල් කෑල්ලක ඇහැරී දුක් විඳින බව කිසිවෙක් දැනගෙන උන්නේ නැත.

මේ දවස්වල රෑට ඉවසගන්නට බැරිතරම් සීතලය. ජනේල් කිසිවක් නැති සාල කෑල්ලේ වැඩකරද්දී එන සුළඟේ ඇත්තේ ඉවසගන්නට අමාරු තරම් සීතලකි. හිමිහිට ගොස් කෝපි ටිකක් හදාගෙන විත් කොල්ලා වැඩය.

පුදුමයකට මෙන් දේවක ඉලක්ක

කරන්නේ භාවනා පිරිස ඉදිරියේ පොරොන්දු වූවාක් මෙන් දවසකට ලක්ෂ පහක සේල් එකක් නොවේ. ලක්ෂ දහයක සේල් එකකි. කෙල්ල කිව්වේ ඒක මාස තුනෙන් ගන්නවා කියාය. ඒත් දේවක සිතන්නේ මාසයක් ඇතුළත සීගිරි එකේ සේල්ස් ඒ ගාණට වැඩිවිය යුතු බවය.

කතාවට කියන්නේ හඳ ඉලක්ක කර ගසන්නට කියාය. එවිට අඩුම තරමේ තරු අතරවත් ඉන්නට පුළුවන. කොල්ලා මේ කතාව හොඳට අදහයි.

# 36

වෙලාව පාන්දර පහය. භාවනා පිබිදුනේ දැන් ටිකකට කළිනි. ඇය එහෙමම ඇඳටම වී උන්නාය. තොල කට වියලී තිබුණි. කෙල්ල මග් එක පිරෙන්නට තේ එකක් ගෙන්නා ගත්තාය. නිවසේ කිසිම හැල හොල්මනක් නැත. ඇය තේ එක බොමින් සිට හදිස්සියේම නැඟිට ගොස් අල්මාරිය විවර කළාය.

ඒ අද අඳින්නට සාරියක් තෝරාග

න්නටය. දැන් හැමදාම ඒකත් පොඩි ප්‍රශ්නයකි. 'හෙට අනිද්දට කොහොමත් රවුමක් යන්න වෙනවා සාරියක් දෙකක් ගන්න. දැන් මගෙත් මෝස්තර වැඩියි. මේක ලෙඩක් සුදූ' කෙල්ල කියාගන්නේ තමාටමය.

සෑහෙන වෙලාවක් ගෙන ඇය ලාදම් පැහැගත් සාරිය තෝරාගත්තාය. එය දම් පැහැයමම නොවේ. රෝස පාටත් දම් පැහැයත් අතර පාටකි. සාරිය ප්ලේන්ය. කිසිම බෝඩරයක් නැත. සාරියේ ඇති ලස්සනත් ඒකමය. කෙල්ල මෙහෙම ප්ලේන් සාරි අඳින්නට ආසය.

"දවසක සීගිරි එකට උතුරන දවසක ලස්සනටම අඳිනවා. එතකල් මේ තියෙන සාරි ටික ඇඳලා ඇඳලා ඉවර කරනවා."

කෙල්ල සිතාගත්තාය. ඇය එහෙමය. විශේෂ දේවල් කරන්නේ හදවතට විශේෂ හැඟීමක් එනවානම් පමණය.

යළිත් පැමිණි භාවනා ඇඳෙන් ඉඳගත්තාය. අද කොහොමත් විශේෂ දවසකි. ඒ ඔහු සීගිරි එකට එන නිසාද? කෙසේ වෙතත් සීයා ඔහුත් සමඟ කතාකරන වෙලාවේදී එතන සිටිය යුතුයැයි කෙල්ල සිතාගත්තාය.

"ඕනවට වඩා හිතනවත් වැඩියි. බලමුකෝ. මොකක්හරි වෙයිනේ."

කෙල්ල එහෙම සිතා පපුව සැහැල්ලු කරගන්නට හැදුවාය. ඒක බොරුවක් බව ඇයම නොදන්නවා නොවේ. මේ පපුවට බරක් දැනෙන්නේ වෙන කතාවක් නිසාද? 'යන්න අනේ යන්න' කෙල්ල හැමෝටම කියන

කතාව හිතටත් කීවාය.

ඉඳුනිල් ආවේ උදෙන්ම කෙල්ල එක්ක ටිකක් කතාකරන්නට හිතාගෙ නය. ඇය සීගිරි එකේ ප්‍රශ්නවලට අතදාන්නේ නැත. ඒත් මේ කෙල්ලෝ තුන්දෙනා ඇයට පණ වාගේය. මල් තුනක් වන් කෙල්ලෝ තුන්දෙනෙක් හැදුවේ හරි ආදරයෙනි. නේත්‍රාගේ ජීවිතයට වූ දේ නිසා ඉඳුනිල් තාරකාගේත් භාවනාගේත් ජීවිත ගැන ඉන්නේ තරමක් බියකිනි. ඇය එද්දී භාවනා උන්නේ ඇඳටම වීය.

අම්මා මේ වේලාසනම එන්නේ තමාව කතාවට අල්ලාගන්නට බව භාවනා දනී.

"අද උදෙන්ම ඇහැරිලා ඔයා."

"ටිකක් අම්මා. වැඩ ගොඩක් තියෙනවා."

"ම්."

ඉඳුනිල් කෙල්ලගේ ඇඳ මතින් ඉඳගත්තාය. ඊටත් පසු ඇයගේ දෙපා හිමිහිට පිරිමැද්දාය.

"ආයේ මෙයාලා එක්ක කතාවට යන්න එපා ඔයා. තේරුමක් නෑ."

අම්මා මෙහෙම කියන බව භාවනා දනී.

"මම කතාවට ගියේ නෑ අම්මා ඒත් සීගිරි එකට මෙහෙම වෙන්න දෙන්නත් බෑ."

"ම්. හැමදාම ඕක අල්ලගෙන ඉන්නත් බෑනේ. මැරිකරපු කාලෙක ඔයා මේවලින් අයින්වෙන්නත් ඕනනේ."

ඒත් සීගිරි එකෙන් තොර ජිවිතයක් ගැන කෙල්ල කවදාවත් හිතා නැත.

"මගේ පළවෙනි කොන්දේසිය ඒක අම්මා."

"මොකක්ද"

"මම එයාට කියනවා මම දිගටම සීගිරි එකට යන්නෝන කියලා."

ඉඳුනිල් සිනාසුනාය. කොන්දේසිවලට යටත්ව කසාඳ බඳින කොල්ලෝ අද නැත.

"ඉස්සෙල්ලා ඉතින්."

කියන්න ගිය දේ ඉඳුනිල් ගිලගත්තාය.

"තාත්තා කියන්නේ දැන් ඔයාගේ හරි පොඩ්ඩි අක්කගේ හරි වැඩ ඉවරකරන්න කාලේ හරි කියලා."

"තාත්තට පිස්සු අනේ."

"පොඩි අක්කා කියන්නේ එයාගේ එයාලයින් ජොබ් එක හරියනවා

කියලා එහෙම වුනොත් අවුරුදු පහකට එයා මැරිකරන්නේ නෑ."

"මාත් අවුරුදු පහකට මැරිකරන්නේ නෑ."

"මෙහෙම ඉඳලා වයසට යන්නද හිතාගෙන ඉන්නේ."

"ටිකක් ගිහින් බැන්ඳාම මොකෝ. මේ විස්සෙන් විසි එකෙන් මැරිකරන්නේ නෑ අම්මා දැන්."

ඉඳුනිල් සිනාසුනාය.

"කොහොමත් ජීවිතේ ගැනත් ටිකක් හිතන්න වෙයි."

"ම්. බලමුකෝ."

"කෙල්ලෙක්ගේ ජීවිතේ වටිනාකම තීරණය වෙන්නේ එයාට ලැබෙන මහත්තයා අනුව. කරන රස්සාව එච්චර වැදගත් නෑ."

භාවනාද එය නොදන්නවා නොවේ.

"අපි එයා ආපු දවසට ඕක කතාකරමු. දැන් කතාකරලා වැඩක් නෑ."

"කවුරුද ආපු දවසටද?"

"ඔය කියන්නේ. මහත්තයා ගැන."

ඉඳුනිල් සිනාසුනාය. කෙල්ලට කොහොම මහත්තයෙක් ලැබේදැයි ඇයද සිතුවාය.

"ඒ ගැන හිතන්න ඕන නැතුව එන්නේ නෑ."

"එන කෙනෙක් එන්නේ නැතෑ අනේ හිතුවා කියලා ඔය පිස්සා එනවයෑ."

ඉඳුනිල් සිනාසුන් මේ කෙල්ලව හදන්න බෑ කියන්නාක් මෙන්ය. ඉඳුනිල් ගියේ තවත් ටික වෙලාවක් ඉඳලය. අම්මා ගිය පසු කෙල්ල

දිගටම සිතුවේ ඇයගේ මහත්තයා ගැනය. 'ඔයා කොහොම කෙනෙක්ද? මොන වගේ කෙනෙක්ද? කොයිවගේ ගතිගුණ තියෙන කෙනෙක්ද?' ඇය දිගටම සිතුවාය. එහෙම සිතාගෙන සිතාගෙන යද්දී කෙනෙක්ගේ රුවක් පුදුමාකාර ලෙස ඇගේ දෙනෙත් අභියස මැවෙන්නට විය. කෙල්ල ඉන් තැති ගත්තාය. 'ඇයි මට ඔයාගේ රූපේ මතක්වෙන්නේ දේවක. මේ ඇයි ඇත්තටම' කෙල්ලම දන්නේ නැත. එහෙත් ඕනවටත් වඩා ඔහුගේ රුව හදවතේ ඇඳෙයි.

උදේ ඔහුව දකින තුරු හදවතට නිවනක් නැත. මේ පාන්දර ඇහැරීගෙන ඇස්දෙක විඳින දුකත් ඒකම නොවේද??

***    ***    ***    ***    ***

දේවක උදෙන්ම නැඟිට සුදු කැකුළු බත් හදා කට දන පොල් සම්බෝලයක් හදා ඒකටම බිත්තර බුල්සයි දෙකක් දාන්නට ගත්තේය. සුදු කැකුළු බත් එකට පොල් සම්බෝලයක් ඇතිය. ඒත් ඒකට බිත්තර බුල්සයි එකක් කියන්නේ දිව්‍ය බෝජනයකි. කොල්ලා බිත්තර දෙක බුල්සයි දැම්මේ නැත. ඒක කරන්නේ කන්න ආ විටය. නැත්නම් බිත්තර බුල්සයි එක රස නැත.

අද ටයි ඕනා නැතැයි දේවකට සිතුණි. ඔහු චාම් කළු කලිසමට සුදු අත් කොට කමිසය ගෙන මැද්දේය. ඒත් සමඟම අප්පච්චිගේ කලිසමත් කමිසයත් ගෙන මැද්දේය. 'අතට

කීයක්හරි ලැබුණාම අප්පච්චිටත් එක්කම ෂර්ට් ටිකක් ගන්නවා. එයාගේ කමිසත් කඩදාසිම වෙලා ගිහින්’ ඔහුට දුකය. අප්පච්චී මේ දවස්වල වැඩිපුර වියදම් කරන්නේ නැත. කීයක්හරි ඉතුරු කරන්නේ කොළඹින් ගේ කෑල්ලක් හදාගන්නටය.

“වෙලාවකට හිතෙනවා අප්පච්චී ගෙදරට වෙලා අමුතුම විදිහේ බිස්නස් එකක් කරන්නත්. ඔය මොනවාහරි පොඩි ප්‍රඩක්ට් එකක් කළාකම් කීයක්හරි හොයාගන්නවා. ඒත් ඔයා මට සීගිරි එකට යන්නම කියනවනේ. මාත් දැන් ඒකටම යන්න හීන දකිනවනේ. බලමුකෝ ගිහින්.”

දේවක සිතුවේය. දේවක ඇඳගත්තේ අප්පච්චීත් සමඟම යන්නටය. වෑන් එකේම ගියවිට

පහසුය.

"ඇයි පුංචි මහත්තයෝ අද ටයි එක අඳින්නේ නැද්ද?"

දේවක සිනාසුණේය.

"අද මෙහෙම යනවා අප්පච්චී."

"ම්. කොහොමත් ලස්සනයි."

ජීවන් කිවේය. කොල්ලා සිනාසුණේය.

"කන්න ගන්න අප්පච්චි මම බුල්සයි දෙක දාගෙන එන්නම්."

"කෝ මම දාන්න."

"අප්පච්චි කන්නකෝ. ඒක මම දාගෙන එන්නම්."

කොල්ලා පොඩි පෑන් එක ලිපේ තබා තෙල් ටිකක් දැම්මේය. ඊටත් පසු බිත්තරය කඩා දැම්මේය. චිරි චිරිස් හඬ නංවමින් බිත්තරය බැදෙන

විට එන සුවඳ ඉවසගන්න අමාරුය. ජීවන් සිනාසුනේය.

"ඇයි අප්පච්චි?"

"ඉස්සර අම්මගෙයි මගෙයි ප්‍රියතම කෑම ඔය. හැබැයි පාන් එක්ක. අපි දෙන්නා බිත්තරයක් බුලසයි දාගෙන ලූණු ගෙඩියක් කපාගෙන පාන් කනවා. ඒක මාර රසයි."

"ඒකනේ අප්පච්චි. මාර පාරනේ."

දේවක කීවේය. ඔහු කෑලි හිටින්නට තලාගත් ගම්මිරිස් ටිකක් බිත්තරය උඩින් ඉස්සේය. ජීවන් බලාගෙනම උන්නේය. 'කොල්ලා දැන් එක ගාණකට ඇවිත් සුදු නෝනා' ඔහු මේ කියන්නේ බිරිඳටය. මැරිච්ච බිරිඳටය.

"කමු අප්පච්චි."

දෙන්නාම කන්න ගත්තේ එකටම

ඉඳගෙනය. සුදුකැකුළු බත තාමත් උණුය. පොල් සම්බෝලත් සමඟ රස එහෙම උණු බත් ටිකකි.

"සමහරවිට සීයා කියයි ඔයාට හෙට ඉඳලා එන්න කියලා."

"එහෙම වුණොත් අප්පච්චී හෙට ඉඳලම යනවා නේද?"

"යමු. ඔයාට මේක අභියෝගයක් පුංචි මහත්තයෝ."

"ඒක දැනගෙන යන්නේ අප්පච්චි. මම පාන්දර හතරයි නැඟිටිනකොට."

කොල්ලා කීවේය. ජීවන්ට දුකක් නැත. කොල්ලෙක් එහෙම දුක් වින්ඳාට කමක් නැත. කොල්ලෙක් කියන්නේ ඒකටය.

"හේරත්ට අද හවස් වෙද්දී එයි හරි ආසයි මම කතාකළාම."

“මම අප්පච්චි උයන බඩුටිකක් එහෙම ගෙනත් දාන්නම්. එතකොට ලේසියිනේ. නේද?”

“ඔව්. උදෙන්ම එයා උයයි. ඔයත් බත් එකක් අරගෙන යන්නෝනනේ.”

දේවක සිනාසුනේය. නොකා නොබී හෝ සීගිරි එක ගොඩනැඟිය යුතුය. ‘අද ඔයාවත් ටිකක් බලාගෙ නම එනවා මිස්.ඒකයි මේ උදෙන්ම හිත පේවෙලා යන්නේ’ කොල්ලා ඒක නොදන්නවා නොවේ.

“දවල්ට මොනවාහරි කන්න. අපි රෑට හේරත් ආවාමම උයමු”

“මම කන්නම් අප්පච්චි.”

“ඔය කිව්වට කන්නේ නෑනේ. නෙළුම් කොළේ බත් තැන හොඳයිනේ බත්.”

“රෝස් පාන් එකක් කන එකත්

මරු අප්පච්චි."

දේවක කීවේය. ජීවන් සිනාසුනේය. ඔහුත් රෝස් පාන් කන්න ආසය. ඒ ඇඹුල් කෙසෙල් ගෙඩි එක්කය.

දේවක අප්පච්චීත් සමඟම ආවේය. සීගිරි එක පේන මානයේදී ඔහු බැසගත්තේය.

"කෝල් එකක් දෙන්න පුංචි මහත්තයෝ."

"හා අප්පච්චි පරිස්සමින් යන්න."

ජීවන් ගියේ ටික වෙලාවක් කොල්ලා යනතුරු බලාගෙන ඉඳය. ඔහු යන ගමන් සීගිරි එක දෙස බලාගෙනම ගියේය. 'සීගිරි එක අදටත් එහෙමමයි. ඒත් ජීවිතේ ලොකු කාලයක් ගියා' ජීවන්ට සිතුණි.

දේවක පාර පැන්නේය. පාර එහා පැත්තේ නවතා තිබූ වෑන්

රියේ උන් දෙන්නෙක් තමා දෙසම බලාගෙන ඉන්නවා දේවක දැක්කේය. ඔහුගේ හිතට මොකක්ද අමුත්තක් දැනුණි. 'ලෙඩක්ද' දේවක සිතින් කීවේය. ඔහුට මේ කොයිකත් එකය. කොහොමත් ජීවිතේ හැම අභියෝග යකටම මුහුණ දෙන්නට පුළුවන් හයියක් දේවකට තිබුණි. ඔහු හැදුනේ එහෙම අභියෝග මැදය. දෙන්නාම බලාගෙන ඉන්නේ තමා දෙස බව දේවක හොඳින් දැක්කේය. තමා අද සීගිරි එකට ඒමත් මේ බලාගෙන ඉන්නා දෙන්නාගේ බැල්මත් අතර මොකක් හෝ සම්බන්ධයක් ඇතැයි ඔහුට නිකමට මෙන් සිතුණි.

දේවක පාර පැන කෙළින්ම ආවේය. ඔවුන් දෙදෙනාත් ඔහුත් අතර වූයේ අඩි විස්සක පමණ

පරතරයකි. දේවක දෙන්නාගේ මුහුණ දෙස හොඳින් බලාගෙන උන්නේය. මරාගෙන මැරෙන එකාගේ හෝ මුහුණ හොඳින් බලාගත යුතුය.

දේවක ඔහුගේ ජංගම දුරකථනය අතට ගත්තේය. කොල්ලා එහි කැමරා ඔප්ෂන් එක මුහුණතට ගත්තේ තත්පර කිහිපයකිනි. කොල්ලා ඔහු දෙස බලාගෙන උන් දෙදෙනාගේ පින්තූයක් ගත්තේ තවත් කිට්ටු වූ පසුය. ඔහු ඇමතුමක් ගන්නා ලෙසක් අඟවමින් දුරකථනයෙන් ඡායාරූපයක් ගත්තේය. දේවකට මේ වැඩ ලස්සනට කරන්නට පුළුවන. ඔහු නුවර කොල්ලෝ කෙල්ලන්ට සැම්සුන් ස්මාට් ජංගම දුරකථන දෙතුන් දාහක් විකුණූ අලෙවි කරුවෙකි. ඒවා විකුණන්නේ ජංගම දුරකථනවල

ඇති ස්මාට් උපාංග ගැන කොල්ලෝ කෙල්ලන්ව දැනුවත් කරමිනි. 'ඩන්. බලමුකෝ දෙන්නා මොන වගේ කතාවකටද එන්නේ කියලා' දේවක සිතුවේ ඔවුන් ළඟින් පාස්වෙද්දීය.

වෑන් රියේ දොරක් ඇරගෙන එකෙක් උන්නේය. අනෙකා උන්නේ පිටුපස අසුනේය. දෙන්නාම උන්නේ බිමට පයක් තබන්නට බලාගෙනය.

"මේ මල්ලී."

වෑන් රියේ ඉදිරිපස උන් කෙනා දේවකට කතාකළේය. දේවක නැවතුනේය. 'ලෙඩකට වගේ තමයි. බලමුකෝ.' දේවක සිතුවේය.

"ඇයි අයියේ?"

කොල්ලාගේත් කටය. ඔහු කතාකළේත් නෑකමින්මය.

"මේ. නවරත්න මහත්තයලගේ

ගෙවල් කොහෙද?"

දේවක බැලුවේය. හොඳින් බැලුවේය. කෙනෙක්ව හොයන කෙනෙක් මෙහෙම මඟ නැවතී නිවී සැනසිලේ හොයන්නේ නැත. 'මූන් ටික බලාගෙන හිටියේ මම එනකල්. ඇතුලේ තවත් එකෙක් ඉන්නවා වගේ' දේවක දැක්කේය.

"මොනවා කරන කෙනෙක්ද අයියේ?"

දේවක නොදන්නා ගාණට ඇසුවේය.

"මේ. ආ ලෝයර් කෙනෙක්."

"ලෝයර් කෙනෙක් නේ. ඉන්නකෝ ටිකක් පොලීසියේ ඕ අයි සී මගේ මාමා. අහලා බලලා කියන්නම්. ඉන්න තත්පරයක්."

කොල්ලා ජංගම දුරකථනය

අතට ගත්තේය. වෑන් රියේ උන් අය එකිනෙකාගේ මුහුණු බැලුවෝය. මේ ඉන්නේ පොලිස් ස්ථානාධිපතිගේ පුතෙක් යැයි ඔවුන් සිතුවේ නැත.

"ආ හරි හරි මල්ලි. අපිට ඇඩ්‍රස් එක ආවා. තැන්කියූ."

කොල්ලා ජංගම දුරකථනට පහළට ගත්තේ මෘදු සිනාවක් සහිතවය.

"එහෙනම් හරිනේ අයියා. මම යන්නම්."

ඉදිරිපස උන් මැරයා හිස වැනුවේය. දේවක ඔහුගේ ජංගම දුරකථනයේ කැමරාව ක්‍රියාත්මක කළේ එය පහළට කරගෙනය. කොල්ලාට ඕනා වූයේ වෑන් රියේ අංකය ගන්නටය. ටික දුරක් ගොස් දේවක එය ගෙන බැලුවේය. හයි

එස් වෑන් රියේ අංකය ලස්සනට දුරකථනයේ සටහන්ව තිබුණි.

දේවක සීගිරි එකට ඇතුල්වෙන අයුරු වෑන් රියේ උන් සියල්ලන්ම බලාගෙන උන්නෝය. ලෝයර් නවරත්නගේ ලිපිනය ලැබුණානම් එහි යන්නේ නැතුව තමා යන දෙස බලාගෙන ඉන්නේ ඇයිද කියා දේවක සිතුවේය. 'මෙතන මොකක්හරි කේස් එකක් තියෙනවා. බලමුකෝ.'

දේවක සීගිරි එකට පය තැබුවේ මේ සියල්ල අමතක කරය. කුමක් හෝ දෙයක් වෙන බව ඔහුට ඉවෙන් මෙන් දැනුණි. 'වෙන දෙයක් වෙන්නේ මම සීගිරි එකට එන එක නවත්තන්නද' පුදුමයකට මෙන් ඔහුට එය සිතුණි.

සීගිරි සුපර් විවෘත කර තිබුණේ

නැත. එහෙත් කාර්යාලයට පිවිසෙන දොරටු ඇර තිබුණි. දේවක ඔහුගේ කළු පැහැගත් සයිඩ් බෑග් එක දමාගෙනම ඇතුල්වූවේය.

සීගිරි පළමු කොටස මින් නිමාවේ.

දේවක පුංචි බණ්ඩාර
සීගිරි සුපර් මාර්ට් එකට කරන
හාස්කම සමඟ සීගිරි දෙකේදී යළි
හමුවෙමු.
සීගිරි 2 වන පොත
දැන් ඩවුන්ලෝඩ් කරගත හැක.